
# පහන් කණුව ධර්ම දේශනා

7 - වෙළුම



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

# පහන් කණුව
# ධම් දේශනා

*සත්වන වෙළුම*

ISBN 978 - 955 - 1255 - 25 - 1

කටුකුරුන්දේ ඤාණනන්ද හිකෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම

ප්‍රකාශනය
ධම්ග්‍රන්ථ මුද්‍රණභාරය

2008



ධම්දානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2008 නොවැම්බර්

පොත ලබාගත හැකි ස්ථාන

1. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
   'පහන් කණුව', කන්දේගෙදර, දේවාලේගම.

2. රෝයල් ඉන්ස්ටිටියුට්,
   191, හැව්ලොක් පාර,
   කොළඹ 5.

3. ඩී.ටී. වේරගල මහතා
   422, වැලිපාර, තලවතුගොඩ

4. අනුර රූපසිංහ මහතා
   27, කොළඹ වීදිය,
   මහනුවර.

5. හේමා රූපසිංහ මිය
   26, හැව්ලොක් පාර, ගාල්ල.

6. මහා භාරකාර දෙපාර්තමේන්තුව
   2, බුලර්ස් පටුමග,
   කොළඹ 07.

වෙබ් අඩවිය: www.seeingthroughthenet.net

මුද්‍රණය
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැහිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
දු.ක. 0114-870333

**'සබ්බපාපස්ස අකරණං**
**කුසලස්ස උපසම්පදා**
**සචිත්ත පරියොදපනං**
**එතං බුද්ධානසාසනං'**

බුද්ධවග්ග, ධම්මපද

**හැම පවින් වැළැකුම**
**කුසල් වෙතටම එළැඹුම**
**සිත පිරිසිදු කැරුම**
**සස්න මෙයමැයි හැම බුදුන්ගෙම**



## පටුන


පිටු

හැඳින්වීම v

ප්‍රකාශක නිවේදනය viii

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළ කැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම x

අමා ගඟ xi

31. 'ඉමෙසු කිර සජ්ජන්ති' 3

32. 'අයොඝන හතසෙසව' 29

33. 'පස්ස චිත්තකතං බිම්බං' 53

34. 'දානංච පෙය්‍යවජ්ජඤ්ච' 77

35. 'උට්ඨානෙනප්පමාදෙන' 99

# හැඳින්වීම

දහම් දන හැමදන්ම — පරදයි
දහම්රස හැම රසම — පරදයි
දම් ඇලුම හැම ඇලුම් — පරදයි
නිවන් සුව හැමදුක්ම — පරදයි

අනුත්තර ධර්මරාජයාණන් වහන්සේගේ ධර්මවිජයට අරමුණුවූයේ දෙව් මිනිසුන්ගේ චිත්ත සන්තානයයි. අනාදිමත් කාලයක් තුළ මෝහයෙන් මුළාවී සසර දුක් ගින්නෙන් දැවෙමින් සිටින ලෝ සතුන්ගේ සිත් සතන් දහම් අමා දහරින් සිසිල් කර අමා මහ නිවනින් නිවා සුවපත් කිරීම ඒ මහා කාරුණිකයාණන් වහන්සේගේ ධර්මවිජය පරමාර්ථය විය. දුක් ගිනි වඩන දිග්විජය වෙනුවට දුක් ගිනි නිවන ධර්මවිජයක් බුදුපියාණන් වහන්සේ ලෝකයාට හඳුන්වා දුන්හ.

ධර්මදානය අන් හැම දානයකටම වඩා උතුම් වන්නේ සිතකට වැටෙන දහම් පදයකින් පූර්ණ ජීවිත පරිවර්තනයක් පවා සිදුවිය හැකි බැවිනි. බාහිර වස්තු දානයෙන් සැළසෙන තාවකාලික සහනය මෙන් නොව, එය සනාතන සැනසුමකට මඟ හෙළිකරයි. මොහොතකට දිවගට දැනී-නොදැනී යන ආමිස රසය මෙන් නොව, නිරාමිස දහම් රසය අසහනය දුරුකොට සිත් සනහන ගැඹුරු අර්ථ රසයකි. සසර වඩන ගේහසිත ඇලුම් මෙන් නොව, ලොවුතුරු දහමට ඇති ඇල්ම සසර ගමන කෙටිකරයි. තණ්හා පිපාසය සන්හිඳුවන අමා මහ නිවන සියලු සසර දුක් නිවාරණය කරයි.

'නිවනේ නිවීම' පොත් පෙළෙන්* අප දියත් කළ ධර්මදාන වැඩ පිළිවෙළෙහි දෙවැනි අදියර වශයෙන් මේ **'පහන් කණුව ධර්ම දේශනා'** පොත් පෙළ එළි දකී. මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි යෝගාවචර සඟපිරිස හමුවේ අප විසින් දේශනා කරන්නට යෙදුන දෙසුම් **33** ක් රැගත් යටකී පොත් පෙළට වඩා සරල අන්දමින්. ජන ජීවිතයේ එදිනෙදා ගැටළුවලට එල්ල කොට දෙසන ලද බැවින් මෙම ධර්මදේශනා මාලාව බොහෝ දෙනෙකුට වැඩදායක වනු ඇතැයි සිතමු. සසරදුක් ලියලවන විවිධ විෂම දෘෂ්ටි

* වෙළුම් 11කින් යුත් මේ පොත් පෙළෙහි වෙළුම් 11 ම නිකුත් වී ඇත.



මතවාදයන්ගෙන් ගැවසීගත් පොත් පත් සහරා 'සහරාවක' අතරමංව සිටින වත්මන් පාඨක සමාජයට මේ තුළින් ලොවුතුරු මඟට යම් 'තරු සළකුණක්' හෝ ලැබෙතොත් අප දැරූ උත්සාහය සඵල වූ ලෙස සළකමු.

'ආනුපුබ්බී කථා' නම් වූ අනුපිළිවෙළ කථාමාර්ගයක් අනුගමනය කරමින් දහම් දෙසූ බුදු පියාණෝ එවැනිම 'අනුපිළිවෙළ කථාවක්' ධර්මදේශකයින්ට අනුදැන වදාළහ. දාන කථාව, සීල කථාව, සග්ග කථාව, කාමයන්ගේ ආදීනව හා නෙක්ඛම්මයෙහි ආනිසංස ඒ අනුපිළිවෙළ කථාවට අයත්වේ. ඒ සියල්ල තුළින් සකස් වූ, මෘදුවූ, පුබුදුවූ. පහන්වූ සිතට චතුරාර්යසත්‍ය දේශනාව මැනවින් විෂය වේ. දේශනා විලාස වශයෙන් සළකන කල, බුද්ධ දේශනාවෙහි ඉස්මතුව පෙනෙන ආදර්ශවත් අංග සතරක්ද ඇත. එනම්, උපමා, නිදර්ශන, ආදියෙන් ධර්ම කරුණු සන්දර්ශනය කිරීම ('සන්දස්සෙති') සිත් කාවදින අන්දමින් එත්තු ගන්වාලීම (සමාදපෙති) ඒවා ප්‍රතිපත්තියට නැංවීමෙහිලා උත්සාහවත් කිරීම (සමුත්තෙජෙති) සහ අසන්නන්ගේ සිත්සතන් ප්‍රසාදයට පත්කිරීමයි (සම්පහංසෙති).

ධර්මපදයෙන් තෝරාගත් ගාථා මාතෘකා කොටගෙන පැවැත්වෙන මෙම දෙසුම් පෙළෙහිදීද හැකිතාක් දුරට ඉහත සඳහන් මූලධර්ම අනුගමනය කිරීමට තැත් දැරුවෙමු. බුද්ධෝත්පාද කාලයක ලැබිය හැකි අග්‍රඵලය වන අර්හත් ඵලයෙන්ම දේශනාවක් කුළුගැන්වීමට උනන්දු වීමු. වෙනත් සුලභ ලෞකික පරමාර්ථ තුළ අසන්නන් සිරකොට නොතබා, බුදුපියාණන් වහන්සේ වදාළ අප්‍රමාද පදය සිහිගන්වමින් සංසාර විමුක්තිය දෙසටම ඔවුන් යොමු කරවීම අපගේ පරම අධ්‍යාශය විය. 'පහන් කණුවෙන්' විහිදෙන මෙම ධර්මාලෝකයෙන් ලෝකයාට නිවන් මඟ හෙළි පෙහෙළි වේවා!

මෙම 'පහන් කණුව ධර්මදේශනා' පොත් පෙළද, 'නිවනේ නිවීම' දෙසුම් පෙළ එළිදැක්වීම උදෙසා කොළඹ හැව්ලොක් පාරේ 'රෝයල් ඉන්ස්ටිටියුට්හි' පින්වත් ජී.ටී. බණ්ඩාර මහතා විසින් මහාභාරකාර දෙපාර්තමේන්තුවේ පිහිටුවන ලද 'ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරය' මගින් මුද්‍රණය කරවීමට මහාභාරකාර තැන්පත් යූ. මාපා මහතා තීරණය කිරීම අපට මහත් ධෛර්යයක් විය. අමිලවූ ධර්මය මිල කිරීමකින් නොපිරිහෙළා පාඨකයින් අතට පත්කිරීමේ අප ප්‍රතිපත්තියට දිරිදෙන ඒ පින්වත් මහතුන් දෙපොළටත්, මේ සත්කෘත්‍යයට සහාය දීමට මෙතාක් ඉදිරිපත්වූ පරිත්‍යාගශීලී හැම පින්වතුන්ටත්. පටිගත කළ 'පහන් කණුව' දෙසුම් පිටපත් කරදීමේ කාර්යයට සහාය වන පින්වත් ඒ.එස්.වයි. අබේවර්ධන මහතාට සහ අනුලා හිඳගොඩ, එම්. නාගහවත්ත, ජයන්ති රණවීර යන මහත්මීන්ටත්, දෙන දේ පිරිසිදුව දීමට ශෝභන ලෙස මුද්‍රණ කටයුතු නිම කරන, සීමාසහිත කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ

අධ්‍යක්ෂක මහතුන්ට හා කාර්‍ය මණ්ඩලයටත් අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ. ඒ හැම දෙනාටම මෙම ධර්මදානමය කුශලය පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිසම හේතුවාසනා වේවායි පතමු.

'චිරං තිට්ඨතු ලෝකස්මිං - සම්මාසම්බුද්ධ සාසනං'

මෙයට
සසුන් ලැදි,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර
දේවාලේගම
(2542) 1999 පෙබරවාරි 12



# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ "නිවනේ නිවීම" දේශනා මුද්‍රණය කොට, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයහට එම දහම් පොත් ලබාදීමේ මූලික අදහස අප තුළ ඇතිවී මුත්, මුද්‍රණය සඳහා වැය වන මුදල උපයා ගැන්ම ප්‍රශ්නයක් විය. එය විසඳීම පිණිස අප කිහිප දෙනෙක් යෝජනා කළේ වැයවන මුද්‍රණ වියදම පමණක් අය කර ගැන්මට ප්‍රමාණවත් වූ මිලකට එම දහම් පොත් විකිණීමයි. එහෙත්, අපගේ එම යෝජනාව ගරු ඤාණනන්ද ස්වාමීන් වහන්සේ එකහෙලා ප්‍රතික්ෂේප කරමින් "ධර්මය මිල කරන්න බැහැ. එය අවශ්‍ය අයහට නොමිලේ ලබා ගැන්මට හැකිවිය යුතුයි...." කීහ.

එබැවින් උන්වහන්සේ අදහස් කළ පරිදි මුලින්ම මුද්‍රණය කළ "නිවනේ නිවීම" දේශන මාලාව සඳහා වියදම් ලබා ගැන්මේ වැඩ පිළිවෙලක් වශයෙන් රෝයල් ඉන්ස්ටිටියුට් හි අධිපති ජී.ටී.බණ්ඩාර මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් අරමුදලක් අරඹනු ලැබීය. එවකට මහා භාරකාර ධූරය දැරූ යූ. මාපා මහතාගේ අදහසක් අනුව පිහිටුවන ලද එකී භාරයෙහි අරමුණ වූයේ මෙම පුණ්‍ය ක්‍රියාව ඉටුකර ගැනීම සඳහා දායක වීමට කැමති අයහට මුදලින් කෙරෙන තම පුණ්‍යාධාර එම භාරයට බැර කිරීමට අවස්ථාව සළසා දීමයි.

1997 වසරේදී ඇරඹුණු මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පූජ්‍ය ඤාණනන්ද හිමියන්ගේ දේශනා 33 කින් යුත් "නිවනේ නිවීම" වෙළුම් 11 කින් මුද්‍රණය කොට නොමිලේ බෙදා දීමට අමතරව පසළොස්වක පොහෝ දිනයන්හිදී පහන් කණුව සෙනසුන වෙත රැස්වෙන උපාසක උපාසිකාවන් සඳහා උන්වහන්සේ විසින් කෙරෙන ධර්ම දේශනා "පහන් කණුව ධර්ම දේශනා" නමින් මේ වන විට ග්‍රන්ථ 5ක් පළකොට තිබේ. එතැනින් නොනැවතී උන්වහන්සේගේ අනෙකුත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථ එසේම ධර්ම දාන වශයෙන් පළකිරීමට හැකිවීම ඊට දායක වූ අප සැමගේ ඉමහත් සතුටට හේතුවිය.

අති පූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ එම ධර්ම දේශනා අගයමින් එම සත්කාර්යය නොනවත්වා කරගෙන යෑම පිණිස දායක භවතුන්ගෙන් අප වෙත ලැබෙන පැසසුම් සහිත ප්‍රතිචාරය නිසාම ඒ අයගේ පහසුව පිණිස අප විසින් මෑතකදී "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ජංගම ගිණුම විවෘත කරන ලදී.

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමියන් විසින් පහදා දෙනු ලබන නිර්මල බුදු දහම ඔබ අතට පත් කිරීම අපගේ එකම අරමුණයි. ඊට ඔබගෙන් ලැබෙන දායකත්වය ඉමහත් කුශලයකි. අපට ඉමහත් ධෛර්යයකි.

මෙම වටිනා ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීමේ සම්පූර්ණ කාර්යභාරය ජී.ටී. බණ්ඩාර මහතා විසින් රෝයල් ඉන්ස්ටිටියුට් හි පින්වත් නිලධාරීන්ගේ සහායද ඇතිව වෙහෙස මහන්සි නොබලා ඉටුකර දීම ගැන අපගේ බලවත් ප්‍රසාදය මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතු වේ.

මෙයට,
සසුන් ලැදි
ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරකාර මණ්ඩලය



# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම, "නිවනේ නිවීම" සහ "පහන් කණුව ධර්ම දේශනා" නමින් පළ වී ඇති දහම් පොත් තුළින් මේ වන විටත් ඔබ ඇතැම් විට කියවා තිබිය හැක.

එම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා හැකි පමණ මුද්‍රණය කොට නොමිලේ බෙදා දීම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අරමුණයි.

මෙතෙක් එම භාරය මගින් පළකොට ඇති ධර්ම ග්‍රන්ථ එකී ග්‍රන්ථ වල අවසාන පිටුවෙහි දක්වා ඇත.

මෙම මහඟු පුණ්‍ය ක්‍රියාව සඳහා දායක වීමට කැමති පින්වතුන්, පහත සඳහන් උපදෙස් පිළිපැදීම මැනවි.

1. චෙක්පත්/මුදල් ඇනවුම් මගින් එවන සියලු ආධාර "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ගිණුමට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකිය.
2. දිවයිනේ පිහිටි ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් ඔබගේ ආධාර මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කල හැක.
3. කෙසේ වුවද, ඔබගේ පහසුව පිණිස සියලු පුණ්‍යාධාර කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 191 හි පිහිටි රෝයල් ඉන්ස්ටිටියුට් ආයතනයේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය වෙනුවෙන් පිහිටුවා ඇති අංශයටද බාර දියහැක.
4. මෙම භාරය මගින් නිකුත් කැරෙන ධර්ම ග්‍රන්ථ මගින් ඔබගේ දායකත්වය වරින් වර දායක භවතුන්ගේ දැනගැන්ම සඳහා පළ කරනු ඇත.
5. ඔබ විසින් කරනු ලබන ආධාරය බැංකු ගිණුමට බැර කරන විට ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියෙහි ඡායා පිටපතක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් මෙම ධර්ම දානමය කටයුත්තට දායක වන ඔබගේ නම සහ දායක මුදල අප විසින් වරින් වර පළ කරන දායක ලැයිස්තුවෙහි ඇතුළත් කිරීම කළ හැකිය.

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්
අංක 191, හැව්ලොක් පාර
කොළඹ 05

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරැවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරැවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මහට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

"ධර්‍ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්‍මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්‍මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරැවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්‍මදේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්‍මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්‍මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්‍ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් "ධර්‍ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මෙයට,

සසුන් ලැදි

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය

'පහන් කණුව'

කන්දේගෙදර, දේවාලේගම

2000 ජුනි 05 (2544 පොසොන්)

# 31 වන දේශනය



## 31 වන දේශනය

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

**ඉමෙසු කිර සජ්ජන්ති**
**එකෙ සමණ බ්‍රාහමණා**
**විගය්හ නං විවදන්ති**
**ජනා එකංගදස්සිනොති**

-උදාන, ජච්චන්ධවග්ග-

සැදැහැවත් පින්වතුනි,

මේ වගේ වෙසක් පුර පසළොස්වක පෝය දවසකයි අපේ තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ උත්තරීතර ප්‍රඥා ඇස පහළ කර ගත්තේ. ඒ ප්‍රඥා ඇසට විෂය වුනු ලෝකය පිළිබඳ අවබෝධය නව අරහාදී බුදුගුණ අතරින් ''ලෝකවිදූ'' ගුණය තුළ තැන්පත්ව තිබෙනවා. අද අපි මාතෘකා කරගත්තු ගාථාවත් ඊට අදාළ නිදාන කථාවත් ආශ්‍රයෙන් අපට මෙන්න මේ **ලෝකවිදූ** ගුණයෙ යම් යම් අංශ මතු කර ගන්න පුළුවන් වේවි.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ වාසය කරන එක් කාලයක ඒ ඒ දෘෂ්ටි ගත්තු ශ්‍රමණ බ්‍රාහ්මණයින් පරිබ්‍රාජකයින් සැවැත් නුවරට ඇවිල්ලා වාසය කළා. ඒ අය තම තමන්ගේ දෘෂ්ටි පිළිබඳව වාද විවාද කරමින් සිටියා මෙන්න මේ විදියට.

ඇතැම් කෙනෙක් කිව්වා ලෝකය සදාකාලිකයි මෙයම සත්‍යයයි, අන් සියල්ල බොරුයි.

තව කොටසක් කිව්වා, ලෝකය සදාකාලික නැහැ, මෙයම සත්‍යයයි, අන් සියල්ල බොරුයි.

තව කොටසක් කියනවා ලෝකයෙ කෙළවරක් තියනවා, මේකම සත්‍යයයි, අන් සියල්ල බොරුයි.

තව කොටසක් කියනවා ලෝකයේ කෙළවරක් නැහැ, මේකම සත්‍යයයි, අන් සියල්ල බොරුයි.

තව කොටසක් කියනවා, ජීවයත් ශරීරයත් කියන්නෙ එකක්මයි (එතන ජීවය කියන්නේ ආත්මය) ආත්මයත් ශරීරයත් එකක්මයි. මේකම සත්‍යයයි. අන් සියල්ල බොරුයි.

තව කොටසක් කියනවා, ආත්මය එකක් ශරීරය වෙන එකක්. මෙයම සත්‍යයයි. අන් සියල්ල බොරුයි.

මේ විදියට දෘෂ්ටි ගත්තු අයත් එතන ඉදිරිපත් කළා තර්ක. තථාගත තෙම මරණින් මත්තහේ වෙයි. (එතන තථාගත කියල කිව්වේ අපේ බුදුරජාණන් වහන්සේ පිළිබඳව පමණක් නොවෙයි. ඒ ඒ සමයවාදවල, ආගම්වල පරම තත්ත්වයට පැමිණි තැනැත්තා තථාගත නමින් හැඳින්වෙනවා.) එතකොට තථාගත තෙම, විමුක්ත පුද්ගලයා, ඉහළම තත්ත්වයට පැමිණි තැනැත්තා, මරණින් මත්තෙහි වෙයි. මෙයම සත්‍යයයි. අන් සියල්ල බොරුයි කියලා ඇතැම් කෙනෙක් කිව්වා.

තව කොටසක් කියනවා තථාගත තෙම මරණින් මත්තෙහි නොවෙයි. මෙයම සත්‍යයයි. අන් සියල්ල බොරුයි.

තවත් කොටසක් කියනවා තථාගත තෙම මරණින් මත්තෙහි වෙයි සහ නොවෙයි. ඒ දෙකම එකතු කරලා වෙයි සහ නොවෙයි. එක අර්ථයකින් වෙයි, තව අර්ථයකින් නොවෙයි. මෙයම සත්‍යයයි. අන් සියල්ල බොරුයි.

තවත් කොටසක් කිව්වා තථාගත තෙම වෙයිත් නොවෙයි. නොවෙයිත් නොවෙයි. ඒ දෙකම ප්‍රතික්ෂේප කරලා. මෙයම සත්‍යයයි. අන් සියල්ල බොරුයි.

ඔන්න ඔය විදියට දෘෂ්ටි ගතිකව ඒ ඒ අය අන්තිමට කලහ විවාද කරමින් ඔවුනොවුන්ට ඇනුම් පද කියමින් සිටියා. ඉතින් ඒ කාලයේ දවසක සංඝයා වහන්සේලා පිරිසක් පිණ්ඩපාතයේ වැඩලා සැවැත් නුවර, මේ කලහ විවාද අහලා බුදුරජාණන් වහන්සේට ඇවිල්ල කියනවා මෙන්න මෙහෙම "විවිධ දෘෂ්ටි ගත්තු ශ්‍රමණ බ්‍රාහ්මණයින් පරිබ්‍රාජකයින් විවාද කරමින් ඔවුනොවුන්ට ඇනුම්පද කියමින් සිටිනවා" කියලා. බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කළාම බුදුරජාණන් වහන්සේ කියනවා "ඕව ඔහොම තමයි මහණෙනි, ඒ අන්‍ය දෘෂ්ටික ශ්‍රමණ බ්‍රාහ්මණයින් 'අන්ධා' අන්ධයි. 'අචක්ඛුකා' ඇස් නැහැ. 'අන්ධා අචක්ඛුකා' කියන වචන වලින් බුදුරජාණන් වහන්සේ ඒ අය හැඳින්වුවෙ. ඒ අය අර්ථය මොකක්ද දන්නෙ නැහැ. ඒ කියන්නේ යහපත මොකද්ද කියලා දන්නේ නැහැ. අයහපත මොකද්ද කියලා දන්නේ නැහැ. ධර්මය මොකද්ද කියලා දන්නේ නැහැ. අධර්මය මොකද්ද කියලා දන්නේ නැහැ. එහෙම ඉඳගෙනයි ඔය විදියට වාද විවාද කරන්නේ" කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා උපමා කථාවක් වශයෙන් පටන් ගත්තා යම්කිසි අතීත ප්‍රවෘත්තියක් ඉදිරිපත් කරන්න.





මහණෙනි මේ සැවැත් නුවරම අතීතයේ රජකෙනෙක් හිටියා ඒ රජ්ජුරුවෝ දවසක් දා රාජ පුරුෂයෙක් කැඳවලා කියනවා 'ගිහිල්ලා, මේ නුවර ඉන්න තාක් ජාත්‍යන්ධයින් එකතු කරගෙන එන්න කියලා. ජාත්‍යන්ධයින් කියන්නේ උපතින්ම අන්ධ අය. සැවැත් නුවර ඉන්න තාක් උපතින්ම අන්ධ මිනිසුන් මෙතනට එකතු කරගෙන එන්න' කියලා. ඉතින් අර රාජ පුරුෂයා ගිහිල්ලා ඒ මිනිසුන් එක්කගෙන ඇවිල්ලා කිව්වා 'ඔන්න මම එක්කගෙන ආවා" කියලා. "එහෙනම් ඒ ජාත්‍යන්ධයින්ට ඇතෙක් පෙන්වන්න" කිව්වා. ඉතින් මේ රාජ පුරුෂයා ගිහිල්ලා ඒ අන්ධයින්ට ඇතෙක් පෙන්නුවා. කොහොමද පෙන්නුවේ, ඇතැම් අන්ධයින්ට ඇතාගේ හිස අල්ලන්න සැලැස්සුවා. තව කොටසකට කණ අල්ලන්න සැලැස්සුවා. තව කොටසකට දළය අල්ලන්න සැලැස්සුවා. තව කොටසකට හොඬවැල අල්ලන්න සැලැස්සුවා. තව කොටසකට ඇතාගේ බඩ අල්ලන්න සැලැස්සුවා. තව කොටසකට ඇතාගේ පය අල්ලන්න සැලැස්සුවා. තව කොටසකට ඇතාගේ කලවා අල්ලන්න සැලැස්සුවා. තව කොටසකට ඇතාගේ වලිගය අල්ලන්න සැලැස්සුවා. තව කොටසකට ඇතාගේ නගුට අල්ලන්න සැලැස්සුවා. නගුටයි, වලිගයයි දෙකක් හැටියට එතන දක්වන්නේ.

ඉතින් ඔහොම පෙන්නලා ඉවරවෙලා ගිහිල්ලා රජ්ජුරුවන්ට කීවා අන්ධයින්ට මම ඇතා පෙන්නුවා කියා. රජ්ජුරුවෝ එළියට ඇවිල්ලා අන්ධ මිනිසුන් සිටින මිදුලට ඇවිල්ලා අහනවා "ජාත්‍යන්ධයිනි ඔය ගොල්ලෝ අර ඇතා දක්කාද" කියලා?. 'ඔව්' කියලා කිව්වා 'ඇතා කොයි වගේද' කියලා ඇහුවා. ඔන්න එතකොට අර ඇතාගේ හිස අතගාපු අන්ධයෝ කියනවා ඇතා හරියට කලයක් වගෙයි කියලා. ඇතාගෙ කණ අල්ලපු අය කියනවා ඇතා හරියට කුල්ලක් වගෙයි කියලා. ඇතාගේ දළ අල්ලපු අය කියනවා ඇතා හරියට හීවැලක්, නගුල් තලයක් වගෙයි කියලා. හොඬවැල අල්ලපු අය කියනවා ඇතා නගුලිස් දණ්ඩක් වගෙයි කියලා. ඇතාගේ ශරීරය, කය අල්ලපු අය කියනවා ඇතා කොටුවක් වගෙයි ඒ කියන්නේ ගබඩාවක් වගෙයි කියලා. ඊළඟට ඇතාගේ පය අල්ලපු අය කියනවා ඇතා කණුවක් වගෙයි කියලා. ඊළඟට ඇතාගේ කලවා අල්ලපු අය කියනවා ඇතා වංගෙඩියක් වගෙයි කියලා. ඇතාගේ නගුට අල්ලපු අය කියනවා ඇතා මෝල්ගහක් වගෙයි කියලා. ඇතාගේ වලිගය අල්ලපු අය කියනවා ඇතා කොස්සක් වගෙයි කියලා. ඔහොම කියලා ඉතින් 'ඇතා මෙහෙමයි ඔහොම නොවෙයි' කියලා ඒ අන්ධයින් එකිනෙකා එක්ක කලහ කරමින් එකිනෙකාට අතින් පයින් ගහගත්තා කියල සඳහන් වෙනවා. රජ්ජුරුවෝ ඒක දැකලා විනෝද වුනා.

ඔන්න ඕකයි බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ කථාව. ඔහොම කියලා බුදුරජාණන් වහන්සේ කියනවා "අන්න ඒ වගේ මහණෙනි ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් අන්ධයි. ඒ අයට ඇස් නැහැ. ඒ ගොල්ලෝ අර්ථය දන්නෙත් නැහැ. අනර්ථය දන්නෙත් නැහැ. ධර්මය දන්නෙත් නැහැ. අධර්මය දන්නෙත් නැහැ. ඒක නිසයි කලහ විවාද කරන්නෙ" කියල ඔන්න මේ උදාන ගාථාව ප්‍රකාශ කළා.

**ඉමෙසු කිර සජ්ජන්ති**
**එකෙ සමණ බ්‍රාහ්මණා**
**විග්ගය්හ නං විවදන්ති**
**ජනා එකංගදස්සිනො**

"ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ - ඇතැම් මහණ බමුණෝ - මේ දෘෂ්ටීන්හි ඇලෙත්. මේ දෘෂ්ටිවල ඇලිලා ඉන්නවා. 'විග්ගය්හ නං විවදන්ති ජනා එකංග දස්සිනො' එක කොටසක් විතරක් දකින මේ අන්ධ ජනයා ඒක අල්ලාගෙන දැඩිව කලහ විවාද කරනවා" ඕකයි අදහස.

ඉතින් මෙන්න මේ කථාවත් ගාථාවත් ආශ්‍රයෙන් අපට හිතාගන්න පුළුවන් බුදුරජාණන් වහන්සේ අන්න අර විදියේ දෘෂ්ටි ගත්තු අය හැම දෙනෙක්ම අන්ධයින් හැටියට, ඇස් නැති අය හැටියට, සැළකුවා. මොකද එහෙම සැළකුවේ? අපට අන්න එතන ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්ත වශයෙන් මෙන්න මේ කියන ප්‍රශ්න දහය, මේ ධර්මයේ සූත්‍ර දේශනාවල නිතරම ඒවා කියවන පින්වතුන්ට හමුවනවා. බොහෝවිට බුදු රජාණන් වහන්සේට අභියෝගයක් හැටියට ඉදිරිපත් කරනවා මෙන්න මේ ප්‍රශ්න දහය. මේ ප්‍රශ්නවලට කෙලින් උත්තරයක් දෙන්න කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ කෙලින් උත්තරයක් දෙනවා වෙනුවට ඒක විවරණය පැත්තකින් තැබුවා. ප්‍රතික්ෂේප කළා ඒ ප්‍රශ්න. මේකත් උගතුන්ට බොහොම පුදුම ප්‍රශ්නයක්. බුදුරජාණන් වහන්සේට පුදුම ඥාන සම්භාරයක් තිබෙද්දී ඇයි මේ විදියේ ප්‍රශ්න වලට උත්තර දුන්නේ නැත්තේ කියලා. නමුත් මෙතන අපට රහස එළිවන කාරණයක් තිබෙනවා. බුදුරජාණන් වහන්සේ මෙතන ප්‍රකාශ කළා අන්න ඒ දෘෂ්ටි ගත්තු අය අන්ධයි, ඇස් නැති අය කියලා. මොකද එහෙම කිව්වේ කියලා අපට හිතාගන්න පුළුවන්. අපි දැන් ආරම්භ කළේ බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥා චක්ෂුසය ගැන කියලයි. ලෝකයේ ඇස් තුනක් තිබෙනවා කියල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. මසැස, දිවැස, පැණැස. පැණැස කියලා කියන්නේ ප්‍රඥා ඇස, මාංශ චක්ෂුසය ආශ්‍රයෙන්මයි දිවැස ලබාගන්නේ. මාංශ චක්ෂුසය ඇති කෙනාටයි දිවැස ලබා ගන්න පුළුවන් වෙන්නෙ. ඒ දෙක සම්බන්ධයි. නමුත් ප්‍රඥා චක්ෂුසය





විශේෂයි. ඒක බුදුරජාණන් වහන්සේ තමයි ලෝකයාට හඳුන්වා දුන්නේ- ප්‍රඥා ඇස. එතකොට අර මසැසත් දිවැසත් තුළින් ලබාගත්තු දැනුමට වඩා උසස්. **ඒ හැම එකක්ම පරදනවා ප්‍රඥා චක්ෂුසය.**

ඒ වගේම අර ප්‍රශ්නවලට පිළිතුරු නොදීමට හේතුවත් බුදුරජාණන් වහන්සේ දක්වනවා ධර්මයේ මේ විදියට. "මහණෙනි පිළිතුරු දීම පිළිබඳව, විවරණය කිරීම පිළිබඳව කියන කොට ප්‍රශ්න හතර වර්ගයක් තිබෙනවා. **එකංස ව්‍යාකරණීය, විභජ්ජ ව්‍යාකරණීය, පටිපුච්ඡා ව්‍යාකරණීය, ඨපනීය** කියලා. එකංස ව්‍යාකරණීය කියලා කියන්නේ කෙලින්ම ඔව් හෝ නැහැ වශයෙන් පිළිතුරු දිය හැකි ප්‍රශ්න. ඇතැම් ප්‍රශ්න තිබෙනවා කෙලින්ම කියන්න පුළුවන් ඔව් හෝ නැහැ හෝ කියලා.

තවත් ප්‍රශ්න තිබෙනවා, විභජ්ජ ව්‍යාකරණීය. විභජ්ජ ව්‍යාකරණීය ප්‍රශ්න කියලා කියන්නේ බෙදලා දක්වලා, විභාග කරලා, අපක්ෂපාත වශයෙන් ප්‍රශ්නය විග්‍රහ කරලා පිළිතුරු දිය යුතු ඒවා. එක පාරටම 'ඔව්' හෝ 'නැහැ' හෝ නොකියා. පටිපුච්ඡා ව්‍යාකරණීය කියන්නේ ප්‍රශ්නකරුගෙන්ම නැවත නැවත ප්‍රශ්න අහලා ප්‍රශ්නයේ මූල ශුද්ධ කර ගන්න ඕන ඒවා. ඒ විදියේ ප්‍රශ්නත් තිබෙනවා. ඔන්න හතරවෙනි කොටස 'ඨපනීය'. පැත්තකට කරන ප්‍රශ්න. මොකද පැත්තකට කරන්නේ? ඒවායේ පදනම වැරදි නිසා. ඒවා මිථ්‍යා උපන්‍යාසයක්, වැරදි පදනමක් උඩ සකස් වෙලා තියන ප්‍රශ්න නිසා. ඒවා පැත්තකින් තබනවා, ප්‍රතික්ෂේප කරනවා. ඒවාට ඔව් හෝ නැහැ හෝ කියන්න බැහැ. උත්තර දෙන කෙනා අල්ලගන්න තමයි උභතෝකෝටික චතුෂ්කෝටික, දෙකොන් සතරකොන් වශයෙන් ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ. ඒ උත්තර දෙන කෙනා පොළඹවන්න කොහොමහරි උත්තරයක් දෙන්න කියලා. නමුත් ඒ එකකටවත් බුදුරජාණන් වහන්සේ උත්තරයක් දුන්නේ නැහැ. ඕක සමහර විට උගතුන්ට තෝරා ගන්න බැරි දෙයක්.

නමුත් ඔන්න අපි මෙතැනදී මතු කරනවා බුදුරජාණන් වහන්සේගේ අර 'ලොකවිදූ' ගුණයට අදාළව, ප්‍රඥා චක්ෂුසය කියන්නේ මොකද්ද? දහම් ඇස පහළවුනා කියන තැන පවා සඳහන් කරනවා. **"යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධ ධම්මං"** යම්තාක් දෙයක් හටගන්නා ස්වභාවය ඇත්තේද ඒ හැම දෙයක්ම නිරුද්ධ වන ස්වභාවය ද ඇත්තේය". අන්න ඒ ධර්මතාව, ඇතිවීම් නැතිවීම් ධර්මතාව, බුදු ඇසට පමණයි පෙනුනේ. ඒ තාක් ලෝකයා ආත්ම දෘෂ්ටිය තුළ ලැගගෙන, සක්කාය දෘෂ්ටිය තුළ ලැගගෙන, ඝන සංඥාවෙන් ලෝකය නිත්‍යය කියන හැඟීමෙන් යම්කිසි නිත්‍ය දෙයක් තිබෙනවා. ලෝකයේ යම් යම් දේ දිරාපත්වන බව

පෙනෙනවා. නමුත් නොදිරන යම්කිසි අරටුවක් තිබෙනවා කියන හැඟීම ලෝකයා තුළ තිබුනා. ඒකටයි සක්කාය දිට්ඨිය කියන්නේ. බුදුරජාණන් වහන්සේ පමණයි අනිත්‍ය දුක්ඛ අනාත්ම ත්‍රිලක්ෂණය මතුකරලා දීලා අන්න ඒ වැරදි දෘෂ්ටිය කැඩුවේ. ඒකයි මේ ප්‍රඥා චක්ෂුසය මසැසත්, දිවැසත් කියන ඒ ඔක්කොටම වඩා බලසම්පන්න වන්නේ, උත්තරීතර වන්නේ.

ඉතින්, ඊළඟට දැන් මෙතන පළමුවෙන්ම කියවුනා නේ ලෝකය සදාකාලිකද නැද්ද කියන එක. ඇතැම් කෙනෙක් කිව්වා සදාකාලිකයි කියලා. ඇතැම් කෙනෙක් කිව්වා සදාකාලික නොවේ කියලා. බුදුරජාණන් වහන්සේ ඒ එකක්වත් පිළිනොගත්තේ මක්නිසාද? එතන ලෝකය කියන වචනය නැවත විග්‍රහ කරන්න සිද්ධ වුනා බුදුරජාණන් වහන්සේට. ලෝකයා හිතන ලෝකය නොවෙයි. ඒකට අපට ඔන්න ඉඟියක් ලැබෙනවා. සමිද්ධි කියන ස්වාමීන් වහන්සේ නමක් බුදුරජාණන් වහන්සේගෙන් අහනවා කෙළින්ම 'මේ ලෝක, ලෝක' කියලා කියනවා ස්වාමීනි, කෙතෙකින්ද ලෝකයක් වෙන්නෙ?'. ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'සමිද්ධි, යම් තැනක ඇසත් තිබේද රූප තිබේද ඇස පිළිබඳ විඤ්ඤාණය තිබේද ඇස පිළිබඳ විඤ්ඤාණයට හසුවන දේවල් දේවල් තිබේද එතන ලෝකයක් තිබෙනවා. ඒ වගේම කණ තිබේද ශබ්ද තිබේද ඒ පිළිබඳ විඤ්ඤාණය තිබේද ඒ විඤ්ඤාණයට හසුවන දේවල් තිබේද එතෙක් ලෝකයක් තිබෙනවා" ඔහොම ඔහොම මනසත් ඇතුළුව ආයතන හයට අදාළවයි ලෝකයක් තිබෙන්නේ. දැන් මේ පින්වතුන් දන්නවා ආයතන හයක් කියලා තියන බව. සළායතන කියල කියන්නේ මේ ධර්මයේ ඇස කණ නාසය දිව කය මන යන හයයි. මේවා හඳුන්වනවා ස්පර්ශ ආයතන නමිනුත්. මොකද, මේවායින් ස්පර්ශ කරලයි ලෝකයක් හඳුනාගන්නේ. ඉතින් ලෝකය කියන එක බුදුරජාණන් වහන්සේ ඒ විධියට දක්වලා ඊළඟට කියනවා යම් තැනක - කොතනද කියලා කියන්නේ නැහැ කෙලින්ම - යම් තැනක, ඇසත් නැත්නම්, රූපත් නැත්නම්, ඇස පිළිබඳ විඤ්ඤාණයත් නැත්නම්, විඤ්ඤාණයට හසුවන දේවලුත් නැත්නම්, එතන ලෝකයක් නැත. ඔහොම කියාගෙන ගිහිල්ලා යම්තැනක මනසත් නැත්නම්, මනසට හසුවන 'ධර්ම' කියලා කියන දේවලුත් නැත්නම්, මනෝ විඤ්ඤාණයත් නැත්නම් මනෝ විඤ්ඤාණයට හසුවන දේවලුත් නැත්නම් එතන ලෝකයක් නැත. ඔන්න ඔයින් පෙන්නුම් කරන්නේ ලෝක සමුදයක් සහ ලෝක නිරෝධයක් තිබෙන බවයි. ලෝකය කියන එක අනිත් අය හිතනවා වගේ සදාකාලික දෙයක් නොවෙයි. ඒක මෙන්න මේ සළායතනය හා සම්බන්ධ, සළායතනයට සාපේක්ෂව තිබෙන දෙයක්. මේ සළායතනය හා සම්බන්ධ දෙයක් මේ ලෝකය කියන එක.





ලෝක ප්‍රඥප්තියක් ඇතිවෙන්නේ ඒක ආශ්‍රයෙන්. මේක සාමාන්‍යයෙන් භෞතික විද්‍යාවට එහෙම හසුවන්නේ නැති දෙයක්. ගැඹුරු කාරණයක් මෙතන තිබෙන්නේ. මේක පටිච්ච සමුප්පාද ධර්මය තුළින් බුදුරජාණන් වහන්සේ පළමුවරට ලෝකයාට ඉදිරිපත් කළා.

ඒක ඉතාමත්ම කෙටි ගාථාවකින් බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක ප්‍රකාශ කළා.

**ඡසු ලොකො සමුප්පන්නො**
**ඡසු කුබ්බති සන්ථවං**
**ඡන්නමෙව උපාදය**
**ඡසු ලොකො විහඤ්ඤති.**

එතන 'ඡ' කියලා කියන්නේ හය, පාළි භාෂාවෙන්. 'ඡසු ලොකො' සමුප්පන්නො ලෝකය හයෙහි හටගත්තා. ලෝකය උපන්නේ හයේ. මේ ආයතන හයෙයි ලෝකය ඉපදිලා තියෙන්නේ. කොයි තරම් පුදුමද ඒ කියන හැටි. 'ඡසු කුබ්බති සන්ථවං' මේ හය තුළ තමයි ලෝකයේ තිබෙන ඔක්කොම සම්බන්ධීකරණ. ඔක්කොම සම්බන්ධතාවන් පවත්වන්නේ මේ හය එක්කයි. මේ පින්වතුන් ටිකකට හිතලා බලන්න ඔය අලුත් ආම්පන්න ඔක්කොම ගැන. හැම එකක්ම මේ හයට සම්බන්ධ කරලයි යන්නේ. එතකොට 'ඡසු කුබ්බති සන්ථවං' ඊළඟට 'ඡන්නමෙව උපාදය ඡසු ලොකො විහඤ්ඤති' මේ හයම අල්ලාගෙන ලෝකයා හය තුළම වෙහෙසට පත්වෙනවා. ඔන්න හයේ කථාව, බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ. එතකොට ලෝකය උපදින්නෙත් හයෙයි. ලෝකය සියලු සම්බන්ධකම් පවත්වන්නෙත් හය තුළයි. මේ හයම අල්ලාගෙන හය තුළ ලෝකයා වෙහෙසට පත්වෙනවා. ඔන්න ඔහොම කතන්දරයක් බුදුරජාණන් වහන්සේ ලෝකයට ඉදිරිපත් කරන්නේ.

ඉතින් මෙන්න මේකටම අදාළව තමයි ඊළඟට අපට හිතාගන්න තියෙන්නේ ලෝකය එහෙම දෙයක් නම්, මේ සළායතන ආශ්‍රයෙන් තියෙන දෙයක් නම්, බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා, මේකෙ නිරෝධයකුත් තිබෙනවා. මේක නිරුද්ධ කරන්න පුළුවන්. නිරුද්ධ කරන්නේ කොහේද කියන එකයි ඊළඟට ප්‍රශ්නය. අපි ඒක කියන්න කලින් මේ ලෝක කියන වචනයට තවත් දීපු නිරුක්ති අපි බලමු.

බුදුරජාණන් වහන්සේගෙන් එක් අවස්ථාවක ආනන්ද හාමුදුරුවෝ අහනවා, ඒත් අර විදියේ ප්‍රශ්නයක්. ස්වාමීනි, 'ලෝක ලෝක' කියලා කියනවා. මොන අර්ථයෙන්ද ලෝක කියන්නේ. බුදුරජාණන් වහන්සේ

කියනවා ආර්ය ව්‍යවහාරයට අනුව යමක් -එතන, පාලි වචනයක් යොදනව **පලොක ධම්මං-** යමක් බිඳෙන ස්වභාවය ඇත්තේද, 'පලොක ධම්මං' කියන්නේ පලුදු වන ස්වභාවය ඇත්තේද අන්න එයයි ලෝකය. එතන පලොක ධම්මං කියන එකේ ලෝක කියන එකත් සඳහන් වෙනවා. නමුත් එතැන කියන්නේ පලුදු වන ස්වභාවයයි. මොකද්ද පලුදු වන්නේ කියලා ප්‍රශ්නය නඟලා බුදුරජාණන් වහන්සේ කියනවා ඇස පලුදු වනවා, රූප පලුදු වනවා, ඒ දෙක නිසා ඇතිවන චක්ඛු විඤ්ඤාණය ඒකත් පලුදු වෙනවා. ඒ නිසා ඇතිවන වේදනා සැප දුක් හෝ නොදුක් නොසුව වේදනා ඒවාත් පලුදු වෙනවා. පලුදු වෙනවා කියන්නේ බිඳී බිඳී යනවා. අන්න එතකොට 'බිඳි බිඳී යන සිඳී සිඳී යන' දෙයක් මේක. එතකොට ලෝකය එහෙම දෙයක් නම් - ටිකකට හිතලා බලන්න ලොකු වතුර භාජනයකින් අපි කෙනෙස්සකින් වතුර ගන්න යනවා. ඒ වතුර ගන්න භාජනය හොඳටම හිල්වෙලා ඕකෙන් මනින්න පුළුවන්ද වතුර? උඩට උස්සන කොට අර භාජනයෙන් වතුර වැක්කෙරෙනවා. අන්න ඒ වගේ මුලු මහත් ලෝකයම මොහොතක් මොහොතක් පාසා සිඳි සිඳී බිඳි බිඳී යන බව - මේ මසැසට නොපෙනෙන තරම් වේගයකින් බිඳි බිඳී යන බව - බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. ඒකයි 'යං කිංචි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මං' යම්තාක් දෙයක් හටගන්නා ස්වභාවය ඇත්තේද ඒ හැම දෙයක්ම නිරුද්ධවන ස්වභාවය ඇත්තේය.

මේ ධර්මතාව මේ කාලයේ ඔය පරමාණුව කියලා කියන දෙයටත් බලපානවා. පරමාණුවේ සිට ලෝක ධාතුව දක්වාම බලපාන එකක්. පරමාණුව නොබිඳෙන දෙයක් කියලා පසුගිය ශත වර්ෂයේ මුල් භාගය වන තාක් විද්‍යාඥයින් හිතුවා. නමුත් ඒකත් දන් නමට විතරයි පරමාණුව. ඒකත් බිඳි බිඳී යන දෙයක් බව ඒ අයට යම් සුලු ප්‍රමාණයකින් වැටහුනා. ඒ වගේ ලෝක ධාතුවත් බිඳි බිඳී යනවා. බුදුරජාණන් වහන්සේ කල්පාරම්භය කල්ප විනාශය පිළිබඳව මහ පුදුම විස්තර සූත්‍ර දේශනාවල ඉදිරිපත් කරල තිබෙනවා. එතකොට ලෝකය පරමාණුවේ සිට ලෝක ධාතුව දක්වා මොහොතක් පාසා වෙනස් වෙනවා. එහෙම මොහොතක් පාසා වෙනස්වන එකක් සදාකාලිකද සදාකාලික නොවේද කියලා කියන්න බැහැ. එය ඇතිවෙනවා වගේම තව තැනක නැතිවෙනවා. ඔන්න ඔය වගේ ප්‍රවෘත්තියක් ලෝකේ තිබෙන්නේ. එතකොට බුදු රජාණන් වහන්සේ ලෝකය සදාකාලිකද සදාකාලික නැද්ද කියන ප්‍රශ්න පැත්තකින් තිබ්බේ ඒක නිසයි.

ඊළඟ ප්‍රශ්න ජෝඩුව මොකද්ද? ලෝකයේ කෙළවරක් තියනවාද? නැද්ද? ඇතැම් කෙනෙක් ලෝකයේ කෙළවරක් තියෙනවා මෙයම සත්‍යයයි කීවා.





ඇතැම් කෙනෙක් කීවා ලෝකයේ කෙළවරක් නැහැ. මෙයම සත්‍යයයි. ඔය දෙකටම බුදුරජාණන් වහන්සේ උත්තර දුන්නේ නැහැ. ඒ ප්‍රශ්න එහෙම පිටින්ම මිථ්‍යා දෘෂ්ටි හැටියට පැත්තකට කළා. ඒක හරියට උණ කාරයින් අහන ප්‍රශ්න වගේ වැරදි ප්‍රශ්න හැටියට. ප්‍රස්තුතය, ඒකට යටින් තියන උපන්‍යාසය, වැරදි හැටියට දැක්වූවා. ඔන්න ඕකට හොඳ නිදර්ශන කතාවක් එනවා ධර්මයේ.

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වාසය කරන අවස්ථාවක රෝහිතස්ස කියන දිව්‍ය පුත්‍රයෙක් රාත්‍රි කාලයේ ඇවිල්ලා බුදුරජාණන් වහන්සේගෙන් අහනවා, බුදුරජාණන් වහන්සේට ආමන්ත්‍රණය කරන ක්‍රමයක් තියෙනවා දෙවියන්. එය සිංහලට බොහෝවිට නගන්නේ 'නිදුකාණෙනි', කියලා. බුදුරජාණන් වහන්සේගෙන් අහනවා 'නිදුකාණෙනි, යම්තැනක කෙනෙක් නූපදීද, නොදිරයිද, නොමැරෙයිද, නැවත නූපදියිද, අන්න එබඳු ඒ ලෝකයේ කෙළවරට ගමන් කරලා පැමිණෙන්න පුළුවන්ද? එතකොට බුදුරජාණන් වහන්සේ කියනවා 'නැහැ ඇවැත්නි, ඒ විදියට ලෝකයේ කෙළවරකට ගමන් කරලා පැමිණෙන්න බැරිය' කියලා. එතකොට රෝහිතස්ස දිව්‍යපුත්‍රයා කියනවා 'මේක ආශ්චර්යයි, අද්භූතයි. භාග්‍යවතුන් වහන්සේ මේ කියන කාරණය මම ප්‍රත්‍යක්ෂ කරගෙන තිබෙනවා. කොහොමද? අතීතයේ මීට කලින් ආත්මයේදී මම **රෝහිතස්ස** නමැති මහා ඍද්ධිමත් ඍෂිවරයෙක්. මට ශක්තිය තිබුණා ඍද්ධි බලයෙන් අහසින් යෑමට. ඒ අහසින් යන වේගය කොයිතරම්ද කියලා දක්වලා තිබෙන්නේ ඊතලයක වේගයෙන් අහසින් යන්න පුළුවන්. ඒ වගේම මට එක පයක් නැගෙනහිර වෙරළේ තියලා අනිත් පය බටහිර වෙරළේ තියන්න පුළුවන්. මුහුදේ ඒ තරම් ඈතට පා තබන්න පුළුවන් ශක්තිය තිබුණා. ඒ තරම් වේගයකින් අවුරුදු සියයක් ගමන් කරලත් ලෝකයේ කෙළවර නොදැක මම මරණයට පත්වුනා. භාග්‍යවතුන් වහන්සේ කිවූ එක හරියටම හරි කියා රෝහිතස්ස දිව්‍යපුත්‍රයා ප්‍රකාශ කළා.

එතකොට භාග්‍යවතුන් වහන්සේ ඒකත් අනුමත කරලා කියනවා "මම කියනවා ගමන් කරලා ලෝකේ කෙළවරකට පැමිණෙන්න බැහැ. නමුත් ලෝකයේ කෙළවරට නොපැමිණ දුක් කෙළවර කරගන්නත් බැහැ." එතකොට ලෝකයේ කෙළවර තියෙන්නේ කොහේද කියන එක ඔන්න ඊළඟට ප්‍රකාශ කරනවා. **"මම කියනවා සංඥාවත් මනසත් සහිත බඹයක් පමණ වූ මේ ශරීරය තුළම ලෝකයත්, ලෝකයේ හටගැන්මත්, ලෝක නිරෝධයත්, ලෝක නිරෝධයට ඇති ප්‍රතිපදාවත් මම පෙන්වා දෙනවා".** කියල පුදුම විදියෙ ප්‍රකාශයක් එතන කරනවා. එයිනුත් අපට පෙනෙනවා එතකොට ලෝකය කියන එක බුදුරජාණන් වහන්සේ විග්‍රහ

කළේ මෙන්න මේ සළායතනය ආශ්‍රයෙන්. යම් අවස්ථාවක මෙන්න මේ සළායතනය නිරුද්ධවන තත්ත්වයට අපේ හිත ගේන්න පුළුවන් වෙනවා නම් අන්න එතකොට ලෝකයෙන් මිදුනා. ලෝකයේ කෙළවර සොයා ගත්තා. අර සදාකාලික කතාන්දරය එතැනම ඉවරයි.

ඔන්න ඔය කාරණය අපට තව දුරටත් පැහැදිලි වෙනවා මේ ලෝකයේ තියෙන දෘෂ්ටි පමණක් නොවේ. ඇතිවිය හැකි සියලුම දෘෂ්ටීන් ඇතුළත් කරන්න පුළුවන් අන්දමට බ්‍රහ්මජාල සූත්‍රය කියන බඹ දල - මහා බ්‍රහ්ම ජාලයක් එලුවා. බ්‍රහ්මජාල සූත්‍රය කියන මහා ගැඹුරු සූත්‍රයක් තියෙනවා ලෝකයේ තියෙන සියලුම දෘෂ්ටීන් දෘෂ්ටි හැට දෙකකට ඇතුළත් කරනවා. ඒ දෘෂ්ටි හැට දෙකට සියලුම දෘෂ්ටි ඇතුල් වෙනවා. ඒ දෘෂ්ටි ප්‍රතික්ෂේප කරන්නේ කොයි විදියටද? බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා අහවල් අහවල් දාෂ්ටීන්ය කියල සම්පිණ්ඩනය කරමින් ගිහිල්ලා කියනවා ඒ හැම එකක්ම ස්පර්ශයෙන් ඇතිවූ දේවල්. **'ස්පර්ශය'**, අර ඇතාගේ ස්පර්ශය ගැන දන් හිතලා බලන්න. අර කතාවේ කියැවුනානේ අන්ධයින්ට ඇතා පෙන්නුවා කියලා. ඇතා පෙන්නුවාට ඇතා බලන්න පුළුවන්ද අන්ධයින්ට?

ඒ වෙනුවට කළේ ඇතා අතගෑවා. අතගාලා ඒ ස්පර්ශය තුළිනුයි ඇතා හඳුනා ගත්තේ. අන්න එතකොට දන් හිතාගන්න ඇතා අල්ලන්නා වගේ තමයි මේ සාමාන්‍ය පෘථග්ජන ලෝකයා ලෝකය හඳුනා ගන්න යන්නේ. මෙන්න මේ හයෙන් අල්ලන්න යන්නේ. ඇහෙන් අල්ලනවා. ඇහැට පෙනෙන ලෝකය තිබෙනවා. දන් මේ පින්වතුන් දන්නවා, ඇහැට පෙනෙන ලෝකය, කණට ඇහෙන ලෝකය, නහයට දනෙන ලෝකය, දිවට දනෙන ලෝකය කයට දනෙන ලෝකය, අන්තිමට මනසට වැටහෙන ලෝකය, ඔන්න ඔය හැර වෙන ලෝකයක් නැහැ. ලෝකයා ඒවා අල්ලාගෙනයි මේ තර්ක විතර්ක කරන්නේ - වෙන එකක් තබා විද්‍යාව පවා. දන් අර කිව්ව දෘෂ්ටි හැටදෙක අතරින් සමහර දෘෂ්ටි දක්වෙනවා අභිඥාලාභීන්ගේ දෘෂ්ටි. ධ්‍යානබල උපදවාගෙන දිවැස් ලබාගෙන අතීත ජාති සිය දහස් ගණන් දකපු යෝගීන්ගේ දෘෂ්ටි. නමුත් බුදුරජාණන් වහන්සේ ඒවා ඔක්කොම ප්‍රතික්ෂේප කරනවා. ඒවා ඔක්කොම මේ ආයතන හයෙන් ස්පර්ශ කරලා හදා ගත්තු දේවල් කියලා.

එතකොට මොකද්ද එහෙනම් නියම දෘෂ්ටිය. නියම දර්ශනය. ඒවා හැර නියම දෘෂ්ටිය මොකද්ද? අන්න එතන ප්‍රශ්නයක් නැගෙනවා. ඒක තමයි **ප්‍රඥා ඇ**ස. ඒ ප්‍රඥා ඇස උදාවන්නේ කොහොමද කියන එකත් ඒ බ්‍රහ්මජාල සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ පැහැදිලි කරනවා. යම්කිසි භික්ෂුවක් මෙන්න මේ කියාපු සළායතන හටගැන්මත්, නැතිවීයාමත්, ඒවායේ ආස්වාද





පක්ෂයත්, ආදීනව පක්ෂයත් එයින් නික්මීමත් කියන මේ කාරණා පහම, මේ අංශ පහම, හරියාකාරව තේරුම් ගන්නවා නම් අන්න ඒ භික්ෂුව අර කියාපු දෘෂ්ටිජාල ඔක්කොම ඉක්මවල ඊට වඩා උත්තරීතර දර්ශනයක් ලබාගන්නවා කියලා ප්‍රකාශ කළා. අන්න එයින් අපිට පෙනෙනවා සළායතන නිරෝධයමයි නිවන. මේ ආයතන හයේ හිරවෙලා ඉන්න ලෝකයා, පෘථග්ජන ලෝකයා, ලෝකෙ කෙළවරක් සොයාගෙන යනවා. දන් රෝහිතස්ස මහා සෘද්ධිමත් සෘෂිවරයා අර කියාපු වේගයෙන් ගියේ, අහසින් ගියේ, කිසි වියදමක් නැතිව. මහ වියදම විතරයි එතැන තියෙන්නේ. "මම මේ ආහාර ගන්නා නිදාගන්නා වේලාව හැර අවුරුදු සීයක් ගමන් කරලත් මට ලෝකයේ කෙළවර බලාගන්න බැරිවුනා" අමුතු වියදමක් නැතිව, ඒ සෘද්ධි බලයෙන්. නමුත් ඒ විදියෙ අභිඥාවක්, සෘද්ධියක්වත් මොකක්වත් නැති අපේ මේ **නවීන රෝහිතස්සලා** කෝටිගණන් වියදම් කරලා ලෝකයේ අන්තය සොයා ගන්න දුවනවා. අවුරුදු සියයකටත් අඩු මේ ජීවිත කාලය තුළ එහෙම දුවලා හති වැටිලා මැරිලා යනවා. අන්තිමට අපාය වගේ තැන්වලටයි යන්නේ. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් ඇති බව අපි නුවණින් කල්පනා කරන්න ඕනෑ. මොකද මේ යුගය ඔය 'ලෝකවිදූ' ගුණය ගැන හුඟක් අය කතා කරන හිතන යුගයක්. ඒක නිසයි අපි මේ ටික කියන්නේ. 'ලොකවිදූ' කියන වචනය තේරුම් ගත යුත්තේ කොයි විදියටද කියලා.

බුදුරජාණන් වහන්සේ අංගුමාත්‍ර වශයෙන් පෙන්වනවා චූළනිකා ලෝකධාතු මහා සහස්‍සී ලෝක ධාතු ආදි වශයෙන් මහ පුදුම අන්දමේ මේ විශ්වයේ අපි හිතනවාට වඩා ඇසට පෙනෙනවාට වඩා පමණක් නොවෙයි යන්ත්‍ර උපකරණ වලට, දුරදක්නා ආදියටවත්, මේ කාලයේ ඔය තාරකා විද්‍යාඥයින්ටත් හිතාගන්න බැරි අන්දමේ ලෝකධාතු ගැන බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ සියල්ලම පරදනවා මේ ප්‍රඥා ඇස. මොකද? ඒ හැම එකක්ම බිඳි බිඳී යනවා. බිඳි බිඳී, සිඳි සිඳී යන දෙයක් අර විදියට මනින්න බැහැ. සදාකාලිකද? ඊළඟට ඒකෙ කෙළවරක් පිළිබඳ කථාව. ඒ හැම එකක්ම. ඒකයි බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ. ඊටත් වඩා වැදගත් වන්නේ මේ කියාපු ලෝකය හිතෙන්ම මවා ගත්තු එකක්. මේ ඇස ආශ්‍රය කරගෙන ඇසේ ස්පර්ශයෙන්. එතෙන්දි ඒක තේරුම් ගන්න අර ඇතාගෙ උපමාව හුඟක් උපකාර වනවා. අර අන්ධයිනුත් එක එක අංගය අල්ලාගෙන ඇතාය කියල කිව්වා වගේ. මේ ඇසට පෙනෙන ලෝකය, කණට ඇහෙන ලෝකය, මේවයි මේ ලෝකයා ලෝකය හැටියට ගන්නේ. නමුත් බුදුරජාණන් වහන්සේ පෙන්වනවා මේ හැම එකක්ම අන්තිමට හිස්, ශූන්‍යයි.

ඉතින් මෙයින් මිදෙන ආකාරයත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ඒකයි අර කිව්වේ යම් භික්ෂුවක් මෙන්න මේ ආයතන හයේ හටගැන්මත් ඒ වගේම බිඳී යාමත්- 'සමුදය අත්ථගම' - 'සමුදය වය' කියන එකයි. ඇතිවීම් සහ නැතිවීම් ක්ෂණිකව සිදුවන දෙයක්. ඇතිවීම නැතිවීම කියන එකත් දැක්කා. ඒවගේම එකෙ ආස්වාද පක්ෂයත් දැක්කා. ආදීනව පක්ෂයත් දැක්කා. ඊළඟට එයින් නික්මීම කියන නිවනත් දැක්කා. එතකොට බුදුරජාණන් වහන්සේ අන්න ඒ සළායතන නිරෝධය ප්‍රත්‍යක්ෂ කරගත් අවස්ථාවේ තමයි ප්‍රඥා ඇස පහළවුනේ.

දැන් මේ පින්වතුනුත් දන්නවා යම්කිසි පන්තියක ඉන්නවා. පන්තියක් හරි, ශ්‍රේණියක් හරි, ඔය නොයෙකුත් වචන තියෙනවානේ- යම්කිසි ශ්‍රේණියකට හෝ පන්තියකට අදාළ දැනුම් සම්භාරය සම්පූර්ණ වෙන්නේ ඒ පංතියෙන් පාස්වුනාම නේ? පාස්වෙනවා කියල කියන්නේ මොකද්ද? එතනින් එහාට යනවා කියන එක නේ? විභාග පාස්වෙනවා කියලා කියන්නේ එයින් එහාට යනවා. ඒ වගේම තමයි- ලෝකයෙන් එතෙර වුනාම තමයි ලෝකය තේරුම් ගන්න පුළුවන් වන්නේ. **ලෝකයෙන් එතර වුනහමයි ලෝකය ගැන පූර්ණ අවබෝධය ලැබෙන්නේ.** එතකන් යථාවබෝධය නැහැ. අර කියාපු අඩාල දැනුමයි තියෙන්නෙ. අර ඇතාගේ අඟපසඟ අල්ලලා හිතුවා වගෙයි. ඔන්න ඔය ටික අපි තේරුම් ගන්න ඕන.

එතකොට එයින් හිතාගන්න පුළුවන්, ජීවිතයෙන් වැඩගන්න බලාපොරොත්තු වන පින්වතුන් මොකකටද අවධානය යොමුකළ යුත්තේ? මේ බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ප්‍රඥා චක්ෂුසය පිළිබඳ ධර්මයටද? එහෙම නැත්නම් නූතන ලෝකයේ අර කියන දිවිල්ලටද? කෝටි ගණන් වියදම් කරල ලෝකයේ අන්තය සොයාගෙන ගිහිල්ලා අන්තිමට අතරමඟදී මැරෙනවා අර රෝහිතස්ස වගේ. ඔන්න එතකොට ඒ කතාව ලෝකයේ අන්තය පිළිබඳවයි.

අර තව ප්‍රශ්න දෙකක් තියනවා නේ? ජීවයත් ශරීරයත් එකක් කියලා ඇතැම් කෙනෙක් කීවා. ජීවය වෙන එකක් ශරීරය වෙන එකක් කියලා ඇතැම් කෙනෙක් කීවා. එතන ජීවය කියලා කීවේ- මේ පින්වතුන් හිතාගන්න- ආත්මයටම නමක්. හුරුපුරුදු වචනයෙන් කියනවා නම් ආත්මයත් ශරීරයත් එකක් කියලා එක ගොල්ලක් කීවා. අනික් අය කියනවා ආත්මය වෙන එකක් ශරීරය වෙන එකක්. එතකොට බුදුරජාණන් වහන්සේ කොහොමද මේ එකකටවත් උත්තර දෙන්නේ. උත්තර දුන්නොත් අහුවෙනවා නේ? බුදුරජාණන් වහන්සේ පිළිනොගන්නා ආත්මයක් මේ. බුදුරජාණන් වහන්සේ





ප්‍රකාශ කරනවා. "කෙවල පරිපූරො බාලධම්මො" මේ ආත්මය කියන එක එහෙම පිටින්ම පෘථග්ජනයන්ගේ වැරදි අදහසක්. මිථ්‍යා දෘෂ්ටියක්. සක්කාය දිට්ඨිය කියන එක එහෙම පිටින්ම අවිද්‍යාවත් තණ්හාවත් නිසා ලෝකයා තුළ පැලපදියම් වුන වැරදි අදහසක්. එතකොට ඒ විදියේ ඇත්ත වශයෙන් නැති ආත්මයක් ශරීරයත් එක්ක සම්බන්ධ කරලා ඒ දෙක එකක්ය කීවත් ඒ දෙක දෙකක්ය කීවත් ඒ දෙකම වැරදියි. ඔය උසාවි වල අහන ප්‍රශ්න මේ පින්වතුන් දන්නවා නේ? කිසිදාක මත්පැනක් බිව්වේ නැති මනුෂ්‍යයකුගෙන් ඇහුවොත් එහෙම දක්ෂ නීතිඥයෙක් උසාවියේ කාලය අපතේ යවන්නේ නැතුව ඔව් හෝ නෑ හෝ කියන්න කියලා, "දැන් මේ යුෂ්මතා මත්පැන් බීම නතර කරලාද?," ඒකට ඔව් කීවත්, නැහැ කීවත්, අහුවෙනවා. අන්න ඒක නිසා බුදුරජාණන් වහන්සේ ඒ ප්‍රශ්න පැත්තකින් තිබ්බා. ඒකේ උපන්‍යාසය, ඒකෙ මූලික අදහසම, වැරදියි. එතකොට ඒක පහසුවෙන් තේරුම් ගන්න පුළුවන්. ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේ පිළිතුරු නොදුන්නේ මොකද කියන එක පහසුවෙන් තේරුම් ගන්න පුළුවන්. මොකද අපි දන්නවා හැම දෙනෙක්ම පිළිගන්නවා මේක අනාත්ම ධර්මයක්. අනිත්‍යතාව යම් ප්‍රමාණයකට අතීත ඍෂිවරුන් පමණක් නොවෙයි සාමාන්‍ය ජනයා පවා යම් ප්‍රමාණයකට දුටුවා. අනිත්‍ය නිසා දුක බවත් යම් ප්‍රමාණයකට දැන ගත්තා. නමුත් අනාත්ම බව, මමය මාගේය කියා ගතහැකි කිසිවක් සාරයක් හරයක් නැතිබව අන්න බුදුරජාණන් වහන්සේයි මතු කරලා දුන්නේ. මේ ඇස් කන් නාසා ආදිය. දැන් ඇසත්-ආයතන පිළිබඳව කියනකොට යම් අවස්ථාවක-ඇසත් ආත්මය හැටියට ගන්න බැහැ. රූපයත් ආත්මය හැටියට ගන්න බැහැ. කොතනකවත් නැහැ ආත්මයක්. සාරයක් නැහැ. නිස්සාරයි. අන්න ඒක නිසා තමයි එතකොට ඒ ප්‍රශ්න දෙකත් පැත්තකින් තැබුවෙ.

ඊළඟට ඒ විදියටම තමයි අවසානයේ තියෙන ප්‍රශ්න ටික. ඒක ඉතාමත්ම ගැඹුරුයි. තථාගත කියන වචනය. අපි දැන් ආරම්භ කළේ දේශනාව තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගැනයි. නමුත් තථාගත කියන වචනය අන්‍ය දෘෂ්ටික ශ්‍රමණ බ්‍රාහ්මණයින් යෙදුවේ තම තමන්ගේ ශාසන වල 'උත්තමපුරිස පරමපුරිස පරමපත්තිපත්ත' කියල කියන උතුම්ම තත්ත්වයට පත්වූ කෙනා ගැන. කොටින්ම කියතොත් විමුක්ත පුද්ගලයා ගැනයි. ඒ කාරණය හොඳට පැහැදිලි වෙන අවස්ථාවක් තියෙනවා.

වච්ඡගොත්ත කියන පරිබ්‍රාජකයා බුදුරජාණන් වහන්සේගෙන් මේ ප්‍රශ්න දහය විමසුවා. ඇත්ත වශයෙන් කියනවා නම් වච්ඡගොත්ත පරිබ්‍රාජකයා පමණක් නෙවෙයි සූත්‍රවල සඳහන් වෙනවා, නානාවිධ අය සමහර විට රජවරු පවා, ඇතැම්විට සංඝයා වහන්සේලා පවා, බුදුරජාණන් වහන්සේගෙන්

අහනවා ඇයි භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රශ්න වලට පිළිතුරු නොදෙන්නේ? අපි හිතන්නේ ප්‍රශ්නයක් නම් පිළිතුරු දෙන්න ඕනෑ අවශ්‍යයෙන්ම. ඔන්න ඒකටයි අපි කලින් කීවේ ප්‍රශ්න හතර වර්ගයක් බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙනවා කියලා. බුදුරජාණන් වහන්සේ මේ ප්‍රශ්න පැත්තකින් තිබ්බේ යම් හේතුවක් නිසයි. එතකොට මේ ප්‍රශ්න හතර, කෙනෙකුට බේරෙන්න බැරිවිදියටයි මේ ප්‍රශ්න හතර සකස් කරලා තියෙන්නේ.

තථාගත තෙම- 'තථාගත' කියලා කියන්නේ විමුක්ත පුද්ගලයා කියලා හිතාගනිමු. විමුක්ත පුද්ගලයා, යම්කිසි ශාසනයක විමුක්ත පුද්ගලයා මරණින් මත්තෙහි **වෙයි**. මරණින් මත්තෙහි **නොවෙයි**. මරණින් මත්තෙහි **වෙයි සහ නොවෙයි**. හතරවෙනුව මරණින් මත්තෙහි **වෙයිත් නොවෙයි, නොවෙයිත් නොවෙයි.'** ඔන්න ඔය විදියට හතර කොන් කරලා දැන් මේ උත්තර දෙන කෙනා කොන් කරන්න. ප්‍රශ්නයට හතර කොනක් දම්මේ උත්තර දෙන කෙනාට බේරෙන්න බැරිවෙන්න. ඒ කොයි එකට කිව්වත් අහුවෙනවා. නමුත් බුදුරජාණන් වහන්සේ ඒකට අහුවුනේ නැහැ. ඒ එකකටවත් උත්තර නොදී මේක දෘෂ්ටි කාන්තාරයක්. මේක විහිළුවක් කියලා නිග්‍රහ කරලා, ආර්ය පුද්ගලයාට මේ ප්‍රශ්න ඇතිවන්නෙත් නැහැ කියල. මේ ප්‍රශ්න ලොකුවට අරගෙන උත්තර දුන්නෙ නැත්තෙ මක්නිසාද කියල වෙහෙසෙන්නේ අර ඒ අවබෝධය නැති කෙනාය කියා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා.

දැන් තථාගත කියන එක අපේ ශාසනයට අදාළව තේරුම් ගන්න බලමු. දැන් තථාගත කියන පදය ඇත්ත වශයෙන් සූත්‍ර දේශනාවල බුදුරජාණන් වහන්සේ පිළිබඳව පමණක් නොවෙයි ඇතැම් තැන් වල රහතන් වහන්සේ පිළිබඳවත් යොදලා තිබෙනවා. කොටින්ම විමුක්ත පුද්ගලයා. දැන් වච්ඡගොත්ත පරිබ්‍රාජකයා බුදුරජාණන් වහන්සේට ප්‍රශ්න ඉදිරිපත් කළේ තථාගත කියන වචනය අරගෙන නොවෙයි. මේ ශාසනයේ විමුක්ත පුද්ගලයා, විමුක්ත සිත ඇති භික්ෂුව, මරණින් මත්තේ උපදිනවද කියලා ඇසුවා. බුදුරජාණන් වහන්සේ කිව්වා ඔය ප්‍රශ්නය ගැලපෙන්නේ නැහැ. ඊළඟට ඇහුවා 'මරණින් මත්තේ උපදින්නෙ නැද්ද?' 'ඔය ප්‍රශ්නයත් ගැලපෙන්නේ නැහැ' ඊළඟට ඇහුවා මරණින් මත්තේ උපදී සහ නූපදී කියන දෙකමද?' 'ඔය ප්‍රශ්නයත් ගැලපෙන්නේ නැහැ' ඊළඟට ඇහුවා "උපදින්නෙත් නැද්ද? නූපදින්නෙත් නැද්ද?" ඒ ප්‍රශ්නයත් ගැලපෙන්නේ නැහැ" කියලා ඔය විදියට බුදුරජාණන් වහන්සේ කෙටි පිළිතුරු දුන්නා. ඔන්න ඉතින් වච්ඡගොත්ත කියනවා මට යම් ශ්‍රද්ධාවක් ඔබ වහන්සේ කෙරෙහි තිබුනා නම් දැන් ඒකත් නැතිවුනා. එතකොට බුදුරජාණන් වහන්සේ කියනවා හොඳයි එහෙනම් වච්ඡගොත්ත මම නුඹගෙන් ප්‍රශ්නයක් අහන්නම්.





දැන් ඔබ ඉදිරියේ ගින්නක් දල්වෙනවා කියලා හිතමු. ඒ ගින්න දල්වෙනවා නම් ඔබ දන්නවාද මෙතන ගින්නක් දල්වෙන බව. 'ඔව්, භවත් ගෞතමය, මම දන්නවා'. කවුරුවත් ඇසුවොත් මේ ගින්න දල්වෙන්නේ මොකක් නිසාද කියලා ඒකට මොකක්ද කියන්න වෙන්නේ. "මම කියනවා මෙන්න මේ තණකොළ ලී කැබලි ආදිය නිසයි ගින්න ඇවිලෙන්නේ. ඒවා උපාදාන කරගෙනයි, ඉන්ධන කරගෙනයි, මේ ගින්න දල්වෙන්නේ". "හොඳයි ඔබ ඉදිරියේ ගින්න නිවී යනවා. එතකොට යම් කෙනෙක් ඇසුවොත් දැන් මේ නිවුන ගින්න කොහාටද ගියේ? නැගෙනහිරටද? බටහිරටද? උතුරටද? දකුණටද? මොකද්ද නුඹ කියන්නේ?" "ප්‍රශ්නය ගැලපෙන්නේ නැහැ. භවත් ගෞතමයන් වහන්ස" අන්න එයාටත් කියන්න සිද්ධවුනා. ප්‍රශ්නය ගැලපෙන්නේ නැහැ කියලා. මොකද, ඔන්න එයාට ඊළඟට හේතුව කියනවා. යම් තණකොළ ලී කැබලි ආදිය නිසා ගින්නක් ඇති වුනාද, ඒ ගින්න නිවුනාට පස්සේ ඒක කොහේ ගියාද කියන එක මෝඩ ප්‍රශ්නයක්. මෝඩ කියලා කිව්වේ නැහැ. ඒක හරි කියමනක් නොවෙයි. ඒ වෙනුවට කියන්න තියෙන්නේ "නිබ්බුත" කියන වචනයයි. "නිවුනා" කියන වචනය විතරයි. ඒකයි උත්තරේ. යම් යම් ඉන්ධන ද්‍රව්‍ය උපාදාන කරගෙන, අල්ලාගෙන ගින්නක් පැවතුනා. ඒ උපාදාන නැතිවීමෙන් ඒවා ක්ෂයවීමෙන් ගින්න නිවී ගියා. එච්චරයි කථාව. **ඔච්චරයි කථාව**. ඉතින් ඒකට යොදන වචනය තමයි "නිබ්බුත" කියන එක.

ඉතින් ඔන්න දැන් මේ පින්වතුන්ට අර **නිබ්බාන** වචනය ගැනයි හිතන්න තියෙන්නෙ. මෙතෙන්ටයි අපි ඇවිල්ලා තිබෙන්නේ. මේ නිබ්බාන කියන ප්‍රශ්නයටයි. මේ ශාසනයේ පින්වතුන් කවුරුත් දන්නවා ඔය තණ්හාව නිසා ලෝකයා අල්ලාගෙන ඉන්න ගොඩවල් පහක් තියෙනවා කියනවා. මේ පින්වතුන් නිතර ඔය කියනවත් ඇහෙනවා. රූප ස්කන්ධය, වේදනා ස්කන්ධය, සංඥා ස්කන්ධය, සංස්කාර ස්කන්ධය, විඤ්ඤාණ ස්කන්ධය කියලා. ඔය ගොඩවල් පහ අල්ලාගනයි අපි ඉන්නේ. යටත් පිරිසෙයින් ඒ අවබෝධයවත් තියනවා බෞද්ධයාට. අබෞද්ධයා ඒවා ආත්ම හැටියට ගන්නවා. බෞද්ධයා කියල කිව්වට ඒ දෘෂ්ටිය පිරිසිදු වුන අවස්ථාවේ තමයි, ඒ කියන්නේ සෝවාන් පුද්ගලයාට දෘෂ්ටිය පිරිසිදු වුන අවස්ථාවේ තමයි, ඒක දකින අවස්ථාව. එතකොට මෙන්න මේ ගොඩවල් පහ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, අතහරින්න අකමැත්ත නිසා විසිආකාරයකට සක්කාය දිට්ඨිය හැටියට අල්ලාගෙන ඉන්නවා. එක්කෝ රූපය ආත්මය යැයි කියනවා. එක්කෝ ආත්මය රූපය සහිත එකක් කියනවා. එක්කෝ ආත්මය තුළ රූපය තියනවා කියනවා. එහෙම නැත්නම් රූපය තුළ ආත්මය තියනවා කියනවා. ඔන්න එතකොට හතර ආකාරයකට

අර පහම. වේදනාව ආත්මය කියනවා. වේදනාව ආත්මය සහිත එකක් කියනවා. වේදනාව තුළ ආත්මය තියනවා කියනවා. ආත්මය තුළ වේදනාව තියනවා කියනවා. ඔන්න ඔය විදියට හතර ආකාරයකට මේ ස්කන්ධ පහ පිළිබඳවම ලෝකයාට මිථ්‍යාදෘෂ්ටියක්, වැරදි ගැන්මක් තියනවා. අනිත් ඒවා ගැන හිතා ගත්තත් විඤ්ඤාණය පිළිබඳව, විඤ්ඤාණය කියන මායාත්මක ගැඹුරුම කොටසට ඇවිල්ලා බොහෝ දෙනා හිරවෙනවා. අනිත් ඒවා අනාත්මය වුනත් මේ විඤ්ඤාණය, නැත්නම් හිත, මෙතන තියනවා මොකක්හරි හරයක්. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඒකත් යම් අවස්ථාවක, මේ විඤ්ඤාණයත් අනාත්ම බව, විඤ්ඤාණයෙත් ආත්ම වශයෙන් ගතයුතු දෙයක් නැති බව. ඒකත් ක්ෂණිකව, අරිටත් වඩා වේගයෙන් - මේ හිත කියන එක මේ පින්වතුන් අහල ඇති 'ලහුපරිවත්තං' ඉතාම වේගයෙන් කරකැවෙනවා. මේ විඤ්ඤාණය ඉතාම වේගයෙන් කරකැවෙනව. ඒකට උපමාවකුත් නැහැ කියල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. මේ කාලයේ තියන විද්‍යාත්මක උපකරණ වලින්වත් බැහැ ඒක කියන්න. ඒ තරම් පුදුම අන්දමට මේ විඤ්ඤාණය වේගයෙන් කරකැවෙනවා. අතීත දාර්ශනිකයින් එහෙම ඒකට දක්වපු උපමාව 'අලාතචක්‍ර' ගිනිපෙනෙල්ලක් කරකවන කොට ගිනිපෙනෙලි ගොඩක් වගේ පේන්නේ. අලාත චක්‍ර උපමාව දක්වනවා. ගිනිපෙනෙල්ලක් කරකවන්නා වගේ. ඒ තරම් වේගයෙන් මේ හිත යනවා. ඒක නිසා මේ පිළිබඳව වැරදි අවබෝධයක් ආත්මයක් හැටියට ලෝකයා ගන්නවා. එතැනයි බොහෝදෙනා ගිහිල්ලා හිරවෙන්නේ. ඔය අභිඥාලාභීන් පවා අන්තිමට ගිහිල්ලා හිර වෙන්නේ එතැනයි.

නමුත් බුදුරජාණන් වහන්සේ ඔන්න යම් අවස්ථාවක මේ විඤ්ඤාණයේ මායාකාරී ස්වභාවයත් අවබෝධ කරගත්ත. අන්න අර ප්‍රඥා ඇස පහළකරගත්තු අවස්ථාවේ. විඤ්ඤාණයත් මොහොතක් පාසා ඇතිව නැතිවෙනවා. විඤ්ඤාණයත් ඇතිව නැතිවෙනවා නම් අන්න අර කියාපු ආයතන හය ඒ කියන්නේ අර චක්ඛු විඤ්ඤාණ, සොතවිඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනො විඤ්ඤාණ කියන ඒ විඤ්ඤාණ හයම අර විදියට හේතු ප්‍රත්‍ය නිසා ඇතිවෙලා හේතු ප්‍රත්‍ය ඉවත් කරහම නැතිවෙන දේවල්. එතකොට මේ විඤ්ඤාණය- මේක ආශ්‍රිතවයි අපි මේ ලෝක සංකල්පයක් ඇති කරගන්නේ. ලෝකය පිළිබඳ සංකල්පය ලෝක ප්‍රඥප්තියක්. ලෝකය කියන්නේ, අපි මේ ඇති කරගත්තු ප්‍රඥප්තියක්. ඒක තුළයි මේ හිරවෙලා ඉන්නේ. දැන් ටිකකට හිතලා බලන්න මනුෂ්‍යයින්ට පෙනෙන ලෝකය ද අපේ වගේ ඇස් පිහිටලා නැති අනික් සතුන්ට පෙනෙන්නේ. අපට මේ කොච්චර විද්‍යා ශක්තිය තිබුණත් කූඹියෙකුගේ





ලෝකය අපට තේරුම් ගන්න පුළුවන්ද? කූඹියාගේ ලෝකය අපට තේරුම් ගන්න බැහැ. කොයි තරම් විද්‍යාත්මක ගවේෂණ පර්යේෂණ කළත්. ඒකට පොඩි නිදර්ශනයක් අපිටත් වඩා මේ පින්වතුන් දන්නවා ඇති, ඔය පහුගිය 'සුනාමි' කාලයේ මනුෂ්‍යයාගේ උපකරණ පරද්දලා සත්ත්වයා. අපි පහත් හැටියට හිතන සත්ත්වයාගේ ඉව-සත්ත්වයාගේ ඉව කොයි විදියක එකක්ද කියල මනුෂ්‍යයාට හිතා ගන්නත් බැහැ. ඒක නිසානෙ උන් ගැලවුනේ. මනුෂ්‍යයන් ඒ පිළිබඳ අනතුරු සංඥා එනකල් බලන් හිටියා. ඒ සතුන්ට ඉව දැනුනා සුනාමි එක ගැන. ඔන්න හොඳ නිදර්ශනයක්. එයින් පෙනෙනවා ඒ සතුන්ගේ ලෝකය මොකද්ද කියලා. නමුත් අපට ඒක හිතා ගන්න බැහැ. ඒකයි බුදුරජාණන් වහන්සේ සළායතනයට සාපේක්ෂව ලෝකය තියන බව ප්‍රකාශ කළේ. **එතකොට ලෝකය සළායතනයට සාපේක්ෂව තියනව නම්, ලෝක නිරෝධයත් සළායතන නිරෝධයෙන් සිදුවිය හැකියි.**

මේ ඔක්කොම ප්‍රශ්න උණකාරයා අසන ප්‍රශ්න හැටියටයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ. උණ කාරයෙක් වතුර ඉල්ලන කොට වතුර දීලා හරියන්නේ නැහැ. ඒකට බේතයි දෙන්න ඕනෑ. ඒ වගේ බුදුරජාණන් වහන්සේත් වතුර නොවේ දුන්නේ බෙහෙතයි දුන්නේ. බෙහෙත තමයි ධර්මය. එතකොට ඒ ධර්මයයි තියෙන්නේ. අන්න ඒක අවබෝධ වෙනකොට **'යංකිඤ්චි සමුදයධම්මං සබ්බ තං නිරොධධම්මං.'** යම්තාක් දෙයක් හටගන්නා ස්වභාවය ඇත්තේද ඒ හැම දෙයක්ම ක්ෂණිකව බිඳී යන ස්වභාවය ඇත්තේය. ඒක පරමාණුවටත් බලපානවා. ලෝක ධාතුවටත් බලපානවා. ඒ විදියේ ලෝක ධාතුන්, අර කියාපු සක්වලවල්, සිය දහස් ගණන්. ඒවයි සත්ත්වයිනුත් සිටිනව. ඒ ඔක්කොම තිබෙන බව ඇත්ත. ඒ නමුත් ඒ තුළ අපි හිතන්න ඕන සංවේගය, ඇතිකර ගැනීමට, ඒතාක් කාලයක් අපි මේ දීර්ඝ සංසාරයේ ඉපදෙමින් මැරෙමින් යනවා. ඒකයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ. අර සළායතනයෙන් කෙරෙන ස්පර්ශය නිසා වේදනාවක් ඇතිවෙනවා. වේදනාව නිසා තණ්හාවක් ඇතිවෙනවා. තණ්හාව නිසා උපාදනය ඇතිවෙනවා. උපාදනය නිසා භවයක් ඇති වෙනවා. භවය නිසා ජාති ජරා මරණ වලින් මිදෙන්නේ නැහැ අන්න අර දෘෂ්ටි හැටදෙකම ගත්තු අය. ඒ දෘෂ්ටි හැට දෙක ගත්තු අය අතර හිටියා අභිඥාලාභීන්. මේ කාලයේ විද්‍යාඥයින් පරද්දන, අතීත ජාතීන් පෙනෙන මහා පුදුම චිත්ත ශක්තීන් ඇති අය පවා සිටියා. නමුත් ඒ අය ගැන පවා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ ඒ අයත් අර කියාපු ප්‍රඥා ඇස නැති නිසා අන්ධයි. ඒ අයට නියම ඇස නැහැ කියන එකයි 'අචක්ඛුකා' කියලා කිව්වේ. අපි අන්න ඒ ආශ්‍රයෙන් තේරුම් ගන්න ඕනෑ.

එතකොට මෙන්න මේ ධර්මය ලැබිල තියනවා. මේක ආරම්භ කරන්නෙ කොතනින්ද? මෙතනින්ම. මේ සළායතනයෙන්. මේ බඹයක් පමණවූ ශරීරය තුළින්මයි. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ මහා පුදුම ප්‍රකාශනය- බඹයක් පමණ වූ සංඥාවත් මනසත් සහිතවූ මේ ශරීරයෙම මම ලෝකයත්, ලෝකයේ හටගැන්මත්, ලෝක නිරොධයත්, ඊට මාර්ගයත්, පෙන්වා ලමි. කියලා කීවෙ ඒකයි.

එතකොට අපි දැන් මේ අවස්ථාවේ කරන්නේ විශේෂයෙන්ම ශීල, සමාධි, ප්‍රඥා වැඩීම. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ වැඩීම කියලා කියන්නේ ශීල, සමාධි, ප්‍රඥා වැඩීම. මේක අපේ මේ සංඥාවත් මනසත් සහිත කය තුළින් කරන එකක්. ඒක කරලා යම් අවස්ථාවක විදර්ශනාත්මක වශයෙන් මේවායේ ඇතිවීම් නැතිවීම් තත්ත්වය දකලා ඒ යන මාර්ගය තමයි බුදුරජාණන් වහනස්සේ සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් වශයෙන් දක්වූයේ. එතන තියෙන්නේ අවිද්‍යාවත් තණ්හාවත් නැති කිරීමේ ප්‍රයත්නයක්. අවිද්‍යාව තුළින් ගත්තු සක්කාය දිට්ඨියත්, ඒක තහවුරු කරන තණ්හාව. ඇත්ත වශයෙන් මේ තණ්හාව නිසා ගත්තු උපාදානය නිසයි ලෝකයා භවයක් තුළ හිරවෙලා ඉන්නේ. මේ හැම එකක්ම ග්‍රහණය කරලා. මේක අල්ලාගෙන මං බේරගන්න කියනවා. යමක් අල්ලාගෙන අනේ මං බේරගන්න කියනවා. අතහරින්න කියලා බුදුරජාණන් වහන්සේ කියනවා. අතහරින්නේ නැතුව කොහොමද බේරෙන්නේ. අතහැරිය හැටිය බේරෙනවා. ඔතනයි රහස. නමුත් ඕක තේරුම් ගන්න අමාරුයි. ඉතින් බුදුරජාණන් වහන්සේ ඒකයි අපට පෙන්නලා දෙන්නේ.

මේවා එතකොට අතහරින්නේ කොහොමද? අතින් අල්ලලා වීසිකිරීමෙන් නොවෙයි. නුවණැසින් ප්‍රඥා ඇසින්මයි ඒ දකින්නේ. ඒකයි විදර්ශනා ඥානය කියලා කියන්නේ. විදශීනා කියල කියන්නේ, විදසුන් කියලා කියන්නේ විශේෂ දර්ශනයක්. ඒ විශේෂ දර්ශනය අර ඇසින් බලන එකක් නොවෙයි. යෝගාවචරයා ශීල සමාධි ප්‍රඥා දියුණු කරගෙන යනකොට යම් අවස්ථාවක සාමාන්‍ය ලෝකයාට නොපෙනෙන දේවල් පෙනෙනවා. පහන් දල්ල එකක් හැටියට ගත්තු කෙනාට සමහර විට ඒකෙ තිබෙන ඇතිවීම් නැතිවීම් ප්‍රවාහය පෙනෙනවා. දිය ඇල්ලක් බලන බලන තැන ඒ තත්ත්වය පෙනෙනවා එක්තරා අවස්ථාවක. ඊටත් වඩා ඈතට ගිහිල්ලා යම් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මේවා පිළිබඳව තියන ඇල්ම ඉවත් කරන්න, ඉවත් කරන්න, අර සළායතන නිරෝධය- සළායතනයන්ගේ නිස්සරණය කියන්නේ ඒකයි. සළායතනයන්ගෙන් ඉවත්වීම





කියලා කියන්නේ ඒවා පිළිබඳව තියන ආත්ම සංඥාව ඉවත් කරලා ක්‍රම ක්‍රමයෙන් විදර්ශනා මාර්ගයේ ගමන් කිරීමයි.

ඉතින් මේ ලෝකයේ ඇස බිඳෙන බව තේරුම් නොගැනීම නිසාත් රූපය බිඳෙන බව තේරුම් නොගැනීම නිසාත් ඒ දෙක එකතු කරලා අපි යම්කිසි ස්පර්ශයක් ඇතිකරගෙන ලෝකයක් මවා ගන්නවා. අපි මවා ගන්න සිනමාලෝක, සංගීත ලෝක ඔය ඔක්කොම ලෝක මේ අපේ හිත තුළින් මවාගන්න දේවල්. ටිකකට හිතලා බලන්න. ඉතාමත් මිහිරි සංගීතයක්. ඒ සංගීතය මේ කාලයේ සිටින ඉතාම දක්ෂ සංගීතඥයාගේ මිහිරිම සංගීතය. දැන් තියන උපකරණයකින් ඒක හෙමින් ඇසීමට සැලැස්වුවහොත්, ඒක ඇඩීමක්. ඒක ඇඩීමක් වගේ. ඒකයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ. 'රුණ්ණමිදං භික්ඛවෙ අරියස්ස විනයෙ යදිදං ගීතං" ගීතය කියල කියන්නේ ආර්ය ව්‍යවහාරයට අනුව ඇඩීමක්. අන්න ඇඩීමක් බව ප්‍රත්‍යක්ෂ කරගන්න පුළුවන් ඒ විදියට, ඒ වගේම තමයි ඇහැට පෙනෙන ලෝකයත්. ඒ හැම එකක්ම දැන් ඔය සිනමාව තව ඒවට අදාළ දේවල් මේ පින්වතුන් දන්නවා. නූතන දේවල්. ඒවා අපට පෙන්නුම් කරන ඒ තිරයේ වැටෙන්නේ මොකද්ද කියලා හිතලා බලන කොට යම්කිසි රූප රාශියක් රූප සන්තතියක් වැටෙනවා. අපි ඒවා සංඥාවෙන් අල්ලාගෙන ඒවාට යටවෙනවා, මුළාවෙනවා. නමුත් යම් අවස්ථාවක අන්න අර කියාපු ප්‍රඥා ඇස දියුණු වෙනව නම් ඒවාට ඇති ඇල්ම ක්‍රමක්‍රමයෙන් ඉවත් වෙනවා. ඇල්ම ඉවත් වෙනවාත් එක්කම- මේ දෙක එකට යන්නේ- ඇල්ම ඉවත් වෙනවාත් එක්කම ආලෝකය එනව වගෙයි. අන්ධකාරය යම් ප්‍රමාණයකට ඉවත්වෙනවා නම් ඒ ප්‍රමාණයකට ආලෝකයත් එනවා. ආලෝකය යම් ප්‍රමාණයකට වැටෙනවා නම් ඒ ප්‍රමාණයට අන්ධකාරය ඉවත් වෙනවා. අන්න ඒක නිසා අපට තියෙන්නේ අර අන්ධකාර මාවතින් ඉවත්වෙලා මෙන්න මේ ආලෝක මාර්ගයේ ගමන් කිරීමයි.

එතකොට මේ පින්වතුන් කල්පනා කරන්න ඕනෑ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙන්නේ ඒකත් මේ කය තුළින්මයි. අපි හිත දියුණුකර ගැනීමට කරන උත්සාහයෙ පළමුවෙනි පියවර තමයි සීලය. මේ පින්වතුනුත් මේ අවස්ථාවේ සීලසමාදානය තුළින් කය වචනය හික්මවා ගැනීමේ මූලික ශික්ෂණය ලැබුවා. බුදුරජාණන් වහන්සේ සීලයේ විවිධ අවස්ථාවන් දක්වනවා. මොකද ඒකත් කරන්නේ දීර්ඝ කාලයක් අපි මේ සංසාරයේ ගමන් කරන අතර අපේ විඤ්ඤාණයේ නා නා විධ කුසල අකුසල කර්ම ගැබ්වෙලා තිබෙනවා. ඒ වගේම මතක සටහන් වෙලා තිබෙනව. මේ මතකයන් අපේ හිතට ගලාගෙන එනවා. ඒක නිසා අපේ

හිත එක්තැන් කරගන්න අමාරුවෙනවා. නමුත් යම් කෙනෙක් යම් සීමාවන් තබාගෙන තමන්ගේ කය වචනය හික්මවා ගත්තා නම් අර පසුතැවිල්ල වෙනුවට සතුට උපදවාගන්න පුළුවන්. මම මෙච්චර කාලයක් මත්පැන් බීවා, සතුන් මැරුවා, සොරකම් කළා නානාවිධ දේවල් කළා. නමුත් දැන් මම ඒවායින් ඉවත්වෙලා මෙන්න මේ හොඳ ප්‍රතිපත්තියේ පිහිටියා කියලා එතෙන්ට පමණක් හිත යොදලා ඒකෙන් හිත සතුටු කරගෙන සමාධියක් ගොඩ නහා ගන්න පුළුවන්. ඒකයි අපි සමහර විට ප්‍රකාශ කරන්නේ මේ සංසාරය කියන්නේ මඩගොහොරුවක්. මේකේ එරි එරී අපි ඇවිල්ලා තියෙන්නේ, මේ මඩගොහොරුවේ. භාවනා කරන්න ඉඳගන්නවා නම් පොඩි පදනමක් හදාගන්න ඕනෑ. කණු පහක් හරි, අටක් හරි, දහයක් හරි හිටවලා. අන්න ඒ විදියේ දෙයක් කියල හිතාගන්න ඕනෑ ශික්ෂාපද. අන්න ඒ විදියේ වටිනා සීලයක් සමාදන් වෙලයි මේ පින්වතුන් ඉන්නේ.

ඊළඟට එතන ඉඳලා යන්නේ මොකක්ද? සමථ, විදර්ශනා කියලා භාවනාවෙ දෙපැත්තක් තිබෙනවා. මේ පින්වතුන් දන්නවා. යම් ප්‍රමාණයකට සමථයක් ඇතිකර ගන්න ඕනෑ නීවරණ ඉවත්කරලා. සිත එක් තැන් කරගන්න ඕනෑ. කුසලාරම්මණයක් මතුකරගෙන. විසිරෙන සිත කුසලාරම්මණයක රඳවා ගැනීම තුළින් අපට මේ සිතේ ශක්තිය උරගා බලන්න පුළුවන්. දවසේ අපි එදිනෙදා මේ සිතේ ශක්තියෙන් කොයිතරම් සුළු ප්‍රමාණයකින්ද වැඩගන්නේ කියන එක ධ්‍යාන ආදී තත්ත්ව වලට පත්වුනු පින්වතුන් තේරුම් ගන්නවා. අර විසිරිච්ච ජලාශයක ශක්තියක් නැහැ. ඒ වතුර එකතු කරලා නල මහින් ගෙනිහිල්ලා ජලවිදුලිය නිපදවීමට යකඩ රෝදය කරකැවෙන තැනට එනකොට කොයිතරම් වේගයකින්ද මේ වතුර ගමන් කරන්නේ. අන්න ඒ වගේ අපේ මේ හිතෙත් යම් ශක්තියක් තිබෙනවා. අර ධ්‍යාන ආදී සමාධි උපදවා ගැනීම තුළින් ඒ ශක්තිය ඒකාග්‍ර කරලා, එකතු කරලා, ඔන්න ඊළඟට තියෙන්නේ අර යකඩ රෝදය පෙරළන එකයි. ඒ පෙරළීමට තමයි ප්‍රඥාව, විදර්ශනාව කියන්නේ. ඒ තැන්පත් කරගත්තු සිත ඊළඟට අපි යොදන්න ඕන වෙන කොහේවත් නොවෙයි, මේ කයටමයි. මේ කයටත් අනිත් කයටත් කියලා කියන්නේ ධර්මතාව එකයි. මේ කය යම්සේද ඒ කයත් එසේමයි. ඒ කය යම්සේද මේ කයත් එසේමයි. ඒ කයේ රූපස්කන්ධයත් මේ කයේ රූප ස්කන්ධය වගේමයි. අන්න එහෙම ඒ පැත්තෙන් හරි මේ පැත්තෙන් හරි බැලුවත් අන්තිමට එන්නේ මෙන්න මේ ආයතන හයටත් පඤ්චුපාදානස්කන්ධයටත්. මේක පිළිබඳ ක්‍රමක්‍රමයෙන් ගැඹුරින් විදර්ශනාත්මකව වැටහෙන්න වැටහෙන්න අන්තිමට ප්‍රතිඵලය මොකක්ද? මේ ඇතිවීම් සහ නැතිවීම් කියන එක, සමුදය - වය කියන ඒ ධර්මතාව තුළ මුළු මහත් ඥාන





සම්භාරයම ඇතුළත් වෙනවා. ඇතිවීම් නැතිවීම් දෙක තුළ. නමුත් මේ ඇතිවීම් නැතිවීම් කියන දෙක පිළිබඳ දැනුම ක්‍රම ක්‍රමයෙන් ගැඹුරට යන්න යන්න ඇතිවීම් පක්ෂයට වඩා නැතිවීම් පක්ෂය පේන්න පටන් ගන්නවා. මේක බිදි බිදී යනවා. ඒකයි බුදුරජාණන් වහන්සේ "ලුජ්ජති පලුජ්ජති" කිව්වේ. ලෝකය කියල කිව්වෙ බිදි බිදී යන එකක්. බිදි බිදී, සිදි සිදී යන එකක්. අන්න එතකොට මේ රූප වේදනා ආදී පංචස්කන්ධයට සිත යොමු කරන කොට, ඒකාග්‍ර වූ මනසින් යම් අවස්ථාවක මෙනෙහි කරන කොට, ඒක වැටහෙනවා. ඒ තුළින් ඇතිවන නිබ්බිදාව, කලකිරීම, ඒ කලකිරීම තමයි ඈතට යනකොට ඒ පංචඋපාදානස්කන්ධය අතහැරලා අර කියාපු සළායතන නිරොධ කියන ආයතනයන්ගෙන් නික්මීමට පවා උපකාර වන්නේ.

ආයතනයන්ගෙන් නික්මීම කියලා කියන්නේ මොකක්ද? අපි මේ ඇස කණ නාසය ආදිය අල්ලාගෙන ඉන්නේ මේවා ආත්ම හැටියට අරගෙන. ආත්මය පදිංචි වෙච්ච තැන් හැටියට අපි හිතන්නේ. එතකොට මේ මගේ ඇස, මගේ කණ, මගේ නැහැය අන්න ඒ මගේ කම තියනවා. ඒකත් එක්කම හරියට මේවා ඇතුළේ කවුරුවත් පදිංචිවෙලා ඉන්නවා වගේ. නමුත් යම් අවස්ථාවක තේරෙනවා මේ මගේ කියලා හිතාගත්තු දේවල් මෙතන මෙතනම බිඳෙනවා. ඇසත් බිඳෙනවා. රූපයත් බිඳෙනවා ඒ දෙක නිසා ඇතිවන විඥානයත් බිඳෙනවා. ඒ විඥානය නිසා ඇතිවන ස්පර්ශයත් බිඳෙනවා. ඒ ස්පර්ශ නිසා ඇතිවන වේදනා ආදී හැම එකක්ම බිදි බිදී යනවා. අන්න ඔය සත්‍යයටයි එතකොට බුදුරජාණන් වහන්සේ අන්තිමට අපේ හිත යොමු කරන්නේ. ඒ තුළින් යම් අවස්ථාවක අර කියාපු සළායතනයන්ගේ ඇතිවීමත් නැතිවීමත් දැකලා, ඒ වගේම ආස්වාද පක්ෂයත් ආස්වාද පක්ෂයට වඩා තියන ආදීනව පක්ෂයත් තේරුම් අරගෙන යම් අවස්ථාවක එයින් නික්මීම, එයින් නික්මීම කියන තත්ත්වයයි ඔන්න අපි මෙලොවම නිවන් කියලා කියන්නේ. "දිට්ඨෙව ධම්මෙ" දිටු දැමියෙහිම නිවන් දුටුවා කියලා කියන්නේ. නිවන් දක්කා, එතෙරට ගියා, කියලා කියන්නේ. අපි දැන් නිවන ගැන කියන කොට, බුදුරජාණන් වහන්සේලා ගැන කියන කොට, ලෝකෝත්තර කියන වචනයක් අපි යොදනවා. ඇයි මේ ලෝකෝත්තර කියන වචනය යොදන්නේ? ඇතැම් කෙනෙක් හිතනවා ලෝකෝත්තර වුනේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවට පස්සෙයි කියලා. එහෙමත් හිතනවා ඇති සමහර විට. ඇයි? ලෝකයේ නේ හිටියේ. එතකොට ලෝකයේ හිටියා. පිරිනිවන් පෑවට පස්සේ ඔන්න ලෝකයෙන් එතෙර වුනා. එහෙමත් හිතන්න බැරි නැහැ ඇතැම් කෙනෙක්. නමුත් බුදුරජාණන් වහන්සේ ජීවමානවම ලෝකෝත්තරයි කිව්වෙ අන්න අර කිව්ව ලෝකයෙන් එතෙර වුනා. අර ලෝකයෙන් එතර වුනා. පංචස්කන්ධ

ලෝකයෙන් එතර වුනා. සළායතන ලෝකයෙන් එතර වුනා.

එතකොට මෙන්න මේ ලෝකය ආශ්‍රය කරගෙනයි අපි දැන් කතා කරන අර සක්වල ආදිය. ඒ ප්‍රශ්න උණ කාරයා අසන ප්‍රශ්න වගෙයි. මොකද ලෝකයෙන් එතර වුනාට පස්සේ ඒ ප්‍රශ්න නැහැ. ඒ ප්‍රශ්න අසන්නේ සක්කාය දිට්ඨිය තුළ සිටි කෙනයි. ඒ ලෝකය හැටියට ගන්න දේවල් සකස්වෙලා තිබෙන්නේ ඇහෙන් ස්පර්ශ කළ රූපයෙනුත් කණෙන් ස්පර්ශ කළ ශබ්ද ඒ කියන දේවල් ආශ්‍රයෙන්. **එතකොට අර ඇතා ගැන කියපු කථාව ආයි සිහියට නඟා ගත්තොත් මේ ආයතනයන්ගෙන් ස්පර්ශ කරලා ලබා ගත්තු ලෝකය එහෙම පිටින්ම අන්න අර ඇතා පිළිබඳ අවබෝධය ලබාගත්තු අන්ධයාගේ ලෝකයාට සමානයි.** ඒක අඩාලයි. සම්පූර්ණ දැනුමක් නොවෙයි. නමුත් ප්‍රඥා ඇසට හමුවෙනවා අන්න අර කියාපු හැම අංශයක්ම. මේ සළායතනයන් ඇතිවෙන හැටි පෙනෙනවා, ක්ෂණිකව නැතිවෙන හැටිත් පෙනෙනවා. ඒවායේ යම්කිසි ආස්වාද පක්ෂයක් තිබෙනවා නම් ඒකත්, ආදීනව පක්ෂයත් ඊළඟට එයින් නික්මීම කියල කියන ඒවාට තියන ඇල්ම නැති කිරීමෙන්මයි යම් අවස්ථාවක විඥාන නිරෝධය, සළායතන නිරොධය, භව නිරෝධය. දැන් භව නිරෝධය කියන වචනය නිතරම සඳහන් වෙනවා - භව නිරෝධයම නිවන කියලා. "භව නිරොධො නිබ්බානං" "භව නිරොධො නිබ්බානං" කියලා ධර්මයේ නිතර සඳහන් වෙනවා. භව නිරොධය කියලා කියන්නේ අපි දැන් හිතන ලෝකයෙන් ඉවත්වීම නොවේ. පරිනිර්වාණයට පත්වීම කියලා අපි හිතන බුදුරජාණන් වහන්සේගේ අවසාන අවස්ථාව නොවෙයි. **නමුත් ජීවත්ව සිටියදීම අර ලොකෝත්තර තත්ත්වය ලබා ගත්තා.** ලබා ගත්තේ අර ප්‍රඥා චක්ෂුසය පහළවුනු අවස්ථාවේ. අර අවිද්‍යා අන්ධකාරයෙන් මෙතෙක් පෙනුන රූප, ඇසුන ශබ්ද, ඒව ඔක්කොම නිරුද්ධ වෙන අවස්ථාවක් තිබෙනවා. ඒ නිරුද්ධවීම ප්‍රත්‍යක්ෂ කිරීමෙන් තමයි ලෝකය මෙතනම නිරුද්ධ කරන්න පුළුවන් කියන අවබෝධය බුදුරජාණන් වහන්සේ ලබාගත්තේ. එතකොට ඒ හිතටයි බුදුරජාණන් වහන්සේ අවසාන වශයෙන් පත්වුනේ. අපි සමහර විට කල්පනා කරනවා පිරිනිවන් පෑවට පස්සේ, අවුරුදු පන්දාහකට පස්සේ බුදුරජාණන් වහන්සේ ආපහු එනවා කියා. නමුත් අපට එතෙන්දි මතක් කරගන්න තියෙන්නේ අර 'නිබ්බුතො' කියන වචනයයි. ගින්න නිවුනාට පස්සේ ආයේ කොහෙද? නැගෙනහිරට යනවාද? බටහිරට යනවාද, උතුරට යනවාද? දකුණට යනවාද? ආයි එනවාද ගින්න? නැහැ. ගින්නක් තිබුනේ ඒ කියාපු දර නිසයි. ඒ වගේ තථාගත කියල කිව්වත්, විමුක්ත භික්ෂුව කියල කිව්වත්, රහතන් වහන්සේ කියල කිව්වත්, ඒ





සංකල්පය ඇතිකර ගත්තේ අන්න අර පංචඋපාදානස්කන්ධයට ඇති ඇල්ම නිසයි.

බුදුරජාණන් වහන්සේගෙන් ඒකයි එක අවස්ථාවක රාධ කියන ස්වාමීන් වහන්සේ ඇහුවෙ 'ස්වාමීනි මේ සත්තො සත්තො කියලා කියනවා මේ ශාසනයට අනුව සත්ත්වයා කියලා කියන්නේ කාටද?' ඒ තාක් සත්ත්වයා කියන එක තෝරලා තිබුනේ අතීතයේ, සත් කියන නිත්‍ය පදාර්ථයක් තිබෙනවා කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ අමුතුම නිරුක්තියක් ඒකට දුන්නා. රූපයේ ඇලුනු අර්ථයෙන් රූපයේ හෝ වේදනා ආදියේ ඇලුණු අර්ථයෙන්. "රූපෙ ඛො රාධ සත්තො විසත්තො තස්මා සත්තොති වුච්චති" රාධ රූපයෙහි ඇලුනු, වෙසෙසින් ඇලුනු, කියන අර්ථයෙනුයි සත්ත්වයා කියලා කියන්නේ. අන්න එතකොට බිඳෙන පළුදු වන එකක් නිසා ලෝකය කියලා කිව්වා වගේ සත්ත්ව කියන වචනය පවා බුදුරජාණන් වහන්සේ තේරුවෙ යමකට ඇලුනු කියන අර්ථයෙන්. එතකොට රූප වේදනා ආදියෙහි ඇලෙන තාක් සත්ත්වයෙක් ඉන්නවා. ඒවායින් විමුක්ත වුනු හැටියෙ සත්ත්වයෙක් නැහැ. එතනම ඉවරයි. නමුත් අර සත්ත්ව කියන එක ලෝකයා සාමාන්‍යයෙන් හිතන්නේ ආත්ම සංඥාවත් එක්ක. ආත්මයක් හැටියටයි සත්ත්ව කියන එක සළකන්නේ. සදාකාලික වෙනස් වන්නේ නැති යමක් අරටුවක් වගේ දෙයක් හරයක් මෙතන තියනවා කියලයි ලෝකයා හිතන්නේ. එක්කෝ රූපයේ, එක්කෝ වේදනාවේ එහෙමත් නැත්නම් අවසාන වශයෙන් විඤ්ඤාණයේ හරි යම්කිසි නොවෙනස්වන පදාර්ථයක් තිබෙනවා කියන අදහසයි මිථ්‍යාදෘෂ්ටිකයින් තුළ, සක්කාය දිට්ඨි ගත්තු අය තුළ, තිබෙන්නේ. බුදුරජාණන් වහන්සේ පෙන්නුවා විඤ්ඤාණයේවත් නැහැ එහෙම එකක් කියලා. එතන තිබෙන්නේ අර අවිද්‍යාව නිසාත් තණ්හාව නිසාත් ඇතිකර ගත්තු ග්‍රහණයක් උපාදානයක් පමණයි. ඒ උපාදානය ඇතිතාක්,- උපාදානය ඇතිතාක් ඒ සත්ත්ව ප්‍රඥප්තියට සම්මුතියක් වශයෙන් ඒ තැනැත්තා හිමියි. ඒ තැනැත්තා අයිතිවාසිකම් කියනව. මොකද ඒකෙ වගකීමක් තියෙනව. ඒකයි සංසාරයේ දිගින් දිගට යන්නේ. උපාදානය නිසාම භවයක් තිබෙනව. අර ගින්න පැතිරෙන්නා වගේ. එතකොට ගින්න පැතිරෙන ඒ ඔක්කොම දර ඉවර නම්, පහනක තෙලුත් ඉවර නම්, තිරයත් ඉවර නම්, මොකක්ද වෙන්නේ ?.

**"ඛීණං පුරාණං නවං නත්‍ථි සම්භවං**
**විරත්ත චිත්තා ආයතිකෙ භවස්මිං**
**තෙ ඛීණ බීජා අවිරූළ්හිච්ඡන්‍දා**
**නිබ්බන්ති ධීරා යථායම්පදීපො"**

ඔය ගාථාවේ තිබෙනවා ඔන්න අර කියාපු කතාන්දරය. "ඛීණං පුරාණං" අතීත දේ ඉවරයි. "නවං නත්ථි සම්භවං" අලුතින් ඇතිවන්නේ නැහැ මොකක්වත්. 'විරත්ත චිත්තා ආයතිකෙ භවස්මිං' නැවත උත්පත්තියක් පිළිබඳ ඇල්මක් ආශාවක් නැහැ. "තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා" ඒ විඤ්ඤාණ බීජය ක්ෂය වෙලා ඒ නිසා ඡන්දය පැන නඟින්නේ නැහැ. 'අවිරූළ්හිච්ඡන්දා' ආශාවන් පැන නඟින්නේ නැහැ. "නිබ්බන්ති ධීරා යථා යම්පදීපො" මේ පහන වගේ ඒ ධීර පුද්ගලයෝ නිවී යත්.

ඔන්න ඕකයි එතකොට මේ **'ලොකවිදූ'** කියන වචනය අපි ඔය විදියටයි තේරුවේ. මේ කාලයේ නොයෙකුත් ආකාරයට තේරුම් ගන්න පුළුවන්. තේරුම් කරන්න ඉඩ තිබෙනවා. නමුත් ඔන්න ඔය අංශය දක්වන්න සිද්ධවුනේ මේ ප්‍රඥා චක්ෂුසයට අපි විශේෂ තැනක් දෙන නිසයි.

එතකොට මේ පින්වතුන් කල්පනා කරන්න ඕනෑ අපට කරන්න තියෙන්නේ මොකක්ද කියලා. රෝහිතස්සලා වෙනවාද? එහෙම නැත්නම් මෙන්න මේ බුදුරජාණන් වහන්සේ කියාපු මාර්ගයේ යනවාද කියන එක තමන් තීරණය කරගන්න ඕනෑ.

අද මේ වගේ වටිනා වෙසක් පෝය දවසේ මේ පින්වත් පිරිස ඒ තමන්ගේ එදිනෙදා දින චරියාවෙන් සමු අරගෙන, තාවකාලිකව හරි මේ විදියේ වටිනා සීලයක් සමාදන් වෙලා භාවනානුයෝගීව ඉඳලා මේ අවස්ථාවේ විදර්ශනාවට උපකාරවන, භාවනාවට උපකාරවන යම්කිසි ධර්ම දේශනාවකට සවන් දුන්නා. එතකොට මෙතෙක් මේ රැස්කර ගත්තු කුසල සම්භාරය පිහිට කරගෙන තමන් කළ භාවනාවත් උපකාර කරගෙන කළ්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් හැකිතාක් ඉක්මණින් මේ ශාසන පහන නිවෙන්න කලින් අර කියාපු සෝවාන් සකදාගාමී අනාගාමී අර්හත් කියන මාර්ග ඵල ප්‍රතිවේධයෙන් සංසාර දුක කෙළවර කර ලෝකයේ උතුම් කෙළවරට පැමිණෙන්න ශක්තිය බලය ලැබේවා!. ධර්ම ශ්‍රවණ ආනිශංසයත් ඒකට උපනිශ්‍රය වේවා! කියල ප්‍රාර්ථනා කරගන්න ඕන. එසේම යම්තාක් කෙනෙක් ලෝකයේ අවීචියේ සිට අකනිටාව දක්වා මෙම ධර්මදේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට කැමති නම් ඒ හැමදෙනාමත් අනුමෝදන්වීම තුළින් තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් ඉක්මණින්ම ඒ සසර දුක් කෙළවර කර ගනිත්වා! කියා ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

**"එත්තාවතාච අම්හෙහි .........."**



# 32 වන දේශනය

# 32 වන දේශනය

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

අයොඝන හතස්සෙව - ජලතො ජාතවෙදසො
අනුපුබ්බූපසන්තස්ස - යථා න ඤායතෙ ගති

එවං සම්මා විමුත්තානං - කාම බන්ධොඝතාරිනං
පඤ්ඤාපෙතුං ගති නත්ථි - පත්තානං අචලං සුඛං

- උදාන, පාටලිගාමියවග්ග

සැදැහැවත් පින්වතුනි.

තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ සොයාගත්තු ඒ සංසාර විමුක්තිය අපි කවුරුත් නිවන නමින් හඳුන්වනවා. මේ සංසාර විමුක්තිය කොයි විදියේ එකක්ද කියන එක ලෝකයාට පැහැදිලි කර දෙන්නත් බුදුරජාණන් වහන්සේ ඇතැම් අවස්ථාවල විශේෂ උත්සාහයක් දැරුවා. දබ්බමල්ල පුත්ත මහරහතන් වහන්සේගේ පරිනිර්වාණයත් ඒ වගේ අවස්ථාවක්. ඒ අවස්ථාව නිමිතිකරගෙන බුදුරජාණන් වහන්සේ වදාළ අතිවිශේෂ ගාථා දෙකක් තමයි අද අපි මාතෘකාව හැටියට තබා ගත්තෙ.

දබ්බමල්ලපුත්ත මහරහතන් වහන්සේ කියලා කියන්නේ මේ ශාසනයේ සිටිය ආශ්චර්යවත් ස්වාමීන් වහන්සේ නමක්. උන් වහන්සේගේ ජීවිතයේ ආරම්භයත් ආශ්චර්යවත්, අවසානයත් ආශ්චර්යවත්. උන් වහන්සේ උපන්නේ මව කළුරිය කළාට පස්සේ. ඒ කියන්නේ, උන් වහන්සේ මව් කුසේ සිටියදී හදිසි ආබාධයකින් මව කළුරිය කළා. එහෙම නැත්නම් පණ හැංගෙන්න ඇති. මොන හේතුවකින් හරි ඥාතීන් ඒ ගැබිණි මවගේ ශරීරය ගෙනිහිල්ලා දර සෑයක තබලා ගිනිදැල්වූවාට පස්සේ අර ගිනි දැල්ල උදර පටලයට වැදිලා උදර පටලය පැලිලා අර දරුවා එළියට විසිවෙලා කොටයක් උඩට වැටුනා. ඥාතීන් මේ දරුවා අරගෙන මිත්තණියට භාර කළා. ඒ දරුවාට 'දබ්බ' කියන නම දුන්නේ අර කොටේකට වැටිල ජීවිතය ආරක්ෂා වුන නිසා කියලා කියනවා. 'දබ්බ' කියලා ද්‍රව්‍යවලටත් කියනවා, ලී වලටත් කියනවා. ඉතින් මේ දබ්බමල්ලපුත්ත, මල්ල කියලා කියන්නේ මල්ල පරම්පරාවේ කෙනෙක්, මල්ල රටේ. මේ කුමාරයාට අවුරුදු හත වන විට බුදුරජාණන් වහන්සේ මල්ල රටට වැඩම කළා. වැඩම කරලා අනුපිය අඹ වනයෙහි වැඩ වාසය කළා. ඒ අවස්ථාවේ මේ දරුවා බුදුරජාණන් වහන්සේ දැකලා පැහැදිලා පැවිද්දට අවසර ලබා ගත්තා. පැවිදි කරන අවස්ථාවේ ඒ කාලයේත් මේ කාලයේ වගේම චාරිත්‍රයක්





හැටියට තචපංචක කර්මස්ථානය දුන්නා, ඒ උපාධ්‍යායයන් වහන්සේ. තචපංචක කර්ම ස්ථානය කියල කියන්නේ කේසා, ලෝමා, නඛා, දන්තා, තචෝ කියන ශරීරයේ කුණප කොට්ඨාශ පහ පිළිබඳව මෙනෙහි කිරීමයි. කෙස් කපන්න ආරම්භ වුන අවස්ථාවේම සොවාන් ඵලයට පත් වූ බවත් කෙස් කපලා අවසානයේදී කරගෙයිදීම රහත් වූ බවත් සඳහන් වෙනවා. උන් වහන්සේ එතකොට පැවිදිවෙන අවස්ථාවේදීම රහත්වෙලා ඉවරයි. පැවිදි කෘත්‍යය අවසානයි හිස බාලා අවසාන වෙනකොට.

ඉතින් ඒක නිසා උන්වහන්සේ විවේකව සිටින අවස්ථාවක මේ විධියේ අදහසක් ඇතිවුනා. මම යම් පරමාර්ථයක් සඳහා ද මහණ වුනේ ඒක දැන් සිද්ධවෙලා ඉවරයි. සංඝයාට යම්කිසි වතාවතක් කරනවා නම් හොඳයි කියලා ඒ අදහස ඇවිල්ලා උන්වහන්සේ කල්පනා කළා. මම සංඝයාට 'සේනාසන පඤ්ඤාපක' කියන සේනාසන පැනවීමේ වතත්, 'භත්තුද්දෙසක' කියන ගිහියන්ගෙන් පැමිණෙන දාන ආරාධනාවලට සංඝයා තෝරලා වෙන් වෙන්ව නියම කිරීමේ වතත් ලබා ගන්න ඕනෑ කියලා බුදුරජාණන් වහන්සේට ඒ කාරණය ප්‍රකාශ කළාම සාධු! සාධු!! කියලා ඒ ගැන ප්‍රශංසාව පළකරලා සංඝයා වහන්සේලා රැස්කරලා සංඝ සම්මුතියෙන් ඒ කියාපු තනතුරු දෙක දුන්නා. ඒ කියන්නේ ආගන්තුකව පැමිණෙන සංඝයා වහන්සේලාට සෙනසුන් පැනවීමත් ගිහියන්ගෙන් පැමිණෙන දාන ආරාධනා අනුව සංඝයා වහන්සේලා ක්‍රමානුකූලව ඒ ඒ තැන්වලට යැවීමත්. ඉතින් මේ කාරණා දෙක ඉතාම හොඳින් ඉෂ්ට කළා. විශේෂයෙන්ම සඳහන් වෙනවා අර සෙනසුන් පැනවීම පිළිබඳව උන් වහන්සේ ඉතාම කල්පනාකාරීව බුදුරජාණන් වහන්සේ බැහැදකින්න පැමිණෙන ආගන්තුක භික්ෂූන් වහන්සේලාගේ සිතුම් පැතුම් අනුව බලලා උන්වහන්සේලාට සුදුසු අන්දමින් ඒ ඒ තැන්වල සෙනසුන් පැනවූ බව සඳහන් වෙනවා. සූත්‍රාන්තික කියන සූත්‍ර රැකගැනීම සඳහා සජ්ඣායනා කරමින් ඒවා රැකගන්නා සංඝයා වහන්සේලා පැමිණියාම එකම තැනක සෙනසුන් පැනෙව්වා, රාත්‍රී කාලයේ මේ අය සූත්‍ර සජ්ඣායනා කරමින් සිටිත්වා කියලා. විනයධර සංඝයා වහන්සේලා පැමිණියාම ඒත් වෙනම තැනක ආසන පැනෙව්වා, උන් වහන්සේලා රාත්‍රී කාලයේ විනය පිළිබඳව ප්‍රශ්න සාකච්ඡා කරමින් සිටිත්වා කියල. ධර්මකථික සංඝයා වහන්සේලා පැමිණියාම උන්වහන්සේලාට ඒත් වෙනම තැනක ආසන පැනෙව්වා, මේ අය ධර්මය සාකච්ඡා කරමින් රාත්‍රී කාලය ගතකරත්වා කියල. තිරශ්චීන කථාවේ යෙදෙන, ශරීරය වැඩීම සඳහාම මහණවෙච්ච, සංඝයා වහන්සේලා ආගන්තුක හැටියට පැමිණියාම ඒ අයටත් වෙනම තැනක් පැනෙව්වා. මේ අය තමන්ට පුරුදු තිරශ්චීන කථා කියල කියන පහත් ඕප දූප කථාන්තර

කර කර රැය ගෙවත්වා කියලා. ඔන්න ඔය විධියට ඒ ඒ පුද්ගලයින්ගේ ස්වභාවය අනුව ගැලපෙන හැටියට සෙනසුන් පැනෙව්වා පමණක් නොවෙයි, විකාලයේ, රාත්‍රි කාලයේ, රෑවෙලා පැමිණියහම උන්වහන්සේ කරන්නේ මේ කාලයේ වගේ විදුලි ආලෝකය නැතත් තමන් වහන්සේගේ සමාපත්ති ශක්තිය තුළින් තේජෝධාතු සමාපත්තියට සමවැදී ඒ ආලෝකයෙන් සෙනසුන් පැනෙව්වා. ඉතින් ඈත ඉඳල සමහර සංඝයා වහන්සේලා පැමිණෙනවා මේ දබ්බමල්ලපුත්ත පොඩි රහතන් වහන්සේගේ ඍද්ධි බලය බලන්නෙයි කියලා. රෑවෙලාම එනවා හිතලම. ඇවිල්ලා ඉතින් කියනවා 'ඇවැත්නි දබ්බ ආයුෂ්මතුන් අපට සෙනසුන් පනවන්න' කියල. එතකොට අහනවා කොයි තැනක සෙනසුනටද කැමති? ඈත ඈත සෙනසුන් කියනවා. අපට ගිජ්ඣකූළ පව්වේ සෙනසුන් පනවන්න, ඉසිගිලි පව්වේ, වේභාර පර්වතයේ මද්දකුච්ඡි මිගදායේ, ජීවක අඹවනයේ අන්න ඒ තැන්වල අපට සෙනසුන් පනවන්න කියල ඉල්ලා සිටිනවා.

ඉතින් මේ ස්වාමීන් වහන්සේත් ඒ පිරිස එක්කගෙන යන්නේ කොහොමද? **ඇඟිලි ටෝච් එකෙන්.** තේජෝ ධාතු සමාපත්තියට සමවැදිලා මාපට ඇඟිල්ල ඉස්සරහට කරගෙන උන්වහන්සේ වැඩම කරනවා. අර පිරිස ඒ එළියෙන් ඒ සෙනසුන්වලට එක්කරගෙන ගිහිල්ලා මේ තියෙන්නේ ඇඳන්. මේ තියෙන්නේ පුටු, මේ තියෙන්නේ පැන්, ඒ ආදී වශයෙන් පෙන්නලා ආපසු වේළුවනාරාමයට වඩිනවා. ඉතින් ඒ විධියට දක්ෂ අන්දමින් සෙනසුන් පැනවීම නිසා බුදුරජාණන් වහන්සේ උන්වහන්සේ එතදග්ග තනතුරේ තැබුවා. සෙනසුන් පැනවීම පිළිබඳ දක්ෂ භික්ෂූන් වහන්සේලා අතර අග්‍ර ස්ථානය දී වදාළා මේ දබ්බමල්ලපුත්ත රහතන් වහන්සේට.

මේ තරම් ශ්‍රේෂ්ඨ ස්වාමීන් වහන්සේ කෙනෙක් නමුත් යම් යම් කර්ම හේතූන් නිසා උන්වහන්සේ වැඩි කල් ජීවත් වුනේ නැහැ. තරුණ වයසේදීම උන්වහන්සේට පරිනිර්වාණයට අවස්ථාව පැමිණියා. ඉතින් ඒ අවස්ථාව වන විටත් බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ වැඩ සිටියා. උන්වහන්සේ බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ලා කිව්වා "සුගතයාණන් වහන්ස, මට පරිනිර්වාණයට වෙලාව ඇවිල්ලා තියනවා" කියලා. බුදුරජාණන් වහන්සේ කිව්වා 'යමකට වෙලාව ඇවිල්ලා තියනවා නම් ඒක කරන එකයි තියෙන්නේ දබ්බ' කියලා. ඒක කිව්ව විතරයි දබ්බමල්ලපුත්ත මහරහතන් වහන්සේ ආසනයෙන් නැඟිටලා බුදුරජාණන් වහන්සේට වැඳලා පැදකුණු කරලා, අහසට පැන නැඟිලා, පර්යංකයෙන් ඉඳගෙන තේජෝ ධාතු සමාපත්තියට සමවැදිල එයින් නැඟිටලා පිරිනිවන් පෑවා. අර තේජෝ ධාතු සමාපත්ති ශක්තිය තුළින් උන්වහන්සේ තමන්ගේ ශරීරයට ගිනිදැල්ලූවා. එතකොට අහසේදීම ආදාහනය වුනා. **ආදාහනය





ඉවර වෙනකොට අළුත් නැහැ, දැලිත් නැහැ.** අළු ඉතුරු වුනෙත් නැහැ, දැලි ඉතුරු වුනෙත් නැහැ. අපට වන්දනා මාන කරන්න ධාතූන් වහන්සේලාවත් ඉතුරු කළේ නැහැ.

ඉතින් මේක අති විශේෂ සිද්ධියක් නිසා බුදුරජාණන් වහන්සේ ඒ අවස්ථාවේ උදානගාථාවක්, ප්‍රීති වාක්‍යයක්, ප්‍රකාශ කළා. දැන් මේ කාලයේ නම් එහෙම දෙයක් වුනාම ශෝක ප්‍රකාශ. බුදුරජාණන් වහන්සේ ප්‍රීති වාක්‍යයක් ප්‍රකාශ කළා. මොකක්ද ඒ?

**අභෙදි කායො නිරොධි සඤ්ඤා**
**වෙදනා සීතිභවිංසු සබ්බා**
**වූපසමිංසු සංඛාරා**
**විඤ්ඤාණං අත්ථමගමා**

'අභෙදි කායො' කය බිඳී ගියා. 'නිරොධි සඤ්ඤා' සඤ්ඤාව නිරුද්ධ වුනා. 'වෙදනා සීතිභවිංසු සබ්බා' සියලු වේදනා සිසිල් වුනා. ගින්නෙන් දැවුවට මොකද රත්වුනේ නැහැ. සිසිල් වුනා. 'වූපසමිංසු සංඛාරා' සංස්කාර සංසිඳුනා. "විඤ්ඤාණං අත්ථං අගමා" - විඤ්ඤාණය අස්තයට ගියා. කෙළවර වුනා.

ඒ උදාන ගාථාව එතන ප්‍රකාශයට පත්කළා පමණක් නොවෙයි ඒ සිද්ධිය කොතරම් විශේෂ දෙයක්ද කියතොත් බුදුරජාණන් වහන්සේ යම් අවස්ථාවක සැවැත් නුවර ජේතවනාරාමයට වැඩම කළාද, ඒ අවස්ථාවේ ඒ අර සිද්ධිය මතක් කරලා සංඝයා වහන්සේලාට "මහණෙනි මේ අපේ දබ්බ මේ විදියට පරිනිර්වාණයට පත්වුනා. ඒ අවස්ථාවේ දැවුනු ශරීරයේ අළු ඉතුරු වුනෙත් නැහැ. දැලි ඉතුරු වුනෙත් නැහැ" කියල ඒ කාරණය සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරල ඔන්න අපි මේ මාතෘකා කරගත්ත මේ අතිවිශේෂ ගාථා දෙක ඒ අවස්ථාවෙයි වදාළෙ.

**අයොඝන හතස්සෙව**
**ජලතො ජාතවෙදසො**
**අනුපුබ්බූපසන්තස්ස**
**යථා න ඤායතෙ ගති**

'අයොඝන හතස්සෙව' මේ වචනය අටුවාචාරීන් වහන්සේලා එහෙම තේරුම් ගන්න අමාරු පදයක් හැටියට දක්වනවා. අපට වැටහෙන හැටියට නම් මෙතන මේ කියන්නේ ගිනිගත්තු යකඩ ගුලියක් වගේ දැල්වෙන්නා වූ ගින්නක්. ගිනිදැල්ලක් දක්කාම ඒක හරියට යකඩ ගුලියක් වගේ හැසී ගැවසිල තියෙන කොට ඒ විදියට පෙනෙනවා. 'අයොඝන හතස්සෙව -

'ජලතො ජාත වෙදසො', ජාතවෙද කියල කියන්නේ ගින්න. එතකොට ගිනිගත්තු යකඩ ගුලියක් වගේ ඝන විදියටම දල්වෙන්නා වූ ගින්නක්. 'අනුපුබ්බූපසන්තස්ස' ක්‍රම ක්‍රමයෙන් නිවී ගියාට පස්සෙ 'යථා න ඤායතෙ ගති' ඒ ගිනිදැල්ල කොහේ ගියාද කියලා ඒ ගිය මඟක් දැනගත නොහැකි වේද,

**එවං සම්මා විමුත්තානං**
**කාම බන්ධොඝතාරිනං**
**පඤ්ඤාපෙතුං ගති නත්ථි**
**පත්තානං අචලං සුඛං**

'එවං සම්මා විමුත්තානං' එසේම මැනවින් විමුක්ත වූ 'කාම බන්ධොඝතාරිනං' කාම බන්ධනයන් නමැති සැඩ පහරින් එතර වූ, 'පත්තානං අචලං සුඛං' අචල සුඛයට පත් වූ ඒ රහතන් වහන්සේලාගේ 'පඤ්ඤාපෙතුං ගති නත්ථි' ගිය මඟක් පැනවීමට නැත. අහවල් මඟින් ගියයි කියලා මඟක් පෙන්නුම් කරන්න බැරිය, කියන කාරණයයි මේ දෙවෙනි ගාථාවෙන් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ.

ඉතින් ඔන්න අප හමුවේ තියෙන්නෙ දැන් එතකොට මෙන්න මේ පරිනිර්වාණය පිළිබඳ ප්‍රශ්නයයි. මේ දබ්බමල්ලපුත්ත මහරහතන් වහන්සේගේ පරිනිර්වාණය යම්කිසි ආකාරයකින් ආදර්ශවත් පරිනිර්වාණයක්. මොකද, යමක් ඉතිරි කළේ නැහැ. උන්වහන්සේට ගෙන යන්න යමක් ඉතිරි කරගත්තු බවකුත් නැහැ. ඇයි, රූප, වේදනා, සංඥා, සංඛාර විඤ්ඤාණ ඔක්කොම ඉවරයි නේ. අපට යමක් ඉතිරි කළෙත් නැහැ. ආදාහනය කරන්න, ධාතු චෛත්‍ය බඳින්න මොකුත් ඉතිරි කළේ නැහැ. අංග සම්පූර්ණ පරිනිර්වාණයක්. ඒක නිසා වෙන්න ඇති බුදුරජාණන් වහන්සේ මේ සිද්ධිය සම්බන්ධයෙන් අර විදියට අවස්ථා දෙකකදීම උදාන ගාථා, ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කළේ.

දැන් මේක කියන කොට ඇතැම් කෙනෙකුට භය ඇතිවෙන්න පුළුවන්. මොකද අපි දන්නවා අපි නිතර දැකලා තිබෙනවා මරණ දැන්වීම්වල එහෙම **'පරලෝ සැපත් සියදෝරිස් උපාසක මහතාට නිවන් සැප ලැබේවා'** කියලා. අපි සාමාන්‍යයෙන් හිතාගෙන හිටින හැටියට පරලෝ සැපත් උනාට පස්සෙ තමයි මෙලොවදී ලබා නොගත්තු නිවන ලැබෙන්නේ. අපි විතරක් නොවෙයි කොටින්ම කියතොත් මේ කාලෙ නිවන ගැන හිතන මතන දෙසන කියන තර්ක කරන පිරිසගෙන් සියයට අනූපහටත් වැඩිය කෙනෙක් අන්න අර සියදෝරිස් අප්පුහාමිගෙ නිවනට තමයි තැනදෙන්නේ. මරණින් මතු බුදු, රහතුන් වහන්සේලාත් ඒ යම් කෙනෙක් නිවන් දුටුවා





නම්, ඇත්ත වශයෙන් ඒ අය කියන්නේ අමා මහ නිවන් පුරය තියෙන්නේ මරණින් පස්සේ යන තැනකය කියලා. අමාමහ නිවන් පුරය කොහේද කියලා නම් අහන්න එපා. නමුත් තියෙන්නේ නම් මරණින් පස්සේ. එතනටයි කවුරුත් යන්න ඕනෑ. ඔන්න ඔය කතන්දරයයි තියෙන්නේ.

මේක කොයි තරම් දුරට පිළිගත හැකිද කියන එකයි දැන් අපට විමසන්න තියෙන්නේ. දැන් මේ ගාථා තුළින්ම පේනවා බුදුරජාණන් වහන්සේ මේ දීපු 'අයොඝන හතසෙසව - ජලතො ජාත වෙදසො' මෙතන 'ඝන' කියන වචනය තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ මුළාවට හේතුව මේ ලෝකයා තුළ තිබෙනවා භව දෘෂ්ටියක්. සත්කාය දෘෂ්ටියක් තියෙනවා. මේ හැම එකක්ම රූප වේදනාදිය ආත්ම හැටියට ගන්නවා. විශේෂයෙන්ම විඤ්ඤාණය ආත්මය හැටියට ගන්නවා. නොපෙනෙන විඤ්ඤාණය. ඒක නිසා අපට සසර දුක් කෙළවර කරගන්නත් ඕන. හැබැයි භවයේ ඉන්නත් ඕන, මොන ආකාරයකින් හරි. ඔන්න ඔය දෙකම කරන්න ඕන. රැවුලයි කැඳයි වගේ කථාවක් මෙතන තියෙන්නේ. ඉතින් ඒකට හරියන්න අපි ඉතින් අමාමහ නිවන්පුරයක් කොහොම හරි තර්කයෙන් ඉදිරිපත් කරන්න උත්සාහ කරනවා. නමුත් මෙතන බුදුරජාණන් වහන්සේ පැහැදිලිවම ප්‍රකාශ කරලා තියෙනවා අන්න අර නිවී ගිය ගින්න පිළිබඳව 'අයොඝන හතසෙසව' ඝන යකඩ ගුලියක් වගේ ඇත්ත වශයෙන්ම ගිනිදැල්ලක් දල්වෙන කොට. සාමාන්‍ය පුද්ගලයෙක් යකඩ ගුලියක් දල්වෙනවා කියලා හිතයි. අන්න අර සාමාන්‍ය පෘථග්ජනයාගේ දෘෂ්ටිය එතනින් පෙන්නුම් කළා. නමුත් ඒ විදියට දල්වුනු ගිනිදැල්ලක් පවා නිවුනාට පස්සෙ ගියමඟක් දක්වන්න බැහැ. කොහේද ගියේ කියලා. ගින්න නිවුනාට පස්සේ කොහේද ගියේ කියන ප්‍රශ්නය තුළිනුයි බුදුරජාණන් වහන්සේ රහතන් වහන්සේගේ මරණින් මතු තත්ත්වය පිළිබඳ නොයෙකුත් දෙනා ඇසූ ප්‍රශ්න වලට තීර්ථකයින් නිගණ්ඨකයින් වාදකාරයින් ඒ වගේ අයගේ ප්‍රශ්න වලට පිළිතුරු දුන්නේ. කොටින්ම **නිවන කියල කියන්නේ නිවීම බව බොහෝ දෙනාට අමතක වෙනවා. 'නිබ්බාන'.**

ඉතින් මේ නිවීම තුළ තිබෙන්නේ- බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන හැටියට මේ භවය එහෙම පිටින්ම විපරීත තත්ත්වයක්. මේක ගින්නක් වගෙයි. උපාදාන නිසා, අල්ලා ගැනීම් නිසා පවතින ගින්නක් වගේ. මෙන්න මේ ගින්න නිවුන තැනයි එතකොට නිවන කියන්නෙ. අපි නිවුන තැන කියලා කිව්වාට ඒක නිවීමමයි. එතකොට **මරණින් පස්සේ නිවීමක් නොවෙයි මෙතන කියන්නේ.** මරණින් පස්සේ යන නිවනක් නෙවෙයි. කොටින්ම කියතොත් බුදුරජාණන් වහන්සේ උදුම්බරික සීහනාද සූත්‍රයේ සිංහ නාදයන් පවත්වලා තිබෙනවා.

**බුද්ධො සො භගවා බොධාය ධම්මං දෙසෙති**
**දන්තො සො භගවා දමථාය ධම්මං දෙසෙති**
**සන්තො සො භගවා සමථාය ධම්මං දෙසෙති**
**තිණ්ණො සො භගවා තරණාය ධම්මං දෙසෙති**
**පරිනිබ්බුතො සො භගවා පරිනිබ්බානාය ධම්මං දෙසෙති**

බුද්ධ කියලා අපි ගත්තොත් අවබෝධ කරගත්. අවබෝධ කරගත්තු ඒ බුදුරජාණන් වහන්සේ අවබෝධය සඳහා ධර්මය දේශනා කරනවා. දමනය වූ භාග්‍යවතුන් වහන්සේ දමනය සඳහා ධර්මය දේශනා කරනවා. සමනය කරගත්, කෙලෙස් ආදිය සමනය කරගත්, භාග්‍යවතුන් වහන්සේ සමනය කරවීම සඳහා ධර්මය දේශනා කරනවා. සසරින් එතර වූ භාග්‍යවතුන් වහන්සේ සසරින් එතර කිරීම සඳහා ධර්මය දේශනා කරනවා. නමුත් ඊළඟට තියෙනවා 'පරිනිබ්බුතො සො භගවා පරිනිබ්බානාය ධම්මං දෙසෙති'. පරිනිර්වාණයට පත්වූ භාග්‍යවතුන් වහන්සේ පරිනිර්වාණය සඳහා ධර්මය දේශනා කරනවා. මේක මහා ගැටළුවක්. අපි දැන් පරිනිර්වාණය මරණින් මතු තත්ත්වයක් හැටියට ගත්තොත් කොහොමද පරිනිර්වාණයට පත්වුනාට පස්සෙ ධර්මය දේශනා කරන්නේ? **මෙයින් අපට පෙනෙනවා 'පරිනිබ්බාන' කියන තත්ත්වය මෙලොවදීම ප්‍රත්‍යක්ෂ කරගන්න එකක්.**

රහතන් වහන්සේලාත්- දැන් මේ අපි දක්වපු දබ්බමල්ල පුත්ත රහතන් වහන්සේ ගැන හිතුවත් උන්වහන්සේ අර තේජෝ ධාතු සමාපත්තියට සමවැදිලා ඒ ශක්තිය ඇති කරගෙන පිරිනිවන් පෑවා කියල කියන්නේ අන්න හිත අර විමුක්ත තත්ත්වයට ගත්තා. හිත ශරීරයෙන් වෙන්කර ගත්තා. දැන් මේ ශරීරයෙන් ඉවත් කරගත්තු ඇඳුමක් ගිනි තියන්නා වගේ තමයි උන්වහන්සේ ශරීරයට ගිනි දල්වා ගත්තේ. රත්වීමක් නොවේ ඒ වෙනුවට වේදනා සිසිල්වීමක් එතන කියවෙනවා. **ඒ සිසිල්වීම ආදිය සිදුවුනේ අර පරිනිර්වානය තුළින්. ඒකයි පරිනිර්වාන තත්ත්වය.**

නමුත් බොහෝ දෙනෙක් මේ විදියෙ තැන්වලදී පෙන්නුම් කරනවා ඒ පරිනිර්වානයට පත්වෙන බුදු, පසේබුදු, රහතන් වහන්සේලා ගිහිල්ල යම්කිසි තැනක එකතු වෙනවා කියලා. මේකට සාධක වශයෙන් දක්වන එක්තරා සූත්‍රයක් තියනවා බොහෝ දෙනා මතුකරන, **පහාරාද කියන සූත්‍රය.** පහාරාද කියන අසුරෙන්ද්‍රයා බුදුරජාණන් වහන්සේ සමඟ කළ සාකච්ඡාවක්. එතෙන්දී ඒ අසුරේන්ද්‍රයා පළමුවෙන් ප්‍රකාශ කරනවා බුදුරජාණන් වහන්සේගේ ඉල්ලීමක් අනුව මේ මහා සමුද්‍රයේ ආශ්චර්ය අද්භූත කාරණා අටක් දකලා අසුරයින් මහා සමුද්‍රය ගැන පැහැදෙනවා, සතුටු වෙනවා කියලා. ඒ කාරණා අටම නොවේ අපි මේ පස්වෙනි





කාරණයයි මෙතන මතු කරන්නේ, මෙතැනට අදාළ වන නිසා. අසුරේන්ද්‍රයා කියනවා යම්සේ ලෝකයේ තිබෙනතාක් ගංගාවල් මූදට ගලාගෙන ගියත් අහසින් වර්ෂාව වැටුනත් මේ මහා සමුද්‍රය පිරෙන්නේ නැත. අන්න ඒ කාරණය නිසා අසුරයින් මහා සමුද්‍රය ගැන සතුටු වෙනවය. ඒකට සමාන කරලා බුදුරජාණන් වහන්සේත් අර මහා සමුද්‍රයේ ආශ්චර්ය අද්භූත කාරණා අට වගේ මේ ධර්ම විනයේත් ආශ්චර්ය අද්භූත කාරණා අටක් තියෙනවා කියලා ඊළඟට පෙන්නුම් කරනවා. ඒ අතර පස්වෙනි කාරණයට දක්වන්නේ අන්න අර ගංගාවල් ගලාගන ඇවිත් මුහුද පිරෙන්නේ නැතිවා වගේ බොහෝ භික්ෂූන් වහන්සේලා අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් පරිනිර්වාණයට පත්වුවත් නිර්වාණ ධාතුවේ අඩුවක් හෝ වැඩියක් පෙනෙන්නේ නැත. අඩුවීමක් වැඩිවීමක් පෙනෙන්නෙ නැත. ඔන්න ඔය පාඨය ආශ්‍රය කරගෙන බොහෝ දෙනා කල්පනා කරනවා අනුපාදිසේස පරිනිබ්බාන කියන තැනකට රහතන් වහන්සේලා ගිහිල්ලා එකතුවෙනවාය, කොච්චර ගියත් ඒක පිරෙන්නේ නැත. නමුත් මේ තර්කය වැරදි බව අටවෙනි ආශ්චර්ය අද්භූත කාරණය විස්තර කරන තැනින්ම පේනවා.

අටවෙනි කාරණය දක්වන්නේ, අර අසුරේන්ද්‍රයා කියනවා මේ මහා සමුද්‍රයේ ඉන්නවා මහා විශාල ශරීර ඇති අය. ඒ කාලයේ ඔය තල්මසුන් වගේ විශාල සතුන් වෙනුවට සඳහන් වෙනවා තිමිංගල, තිමිර පිංගල, අසුර, නාග, ගාන්ධර්ව ආදී විශාල ශරීර ඇති සත්ත්වයින් මේ මහා සමුද්‍රයෙ ඉන්නවා. ඒකත් ආශ්චර්ය අද්භූත කාරණයක් අසුරයින් සතුටු වෙන. බුදුරජාණන් වහන්සේ ඒකට සමාන කරලා කියනවා මේ ධර්ම විනයේත් ඉන්නවා මහා ශරීර ඇති සත්ත්වයින් කොටසක්. කවුද ඒ? ඒ සත්ත්වයින් හඳුන්වන්නේ අෂ්ටායෂ්ට පුද්ගල සංඝරත්නය හැටියට. ආර්ය පුද්ගලයින් අටදෙනා. සෝවාන් ඵලයට පැමිණි පුද්ගලයා, සෝවාන් මාර්ගයේ හික්මෙන පුද්ගලයා, ඒ විධියට සකදාගාමී සකදාගාමී මාර්ගීය ඒ විදියට අර්හත් සහ අර්හත් මාර්ගීය මේ පින්වතුන් දන්නවානේ. අෂ්ටායෂ්ට පුද්ගල කියල කියන්නෙ. **අන්න ඒ අටදෙනයි මෙතන ඉන්නේ. අර පිරිනිවන් පෑ රහතන් වහන්සේ මෙතන නැහැ.** එතකොට මේක හොඳ අවස්ථාවක්. අර මහා සමුද්‍රයේ ඉන්න අය දක්වන වෙලාවේ ඇයි අර පිරිනිවන් පෑව රහතන් වහන්සේ ගැන මෙතන සඳහන් වෙන්නේ නැත්තේ? එතකොට අපි මේක කොහොමද තේරුම් ගන්නේ, අර පළමුවෙන් කියපු කාරණය?

දැන් අපි කල්පනා කරන්න ඕන මුහුදේ සමහර විට දියසුළි තිබෙනවා. ඔය දියසුළි තිබ්ලා යම් අවස්ථාවක දියසුළි නැතිවුනයි කියලා හිතමු. එතකොට මුහුදේ වතුර අඩුවීමකුත් නැහැ. වැඩිවීමකුත් නැහැ. ඇත්ත

වශයෙන්ම මේ ධර්මයේ තිබෙනවා ඉතාමත්ම ගැඹුරු සංකල්පයක්. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා මේ පැවැත්ම කියන එක විපරීත තත්ත්වයක්. අපි සාමාන්‍යයෙන් නියම තත්ත්වය කියල හිතන එක බුදුරජාණන් වහන්සේලාට ආර්යයන් වහන්සේලාට අසත්‍යයයි. **ලෝකයා සත්‍යයැයි කියන එක ආර්යයන් වහන්සේලාට අසත්‍යයි. ආර්යයන් වහන්සේලා සත්‍යයයි කියන එක ලෝකයාට අසත්‍යයි.** ඒක බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක ප්‍රකාශ කළා. දැන් මෙතනත් ලෝකයේ පැවැත්ම ලොකුවට ගත්තාට ඒක බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනව විපරීත තත්ත්වයක් හැටියට. ඒක බුදුරජාණන් වහන්සේ දක්වන්නේ **මේ ලෝකයේ ඉපදීම්, මැරීම්, පැවැත්ම ආදී හැම සංකල්පයක්ම තියෙන්නේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර කරකැවෙන දියසුළියක් තුළයි** කියලයි. බුදුරජාණන් වහන්සේ ඒකට 'වට්ට' කියල කියනවා. 'වට්ටං වට්ටති' 'වට්ටං වට්ටති ඉත්ථත්තං පඤ්ඤාපනාය' යම්කිසි තැනක් කියලා පෙන්නුම් කරන්න දිය සුළියක් කරකැවෙනවා, එතකොට දැන් මහමුහුදේ 'අතන මෙතන' කියලා පෙන්නුම් කරන්න පුළුවන් වෙන්නේ දියසුළි තියන කොටයි. නමුත් මේ දියසුළිය කියන එක විපරීත තත්ත්වයක්. යම්කිසි දියවැලක් ඒ ප්‍රධාන ජලකඳට විරුද්ධව යන්න උත්සාහ කරලා ඒක කරගන්න බැරි වුනාම වට රවුමේ කරකැවිලා තෙරපිලා ඇවිල්ලා විසිවෙලා ඊළඟට අන්තිමට පාතාලයක් වගේ හාරාගෙන හාරාගෙන යනවා. ඔහොමයි දිය සුළියක් හැදෙන්නේ.

ඒ වගේ තමයි මේ ලෝකයේ තිබෙන යථා ස්වභාවය අමතක කරලා සත්ත්වයා අවිද්‍යාව නිසා, අවිද්‍යාවත් තෘෂ්ණාවත් නිසා, සත්ත්වයන්ගේ විඤ්ඤාණය ක්‍රියාත්මක වෙලා අනිත්‍ය වූ ලේකයේ නිත්‍ය ස්වභාවයක් සොයාගෙන යනවා. අසුභ ලෝකයේ සුභ දෙයක් සොයාගෙන යනවා. දුක් සහිත ලෝකයේ සැප සොයාගෙන යනවා. අනාත්ම වූ තත්ත්වය තිබෙද්දී ආත්මය සොයාගෙන යනවා. ඔය විපල්ලාස හතරක් හැටියට ධර්මයේ දක්වන්නේ. අනිත්‍ය දේ නිත්‍ය හැටියට සළකනවා. අසුභ දේ සුභ හැටියට සලකනවා. දුක් සහිත දේ සැප හැටියට සළකනවා. අනාත්ම දේ ආත්ම හැටියට සළකනවා. ඔන්න ඔය විපරීත තත්ත්වය උඩ අන්න අර දියසුළිය සකස් වෙනවා. ඒ මේ පුද්ගලයා සත්ත්වයා කියලා කියන ඒ හැම කෙනෙක්ම දියසුළියක්. බුදුරජාණන් වහන්සේ කියලා අපි කීවත් බෝධිසත්ත්ව කාලය දීර්ඝ කාලයක් කරකැවුණු දිය සුළියක්ම තමයි ඒකත්. පසේ බුදුරජාණන් වහන්සේ කීවත් ඒත් දිය සුළියක්. ඔන්න ඔය විදියට ඒ දිය සුළි. රහතන් වහන්සේලාත් රහත් වීමට පෙර දියසුළි. අන්තිම අවස්ථාවේදී අන්න අර ප්‍රඥාව තුළින් තේරුම් ගන්නවා මෙන්න





මේ නිරර්ථක වටරවුමේ යාම. විඤ්ඤාණයත් නාමරූපයත් අතර කෙරෙන මෙන්න මේ වටරවුමේ යාමේ නිශ්ඵලතාව තේරුම් අරගෙන ඒවා ශූන්‍ය හැටියට දකලා එයින් හිත මුදාගත්තු අවස්ථාවෙයි අන්න දියසුළිය නැතිවෙන්නේ. **එතකොට දියසුළි කොච්චර නැතිවුනත් මුහුදේ වතුර අඩුවකුත් නැහැ. වැඩියකුත් නැහැ.** ඔන්න ඔය දිය සුළියේ කතාන්දරය තුළින් තමයි එතකොට අපට තේරුම් ගන්න තියෙන්නේ රහතන් වහන්සේලාට මොනවාද වෙන්නේ කියලා.

ඉතින් අර ගින්න නිවුනා කියන එක වගේ තමා. ගින්න නිවුනාට පස්සේ කොහේට හෝ ගියාය කියන හැඟීම මෝඩ හැඟීමක්. මෝඩ කියමනක්. ගින්නක් නිවුනාට පස්සේ ගියේ නැගෙනහිරටද බටහිරටද උතුරටද දකුණටද, උඩටද යටටද, කියලා කෙනෙක් ඇසුවොත් ඒක මෝඩ අදහසක්. ඒ වගේ තමයි හේතු ප්‍රත්‍යයන් නිසා යමක් පැවතුනා නම් ඒ හේතු ප්‍රත්‍ය ඉවත්කළ තැන නිරෝධයයි. බුදුරජාණන් වහන්සේ ඒකයි පෙන්නුම් කරන්නේ **'භව නිරොධො නිබ්බානං'** කියලා. **භව නිරෝධයමයි නිවන. භවනිරෝධයමයි නිවන. ඒ හැර වෙන අමුතු නිවනක් නැහැ. ඒ නිවන මෙලොවම ප්‍රත්‍යක්ෂ කරන බවයි බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ.**

ඒක නිසා තමයි මේ පින්වතුනුත් ඔය කොතෙකුත් සජ්ඣායනා කරන රතන සූත්‍රයේ තියෙන්නේ.

**ඛයං විරාගං අමතං පණීතං**
**යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො**
**න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි**

ඒ ගාථාවේ කියවෙනවා 'ඛයං' තණ්හාව ක්ෂය කිරීම, 'විරාගං' විරාග වූ, 'අමතං' අමෘතය. නිවනට නම් ඒ ඔක්කොම. 'අමතං' අන්න අමෘතය. එතකොට අමෘතය මෙලොව ම ලබන එකක්. 'අමතං පණීතං' ඒ ප්‍රණීත වූ අමෘතය 'යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො' ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ සමාධිය තුළින් ඒක ප්‍රත්‍යක්ෂ කරගත්තා. **ඒක නිසා තමයි රහතන් වහන්සේලා අමෘතය පරිභෝග කරනවා කියලා කියන්නේ. මරණින් මතු එන අමෘත තත්ත්වයක් නොවෙයි.** දැන් ඒ අමෘතයට හිත යොදා ගැනීම තුළින් තමයි ඒ දබ්බමල්ල පුත්ත රහතන් වහන්සේට අර මරණ වේදනාවක් ඇති නොවුනේ. මරණ වේදනාව ඇතිවෙන්නේ උපාදානය නිසයි. අල්ලා ගැනීම නිසයි. රූප වේදනා ආදී ස්කන්ධයන්ට ඇති ඇල්ම නිසයි. ඒවා ඉවත් කළ තැන නිවීමයි. එතන තියෙන්නේ නිවීමයි. ඒ තණ්හා ගින්නට අනුව එන උපාදානය නිසයි නැවත උත්පත්තියක් ඇති

වෙන්නේ. නැවත භවයක් ඇතිවෙන්නෙ. එතකොට ඒ භවය පවතින්නේ උපාදානය නිසයි. බුද්ධ වචනයට අනුව උපාදානය නැතිවුන තැන පිරිනිවීමයි. ඒකට තමා අනුපාදාපරිනිබ්බාන කියල කියන්නේ. ඉතින් ඔන්න ඕකයි තත්ත්වය. ඒක නිසා අපි තේරුම් ගන්න ඕන මේ පරිනිබ්බානය කියන එක. මේ පිරිනිවීම.

දැන් අතනත් පිරිනිවියා වූ භාග්‍යවතුන් වහන්සේ '**පිරිනිවීම සඳහා ධර්මය දේශනා කරන සේක**' කියල කිව්වා. නමුත් අද කාලයේ පරිනිර්වානය කියන කොට එක පාරටම හිතෙන්නේ රහතන් වහන්සේගේ මරණින් මතු තත්ත්වයක්. ඇත්ත වශයෙන්ම රහතන් වහන්සේගේ අවසාන සිතට එකතුවන්නේ ඔය ඵල සිතයි. ඒකට කියන්නේ අර්හත් ඵල සමාපත්තියයි. මේක කලින්ම ලබාගත්තු තත්ත්වයක්. මරණ අවස්ථාවේදීත් ඉදිරිපත් වෙනවා. ඒ ඉදිරිපත් කර ගැනීම තුළින් තමයි මාරයාව ජය ගන්නේ. ඉතින් මෙන්න මේ කාරණය අර ගාථාවේ පමණක් නොවෙයි තවත් තැන්වල සඳහන් වෙනවා. රතන සූත්‍රයේ සඳහන් වෙනවා.

**යම්බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං**
**සමාධිමානන්තරිකඤ්ඤමාහු**
**සමාධිනා තෙන සමො න විජ්ජති**

බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ යම් සමාධියක් විශේෂ වශයෙන් වර්ණනා කළ සේක්ද,යම් සමාධියකට නුවණැත්තෝ ආනන්තරික යැයි කියත්ද අන්න ඒ සමාධියට සමාන කරන්න කිසිම සමාධියක් නැත. 'සමාධිනා තෙන සමො න විජ්ජති' කිසිම ලෞකික සමාධියක් ඒ සමාධියට සම කරන්න බැහැ. **ඒ සමාධියට 'ගහන්න' සමාධියක් නැහැ**. අන්න ඒ තරම් පුදුම ලෝකෝත්තර සමාධියක් එතන කියන්නේ.

**'ඉදම්පි ධම්මෙ රතනං පණීතං'** ඒකයි ධර්මයේ ප්‍රණීත රත්න ස්වභාවය.

ඔන්න දැන් මේ කියාපු ආනන්තරික සමාධිය මොකක්ද කියන එක ගැන යමක් කියන්න සිද්ධවෙනවා. දැන් ඔය අර්හත්ඵලයට පැමිණෙන්න කලින්, එහෙම නැත්නම් මාර්ග සිත කියලා කියන්නේ විදර්ශනා ඥාන වඩලා ඒකේ උපරිම තත්ත්වයේදී ඒකට අනතුරුවම ඵලයට වැටෙනවා. ඒකයි ආනන්තරික සමාධිය කියලා කියන්නේ. යම් සමාධියකට අනතුරුවම ඵලයට පත්වනවාද ඒකම ආනන්තරික සමාධිය නමින් හඳුන්වනවා. ඒ මාර්ග සමාධිය, ඒක තමා ලෝකෝත්තර මාර්ග සමාධිය. කොටින්ම කියතොත් ආර්ය අෂ්ටාංගික මාර්ගය කියලා මේ පින්වතුන් නිතර ගන්න සම්මා දිට්ඨිය ආදී අංග අටම එක හිතක ප්‍රබල අන්දමින් ඇතිවන





අවස්ථාවක් තිබෙනවා. ඒක තුළින් තමයි කෙලෙස් කපාගෙන ගිහිල්ලා ලෝකයෙන් එතර වෙන්නේ. ලෝකෝත්තර සමාධිය නමින් හඳුන්වන්නේ ඒකයි. **අන්න ඒ ලෝකෝත්තර සමාධිය අතිවිශේෂ දෙයක්.**

ඒ බව හෙළිවන තවත් වටිනා සූත්‍රයක් තිබෙනවා. භද්දජි කියන ස්වාමීන් වහන්සේ එක් අවස්ථාවක ආනන්ද ස්වාමීන් වහන්සේ කොසඹෑ නුවර ඝෝසිතාරාමයේ වැඩවසන වෙලාවක හමුවන්න පැමිණියා. ආනන්ද ස්වාමීන් වහන්සේ භද්දජි ස්වාමීන් වහන්සේගෙන් අහනවා ප්‍රශ්න පහක්. ආයුෂ්මත් භද්දජි,

දර්ශනයන්ගෙන් **අග්‍රවූ දර්ශනය** මොකක්ද?
ශ්‍රවණයන්ගෙන් **අග්‍රවූ ශ්‍රවණය** මොකක්ද?
සැපයන්ගෙන් **අග්‍රවූ සැපය** මොකක්ද?
සංඥාවන්ගෙන් **අග්‍රවූ සංඥාව** මොකක්ද?
භවයන්ගෙන් **අග්‍රවූ භවය** මොකක්ද?

ඔය ප්‍රශ්න පහ ඇහුවාම භද්දජි හාමුදුරුවෝ පිළිතුරු දෙන්නේ මෙහෙමයි. වසවත්ති කියල බ්‍රහ්මයෙක් ඉන්නව. මහාබ්‍රහ්මයෙක්. ඔය මහා බ්‍රහ්මයා දැකීම තමයි දර්ශනයන්ගෙන් අග්‍ර වූ දර්ශනය. ඊළඟට අග්‍රවූ ශ්‍රවණය කියන එක තෝරන්නේ මෙහෙමයි. ආභස්සර කියල දේව නිකායක් තියනවා. ආභස්සර බ්‍රහ්මයින් ප්‍රීතිය අනුභව කරන කොටසක්. ආභස්සර බ්‍රහ්මයින් බ්‍රහ්ම ලෝකයේ. මේ ආභස්සර දෙවියන් විටින් විට ප්‍රීති වාක්‍ය නඟනවා. 'අහෝ සුඛං! අහෝ සුඛං!!" කොයි තරම් සැපයක්ද? කොයි තරම් සැපයක්ද? කියලා. යම් කෙනෙක් ඒ ආභස්සර දෙවියන්ගේ උදානය අහනව නම් අන්න ඒක තමයි ශ්‍රවණයන්ගෙන් අග්‍ර එක. ඊළඟට සැපයන්ගෙන් අග්‍ර වූ සැපය මොකක්ද කියන එක භද්දජි හාමුදුරුවෝ තෝරන්නේ මෙහෙමයි. සුභකිණ්ණ කියලා දේව නිකායක් සිටිනවා. ඒ සුභකිණ්ණ දෙවියන් පුදුම විධියේ සැපයක් විඳිනවා. ඒ විඳින සැපය තමයි සැප අතුරෙන් අග්‍ර වූ සැපය. ඊළඟට සංඥාවන්ගෙන් අග්‍ර සංඥාව තෝරන්නේ මෙහෙමයි. ආකිඤ්චඤ්ඤායතන කියල 'නත්ථි කිඤ්චි' 'නත්ථි කිඤ්චි' කියන අරමුණක් මුල් කරගෙන ඇතිකර ගන්න අරූප සමාපත්තියක් තියනවා. ඒ ආකිඤ්චඤ්ඤායතන බ්‍රහ්මයින්ගේ සංඥාව තමයි සංඥාවන්ගෙන් අග්‍ර. ඊළඟට භවයන්ගෙන් අග්‍ර එහෙම නැත්නම් භවයෙ කෙළවර මොකක්ද කියන එක තෝරන්නේ මෙහෙමයි. නේවසඤ්ඤානාසඤ්ඤායතන තත්ත්වය ලැබූ, ඒ කියන්නේ ඉහළම අරූප තත්ත්වය ලැබූ දෙවියන් නැත්නම් බ්‍රහ්මයින් ඉන්නවා. ඒ අයගේ නේවසඤ්ඤානාසඤ්ඤායතන තත්ත්වය තමයි භවයේ කෙළවර. ඉතින් මෙහෙම තේරුවාම ආනන්ද හාමුදුරුවෝ කියනවා 'ආයුෂ්මත් භද්දජිගෙ මේ විවරණය

තමයි බොහෝ දෙනා පිළිඅරගෙන තියෙන්නේ. ඔය විවරණය බොහෝදෙනාගේ අදහසට ගැලපෙනවා.' එතකොට භද්දජි හාමුදුරුවන්ට තේරුනා මේක නියම උත්තරය නොවන බව.

ඔන්න ඊළඟට ආරාධනා කරනවා 'ආයුෂ්මත් ආනන්ද බහුශ්‍රැතයි. ආයුෂ්මත් ආනන්දයන්ටම වැටහේවා මේ ප්‍රශ්නයන්ට පිළිතුරු.' ඔන්න ආරාධනය කරනවා හරි පිළිතුරු දෙන්න කියලා. එතකොට ආනන්ද හාමුදුරුවෝ කියනවා 'එහෙනං භද්දජි හොඳට කන් දෙන්න. මම කියන්නම්' ආනන්ද හාමුදුරුවෝ දෙන විවරණය මේකයි.

මොකක්ද දර්ශනයන්ගෙන් අග්‍ර කියන එක තෝරන්නෙ මෙහෙමයි. යම් ආකාරයකින් දකිමින් සිටියදී ඉන් අනතුරුවම ආශ්‍රවයන්ගේ ක්ෂය වීම වේද - එතන සඳහන් වෙනවා 'යථා පස්සතො අනන්තරා ආසවානං ඛයො හොති' - ඒක තමා දර්ශනයන්ගෙන් අග්‍ර. ඊළඟට යම් ආකාරයකින් අසමින් සිටියදී ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වේද ඒ තමයි ශ්‍රවණයන් අතුරෙන් අග්‍ර. යම්කිසි සුඛදායක තත්ත්වයක සිටීමෙන් අනතුරුවම ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වේද ඒක තමයි සැප අතුරෙන් අග්‍ර. ඊළඟට යම් සංඥාවක් ඇතිව සිටියදී ඉන් අනතුරුවම ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වේද ඒක තමයි සංඥාවන්ගෙන් අග්‍ර. යම් තත්ත්වයක සිට ඉන් අනතුරුවම ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වේද ඒක තමයි භවයේ කෙළවර. භවාග්‍රය. එතකොට මේ අන්තිම එකෙන් විශේෂයෙන් හිතාගන්න පුළුවන්. මෙතන මේ භවාග්‍රය කියලා කිව්වේ මොකක්ද? අපි දන්නව දන් 'භව නිරොධො නිබ්බානං' කියූ බුදුරජාණන් වහන්සේගේ විග්‍රහය අනුව භව නිරෝධයමයි නිවන. නමුත් මේ භව නිරෝධය ප්‍රත්‍යක්ෂයක්. ඒ ප්‍රත්‍යක්ෂයට වැටෙන්න උපකාරවන තැන තමයි අර කියාපු ආනන්තරික සමාධිය. එතකොට ඒ ආනන්තරික සමාධියට අනතුරුවම වැටෙන්නේ භව නිරෝධ නම් වූ නිවනටයි. ඒක ප්‍රත්‍යක්ෂයක්. එතකොට **භව නිරෝධ තත්ත්වයමයි නිවන. මෙලොවම අත්විඳින නිවනක්.** එහෙම නැතිව පරලොව අර සියදෝරිස්ගේ නිවන නොවෙයි මේක. **'සියදෝරිස්ගෙ නිවන' නොවෙයි.** මෙලොවම අංග සම්පූර්ණව අත්දකින පිරිනිවීමක්. ඒක අවසාන අවස්ථාවේදී උපකාර වෙනවා. ඒ උපකාරවන නිසා තමයි මේ පින්වතුනුත් දන්නා ගාථාවකින් කීවොත් ඔය රතන සූත්‍රයේම තියෙන්නේ.

**ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං**
**විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං**
**තෙ ඛීණ බීජා අවිරූළ්හිච්ඡන්දා**
**නිබ්බන්ති ධීරා යථායං පදීපො**





'ඛීණං පුරාණං' අතීතයේ තිබිච්ච යම්තාක් ඒ කර්ම ශක්තීන් ක්ෂය කරලා ඉවරයි. 'නවං නත්ථි සම්භවං' අලුතින් නැවත භවයක් මවන්න දේවල් නැහැ. 'විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං' නැවත භවයක්, උත්පත්තියක් සඳහා ඇල්මක් නැහැ ඒ සිතේ. 'තෙ ඛීණබීජා' ඒ රහතන් වහන්සේලාගේ විඤ්ඤාණ බීජය ක්ෂය කරලයි තියෙන්නේ. ක්ෂය කරලා නැත්නම් ඒ විඤ්ඤාණ බීජය පැළවෙනවා. සාමාන්‍ය පුද්ගලයාගේ විඤ්ඤාණ බීජය පැළවෙනවා තණ්හා වතුර, තණ්හා තෙතමනය ලැබුණ හැටියේ කර්ම ක්ෂේත්‍රයේ. ඒක නිසා තමයි **'කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනෙහො'** කියලා බුද්ධ වචනය තියෙන්නේ. කර්ම ක්ෂේත්‍රයේ අර ක්ෂය නොවූ විඤ්ඤාණය කියලා කිව්වේ අන්න අර නාමරූපය සහිත විඤ්ඤාණයයි. එතකොට 'තෙ ඛීණබීජා' රහතන් වහන්සේලාගේ විඤ්ඤාණ බීජය ක්ෂය වෙලයි තිබෙන්නේ. ඒක නිසා 'අවිරූළ්හිච්ඡන්දා' නැවත තණ්හාවක් පැන නඟින්න ඉඩක් නැහැ. ඒ බීජය ආයි වැඩෙන්න ශක්තියක් නැහැ. ඒක නිසා මොකක්ද වෙන්නේ කියන එක ඔන්න ඊළඟට කියවෙන්නෙ **'නිබ්බන්ති ධීරා යථායං පදීපො'** ඒ ධීරයෝ, ඒ ප්‍රාඥයෝ, මෙන්න මේ පහන වගේ නිවිලා යනවා. මේකත් අර ගින්න නිවුන වගේ නිවිලා යනවා. පහන නිවුනට පස්සේ කොහේ යනවද කියන ප්‍රශ්නයත් මෝඩ ප්‍රශ්නයක්. තෙලුත් ඉවරයි. තිරයත් ඉවරයි. පහන නිවුනා. එච්චරයි. ඉතින් මේක ආයේ සොයා ගන්න බැහැ. මේකට භය වෙන්න දේකුත් නැහැ. මොකද සංසාර දුක කෙළවර නේ.

බුදුරජාණන් වහන්සේට කොතෙකුත් ආත්මවාදී බමුණන් චෝදනා කළා උච්ඡේදවාදියෙක් කියල. දැන් නම් ආත්මවාදී බමුණන් පමණක් නොවේ බෞද්ධයින්මත් මේ විදියෙ මත වලට චෝදනා කරනවා **උච්ඡේදවාදියි** කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ ඊට දෙන පිළිතුර මොකක්ද? "මට මේ වැරදි චෝදනාවක් මේ අය කරන්නේ, මම නොකියන දේකට. මම එදා කිව්වෙත් අද කියන්නෙත් මෙච්චරයි, දුකක් සහ එහි නිරොධය පමණයි." **'පුබ්බෙචෙව එතරහිච දුක්ඛඤ්චෙව පඤ්ඤපෙමි දුක්ඛස්සච නිරොධං'** එදත් කළේ අදත් කරන්නේ මෙච්චරයි. දුකක් සහ එහි නිරොධයක් පමණයි පෙන්නුම් කරන්නේ. චතුරාර්ය සත්‍ය දේශනාව මහා පුදුම දේශනාවක්. තනිකර පංච උපාදානස්කන්ධයම දුකක් කියලා කියනවා මිසක් මේකෙන් ඉතුරු කරගන්න දෙයක් නැහැ. එතකොට මේ උපාදානස්කන්ධය - ඒකයි අර විපරීත තත්ත්වය කියලා කීවේ. මහා සමුද්‍රයේ ඇති වූ විපරීත තත්ත්වයක් වගෙයි දියසුළිය. දියසුළිය ඇතිවූ දා ඉඳලා යම් අවස්ථාවක මේ විපරීත තත්ත්වය ඇතිවුනා නම් එතන ඉඳලා අර විඤ්ඤාණයත් නාමරූපයත් අතර 'වට්ටං වට්ටති'. එතන කියන්නේ **'එත්තාවතා වට්ටං වට්ටති'**.

පටිච්ච සමුප්පාදය දක්වන තැන්වල, විග්‍රහ කරන තැන් වල, විඤ්ඤාණයත් නාමරූපයත් අතර වට්ටයක් තියනවා කියලා දක්වනවා. මේ සංසාර වට්ටය කරකැවීම උඩ තමයි උපාදානස්කන්ධ පහ ගොඩ නැගෙන්නේ. දැන් දිය සුළියක් කැරකැවෙන කොට අපි දන්නවා ඉස්සෙල්ල අර විදියට උත්සාහ කරනවා ඉස්සරහට යන්න. බැරිවෙන කොට ආපස්සට කැරකැවිලා රවුමක් වගේ, චක්‍රයක් වගේ, හැදිලා පහළට පාතාලයක් හාරා ගෙන හාර ගෙන යනවා. ඒ අතරේ ඒ අවට තියෙන හැම දෙයක්ම අර ආකර්ශන වේගය තුළින් ඒකට ඇද ගන්නවා. ඒ වගේ තමයි අපේ මේ ශරීරයත්. මව්කුසේ පිළිසිඳ ගත් දා ඉඳලම ඒත් ඒ මව්කුසේ සාරය, මව ගන්නා ආහාරයේ සාරය, ඇද ගන්නවා, පෙකණිවැලෙන්. මේ දියසුළිය ඒ ඇදගෙන මදිවට එළියට ආවාට පස්සේ මුළු ලෝකයේම තියෙන සාරය ඇද ගන්නවා, මේ පංච උපාදානස්කන්ධය ගොඩනගා ගන්න. ආහාර පමණක් නොවෙයි අනෙක් දේවල්. අසල්වාසීන්ගෙ ඉඩකඩම්, වස්තු මේ හැම එකක්ම ඇද ගන්නවා අන්න අර දියසුළිය. ඉතින් මෙන්න මේ පුද්ගල දියසුළියටමයි සත්ත්වයා කියල කියන්නේ. පුද්ගලයා කියලා කියන්නේ. බෝධිසත්ත්වයිනුත් ඇතුළුව. මෙච්චර කාලයක් මහා සමුද්‍රයේ ආපු දිය සුළි. බුදු පසේ බුදු, රහතන් වහන්සේලාත් අපට හඳුන්වන්න තියෙන්නේ ඒකෙන්. අපේ මේ ගෞරවය කෙසේ වෙතත්,උන්වහන්සේලාත් දීර්ඝ කාලයක් සංසාරයේ මේ දියසුළි හැටියට ඇවිල්ලා යම් අවස්ථාවක ප්‍රඥාවබෝධය තුළින් විමුක්තිය ලැබුවා.

විමුක්තිය ලැබුවේ කොහොමද? තේරුම් ගත්තා මේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර සම්බන්ධය. මේ නාමරූපය ආත්ම හැටියට ගැනීම වෙනුවට මේක හේතු ප්‍රත්‍ය සම්බන්ධයක් හැටියට තේරුම් ගත්තා. නාමරූපය නිසා විඤ්ඤාණය තිබෙනවා නම් විඤ්ඤාණය නිසා නාමරූපය තිබෙනවා නම් මෙතන එකක්වත් තනිව හටගන්නේ නැහැ. ඒකට සාරිපුත්ත රහතන්වහන්සේ දක්වූ උපමාව බටකෝටු මිටි දෙකක් එකකට එකක් හේත්තු කරලා තිබ්බාම උඩින්. එකක් ඇද්දාම අනික් එක වැටෙනවා මේක ඇද්දාම අනිත් එක වැටෙනවා. ඒ වගේ තමයි අඤ්ඤමඤ්ඤ පච්චයතාව. අන්‍යොන්‍ය ප්‍රත්‍යතාව බුදුකෙනෙක් පමණයි ලෝකයාට හඳුන්වා දෙන්නේ. එතෙක් අර යෝගීන් එහෙම මොකක් හරි ආත්මයක් හැටියට ගන්නවා. යටත්පිරිසෙයින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය පවා ආත්ම හැටියට ගන්නවා. බුදුරජාණන් වහන්සේ පමණයි පෙන්වා දුන්නේ මෙතන ඒකකයක් හැටියට ගන්න දෙයක් නැහැ කියලා. ආයතනයක් කියල කිව්වත් මේ හැම එකකම තියෙන්නේ මහා සට්ටනයක්, පෙරළියක්. ඒකම තමයි දුක.

එතකොට විඤ්ඤාණයත් නාමරූපයත් අතර මේ පෙරළිය යම් අවස්ථාවක





සංසිඳුනා නම් අන්න එතකොට මහමුද විතරයි. **මහ මුදට අඩුවක් වුනෙත් නැහැ. වැඩියක් වුනෙත් නැහැ.** ඔන්න එතකොට මහමුහුදේ කථාව එතැනට ගැලපෙනවා. ඒ මිසක් රහතන්වහන්සේලා ගිහිල්ලා එකතුවෙන, ගුප්ත, කියන්න බැරි, ගුඪ තැනක් නොවෙයි.

ඉතින් මේ කාරණය වඩාත් පැහැදිලි වන එකක් තමයි දැන් අපි කිව්වා විඤ්ඤාණ බීජය ක්ෂය වුනා කියලා. ක්ෂය නොවූ විඤ්ඤාණ බීජය නාමරූපයේ ලැගගෙනයි ඉන්නේ. නාමරූපය දැඩිව ආත්ම හැටියට අරගෙනයි ඉන්නෙ. ක්ෂය වූ විඤ්ඤාණය හඳුන්වන වචනයක් තියෙනවා ධර්මයේ, **'අනිදස්සන විඤ්ඤාණය'** කියලා. ඒ විඤ්ඤාණයේ කිසිවක් නැහැ. පෙන්නුම් කරන්න දෙයක් නැහැ. ඒ තත්ත්වයම තමා බුදුරජාණන් වහන්සේ ලෝකයාට හඳුන්වා දුන්නෙ ඇතැම් අවස්ථාවක අමුතු ආයතනයක් හැටියට. ලෝකයා දන්නේ ආයතන හය පමණයි. මේ ආයතන කියලා කියන්නේ මේ පින්වතුන් අහල තියනවා ඇස, කණ, නාසය, දිව, කය, මන. මේවා ආයතන බවට පත්වන්නේ ඒවාට අදාළ අරමුණුත් එක්ක ක්‍රියා කරන විටයි. ඇසට රූප කණට ශබ්ද ආදී වශයෙන් ඒවාත් එක්ක යන නිරන්තර ක්‍රියාකාරිත්වයක් තියෙනවා. ඒකත් අර දියසුළිය වගේ ක්‍රියාකාරිත්වයක්. ඒ ක්‍රියාකාරිත්වය තිබෙන මේ සළායතනය තුළයි උන්වහන්සේ ප්‍රකාශ කළ හැටියට මේ මුළු මහත් ලෝකයම තිබෙන්නේ. මේ කාලයේ භෞතික විද්‍යාව කෙසේ කීවත් බුදුපියාණන් වහන්සේ පෙන්නුම් කරනවා ලෝකය කියන්නේ මේ සළායතන තුළම හටගෙන සළායතන තුළම නැතිවන දෙයක් කියල.

ඒකයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ මේ සංඥාවත් මනසත් සහිත බඹයක් පමණ වූ ශරීරය තුළම ලෝකයත්, ලෝකයේ හටගැන්මත් ලෝක නිරොධයත්, ලෝක නිරෝධගාමිනී මාර්ගයත් පෙන්වාලනව කියලා. බුදුරජාණන් වහන්සේ ඇතැම් අවස්ථාවල පෙන්නුවා මේ සළායතන නිරුද්ධ වූ තත්ත්වයක්. ඒකත් ආයතනයක් හැටියට හැඳින්වූවා ඇතැම් අවස්ථාවල. සළායතන නිරොධය කියන එක, ආයතනයන්ගේ නිරොධයත් ප්‍රත්‍යක්ෂ කරගන්න පුළුවන් දෙයක් හැටියට. ඒ නිරෝධ තත්ත්වය පෙන්නුම් කරනවා බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මෙන්න මෙහෙමත් ආයතනයක් තියනවා, කොහොම ආයතනයක්ද?" ඒ ආයතනයේ අපි මේ ලොකුවට ගන්න පඨවි, ආපො, තේජෝ, වායෝ කියල ගන්න රූප ධර්ම වලට අදාළ කිසිවක් නැහැ. අරූප සමාපත්ති කිසිවකුත් නැහැ. ආකාසඤ්ඤායතනය විඤ්ඤාණඤ්ඤායතනය ආදී කිසිවකුත් නැහැ. මෙලොවකුත් නැහැ. පරලොවකුත් නැහැ. ඉරත් නැහැ. හඳත් නැහැ. ඒමකුත් නැහැ, යාමකුත් නැහැ, සිටීමකුත් නැහැ, චුතියකුත් නැහැ, උත්පත්තියකුත් නැහැ. කොටින්ම කියතොත් එතන ඒ තත්ත්වය බුදුරජාණන් වහන්සේ අන්තිමට හඳුන්වන්නේ

'අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණං' කියල. එහි පිහිටීමකුත් නැහැ, පැවැත්මකුත් නැහැ, අරමුණකුත් නැහැ කියල. මේ නෑ නෑ කථාවෙන් මොකක්ද පෙන්නුම් කරන්නේ. මේ ඔක්කොම බන්ධන. සංසාරයේ තිබුන ඒ සියළුම බැමි කැඩිල ගිහිල්ලා. සංසාරයේ 'දේවල්' හැටියට හදාගන තිබුන දේවල්. දැන් අර රූප කියන ධර්ම අපි ඇතිකර ගෙන තිබෙන්නේ අර ධාතු හතර අල්ලා ගැනීම තුළින්. එතකොට ඒ උපාදානය ඉවත්වුනු බවයි මෙතන පෙන්නුම් කරන්නේ. ඉතින් මේ විධියෙ මහ පුදුම ඒ අනිදස්සන විඤ්ඤාණ තත්ත්වයම තමයි රහතන් වහන්සේලා භුක්ති විඳින අර්හත් ඵල සමාපත්තිය.

ඒකට හොඳ නිදර්ශනයක් බුද්ධ චරිතයෙන්ම ගත්තොත් සමහර විට මේ පින්වතුන් අහලත් ඇති එක්තරා අවස්ථාවක මහා පරිනිර්වාණ සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ එක්තරා අත්දැකීමක් සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරනවා.'මහණෙනි මම එක් අවස්ථාවක ආතුමාවෙහි දහයියා ගෙයක විවේකයෙන් සිටින විට හෙණ පුපුරමින් මහා වර්ෂාපතනයක් සිද්ද වුණා. ඒ අවස්ථාවේ හෙණ පහරින් සහෝදර ගොවියන් දෙදෙනෙකුත් ගවයින් හතර දෙනෙකුත් මරණයට පත්වුනා. ඊළඟට ඒ සිද්ධිය නිසා විශාල පිරිසක් එතනට රැස්වෙලා හිටියා. මම ඒ දහයියා ගෙයින් එළියට ඇවිල්ලා ඒ පිරිසේ කෙනෙකුගෙන් ඇහුවා මොකද මේ මෙතන මහ පිරිසක් රැස්වෙලා ඉන්නෙ කියලා. ඔන්න එතකොට කියනවා දැන් මහා වර්ෂාවක් ඇවිල්ලා හෙණ ගහලා මිනිසුන් දෙදෙනෙකුත් ගවයින් හතර දෙනෙකුත් මැරුණා. ඇයි භාග්‍යවතුන් වහන්ස ඔබවහන්සේ කොහෙද හිටියේ? මම මෙතනමයි සිටියේ.

ඇයි ඔබ වහන්සේ සැතපිලාද සිටියේ?
නෑ අවදිවයි සිටියේ.
ඇහුණේ නැද්ද?
ඇහුණේ නැහැ.
දැක්කෙත් නැද්ද?
දැක්කෙත් නැහැ.

බුදුරජාණන් වහන්සේ ඔහොම ප්‍රකාශ කළාම අර පුද්ගලයා කියනවා මේක හරි පුදුමයිනෙ. එහෙනම් සංඥාවත් සහිතව අවදිව සිටිද්දී ඔබ වහන්සේ දැක්කේ නැහැ නේද මේ කිසිවක්. එසේය කියලා බුදුරජාණන් වහන්සේ පිළිතුරු දුන්නා. අන්න ඒ හිටියෙ ඔය කියාපු තත්ත්වයෙ. ලෝකයෙන් හිත මෑත්කරගෙන හිටිය අවස්ථාවල ලෝකයේ ඒ පෙනීම්, ඇසීම් කිසිවක් බුදුරජාණන් වහන්සේට දැනෙන්නෙ නැහැ.





රහතන් වහන්සේලා අර්හත්ඵල සමාපත්තියෙ සිටිය අවස්ථාවල් කොතෙකුත් ධර්මයේ සඳහන් වන නමුත් අන්න අර සියදෝරිස් මතය ගත්ත අය ඒක ලෝකයක් කර ගන්නවා. ඒ දක්වන තැන කාටවත් කියන්න බැරි ගුප්ත ගූඪ අමුතු ලෝකයක්. එතෙන්ට තමයි රහතන් වහන්සේලා යන්නේ. ඔන්න ඕක තුලයි බොහෝ බෞද්ධයින් හිරවෙලා ඉන්නේ. **ඒක සක්කාය දිට්ඨිය වඩන, භව තෘෂ්ණාව වඩන අර බමුණු මතයට අදාළ දෙයක් බවයි අපට මතක් කරන්න සිද්ධවෙන්නේ.**

මේක විසඳා ගන්න අපි තේරුම් ගන්න ඕනෑ මේ පැවැත්ම කියන එක විපරීත තත්ත්වයක් බුද්ධ වචනයට අනුව. සාමාන්‍ය ලෝකයා පැවැත්ම තමයි ලොකුවට ගන්නේ. බුදුරජාණන් වහන්සේ කියනවා ඒක විපරීත තත්ත්වයක්. මහා සමුද්‍රයේ කරන්න බැරි වැඩක් කරන්න යන දියවැලක් වගේ. ඒ දිය වැල ඉදිරියට යන්න ගියාට ආපසු හැරෙන්න සිද්ධ වෙනවා. ගැටිලා ගැටිලා ඉස්සරහට යන්න බැරිවෙන කොට හාරාගෙන හාරාගෙන පාතාලයක් හදාගන්නවා. නමුත් අපට එතන එකක් පේනවා. අපට පෙන්නුම් කරන්න පුළුවන් දිය සුළියක් තියන තැන. මහා සමුද්‍රයේ ඇඟිල්ල දික්කරලා පෙන්නන්න දෙයක් නැහැ. දියසුළියක් තියෙනව නම් 'අන්න අතන' කියන්න පුළුවන්. 'මෙතන' කියන්න පුළුවන්. 'අරයා' කියන්න පුළුවන්. 'මෙයා' කියන්න පුළුවන්. එහෙම නැත්නම් සංඝයා වහන්සේලා නම් 'අර තැන, මේ තැන' කියන්න පුළුවන්. ඒ කියන්න පුළුවන් වුනේ දියසුළියක් තියෙන නිසා. නමුත් එහෙම කියන්න පුළුවන් වුන පමණට එතන ආත්ම තත්ත්වයක් නොවෙයි. එතන තියෙන්නේ මහා ඝට්ටනයක්. එතන ඒකකයක් නොවෙයි. බුදුරජාණන් වහන්සේ ඒ කාරණය ලෝකයාට පෙන්නුම් කරලා දුන්නා. පැවැත්ම කියන්නේ තනිකර දුකක් කියන එක. වෙන කිසිම අන්‍යආගමිකයෙකුට, ශාස්තෘවරයකුට ඒක පිළිගන්න බැහැ. පිළිගන්න බැරි මොකද? අර සක්කාය දිට්ඨිය තුළ හිරවෙලා ඉන්න නිසා. ආත්ම දෘෂ්ටිය ඩැහැගෙන සිටින නිසා. බුදුරජාණන් වහන්සේ අන්න ඒ ටික පෙන්නුම් කළා පටිච්චසමුප්පාද ධර්මය තුළින්. අවිද්‍යාව නිසා. සංස්කාර සකස් කිරීම් රාශියක් සිද්ධ වෙනව. ඒ සකස් කිරීම් රාශියටම අයිති දෙයක් තමයි විඤ්ඤාණයත්, නාමරූපයත් කියන දෙක වෙන්කර ගැනීම. ඉතින් මේ දෙක වෙන් කරගෙන - දාම් පෙතක දාම් අදින්නා වගේ. අපට දාම් ක්‍රීඩාවක් කරන්න ඕන නම් කොච්චර යාලුවො දෙන්නෙක් වුනත් අපි පිල් දෙකකට බෙදෙන්න ඕන. තරඟයක් වුනාම මේ පින්වතුන් දන්නවා ඔය දැන් කාලේ තියන තරඟවල යාළුවෝ වුනත් පිල්දෙකකට බෙදිල තමයි තරඟය යන්නෙ.

ඒවගේ දෙයක් තමයි මේ පැවැත්ම කියන එකත්. අන්න අර විඤ්ඤාණයත් නාමරූපයත් අතර තරඟයක් යනවා. ඒක වටරවුමේ යාමක්. කවදාවත් ඒක කෙළවරක් වෙන්නේ නැහැ. මේ තත්ත්වය බුදුරජාණන් වහන්සේ දක්කා සට්ටනයක්, දුකක් හැටියට. මේ අපේ ශරීරය තුළත් ක්‍රියාකාරී වන්නේ ඒකමයි. ආශ්වාසයක් අරගෙන අපට නතර කරන්න පුළුවන්ද? ප්‍රශ්වාසයක් කරන්න සිද්ධ වෙනවා. ප්‍රාශ්වාසයක් කරලා නතර කරන්න පුළුවන්ද? ආශ්වාසයක් ගන්න සිද්ධ වෙනවා ආයිත්. අද ආහාර ගත්තා උදේ. ඒක රඳවා ගන්න පුළුවන්ද? එතනින් ඉවරයක් තියනවාද? අන්න ඒ වගෙයි මේ ශරීරය. මමය කියල ගත්තු තැන.

මෙතන කියල ගත්තොත් අතනකුත් හැදෙනවා. අතන කියල ගත්තොත් මෙතනකුත් කියල හැදෙනවා. මෙයා කියල ගත්තොත් අරයා කියල හැදෙනවා. අරයා කියල ගත්තොත් මෙයා කියල හැදෙනවා. ඔන්න ඔය විධියට මේ දෙකක් තුළ හිරවෙලා තිබෙනවා ලෝකය. ඒකයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ. 'මහණෙනි, මම නුඹලාට **දෙකක්** කියනවා. මොකද්ද දෙක. ඇසයි රූපයයි, කණයි ශබ්දයයි, නැහැයයි ගඳ සුවඳයි මේ දෙක හැර වෙන දෙකක් නැහැ ලෝකෙ' කියල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. අන්න ඒ විධියට මේ මුළු මහත් ශරීරය තුළත් මේ අපේ පැවැත්ම තුළත් නිරන්තරයෙන්ම ඔන්න ඔය විධියේ ගනුදෙනුවක් කෙරෙනවා. මේ ගනුදෙනුව කවදාවත් විසඳෙන එකක් නොවේ. ඒක නිසා බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා මුළු මහත් පැවැත්මම දුකක්. තනිකර 'කේවල පංචුපාදානස්කන්ධය'. දැන් බොහෝ දෙනා දුක්ඛ සත්‍යය තෝරන කොට ඉපදීම දුකක්, ජරාව දුකක්, මරණය දුකක් ආදි වශයෙන් කියාගෙන යනවා. නමුත් අන්තිමට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා සැකෙවින් කියතොත්, කොටින්ම කියතොත් පංචඋපාදානස්කන්ධයම, උපාදාන ගොඩවල් පහම දුකක්.

ඔන්න එතකොට ඊළඟට තියෙන්නේ අපි කලින් කිව්වා වගේ අර ඝන සංඥාව. විදර්ශනා භාවනාවට උපකාරවන ප්‍රඥප්තියක් මෙතන තිබෙනවා. සාමාන්‍ය ලෝකයා සිටින්නේ ඝන සංඥාව තුළයි. ඒකයි අර ගිනි දල්ල එකක් හැටියට ගත්තේ. දැන් පොඩි දරුවෙක් උනත් ගිනි දැල්ලක් දක්කාම බිත්තියක් කියලා අල්ලන්න බැරි නැ. ඒ වගේ ඝන සංඥාව තුළ ලෝකයා රැඳෙනවා. නමුත් විදර්ශකයා සමාධිමත් සිතින් බුදුරජාණන් වහන්සේ පෙන්වූ යෝනිසොමනසිකාරය අවදි කරගෙන, සතිසම්පජඤ්ඤය අවදි කරගෙන, නාමරූප ධර්මයන් අවබෝධ කරගත්තු අවස්ථාවේ පෙනෙනවා එකක් හැටියට පෙනුන එක රාශියක් හැටියට. එතැන තිබෙන්නේ 'රාශි සංඥාව'. අන්න රාශි සංඥාව මතුකරගෙන තමයි ක්‍රම ක්‍රමයෙන් අර





විදර්ශනා මාර්ගයට අවතීර්ණ වන්නේ. එහෙම අවතීර්ණ වීම තුළ ඊළඟට තිබෙන්නේ කලකිරීමයි. යථා තත්ත්වය දකින කොට ඉබේටම කලකිරෙනවා. යථාභූත ඥානය කියලා කියන ඒ යථාතත්ත්වය දකලා කලනොකිරී ඉන්න බැහැ. නොකලකිරී ඉන්න බැහැ. යථාභූත ඥාන දර්ශනයත් එක්කම කලකිරීම ඇතිවෙනවා. ඒ කලකිරීම තුළින් ඊළඟට අතහැරීම එනවා. අතහැරුණු අවස්ථාවෙයි අන්න අර කියාපු පරිනිර්වානය. ඒ අතහැරීමට අයිතියි ලෝකයේ ලොකුවට ගන්න පඨවි, අපො, තේජො, වායො කියන ඒවා.

දැන් මේ කාලයේ මේ පින්වතුන් දන්නවා භෞතික දෘෂ්ටිය දැඩිව වැඩෙන යුගයක්. මේ භෞතික කථාව කියනකොට අපට දබ්බමල්ලපුත්ත මහරහතන් වහන්සේ නැවත සිහිපත් කරගන්න පුළුවන්. දබ්බ කියලා කියන්නේ අපි කීවා ද්‍රව්‍යය කියලා. දබ්බ කියන්නේ 'ද්‍රව්‍යය'. ලී පමණක් නොවෙයි. මේ කාලයේත් ද්‍රව්‍ය කියලා කියන්නේ. නමුත් දබ්බමල්ලපුත්ත රහතන් වහන්සේගේ ජීවිතය **ද්‍රව්‍යයට අභියෝගයක්**. උන්වහන්සේගේ පුණ්‍ය ශක්තිය නිසා මව මිය ගියාටත් පස්සේ අර ගිනිදැල්වලට දවන්න බැරිවුනා උන්වහන්සේව. ඒ නමුත් තමන්ගේ අධිෂ්ඨාන ශක්තිය තුළින් තෙජො කසිණ සමාපත්තිය තුළින් උන්වහන්සේ අවසාන අවස්ථාවේදී තමන්ගේ ශරීරය දව්වා අළුවත් දැලිවත් ඉතිරි නොවන ආකාරයට. එතනත් භෞතික ද්‍රව්‍යයට උන්වහන්සේ අභියෝගයක් කළා. ඒකයි බුදුරජාණන් වහන්සේ විශේෂයෙන් මෙතන ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කළේ. මොකද බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළ තිබෙන්නේ ඒකයි, මේ පින්වතුන් කවුරුත් දන්නවා- මේ මුළු මහත් සද්ධර්මය අපි හිතමු පුස්තකාලයක් කියලා. මේ පුස්තකාලයේ දොර ඇරෙන්නේ ධම්මපදයේ

**මනො පුබ්බංගමා ධම්මා**
**මනො සෙට්ඨා මනොමයා**

කියන ගාථා දෙකකින්. ගාථා දෙකකම ඒ බව සඳහන් වෙනවා. ඒක ධර්මතාවක්. එතන පෙන්නුම් කරන්නේ 'මනො පුබ්බංගමා ධම්මා' මේ ධර්මය, බුදුරජාණන් වහන්සේගේ ධර්මය මනොමූලිකයි. ද්‍රව්‍ය මූලික නොවේ. **හැමදෙයකට පෙරටු වන්නේ මනසයි. 'මනො සෙට්ඨා' මනසයි ශ්‍රේෂ්ඨ, 'මනොමයා' මනසින්මයි මේ සියල්ල හැදිලා තියෙන්නේ,** අන්තිමට බලනකොට.

අන්න ඒ මනෝමූලික දර්ශනයට අනුව බලනකොට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා අර ද්‍රව්‍ය කියලා ගත්තු දේ පවා අර කියාපු ලෝකෝත්තර සමාධිය නිසා බලපවත්වන්නේ නැහැ. ඒවා නැතිව වගේ හරියට. පඨවි,

ආපො, තේජො, වායො ධාතු කිසිවක් නැහැ. ඒවා ආශ්‍රිතව එන සංකල්ප තමයි ඒම, යාම, සිටීම, ඉපදීම, චුතවීම. ඒ සියල්ලම අර විඤ්ඤාණයේ සටහන් වෙන්නේ නැහැ. ඒක නිසා තමයි ඒ විඤ්ඤාණය 'ඛීණබීජ' කියලා කිව්වේ. නැවත වැඩෙන්නේ නැහැ මව්කුසක. ඒක ක්ෂය කරලයි තියෙන්නේ. ඒ බීජය ක්ෂය කරලයි තියෙන්නේ-විඤ්ඤාණ බීජය- රහතන් වහන්සේලාගේ. ඒකයි අවසාන අවස්ථාවේදී අන්න අර බුදුරජාණන් වහන්සේගේ අප සඳහන් කළ ආතුමාවේ සිද්ධියත් ඒ වගේම තමයි. බුද්ධ චරිතයම අපි ආදර්ශයට ගන්නවා නම් එක් අවස්ථාවක සඳහන් වෙනවා බුදුරජාණන් වහන්සේට අර දේවදත්ත ගලක් පෙරලලා බුද්ධ බලය තුළින් ඒ ගල බුදුරජාණන් වහන්සේ මත වැටුනේ නැතත් ඉන් පතුරක් වැදිලා බරපතල තුවාලයක් සිදුවුනා බුදුරජාණන් වහන්සේගේ පාදයට. වේදනාවකුත් ඇතිවුනා. ඇත්ත වශයෙන් ජීවක වෙද මහත්මයාට බෙහෙත් කරන්නත් සිද්ධවුනා. නමුත් ධර්මයෙහි සඳහන් වෙනවා එක් අවස්ථාවක ඒ ප්‍රබල වේදනාව පවා උන්වහන්සේ ඵල ශක්තිය තුළින් ජයගත්තා කියලා. හිත දැම්මා ඒ ඵල ශක්තියට. අන්න ඒ විධියට රහතන් වහන්සේලාට යම් ශක්තියක් තිබුනා. ඒක අන් අවස්ථාවලදී කෙසේ වෙතත් අවසාන අවස්ථාවේ ඉදිරිපත් කරගෙන ඒක තුළින් තමයි අර ශරීරය පාවිච්චි කළ ඇඳුමක් ඉවතට අරගෙන ගිනිතියන්නා වගේ දබ්බමල්ලපුත්ත රහතන් වහන්සේ තමන්ගේ ශරීරයට ගිනිදල්වා ගත්තේ.

එතකොට අපට හිතා ගන්න පුළුවන් මේ පරිනිබ්බාන කියන එක, මේ නිවන මෙතනම තියන දෙයක්. මරණින් මතු තියන දෙයක් හැටියට හිතාගත්තොත් කවදාවත් ඒකට කළයුතු උත්සාහය කරන්න කෙනෙක් පෙළඹෙන්නේ නැහැ. ඒ සියදෝරිස් අප්පුහාමි මේ ජීවිතයේදී කරපු පිනුත්, අපි අනුමෝදන් කරන පිනුත් කවදාහරි නිවනට උපනිශ්‍රය වේවා කියල පැතුවාට වරදක් නැහැ. නමුත් මරණින් මතු ගිහිල්ලා අමුතු නිවන් ලෝකයක පහළවේවා කියල පැතුවොත් ඒක වැරදියි. රහතන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ ගැනත් එහෙමයි. අපි කොයි තරම් ගෞරවයෙන් කථා කළත් උන්වහන්සේලාත් අපි තේරුම් ගන්න ඕන සංසාරයේ දීර්ඝකාලයක් කරකැවෙමින් ආපු දියසුළි. ඒවා දුක්බව තේරුම් අරගෙන "දුක්ඛ නිරොධො නිබ්බානං" කීවේ ඒකයි. ඒකයි බුදුරජාණන් වහන්සේ බමුණන්ගේ චෝදනා හමුවේ ප්‍රකාශ කළේ, මම වෙන දෙයක් කියන්නේ නැහැ. ලෝකයා කෑ ගසන්නේ දුකක් ගැන. ඒකට විසඳුමයි මේ ඉදිරිපත් කළේ. මම ඉස්සරත් ප්‍රකාශ කළේ දැනුත් ප්‍රකාශ කරන්නේ දුකක් සහ දුක්ඛ නිරොධයක් පමණයි. ඒක නිසා තමයි මේ පින්වතුන් දන්නවා





චතුරාර්ය සත්‍යයේ දුක්ඛ නිරොධය නිර්වාණයයි කියලා දක්වලා තිබෙනව. නමුත් ඊට අමතරව යම්කිසි අමුතු දෙයක් බොහෝ උගතුන් මතුකර දක්වන්නේ අන්න අර කියාපු භව දෘෂ්ටියට යටවීම නිසයි. යමක් ඉතිරිකරගන්න ඕන. නමුත් ඒ විධියේ තත්ත්වයක් නැහැ ධර්මයේ, මහ පුදුම ධර්මයක් මේක.

මෙන්න, මේ තත්ත්වයම තමයි "එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාර සමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං" කියන උපසමානුස්සති පාඨය හැටියට දක්වන ඒ පාඨයෙන් සඳහන් වන්නේ. 'මෙය ශාන්තයි, මෙය ප්‍රණීතයි, සියලු සංස්කාර සංසිඳීම සියලු උපධීන් අතහැරීම, තණ්හාව ක්ෂය කිරීම, විරාගය, නිරෝධය නිවීම.

අන්න එතකොට මේ පින්වතුන් කල්පනා කරන්න ඕන තමන් ගන්න ඉලක්කය වැරදිනම් විදමන හරියන්නේ නැහැ. ඉලක්කය හරිගස්සා ගැනීම කියන සම්මා දිට්ඨිය- සම්‍යක් දෘෂ්ටිය - දෘෂ්ටිය කෙලින් කරගන්න ඕනෑ. සම්මා දිට්ඨිය නාමයෙන් මිථ්‍යා දෘෂ්ටියක් ගත්තොත් කවදාවත් නිවනට පැමිණෙන්නේ නැහැ. ඒක නිසා ඒ ටික ශුද්ධ කරගැනීම සඳහා අද මේ කළ ධර්ම දේශනාව උපකාරවත් වේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා.

එතකොට මේ වටිනා දවසේ යම් ශීලයක් සමාදන් වෙලා තමන්ට හුරු භාවනාවක් කරමින් මේ දේශනාවත් උපකාර කර ගනිමින්, බුද්ධ ශාසනයේ පරිහානියට කලින් තම තමන්ගේ බණ භාවනා සම්පූර්ණ කරගෙන හැකිතාක් ඉක්මණින් අතිභයානක සංසාර ගමන - **දියසුළිය** - කෙළවර කරගෙන උතුම් වූ අමාමහ නිවනින් සැනසෙත්වා! ඒ උතුම් අමාමහ නිවන මෙතනම තියන එකක් බව තේරුම් ගනිත්වා! කියන එකයි අපි බලාපොරොත්තු වෙන්නේ. මේ ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලය අවීචියේ සිට අකනිටාව දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් පින් අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන්වීම තුළින් හැකිතාක් ඉක්මණින් තම තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියල ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

**"එත්තාවතාව අමෙහි ......"**

# 33 වන දේශනය



## 33 වන දේශනය

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

**පස්ස චිත්තකතං බිම්බං**
**අරුකායං සමුස්සිතං**
**ආතුරං බහු සඞ්කප්පං**
**යස්ස නත්ථි ධුවං ඨිති**

-ජරා වග්ග - ධම්ම පදය.

සැදැහැවත් පින්වතුනි,

ශරීර කූඩුව පිළිබඳව තිබෙන සුභ සංඥාව සත්ත්වයා සසරට බැඳ තබන ප්‍රබල බැම්මක් බව බුදුරජාණන් වහන්සේට අවබෝධ වුනා. රාගාදී කෙලෙස් වඩන මේ සුභ සංඥාව බිඳින්න අසුභ සංඥාව උන්වහන්සේ වදාළේ ඒ තුළින් ඇතිකර ගන්න සසර කලකිරීම විමුක්තියට උපකාර වන නිසයි.

අද මේ මාතෘකා කරගත්තු ගාථාවෙනුත් ඊට අදාළ කථා පුවතිනුත් මේ කාරණයට ගැළපෙන සාධක රාශියක් අපට මතු කරගන්න පුළුවන් වේවි. මේ ගාථා ධර්මය බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළේ රජගහනුවර වේළුවනාරාමයේ වැඩ වාසය කරන අවස්ථාවකයි. ඒ නගරයේ සිටිය සිරිමා නමැති නගර ශෝභිනිය, ගණිකාව, පිළිබඳ කාරණයක් නිසයි මේ දේශනාව වදාළේ. රජගහනුවර සිටිය සිරිමා නමැති ඒ ගණිකාව ජීවක වෙදතුමාගේ නැගණියයි. රූප සම්පත්තියෙන් බොහොම අගතැන් පත් සුප්‍රසිද්ධ නගරශෝභිනියක්ව සිටි ඇය එක අවස්ථාවක බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අහලා සෝවාන් ඵලයට පැමිණියා. පසුවදාම බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වහන්සේලාට විශාල දානයක් පවත්වලා අවසර ලබා ගත්තා දිනපතා තමාගේ නිවසෙහි සංඝයා වහන්සේලා අට නමකට සලාක බත් පිළිගැන්වීමට. "අට්ඨක භත්ත" නමින් හඳුන්වන සලාක බත් ක්‍රමයක් ඒ කාලේ තිබුණා. දිනපතා සංඝයා වහන්සේලා අටනමක් සලාක ක්‍රමයට, ලහබත් ක්‍රමයට, තෝරා ගෙන එතැනට වැඩම කරනවා. මේ තැනැත්තිය ඉතාම ශ්‍රද්ධාවෙන් ඉතාමත් ප්‍රණීත අන්දමින් දානය පූජා කරනවා. එක නමකට, තුන්හතර නමකට සෑහෙන දානය පූජා කරනවා.

එක දවසක්දා ඒ සිරිමාවගේ ගෙදර දානය වැළඳූ එක්තරා භික්ෂුවක් එයින් යොදුන් කීපයක් ඈත විහාරයකට වැඩම කළා. හැන්දෑවේ සංඝයා

වහන්සේලා රැස්වූ අවස්ථාවේ සංඝයා වහන්සේලා මේ භික්ෂුවගෙන් ඇසුවා අද කොහේදීද දානය වැළඳුවේ කියලා. ඉතින් කිව්වා සිරිමාවගේ "අට්ඨක භත්ත" දානය වළඳලයි ආවේ කියලා. "කොහොමද හොඳට දානය එහෙම දෙනවාද" කියලා ඇසුවා. 'අපොයි ඒක වර්ණනා කරන්න බැරිතරම්. ඉතාම ප්‍රණීත අන්දමින් දානය දෙනවා දෙතුන් නමකට සෑහෙන තරම්. හැබැයි දානයටත් වඩා ඇයගේ රූප ශෝභාව විශිෂ්ටයි' කියලා කිවුවා. ඒක මේ මේ විධියයි කියලා රූප ශෝභාව හිටන් වර්ණනා කළා. මේක අහලා එතන සිටි තරුණ භික්ෂුවකට අදහසක් පහළවුනා. කොහොමහරි මේ තැනැත්තිය දකින්න ඕන කියල. එදාම පිටත් වෙලා පස්සෙන්දා එළිවෙන යාමය වෙනකොට අර ප්‍රදේශයට පැමිණිලා සලාක භත්ත වාරය ලබා ගත්තා. මේ අතරතුර යම්කිසි සිද්ධියක් සිරිමාවගේ නිවසේ සිද්ධ වුනා. කලින් දවසේ භික්ෂූන් වහන්සේලා දානය වළඳලා වැඩිය හැටියෙම වාගේ සිරිමාවට යම්කිසි බරපතල ආබාධයක් හැදිලා ආභරණ ඉවත් කරලා ඇඳේ හාන්සි වුනා. පස්සෙන්දා අර භික්ෂුව සළාක භත්ත වාරයට පැමිණෙන වෙලාව වෙනකොට ඇයට නැගිටින්නත් බැරි තරම් දුර්වලයි. සංඝයා වහන්සේලා වැඩියයි කියල දැන්වූවාම දාසියන්, එහෙනම් ඔය කට්ටියම දානය සූදානම් කරල පිළිගන්වන්නය කීවා. දානය පිළිගැන්වූවාට පසු අවසානයේ ඒ සංඝයා වහන්සේලාට වඳින්න සිරිමාව කිට්ටු වුනේ අර දාසියන්ගේ පිහිටෙන්. වාරු කරගෙන වෙව්ල වෙව්ලා ඇවිල්ලා සංඝයා වහන්සේලාට වැන්දා. මේකෙන් ඇතිවුන යම්කිසි සංවේගයක් නිසා අර භික්ෂුව දානය එතැනදී වැළඳුවෙත් නැහැ. පාත්‍රයත් අරගෙන විහාරයට ගිහිල්ලා දානය නොවළඳාම පාත්‍රය පැත්තකින් තියලා හාන්සි වුනා. අනික් සංඝයා වහන්සේලා දානය වළඳන්න කිව්වත් ආහාර ගත්තේ නැහැ. ඔය විදියට තුන් දවසක් ගතවුනා. මේ අතරතුර ඔය කියන දවසෙ හැන්දෑවෙම සිරිමා අර රෝගය නිසා කාලක්‍රියා කළා. රජ්ජුරුවෝ පණිවිඩයක් ඇරියා බුදුරජාණන් වහන්සේට, 'ජීවක වෙදතුමාගේ නැගණිය සිරිමාව කළුරිය කළා' කියලා. බුදුරජාණන් වහන්සේත් රජතුමාට ආපසු පණිවිඩයක් යැව්වා 'සිරිමාගේ ශරීරය දවන්න එපා, අමු සොහොනෙහි බලු කැණහිලුන්ට කිට්ටුවෙන්න බැරිවෙන හැටියට ආරක්ෂා කර තබන්න' කියලා.

ඔහොම දවස් තුනක් ගතවුනාට පසුව හතරවෙනි දවස වෙන කොට අර ශරීරය පුපුරපු බත් හැලියක් වගේ, පණු කැදැල්ලක් වගේ නවදොරින් පණුවන් වැගිරෙන්න පටන් ගත්තා. ඉතින් ඒ වගේම බුදුරජාණන් වහන්සේගේ උපාය කෞශල්‍යය අනුව රජ්ජුරුවෝ අණ බෙර ලැව්වා "මේ නගරයේ ඉන්න හැම කෙනෙක්ම ගෙවල් ආරක්ෂාවට ඉන්න දරුවන් හැර අනෙක්





හැම දෙනෙක්ම අමු සොහොනට පැමිණෙන්නෙයි, නොපැමිණියොත් කහවණු අටක් දඩය" කියලා. ඒ වගේම බුදුරජාණන් වහන්සේටත් සංඝයා වහන්සේලාටත් ආරාධනය කළා. බුදුරජාණන් වහන්සේත්, සංඝයා වහන්සේත් වැඩම කරන්න සූදානම් වන අවස්ථාවේ අර තරුණ භික්ෂුව ඉන්න තැන ඒ අනික් භික්ෂූන් වහන්සේලා කිව්වා අන්න ශාස්තෲන් වහන්සේ සිරිමාව දකින්න යනවා කියලා. 'සිරිමා' කියන වචනය ඇහුන හැටියේම දනිපනිගාලා මේ භික්ෂුව නැගිටල මොකක්ද කිව්වේ කියලා ඇසුවා. බුදුරජාණන් වහන්සේ සිරිමාව දකින්න යනවා කිව්වා, ඔබ වහන්සේත් වඩිනවාද කියලා ඇසුවා. 'අපොයි යන්න ඕන' කියලා නැගිටලා පිළුණු වෙල ඒ වෙනකොට බත්.පිළුණු වෙච්ච බත්ටික වීසිකරලා පාත්තරෙත් මළකඩ කාල තිබුණා. ඒකත් හෝදලා එල්ලගෙන ඔන්න පිටත්වුණා. ඒ වෙනකොට සිවුපිරිස එතන රැස්වෙලා හිටියා. බුදුරජාණන් වහන්සේ ඇසුවා රජතුමාගෙන් කාගෙද මේ සිරුර කියල. මේ අර සිරිමාවගේ සිරුරයි කිව්වා. එහෙනම් නගරයෙ අඬබෙර ගහලා මේ සිරිමාවගේ ශරීරය වෙන්දේසි කරන්නෙයි කිව්වා. මේ කාලෙ හැටියට කියනව නම් ඉතින් වෙන්දේසි ලන්සුව කහවණු දාහයි, සිරිමාව දිනකට අය කරන ගණනයි. කහවණු දහසක් ගෙවලා මේ සිරිමාවගේ ශරීරය ගන්න කැමති කෙනෙකුට ගන්න කියල අඬබෙර ගැසුවා. කවුරුවත් නැහැ සද්දයක්. එහෙනම් ගණන අඩුකරන්න කීවා. කහවණු පන්සියයක්, සියයක්, පණහක්, දහයක්, කහවණුවක්, අඩුම ගණනේ කාකණිකයක් කියන ඉතාමත්ම අඩු මුදලක්. ඒ කාලෙ හැටියට. ඒක කිව්වත් කවුරුවත් ගන්න සූදානම් නැහැ. ඒ සැරේ නොමිලේ හරි ගන්න කිව්වා. ඒත් කවුරුවත් ගන්න සූදානම් නැහැ. එතකොට ඔන්න බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. "මහණෙනි, පේනවා නේද වෙනදා කහවණු දහසක් ගෙවලා දවසකට ඇසුර ලබා ගත්තු ඒ සිරිමාවගේ සිරුර දැන් නිකම්වත් ගන්න සූදානම් නැහැ. ඔන්න ඕකයි ශරීරයේ තත්ත්වය." කියල ඒ අවස්ථාවෙ තමයි මේ වටිනා ගාථාව වදාළේ.

**පස්සෙ චිත්තකතං බිම්බං**
**අරුකායං සමුස්සිතං**
**ආතුරං බහු සඞ්කප්පං**
**යස්ස නත්ථි ධුවං ඨිති**

එක එක වචනයක්ම ඉතාම ගැඹුරුයි. 'පස්සෙ චිත්තකතං බිම්බං - ආරුකායං සමුස්සිතං' විසිතුරු කොට ඔසවා තබන ලද තුවාල පිරුණු මේ පිළිරුව, 'බිම්බං' මේ පිළිරුව දෙස බලන්න. 'ආතුරං බහු සඞ්කප්පං - යස්ස නත්ථි ධුවං ඨිති' රෝගාතුර වූ බොහෝ සංකල්පනා අවදිකරන්නා වූ

මේ සිරුරේ කිසිම නොවෙනස් වන බවක් නිත්‍ය බවක් ස්ථිර බවක් නැත. කියන කාරණයයි ගාථාවෙන් කියවෙන්නේ.

ඉතින් මේ දේශනාව අහලා අර භික්ෂූන් වහන්සේත් සෝවාන් ඵලයට පැමිණියා කියලා සඳහන් වෙනවා. ඒ වගේම විශාල පිරිසකට ධර්ම අවබෝධය වූ බවත් සඳහන් වෙනවා. මේ කථාන්තරය ආශ්‍රයෙන් අපට හිතා ගන්න පුළුවන් අර ශරීරයේ තත්ත්වය පෙන්නුම් කිරීමට බුදුරජාණන් වහන්සේගේ උපාය ඥානය අනුව යම්කිසි වෙන්දේසියක් පැවැත්වූවා. මේ කාලයේ පැවැත්වෙන මල්වට්ටි වෙන්දේසියකින් තරම්වත් ආදායමක් නම් ලැබුනේ නැහැ. නමුත් අමිල ආදායමක් හැටියට තිබුණේ අන්න අර ලෝකෝත්තර මාර්ග ඵල ලැබුණා, ඒ වෙන්දේසිය නිසා. ඉතින් ශරීරයේ යථා තත්ත්වය හෙළිකරන්නයි බුදුරජාණන් වහන්සේ එක එක වචනයක් පාසා මේ ගාථාවේ යොදලා තිබෙන්නේ.

'පස්ස චිත්තකතං බිම්බං' නොයෙකුත් විදියේ හැඩගැන්වීම් වලින්, විලාසිතා වලින්, විසිතුරු කරල තිබුනත් මේ බිම්බය, බිම්බය කියලා කිව්වේ, පිළිරුවක් වගේ මේක. ඇට නහර වලින් කෙළින් කරලා හේත්තු කරලා තියෙන මේ පිළිරුව ආතුරං - රෝගාතුරයි. ඔය ගිරිමානන්ද සූත්‍රයේ කියන්නා වගේ රෝගාදියක් නැතත්, සම්මත රෝග නැතත් අවම වශයෙන් අර සීතං, උණ්හං, ජිඝච්ඡා, පිපාසා, උච්චාරො, පස්සාවො කියන ශරීරයට ආවේණික මූලික ලෙඩ හය තියෙනවා.

සීතල දැනෙනවා
උෂ්ණය දැනෙනවා
කුසගින්න දැනෙනවා
පිපාසය දැනෙනවා
මලමුත්‍ර පහකිරීමට සිද්ධ වෙනවා

ඔන්න ඔය තත්ත්වයයි මේ ශරීරයේ තියෙන්නේ. ඒ වගේම ආතුරභාවය පෙන්නුම් කරන එකක් තමයි, එක ඉරියව්වක ශරීරය තබා ගන්න බැහැ. ලෙඩෙක් වගේ නිරන්තරයෙන්ම ශරීරයේ ඉරියව් වෙනස් කරන්න සිද්ධ වෙනවා. ශරීර තත්ත්වය ඔහොමයි. නමුත් මේක "බහුසංකප්පං" මේක ලෝකයාගේ -ඔය කලාකරුවන්ගේ, සිත්තරුන්ගේ, කවියන්ගේ- කවි සංකල්පනා අවදිකරවන පිළිරුවක්. "ආතුරං - බහුසඞ්කප්පං". නමුත් මේකෙ "යස්ස නත්ථි ධුවං ඨිති" ස්ථිර භාවයක් නැත කියන එකයි බුදුරජාණන් වහන්සේ වදාළේ. ඉතින් ඒ ගාථාවත් දේශනාවත් අහලා ශරීරයේ යථා ස්වභාවය අවබෝධ කරගැනීමෙන් විශාල පිරිසක් ඒ අවස්ථාවේ





ධර්මාවබෝධය ලැබුවා.

අර භික්ෂුව ගැන හිතලා බැලුවත් අපට යම්කිසි ධර්මතාවක් මතු කරගන්න පුළුවන්. දැන් කුඩා දරුවෙක් වුනත් සමහර විට සබන් බෝල පුම්බනවා. සබන් බෝලයක් පුම්බලා ඒක හොඳට ලස්සණට පේනකොට පිටිපස්සෙන් එළවනවා. අන්තිමට බිඳිලා ගියාම කොයි තත්ත්වයටද පත්වන්නේ? අන්න ඒවගේ දෙයක් අර තරුණ භික්ෂුවටත් සිද්ධ වුනේ. දුර බැහැර ඉඳලා ආව සිරිමාවගේ සිරිය බලන්න. නමුත් ඒ වෙනකොටත් ලෙඩවෙලා වෙව්ල වෙව්ල අනිත් අය වාරු කරගෙන යන ලෙඩ සිරිමාවක්. ඊට පස්සේ දවස් තුන හතරකට පස්සේ ඒ වචනය ඇහෙන කොටම නැගිටලා ආවේ අදවත් සිරිය බලන්න පුළුවන් කියලා හිතාගෙනයි. එතකොට අන්තිමට පණු කැදල්ලක් වගේ මළසිරුරක්. ඒකම ඇති ඒ භික්ෂුවට මෙතෙක් මවාගන සිටිය ශරීරය පිළිබඳ චිත්‍රය බිඳිලා යන්න. ඒක තුළින් අර ආදීනව- දැන් මේ සංසාරයේ පාඩම් තුනක් තියෙනවා ඉගෙන ගන්න.

ආස්වාද
ආදීනව
නිස්සරණ

කියලා ශ්‍රේණි තුනක් තිබෙනවා. ආස්වාද පක්ෂය කියලා කියන්නේ පංචකාම සම්පත්තියට අදාළව රූප ශෝභාදියෙන් ඇති කර ගන්නා ආස්වාදයයි. රස වින්දනයයි. බුදුරජාණන් වහන්සේ ඒක නැතැයි කියන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ කියනවා එහෙම ආස්වාද පක්ෂයක් නැත්නම් ලෝකයා ආස්වාදය ඔස්සේ දුවන්නේ නැහැ කියලා. ඒක පිළිගන්නවා. නමුත් ඊට වඩා ආදීනව පක්ෂය තියනවා. ඒ ආදීනව නිසා තමයි යම් අවස්ථාවක ආස්වාද පක්ෂයේ දුවපු තැනැත්තන්ම අන්තිමට ඒකේ ආදීනව දැකලා කලකිරෙන්නේ. ඒ කලකිරුණ අවස්ථාවේ ධර්මය හරියට වැටුනොත් ඊළඟට තුන්වැනි අවස්ථාව හැටියට දක්වන තත්ත්වයට පත්වෙනවා. ඒ නිස්සරණයයි. නිස්සරණ කියන්නේ එයින් නික්මීම, වෙන්වීම, මිදීම. ඒ නිස්සරණයට උපකාර වන්නේ බුදුරජාණන් වහන්සේගේ ත්‍රිලක්ෂණ දේශනාවයි. අනිත්‍ය දුක්ඛ අනාත්ම. ඒකයි මේ ලෝකයේ අපට නිවන් කරා යන්න තියෙන්නේ නිස්සරණයයි.

මේ කථාන්තරයත් ගාථාවත් තුළින් බුදුරජාණන් වහන්සේ මතුකරලා දුන්නේ ඔය තත්ත්වයයි මේක ඉතාමත්ම ක්‍රමානුකූලව ධර්මයේ දක්වෙන අවස්ථාවක් තියනවා. බොහොම ප්‍රකට වටිනා සූත්‍රයක් "මහා දුක්ඛක්ඛන්ධ

සූත්‍රය" කියලා මැදුම් සඟියේ. බුදුරජාණන් වහන්සේ මහා පුදුම අන්දමට සංඝයා වහන්සේලා සමඟ සංවාද වශයෙන්, එහෙම නැත්නම් ප්‍රශ්නෝත්තර වශයෙන් මෙන්න මේ කාරණා ඒත්තු ගන්වන්න උත්සාහගත් ආකාරය දක්වෙනවා. එක් අවස්ථාවක සංඝයා වහන්සේලාගෙන් අහනවා,

"මහණෙනි, ක්‍ෂත්‍රිය තරුණියක්-කන්‍යාවක් කියලා එතැන කියන්නේ, ක්ෂත්‍රිය තරුණියක් හෝ බ්‍රාහ්මණ තරුණියක් හෝ ගෘහපති තරුණියක් හෝ ඉන්නවා වයස පහළොව දහසයේ පමණ, පමණට වඩා උසත් නැති, මිටිත් නැති, කෙට්ටුත් නැති, මහතත් නැති, පමණට වඩා කළුත් නැති, සුදුත් නැති, හොඳ වර්ණ ශෝභාව ඇති කෙනෙක්. කොහොමද, මහණෙනි, මොකද කියන්නේ ඒ අවස්ථාවේ ඒ තැනැත්තියගේ රූප ශෝභාව ඉතා උසස් නේද? උසස් රූප ශෝභාවක් තිබෙනවා නේද?"

"එහෙමයි ස්වාමීනි"

"හොඳයි මහණෙනි, රූපය නිසා යම් සොම්නසක් ඇතිවෙනවා නම් ඒක තමයි රූපයේ තියන ආස්වාදය"

රූපයන්ගේ ආස්වාද ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ එතන ප්‍රකාශ කළා. සංඝයා වහන්සේලාත් එකඟවුනා. ඒ ලස්සනට ඉන්න අවස්ථාවේ යම් සැපයක් සොම්නසක් ඇතිවෙනවා නම් ඒක තමා ආස්වාද පක්ෂය.

ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ පටන් ගන්නවා.

"දැන් මහණෙනි, එම නැගණියම අවුරුදු අසූවක් අනූවක් සියයක් ගතවුන තැන ඉතාම ජරාජීර්ණ, මහලු තත්ත්වයට පත්වෙලා අර නැමුණු පරාළ කොන් දෙකක් වගේ වක ගැහිලා, කඩදත් ඇතිව, කෙස් පැහිලා, තට්ටය පෑදිලා, ඇඟ රැළි වැටිලා, තැන තැන කළු පැල්ලම් මතුවෙලා තියන අවස්ථාවට පත්වෙලා ඉන්න කොට, මොකද මහණෙනි හිතන්නේ. අර කලින් තිබුන ශෝභාව අතුරුදහන් වෙලාද, ආදීනව මතු වෙලාද?"

"එහෙමයි ස්වාමීනි."

"නැවත ද මහණෙනි, ඒ නැගණියම දකින්න ලැබෙනවා ඉතාමත් බලවත් සේ රෝගාතුර වෙලා, තමාගේ මළමුත්‍ර වල ගැලිලා, අන් අය විසින් නැගිට්ටුවන අන් අය විසින් හාන්සිකරවන තත්ත්වයට පත්වෙලා ඉන්නවා. මොකද මහණෙනි හිතන්නේ. ඒ අවස්ථාවේ ඒ අර කලින් තිබුන රූප ශෝභාව අතුරුදහන් වෙලාද ආදීනව මතුවෙලාද?"





"එහෙමයි ස්වාමීනි"

ඕකත් ඔන්න රූපයේ ආදීනවයක් කියලා බුදුරජාණන් වහන්සේ තහවුරු කරනවා. ඊළඟට බුදුරජාණන් වහන්සේ කියනවා,

"නැවතද මහණෙනි එම නැඟණියම දකින්න ලැබෙනවා අමුසොහොනක දමලා තියනවා අතහැරලා. දවසක්, දෙකක්, තුනක් ගතවෙලා ඉදිමිලා, නිල්වෙලා, පැසවලා, සැරව වැගිරෙන තත්ත්වයට පත් වෙලා සිටින අවස්ථාව. මොකද මහණෙනි හිතන්නේ අර කලින් තිබුන රූප ශෝභාව අතුරුදහන් වෙලාද ආදීනව පහළවෙලාද?"

"එහෙමයි ස්වාමීනි"

'ඔන්න ඕකත් ආදීනවයක් රූපයේ'

"නැවත ද මහණෙනි, ඒ නැඟණියම දකින්න ලැබෙනවා කපුටන් විසින් කනු ලබන, ගිජුලිහිණියන් විසින්, උකුස්සන් විසින් කනු ලබන බල්ලන් හිවලුන් අනිකුත් සතුන් විසින් කනු ලබන අවස්ථාවට පත්වෙලා පණුවන් ගැසූ ශරීරයක් හැටියට. මොකද මහණෙනි සිතන්නේ? අර කලින් තිබුන රූපශෝභාව අතුරුදහන් වෙලාද? ආදීනව මතු වෙලාද?"

"එහෙමයි ස්වාමීනි"

'ඔන්න ඕකත් මහණෙනි රූපයේ ආදීනවයක්'

"නැවත ද මහණෙනි, එම නැඟණියම දකින්න ලැබෙනවා මස්, ලේ සහිත නහර බැම්මෙන් බැඳුණු ඇට සැකිල්ලක් හැටියට, සොහොනේ අතහැරලා දාලා සිටිනවා මොකද හිතන්නේ අර කලින් තිබූ රූප ශෝභාව අතුරුදහන් වෙලාද ආදීනව මතුවෙලාද"

"එහෙමයි ස්වාමීනි"

"ඔන්න ඕකත් මහණෙනි රූපයේ ආදීනවයක්"

"නැවතද මහණෙනි, එම නැඟණියම දකින්න ලැබෙනවා මස් නැතිව, ලේ තැවරුන නහර බැම්මෙන් බැඳුණු ඇටසැකිල්ලක් හැටියට සොහොනේ දමලා තිබෙනවා. මොකද මහණෙනි හිතන්නේ අර කලින් තිබූ රූප ශෝභාව අතුරුදහන් වෙලාද ආදීනව මතු වෙලාද?"

"එහෙමයි ස්වාමීනි"

"ඔන්න ඕකත් මහණෙනි රූපයේ ආදීනවයක්"

"නැවත ද මහණෙනි, එම නැඟණියම දකින්න ලැබෙනවා ලේ මස් ඉවත්වුණු නහර බැම්මෙන් පමණක් බැඳුණු ඇට සැකිල්ලක් හැටියට සොහොනේ අතහැරලා දාලා තියනවා මොකද මහණෙනි හිතන්නේ ඒ අවස්ථාවෙ අර කලින් තිබූ රූප ශෝභාව අතුරුදහන් වෙලාද? ආදීනව මතු වෙලාද?

"එහෙමයි ස්වාමීනි"

"ඔන්න ඕකත් රූපයේ ආදීනවයක්"

"නැවත ද මහණෙනි, එම නැඟණියම දකින්න ලැබෙනවා නහර බැම්මෙනුත් මිදිලා, ඇට ඒ ඒ තැන විසිරිලා, එක පැත්තක අත් ඇට, තව පැත්තක පා ඇට, තව පැත්තක කෙණ්ඩා ඇට, තව පැත්තක කලවා ඇට, තව පැත්තක උකුල් ඇට, තව පැත්තක පිටකටුව, තව පැත්තක හිස් කබල. ඒ අවස්ථාවේ මොකද මහණෙනි හිතන්නේ අර කලින් තිබූ රූප ශෝභාව අතුරු දහන් වෙලාද? ආදීනව මතුවෙලාද?"

"එහෙමයි ස්වාමීනී"

'ඔන්න ඕකත් රූපයේ ආදීනවයක්'

"නැවත ද මහණෙනි, එම නැඟණියම දකින්න ලැබෙනවා තනිකර ඇට ගොඩක් බවට පත්වෙලා, අවුරුද්දක් විතර ගතවුනාට පසුව හරියට හක් ගෙඩියක් වගේ සුදුපාටට හැරුණු ඇට ගොඩක් එකතු කරලා තියනවා. ඊළඟට ඒ ඇට ගොඩම තවත් කල්ගත වුනාම දිරලා කුණුවෙලා සුණු බවට පත්වෙලා තිබෙනවා. මොකද මහණෙනි හිතන්නේ අර ඒ නැඟණියගේ අවුරුදු පහලොව දහසය වයසේ සිටියදී තිබූ රූපශෝභාව අතුරුදහන් වෙලාද ආදීනව මතුවෙලාද"

"එහෙමයි ස්වාමීනී"

'ඔන්න මහණෙනි, එතකොට රූපයන්ගේ ආදීනව'

"ඊළඟට කුමක් ද මහණෙනි රූපයන්ගෙන් නිස්සරණය"

නිස්සරණය කියන එකත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා.

"මහණෙනි, රූපයන් පිළිබඳව යම් ඡන්ද රාග විනයයක්, ඡන්ද රාගය සංසිඳවීමක්. ඡන්ද රාගය ප්‍රහාණය කිරීමක් ඒ කියන්නේ ඊට ඇති ඇල්ම, කැමැත්ත, රාගය දුරුකිරීමක් තිබෙනවා නම් අන්න ඒ තමයි රූපයන්ගේ නිස්සරණය, රූපයන්ගේ නික්මීම" කියලා





ඔන්න ඔය විදියට බුදුපියාණන් වහන්සේ ආස්වාද ආදීනව නිස්සරණ කියන අවස්ථා පියවරින් පියවරට සංඝයා වහන්සේලාට ඒත්තු ගන්වන්න ප්‍රශ්නෝත්තර වශයෙන් ඉදිරිපත් කරමින් පෙන්නූ අවස්ථාවක් ඒ මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රයේ සඳහන් වෙනවා.

අපි මේ ආශ්‍රයෙන් හිතා ගන්න ඕන බුදුපියාණන් වහන්සේ මේ හැම එකක්ම කළේ මොකටද අන්න අර ඡන්ද රාග ප්‍රහාණය සඳහායි. රූපයන්ගෙන් මිදීම කියලා කියන්නේ රූපයන් පිළිබඳව ඇති ඇල්ම නැතිවන ආකාරයට සිතුම් පැතුම් පැවැත්වීමයි. කලකිරීම, සසර කලකිරීම ඉස්මතු කිරීමටයි.

ඒ කාරණය තවත් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙනවා වටිනා ගාථාවකින්.

**නතෙ කාමා යානි චිත්‍රානි ලොකෙ**
**සංකප්පරාගො පුරිසස්ස කාමො**
**තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ**
**අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං**

'නතෙ කාමා යානි චිත්‍රානි ලොකෙ' ලෝකයේ තියන ලස්සන දේවල් නොවේ කාමයන්. 'සංකප්පරාගො පුරිසස්ස කාමො' සංකල්ප රාගයයි, සිතුම් පැතුම් පිළිබඳ ඇල්මයි, නියම වශයෙන් කාමය කියලා හඳුන්වන්නේ. පුරුෂයකුට කාමයක් වන්නේ. 'තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ' විචිත්‍ර විසිතුරු දේවල් ලෝකයේ කොතෙකුත් තිබෙනවා. නමුත් 'අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං' නුවණැත්තෝ ඒ පිළිබඳ ඡන්දය, කැමැත්ත, ඇල්ම දුරුකරනවා.

ඉතින් ඕකයි එතකොට ධර්මයේ ඉලක්කය. මේවායේ ආදීනව පක්ෂය වටහා ගැනීම තුළින් මේවායේ ඇති ඇල්ම යම් අවස්ථාවක සිතින් දුරුවුනා නම් ඒ අවස්ථාවේ සිත මුදාගන්න ශක්තියක් ලැබෙනවා. ඒ අවස්ථාවේ තමයි අර සිත තුළ විදර්ශනා ඥාන වශයෙන් අනිත්‍යතාව මුල්කරගෙන යම්කිසි සිතුවිලි පරම්පරාවක් ගැඹුරින් ගිහිල්ලා ඒ අවස්ථාවේ නිර්වාණය අවබෝධය වන්නේ මාර්ග ඵල තත්ත්වය හැටියට.

ඉතින් එතකොට අපට මේ ධර්මයෙ පියවරින් පියවරට යන්න බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළා ලෝකයේ තියන විචිත්‍ර දේවල්. ඒවායේ ආස්වාද පක්ෂයත්. 'අප්පස්සාද' ඒවායේ ආස්වාද පක්ෂය ටිකයි. 'ආදීනවො එත්ථ භියෙයා' ආදීනව පක්ෂය වැඩියි. කියන අවබෝධය තුළින් ආදීනව ගැන වඩා අවධානය යොමු කිරීමෙන් තමයි යම් අවස්ථාවක නිබ්බිදා කියල

කියන සසර කළකිරීම ඇති වන්නේ. ධර්මතාවක් හැටියට දක්වනවා 'නිබ්බිද විරාග විමුත්ති' - නිබ්බිද කියල කියන්නේ නිර්වේදය, ඒ කියන්නේ සසර කලකිරීමයි. ඒ සසර කලකිරීම තුළින් විරාගය කියල කියන නොඇල්මක් ඇතිවෙනවා. ඒ නොඇල්මෙන් තමයි චිත්ත විමුක්තියක් ඇතිවන්නේ. ඔන්න ඔය ධර්ම කාරණා ටිකයි මේ කථාන්තරයෙනුත් අපට මතුකර ගන්න පුළුවන් වන්නේ.

මේ කාරණයම සතිපට්ඨාන සූත්‍රය කියවන පින්වතුන් දන්නවා ඔය නවසීවථිකය වශයෙන් දක්වන අවස්ථා තමයි බුදුරජාණන් වහන්සේ 'මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රයේ ඉස්මතුකරලා දක්වූවේ. කායානුපස්සනාවට අදාළ කයේ යථා තත්ත්වය. ඇත්ත වශයෙන්ම යථාභූත ඥානය කියල කියන ශරීරයේ ඇති තතු වටහා ගැනීම, ශරීරයේත් ලෝකයේත් ඇති තතු වටහා ගැනීම තුළින් තමයි සසර කලකිරීම- 'නිබ්බිද'- ඇති වන්නේ. යථාභූත ඥානය ඇතිකරගෙන සසර නොකලකිරී ඉන්න බැහැ. ඒක ධර්මතාවක්. යථාභූත ඥානය ඇති වෙනවාත් සමඟම සසර කලකිරීම ස්වාභාවිකවම සිද්ධ වෙනවා. මොකද යථාභූත ඥානයට අයිතියි අන්න අර කියාපු තත්ත්ව. ආස්වාද ටිකයි, ආදීනව බහුලයි. ඒ වගේම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ත්‍රිලක්ෂණයට සියල්ලක්ම යටයි. හිත එයින් මෑත් කර ගැනීමයි ඡන්ද ප්‍රහාණය කියලා කිව්වේ.

මේ තත්ත්වය - සතිපට්ඨාන සූත්‍රයේ දක්වෙනවා. සතිය පිහිටුවීම පමණක් නොවේ සතිපට්ඨාන භාවනා කියල කියන ඉතාමත් ගැඹුරු විදර්ශනාවට යන චින්තන ක්‍රමයක් සතිපට්ඨාන සූත්‍රය තුළ තිබෙනවා. මේ අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාගේ සිතට දුන්නා යම්කිසි චිත්‍රයක්. ඉස්සෙල්ලම මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රයේ පසළොස්, සොළොස් හැවිරිදි තරුණියක් පිළිබඳ වර්ණ ශෝභාව පිළිබඳ චිත්‍රය අර සබන් බෝලයක් වගේ ඉදිරිපත් කළා. ඊට පස්සේ තමා ඒක බිඳෙන හැටි පෙන්නුවේ. ඒ වගේ මෙතැනත් සතිපට්ඨාන සූත්‍රයේත් ශරීරයේ යථා තත්ත්වය ක්‍රමානුකූලව දක්වලා එපමණක් නොවෙයි අනුන්ගේ ශරීරයට පමණක් සීමා කරන්නේ නැතිව ඒක තමාගේ ශරීරයට ආරෝපණය කරගැනීමේ ක්‍රමයක් සතිපට්ඨාන සූත්‍රයේ තිබෙනවා. ඒ ටික හැඳින්වෙන එක්තරා විශේෂ වචනයක් තිබෙනවා 'උපසංහරති' කියලා. උපසංහරති කියලා කියන්නේ තමාගේ කයටම පමුණුවා ගන්නවා. තමාගේ කය වෙතට ආරෝපණය කර ගන්නවා. දැන් ඒ සතිපට්ඨාන සූත්‍රයේ නවසීවථිකය දක්වන අවස්ථාවල පෙන්නුම් කරන්නේ 'සෙය්‍යථාපි' කියන උපමාවක් දක්වන ආකාරයට යම්සේ කෙනෙක් දකින්නේද මෙන්න මේ මේ විදියෙ රූපයක්. අමු සොහොනක විසිකරලා තියන මේ විධියේ රූපයක් යම්සේ





කෙනෙක් දකින්නේද කියලයි පටන් ගන්නේ. නමුත් ඒක අන්තිමට ඉවර වෙන්නේ 'සො ඉමමෙව කායං උපසංහරති' හෙතෙම ඒ දර්ශනය තමා වෙතම පමුණුවා ගන්නවා. තමා වෙතටම යොමු කරලා තේරුම් ගන්නවා. 'අයම්පි බො කායො එවං ධම්මො එවංභාවී එතං අනතීතොති.' මේ කයත් මේ විධියෙම ධර්මතාවකට යටයි. මේ විධියේ ස්වභාවයට පත්වෙනවා මේ තත්ත්වය ඉක්ම වූ දෙයක් නොවේ මගේ ශරීරය කියලා තමා වෙතටම ආරෝපණය කර ගන්නවා.

මේ කාරණය සතිපට්ඨාන සූත්‍රයේ ක්‍රමානුකූලව දක්වෙන්නේ 'අජ්ඣත්ත බහිද්ධා' කියන දෙපැත්තත් ඒ දෙක එකතු කරලා 'අජ්ඣත්ත බහිද්ධා' කියල එක වරට සළකා ගැනීමත් කියන අන්න ඔය විදියෙ ගැඹුරු විදර්ශනාවකට යන ඉගැන්වීමක් මේ සතිපට්ඨාන සූත්‍රයෙ තිබෙන්නෙ. මේ කාරණය යම්කිසි උපමාවකින් කියනවා නම් දැන් දලි පිහියක් කරගලක හරි, පටියක හරි, මදිනකොට විටෙක ඒක උඩහට මදිනවා. තවත් විටෙක පහළට මදිනවා. තවත් විටෙක වේගයෙන් ඉහළටත් පහළටත් මදිනවා. මොකද ඒ? අර මුවහත පැති දෙක විතරක් නොවේ මුවහතත් මැදෙන්න ඕනෑ. මුවහත හරියට පෑදෙන්නේ අන්න අර තුන්වෙනි අවස්ථාවෙයි. ඉහළට ඉහළට ඉහළට, පහළට පහළට පහළට, ඉහළට පහළට, ඉහළට පහළට, ඉහළට පහළට මදිනකොට තමයි අන්න හරියට මුවහත හැදෙන්නේ. පන්නරය එන්නෙ දලි පිහියේ.

ඒ වගේ දෙයක් තමයි මෙන්න මේ විදර්ශනාවෙත් ඇතැම් කෙනෙක් අර කියාපු විදියට වෙන කෙනෙකුගේ ශරීරයක් ඇත්ත වශයෙන් මළසිරුරක් උපකාර කරගන්නෙ. තමන්ට මැරුණට පස්සෙ ඒක කරන්න බැහැනේ. කාගෙහරි මියගිය කෙනෙකුගේ ශරීරයක් හිතින් හරි මවා ගන්නවා. මේ කාලයේ නම් ඒකට නොයෙකුත් ක්‍රම තියෙනවා දකින්නටත් පවා. ඒ කාලයේත් තිබුනා අමු සොහොන් වල කදිමට දකින්න. මේ කාලයේ රූප වශයෙන් හරි දකින්න පුළුවන්. නමුත් එයින් ප්‍රයෝජන ගැනීමයි එතැන ප්‍රධාන වන්නේ. යම්සේ දකින්නේද, දැක්කා හෝ දැක්ක දෙයක් ආශ්‍රයෙන් සිතෙන් මවාගෙන ඊළඟට ඒ තත්ත්වය තමා වෙතම ආරෝපණය කර ගන්නවා. මේක භාවනාවක් වශයෙන් වැඩීමේදී ඒක කුළුගැන්වෙන අවස්ථාවෙදි අන්න අර කියාපු ඉහළට පහළට කියන දෙක, එකවරට යන්න වගේ සියුම් අන්දමින් තමාගේ කයට ආරෝපණය වන අවස්ථාවක් තියෙනවා. එතෙන්දීයි යථාභූත ඥානය මතු වන්නේ. **එතෙන්දීයි යථාභූත ඥානය මතුවන්නේ.** ඒක නිසා අතීත ආචාර්යවරු කියන්නේ ඇතැම් කෙනෙක් චරිතානුකූලව තමන්ගේ ශරීරයෙන් පටන්ගෙන මේ ශරීරයම වගේ තමයි අනික් කයත් කියල එහෙම තේරුම් ගන්නවා. තවත් කෙනෙක්

අනුන්ගේ ශරීරයෙන් පටන්ගෙන විදර්ශනාව කුළු ගන්වනවා තමාගේ ශරීරයට ආරෝපණය කරලා. ඒ ඒ පුද්ගලයින් පිළිබඳව - දැන් ඛේමා, රූපනන්දා ආදී රූපසම්පත්තිය පිළිබඳ මාන්නය ඇති අයට බුදුරජාණන් වහන්සේ වෙන ශරීරයක් මවා පෙන්වලා ඒක දිරාපත්වන ආකාරය පෙන්නුම් කළා. ඒවගේ නේද මාත්? මටත් වන්නේ මේක නේද කියලා හිතන්න සැලැස්සුවා. දැන් මෙතැනදිත් සිරිමාවගේ ශරීරය ගැන ලොකුවට හිතාගත්තු අර භික්ෂුවට අන්තිමට ඒ තත්ත්වයම නේද මේකත් කියල වැටහෙන්න ඇති. ඒ වැටහීම තුළින් තමයි අන්න විදර්ශනාව සම්පූර්ණ වුනේ.

ඉතින් ඔය 'අජ්ඣත්ත බහිද්ධා' කියන ඇතුළත පිටත භේදය අපි ඇති කර ගත්තු කෘත්‍රිම භේදයක්. ඇතුළත තියෙන්නෙත් ධාතු හතර, පිටත තියෙන්නෙත් ධාතු හතර. ඇතුළත තියන ශරීරවල තත්ත්වයත් ඒකයි. පිටත තියන ශරීරවල තත්ත්වයත් ඒකයි. නමුත් අපේ අවිද්‍යාව නිසා, මෝහය නිසා, අපි මේවා වෙන්කරගෙන ඒ පිළිබඳ ඇලීම් ගැටුම් ආදිය ඇතිකර ගන්නවා. බුදුරජාණන් වහන්සේ අන්න මතුකරලා දෙනවා ඉස්සරවෙලා ඇතුළත ගැන හිතන කෙනා ඊළඟට යම්කිසි අවස්ථාවක බැහැර ශරීරය ගැනත් හිතන්න ඕනෑ. අන්තිමට ඒ දෙක එකතුවෙන අවස්ථාවයි 'අජ්ඣත්ත බහිද්ධා' වශයෙන් තිබෙන්නේ. ඒ අවස්ථාවේ තමයි විදර්ශනාව කුළු ගැන්වෙන්නේ පුදුම ආකාරයට. ඇතැම් විදර්ශනා යෝගීන්ට ප්‍රත්‍යක්ෂය ලැබිලත් ඇති ඔය ඇටසැකිල්ලක් ගැන හිතන අවස්ථාවේ අපොයි මගේ ශරීරයත් මේකම නේද කියලා. සමහර විට මේ කාලයේ එක්ස්රේ කරන්නා වගේ තමාගේ ශරීරයත් පිට ශරීරත් පේන්න පුළුවන් සමහර අවස්ථා වල. ඒක ස්වාභාවිකයි. ස්වභාවිකයි කියන්නේ විදර්ශනා ඥානයට. සාමාන්‍ය ඇසට නොපෙනෙන තත්ත්වයක් විදර්ශනා නුවණට වැටහෙනවා.

අතීත කථාන්තර වල අහල තියෙනවනේ අර දත් ඇට දකලා ඇටසැකිල්ලක් පාරේ ගියා කියන තිස්ස ස්වාමීන් වහන්සේ පිළිබඳ ප්‍රවෘත්තිය. එයින් අපට පෙනෙනවා. අට්ඨික සංඥාව ප්‍රබල අන්දමින් වැඩූ සංඝයා වහන්සේ නමක් පිණ්ඩපාතය වඩිනා අතර යම්කිසි ස්ත්‍රියක් ස්වාමිපුරුෂයා සමඟ කලහකරගෙන ගෙදර යන්න සූදානම් වෙලා කැලෑ පාරකින් යනවා දක්කහම ඒ ස්ත්‍රිය කෙලෙස් වශයෙන් හයියෙන් සිනාසුනා. මේ භික්ෂුන් වහන්සේ අර ශබ්දයට බැලුවා. බලනකොට දත් ටිකයි පෙනුනේ. ඊට වඩා බැලුවේ නැහැ සංවර නිසා. දත්ටික ආශ්‍රයෙන් කමටහනයි මතුවුනේ. පස්සේ ඒ ස්ත්‍රිය සොයාගෙන ආපු ස්වාමිපුරුෂයා ස්ත්‍රියක් යනවා දැක්කද කියල ඇහුවම භික්ෂුන් වහන්සේ කීවා 'ස්ත්‍රියක්ද පුරුෂයෙක්ද දන්නේ නැහැ. ඇටසැකිල්ලක් නම් ගියා' කියලා. බොරුවක් නොවේ කීවේ. ඒ





සංඝයා වහන්සේගේ විදර්ශනා ඥානයට, විදර්ශනා ඇසට පෙනිච්ච ටිකයි ඒ අවස්ථාවේ ප්‍රකාශ කළේ. ඔය විධියේ දේවල් අට්ඨිකයක් හෝ උද්ධමාතකයක් හෝ ඒ විධියේ කමටහනක් වඩන පින්වතෙකුට වුනත් ඒ තත්ත්වය ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ වන්න පුළුවන්. ඉතින් ඒකයි අර කරගලේ මදින දැලිපිහිය හොඳ හැටි මුවහත් වෙන වෙලාවයි ඒක. ඒක තුළින් යථාභූත ඥානය. මේ දෙකේ වෙනසක් නැහැ.

ඒ ටික ධර්ම සාහිත්‍යයේ සඳහන් වෙනවා බුද්ධ වචනයක් හැටියට ඔය කායවිච්ඡන්දනික ගාථා නමින් හැඳින්වෙන සම්පූර්ණ කමටහනක් වගේ වටිනා සූත්‍ර දේශනාවක් සුත්ත නිපාත ග්‍රන්ථයේ එනවා. ඒක විජය සූත්‍රය නමිනුත් හැඳින්වෙනවා. ඒකේ තියනවා මේ ධර්මතාව කෙටියෙන් දක්වලා.

**යථා ඉදං තථා එතං - යථා එතං තථා ඉදං**
**අජ්ඣත්තංච බහිද්ධාච - කායෙ ඡන්දං විරාජයෙ**

'යථා ඉදං තථා එතං' මේ කය යම්සේද ඒ කයත් එසේමය. 'යථා එතං තථා ඉදං' ඒ කය යම්සේද මේ කයත් එසේමය. 'අජ්ඣත්තංච බහිද්ධාච' ඇතුළතත් පිටතත්, 'කායෙ ඡන්දං විරාජයෙ' කය පිළිබඳ ඡන්දය, කැමැත්ත, ආශාව දුරලන්නේය. අන්න ඒ ධර්මතාවයි ඒකෙන් පෙන්නුම් කරන්නේ. කොයි තරම් පුදුම ධර්මයක් ද මේ තුළ තියෙන්නේ? කායානුපස්සනාව වශයෙන් බලනකොට අසුභ භාවනාව හෝ යම්කිසි කර්මස්ථානයක් කරන කොට විදර්ශනාව කුළු ගැන්වෙන අවස්ථාවේදී ඇතුළත පිටත භේදය මැකිලා යනවා.

ඒ වගේම තවත් පැත්තක් තිබෙනවා සතිපට්ඨාන සූත්‍රය ගැන හිත යොදන මේ පින්වතුන්ට සමහරුන්ට ගැටළුවකුත් වෙන, දැන් අර 'අජ්ඣත්ත බහිද්ධා' කියලා වෙන වෙනම දක්වලා එකට එකතු කරලා අජ්ඣත්ත බහිද්ධා' කියලා දක්වන්නා වගේ,

'සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති. වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. සමුදයවයධම්මානුපස්සී වා කායස්මිං විහරති'

කියලා තවත් ප්‍රහේලිකා විධියේ පාඨ සතිපට්ඨාන සූත්‍රයේ සඳහන් වෙනවා. ඒකේ අදහස එක් එක් පියවරක් පාසා, කායානුපස්සනා කොටසේ කයේ විවිධ කොටස් ගැන කියන අවස්ථාවේ ඒවායේ හටගැනීම් ස්වභාවය, දකිමින්, සමුදය පැත්ත බලමින් වාසය කරනවා. ඒ වගේම වයධම්මානුපස්සී වා, එය ගෙවී යන ආකාරයත් බලමින් වාසය කරනවා. විටින් විට ශරීරය ඇතිවන ආකාරයත්, ආහාර ආදිය තුළින් ශරීරය ඇතිවන ආකාරයත්. මෙනෙහි කරනවා. ඒ වගේම මේක ගෙවී යන ආකාරයත් බලනවා.

ඊ ළඟට ඒ දෙක එකතු කරලා අන්න අර දලි පිහිය මදින්නා වගේ 'සමුදය වයධම්මානුපස්සී වා කායස්මිං විහරති' ඇතිවීම් නැතිවීම් දෙකම එක විට දකිමින් සිටිනවා කියල කියනවා. ඒකත් තේරුම් ගත යුත්තේ අර විධියටයි. ඒක අරකටත් වඩා ගැඹුරුයි. අනිත්‍යතාව පිළිබඳ තියුණුම මුවහත්වීම ඇතිවන්නේ සමුදය-වය එකවරට පෙනෙන අවස්ථාවෙයි. ඒ අවස්ථාවට තමයි **'නිබ්බේධිකා පඤ්ඤා'** කියල කියන්නේ. විනිවිද දකීමක් ඒක. විනිවිද යාමක්. හොඳට මුවහත තියන දලිපිහියක මුවහත කොයි පැත්තටද අයිති? පැති දෙකෙන් කොයිපැත්තටද අයිති? ඒක මහ හිතා ගන්න බැරි සියුම් තත්ත්වයක්. අන්න ඒ වගේ තමයි අර ඇතිවීම් නැතිවීම් කියලා දෙකට බෙදාගන හිටිය එක අන්තිමට ඒ දෙකම එකතු වෙලා යන අවස්ථාවේ අන්තිමට ශූන්‍යත්වය හිස් බව ගැඹුරින් වැටහෙනවා. එතැනම තමයි නිවන තියෙන්නේ.

ඉතින් දැන් අපි අර සමුදයධම්මානුපස්සී, වයධම්මානුපස්සී, කියනවා වගේම අර අජ්ඣත්ත බහිද්ධා භේදය ගැනත් කියන්න තියෙන්නේ මේක සවිඤ්ඤාණක අවිඤ්ඤාණක දෙකටම අදාළයි. සවිඤ්ඤාණක කයත් අසුභයක්. සවිඤ්ඤාණක කය තුළ තමයි මේ දෙතිස්කුණප කොට්ඨාශ පිළිබඳව භාවනාව ගෙන යන්නේ. මේ ශරීරයේ තියන කුණප කොට්ඨාශ පිළිබඳව. එතැනත් අසුභ සංඥාව - අසුභ භාවනාව හැටියට බොහෝ විට දක්වන්නේ මේ සවිඤ්ඤාණක කය පිළිබඳව කොටසයි. අනික් පැත්තෙන් බලන කොට නව සීවථික, නවසිවථික ආශ්‍රයෙන් බලන කොට අවිඤ්ඤාණක කයයි. විඤ්ඤාණය නැති කය. මේ දෙකේම තියෙන්නේ අසුභ තත්ත්වයයි. ඉතින් ඒක අර තමන්ගේ අනුන්ගේ කියන බෙදීම අනුව හිතලා ඒ අසුභ සංඥාව තුළින් කලකිරීම ඇති කර ගන්නවා. ඒ වගේම මේවායේ ඇති, ඇතිවීම් ස්වභාවයත්, නැතිවීම් ස්වභාවයත් ගැන බලන තැනැත්තාට යෝගාවචරයාට ගැඹුරින් ක්‍රමක්‍රමයෙන් මේ දෙක එකතුවෙලා වැටහෙන අවස්ථාවක් එනවා. එතනයි තියෙන්නෙ ධර්මයේ ඉතාම ගැඹුරු කොටස. ඔන්න ඔතන ඉඳලා යන්නේ ධර්මයේ ඉතාම ගැඹුරු කොටසක්. ඒකට බියවිය යුතු නැහැ.

අපි කවුරුත් අහල තියනව ඔය නිවන ගැන කියනකොට 'සංඛත' කියලා වචනයක් කියනවා. 'සංඛත' කියන වචනයෙ අදහස සකස්කර ගත්තු කියන එකයි. සකස්කරගත්තු කියන්නේ මේ කාලයේ කියන විධියට කෘත්‍රිම දෙයක්. මවා-පාපු දෙයක්. අටවා ගත්තු දෙයක්. හිතින් හදා ගත්තු දෙයක්. ඊළඟට නිවන ගැන කියන කොට බොහෝදෙනා සාධුකාර දෙන නිවන කියන වචනයටම 'අසංඛත ධාතු' කියලත් කියනවා. අසංඛත කියල දේකුත් ධර්මයේ සඳහන් වෙනවා. එතකොට සංඛත එක පැත්තකින් තියනවා.





අසංඛත තව පැත්තකින් තියනවා. ඔන්න ඔතන ඉඳලයි ඊළඟට අපි ධර්ම විග්‍රහයට යන්නේ.

බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියනවා **'තීණිමානි භික්ඛවෙ සංඛතස්ස සංඛත ලක්ඛණානි'. මහණෙනි සංඛතයෙහි ලක්ෂණ තුනක් තිබෙනවා.** මොනවාද ලක්ෂණ?

උප්පාදො පඤ්ඤායති
වයො පඤ්ඤායති
ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති

මේ සංඛත කියන සකස්කර ගත්තු හැම දෙයකම උපතක්, හටගැන්මක්, දකින්න ලැබෙනවා. ගෙවීයාමක්, ව්‍යයවීමක්, දකින්න ලැබෙනවා. ඒ දෙක අතර 'ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති' තිබෙනවා, 'සිටිනවා' කියලා කියන ඒ කොටස තුළත් තියෙනවා අඤ්ඤථාභාවයට වෙනස් වීමකට පත්වන ආකාරයක්. 'ඨිති' කියල කියන්නේ, 'ස්ථිති' කියල කියන්නේ, පවතින, තිබෙන කියන එකයි. නමුත් ඒ 'තිබෙන' අවස්ථාවේ පවා නිරන්තර වෙනස්වීමක් තිබෙනවා. ඔන්න ඔතන ගැඹුරු කාරණයක් තියෙන්නේ. එතකොට අපි කිච්චනේ කරගලේ හෝ පටියේ අර දලිපිහිය මදින අවස්ථාවේ ඉහළට ඉහළට ඉහළට, පහළට පහළට පහළට අන්තිමට ඉහළට පහළට, ඉහළට පහළට, ඉහළට පහළට. දැන් එතකොට අන්න අර 'උප්පාදෙ පඤ්ඤායති'. දැන් 'සංඛත කියල කියන්නේ හිතින් හදාගත්තු කොටුකර ගත්තු දෙයක්. ඔය කොටුකර ගත්තු දෙය තුළ හට ගැන්මක් අපට දකින්න ලැබෙනවා. ඒ එක පැත්තකින්. අනික් පැත්තෙන් ඒක ගෙවිලා යනවාත් පෙනෙනවා. නමුත් මැද තියෙනවා ඨිති කියලා අපිම ආරෝපණය කර ගත්තු පැවැත්මක්. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේ ඨිති, ස්ථිති, කියල කියන, අපි මේ තියනවා කියල හිතාගත්තු තත්ත්වය ඇත්ත වශයෙන්ම මුල ඉඳලා අගටම පෙරළීමක් පමණයි. පැවැත්ම කියල කියන්නේ පින්වතුනි ඇත්ත වශයෙන්ම පෙරළීමක්. එතකොට අපි පෙරළීමකට, පෙරළෙන දෙයකටයි පැවැත්මක් කියන්නේ. නොපෙරෙළෙන මොහොතක්වත් නැහැ. අපි හිතාගන්නවා පෙරළෙන්නේ නැහැ කියලා. මේ ශරීරය අපි කියනවා දැන් සමහර විට හොඳට තරුණව ඉඳලා දැන් දිරන්න පටන් ගත්තා. දැන් මහළු වයස මතුවුනා කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ කියන්නේ මුල සිට අගටම ජරාව. උපතේ ඉඳලම ජරාව. ඒ උපන් කෙස් ඉඳලාම හැම එකක්ම දිරනවා. නමුත් ලෝකයා සම්මුතියක් ඇතිකර ගන්නවා දැන් කය පවතිනවා. ඔන්න දැන් තමයි දිරීම ආරම්භ වුනේ කියලා. ඕක මිථ්‍යාවක්. අපි හිතින් මවා ගත්තු දෙයක්. ඉතින් මෙන්න මේක අවබෝධවන අවස්ථාවේදී

තමයි අන්න අර දෙකම, සමුදය, වය එකතු වුනා වගේ ඒ ටිකේදී තමයි 'ඨිතස්ස අඤ්ඤථත්තං' ස්ථිති පවතිනවා, තිබෙනවා කියල හිතාගත්තු අවස්ථාව පවා නිරන්තරයෙන්ම වෙනස් වීමකට භාජනය වන බව වැටහෙන අවස්ථාවක් තියනවා. **එතකොටයි අල්ල ගන්න තැනක් නැති වෙන්නේ.** අල්ල ගන්න දෙයක් නැති වෙනවා. **අල්ලා ගැනීම නිසයි ඨිතියක් තියෙන්නේ.** අන්න එතනයි රහස. **අල්ලා ගැනීම නිසයි ස්ථිතියක් තිබෙන්නේ**. අල්ලගත්තු තැනයි- **'උපාදාන පච්චයා භවො' කියල කියන්නෙ අල්ලා ගත්තු තැනයි පැවැත්මක් තියෙන්නේ. අතහැරිය තැන නැවැත්මයි. අතහැරිය තැන භව නිරෝධයයි.** ඔය රහසයි බුදුරජාණන් වහන්සේ මතුකරලා දුන්නේ මේ විශ්වයට. විශ්වයේ ඇති ධර්මතාව හැටියට කිසිම කෙනෙකුට විසඳාගන්න බැරිව තිබුණු දෙයක්.

එතකොට අපි සාමාන්‍ය ලෝකයේ ව්‍යවහාර කරන්නේ සංඛත දෙයින් මිදිලා අසංඛත ධාතු නම් සදාකාලික නිර්වාණ ධාතුවේ නිවී සැනහී සදාකාලිකව වැඩ වාසය කරනව කියලයි. **ඒක එහෙම පිටින්ම මිථ්‍යාවක්**. මෙන්න මෙතනයි මේ ධර්මතාව. අර අනිත්‍යතාව තුළ තියෙන්නේ සංඛතයේ ලක්ෂණ තුනයි. අර ඇතිවීමත් නැතිවීමත් ඒ අතරතුර අවදානම් පැවැත්මේ ඇති අන්‍යථා භාවයත්. ඒ ස්ථිතිය කියන එක අවදානම් තත්ත්වයක්. **ඇතිවීමත් නැතිවීමත් අතර හිරවෙල තිබෙන අවදානම් තත්ත්වයක් තමයි 'ඨිතිය' කියල අපි ගත්ත මේ පැවැත්ම කියන එක.** ඒකේ අවදානම් තත්ත්වය අවබෝධ වන්නේ අන්න අර විදර්ශනා ඥානය තියුණු වුනාමයි. මොහොතකටවත් ඒක ඒකාකාරයෙන් නැහැ. ඉතින් ඒක තුළ තමයි අර අතහැරීම තියෙන්නේ. **අල්ලා ගැනීම නිසාමයි 'ඨිති' භාවය තියෙන්නේ**.

ඔන්න ඊ ළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා **අසංඛතයේ ලක්ෂණ.**

**'න උප්පාදො පඤ්ඤායති න වයො පඤ්ඤායති න ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති'** අසංඛතය පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. අසංඛතයේ ඇතිවීමකුත් නැහැ. නැතිවීමකුත් නැහැ. තිබෙන දෙයක අන්‍යථා භාවයට පත්වීමක් කියල දෙයකුත් නැහැ. ඔන්න එතකොට අපිට තේරුම් ගන්න පුළුවන් මේක ආශ්‍රයෙන් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ උපාදානය තුළින්, අල්ලා ගැනීම තුළින් අර ඇත්ත වශයෙන්ම අනිත්‍ය වූ දෙයක් නිත්‍ය හැටියට ප්‍රකල්පනය කරනවා. හිතා ගන්නවා. එතකොට ඒ ඨිතිය කියල ගත්තු තැන **'සිතලුවක්' පමණයි. හිතාගැන්මක් පමණයි**.





'සිතලුව' කියන්නේ හිතාගැන්මක් පමණයි. ඇත්ත දෙයක් නොවේ. එතකොට ඒක වැටහෙන අවස්ථාවේදී, ඒක වැටහෙනවාත් එක්කම තේරෙනවා මේක තණ්හාව නිසා ඇතිකර ගත්තු උපාදානයක් කියලා. දන් අර තරුණ භික්ෂුව අර සබන් බෝලය පිම්බුවේ සිරිමා කියන වචනයට අනුව, ඉතාමත් ලස්සණ ඒ නගර ශෝභිණියගේ රූප ශෝභාව හිතෙන් මවාගෙනයි. ඒක හිතෙන් මවාගෙනයි ආවේ. අන්තිමට මොකක්ද දකින්න ලැබුනේ? අන්න ඒ වගේ ඒ හිතින් මවා ගත්තු තත්ත්වයක්. ඒක සත්‍යානුකූල නොවෙයි. ඒක අවබෝධ වෙන අවස්ථාවේ අතහැරීම තුළින් තමයි එතකොට අසංඛත ධාතුව අවබෝධ වුනා කියන්නේ. අමුතු ලෝකයක් නොවේ. අර හිතේ මෙතෙක් ඒ ගැන්ම ඇතිවුනු නිසාම 'ස්ථිති' භාවයෙහි ස්ථිති කියල ගත්තු දෙයෙහි අන්‍යථාභාවය වැටහෙන අවස්ථාවේදී ඉබේටම මේක භයානක දෙයක්. අල්ල ගත්තු තැන බිඳෙනවා. ඒ ගැඹුරු විදර්ශනාවේදී යෝගාවචරයින්ට වැටහෙන අවස්ථාවක්. **කොතනකවත් අල්ල ගන්න දෙයක් නැහැ සංස්කාරවල**.

'සංස්කාර' කියල කියන්නේ මොකද්ද? සංස්කාර වල අනිත්‍යතාව දකිනවා කියන්නෙ මොකද්ද? සකස්කිරීම් ගොඩක්. මේ සකස්කිරීම් හැම එකක්ම බිඳෙනවා කියලා කියන්නේ මොකද්ද? සකස්කර ගත්තු නිසාමයි ඒව බිඳෙන්නේ. මොකද, සකස්කර ගත්තු හැම දේකම අන්න අර ඇතිවීමකුත් නැතිවීමකුත් ඒ අතර අපි ආරෝපණය කළ ස්ථිතියකුත් තියනවා. ඉතින් අන්න ඒකයි 'ඨිතස්ස අඤ්ඤථත්තං' කියන්නේ. ඨිති කියන තත්ත්වය තුළ නිරන්තරයෙන්ම වෙනස්වීමක් බලපවත්වනවා.

ඉතින් ඔන්න ඔය කාරණය උදාන පාළියේ සඳහන් වෙනවා මහා පුදුම ගාථා ධර්මයකින්. බුදුරජාණන් වහන්සේ ඒ නේරංජනා නදී තීරයේ සම්බෝධිය ලබාගෙන සත් දවසක් විමුක්ති සුවයෙන් වැඩ ඉඳලා ප්‍රකාශ කළ මහා පුදුම ගාථාවක් තිබෙනවා. ඇතැම් පින්වතුන් නිරන්තරයෙන් සිහිපත් කරන මහපුදුම ගැඹුරු සූත්‍රයක්. මේ විධියටයි ඒ සූත්‍රයේ අදාළ කොටස් කියවෙන්නේ.

**"අයං ලොකො සන්තාපජාතො ඵස්ස පරෙතො රොගං වදති අත්තතො**
**යෙන යෙනහි මඤ්ඤති තතො තං හොති අඤ්ඤථා**
**අඤ්ඤථාභාවී භව සත්තො ලොකො භව පරෙතො භව මෙවාභිනන්දති**
**යදභිනන්දති තං භයං යස්ස භායති තං දුක්ඛං**
**භව විප්පහානාය ඛො පනිදං බ්‍රහ්මචරියං වුස්සති"**

එතකොට ශ්‍රී මුඛයෙන් පිටවුන මේ වචන වල මහා ගැඹුරක් ඇතුළත් වෙනවා. 'අයං ලොකො සන්තාපජාතො ඵස්සපරෙතො' මේ ලෝකය කියලා කියන්නේ ලෝකයායි. 'සන්තාපජාතො' සන්තාපයට පත්වුනු 'ඵස්සපරෙතො' ස්පර්ශයට ගැතිවුණු, 'අයං ලොකො' මේ ලෝකයා 'රොගං වදති අත්තතො' රෝගයකට ආත්මය යයි කියයි, ලෙඩකට ආත්මය යයි කියයි. ලෙඩ ගොඩකට ආත්මය යයි ව්‍යවහාර කරයි. 'යෙන යෙනහි මඤ්ඤති තතො තං හොති අඤ්ඤථා' යම් යම් ආකාරයකින් සිතා ගනීද, සිතලු වශයෙන් ප්‍රකල්පනය කරයිද, එයින්ම එය අන්‍යථාභාවයකට පත්වෙයි. එයින්ම එය අන්‍යභාවයකට පත්වෙනවයි කිව්වේ අන්න **අර වැට බැඳ ගැනීමට**. 'මේ ටිකේ මම ඉන්නවා' කියලා. ඒක නිසාමයි ඒකේ අඤ්ඤථාභාවයක් ප්‍රකට වෙන්නේ. අර කියාපු බිඳීමට භය වන්නේ. ඉතින් ඔන්න ඊළඟට ඒක තවත් පැහැදිලි කරනවා. අඤ්ඤථාභාවී භව සත්තො ලොකො භව පරෙතො භවමෙවාභිනන්දති' 'අඤ්ඤථා භාවී භව සත්තො ලොකො' අන්‍යාකාරයකට වෙනස්වන ස්වභාවයම ඇති භවයට ඇලුනා වූ මේ ලෝකයා, එතකොට ලෝකයේ ස්වභාවය අඤ්ඤථා භාවයට පැමිණීමයි. නිරන්තරයෙන්ම, මොහොතක් නවතින්නේ නැතිව, මොහොතක් හිටින්නේ නැතිව පෙරළෙන ස්වභාවයයි ලෝකයේ ස්වභාවය. නමුත් ඒක දන්නේ නැහැ. ඒක නිසා ලෝක සත්ත්වයා ඒකෙ ඇලෙනවා. 'භව සත්තො ලොකො භව පරෙතො' ඇලෙනවා පමණක් නොවෙයි ගැතිවෙනවා. භවතෘෂ්ණාවට යට වෙනවා. 'භවමෙවාභිනන්දති' භවය පිළිබඳවම සතුටු වෙනවා. ඊළඟට ඔන්න බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'යදභිනන්දති තං භයං' යමක් පිළිබඳව සතුටු වෙනවා නම් ඒක භයක්. භයක් කියලා කියන්නේ අන්තරායක්. ඒක අන්තරායක්, අනතුරුදායක දෙයක්. කුමක් පිළිබඳවද සතුටු වෙන්නේ? භවය පිළිබඳවයි. එතකොට භවය අන්‍යථාභාවයට නිරන්තරයෙන්ම පාත්‍රවන දෙයක්. ඒ ගැන සතුටුවීම තුළින්ම භයක් එනවා. අනතුරකට භාජනය වෙනවා. ඒකයි 'යදභිනන්දති තං භයං යස්ස භායති තං දුක්ඛං' යමකට බිය වෙනවාද ඒක දුකක්. මොකකටද බිය වන්නේ? අර අන්‍යථාභාවයටයි, බිය වෙන්නේ. අන්‍යාථාභාවය ඇති ලෝකයක් අල්ලාගෙන ඉන්නවා. නමුත් අන්‍යාථභාවයකට කැමති නැහැ. ඒක නිසා තමයි 'යස්ස භායති තං දුක්ඛං' මොකකටද භය වෙන්නෙ? මේක වෙනස් වෙන එකට භය. ඒ වෙනස්වීමට. ඒකම තමයි දුක. 'භව විප්පහානාය ඛො පනිදං බ්‍රහ්මචරියං වුස්සති' ඒ කියාපු භව තත්ත්වය, පැවැත්මයි කියලා හිතාගත්තු තත්ත්වය ප්‍රහාණය කිරීම සඳහායි අතහැරීම සඳහායි මේ බ්‍රහ්මචරිය වාසය.

අන්න බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ සාරාංශය ඒ උදාන ගාථා





වශයෙන් පොඩි ගාථා පද කීපය තුළින් එදා උන්වහන්සේ ප්‍රකාශ කළා. ඒ ටිකම තමයි අපි මේ සතිපට්ඨාන සූත්‍රය ආශ්‍රයෙන් මතුකළේ. ඊ ළඟට ඒ උදාන ගාථාවේ අවසානයේදී බුදුරජාණන් වහන්සේ තව දුරටත් ප්‍රකාශ කරනවා මේ තාක් ලෝකයේ ශ්‍රමණ බ්‍රාහ්මණයින් සිටියා නම්, මේ සංසාර ගැටළුව විසඳන්න, එහෙම නැත්නම් විමුක්තිය පිළිබඳ ප්‍රශ්නය විසඳන්න, ඔවුන් අන්ත දෙකකට ගියා. බුදුරජාණන් වහන්සේ එතැන ප්‍රකාශ කරනවා යම්තාක් ශ්‍රමණ බ්‍රාහ්මණයින් භවයෙන් භවය පිළිබඳ ප්‍රශ්නය විසඳන්න උත්සාහ කළා නම් ඒ කියන්නේ ශාස්වත වශයෙන්. සදාකාලික පැවැත්මක් තුළින් මේ සංසාර ගැටළුව විසඳන්න උත්සාහ කළානම් ඒ අයත් සසරින් මිදිලා නැහැ. ඒ අයත් විමුක්ත නැහැ. භව දෘෂ්ටිය, ශාස්වත දෘෂ්ටිය. ඊ ළඟට අනිත් අන්තය කියල කියන්නෙ විභව දෘෂ්ටිය කියල කියන උච්ඡේද දෘෂ්ටියයි. මේ පින්වතුන් අහල තියනව ධර්මය ගැන අවබෝධයක් තියන අය දන්නවා, ඔය අන්ත දෙකයි තියෙන්නේ. මැදුම් පිළිවෙත කියල කියන්නේ අපේ මේ ධර්මයේ තියෙන මැදුම් පිළිවෙතයි. දෙපැත්තේ තියෙන්නේ අන්න අර ශාස්වත දෘෂ්ටියත්, උච්ඡේද දෘෂ්ටියත්. මේ දෙවනුව කීවේ විභව දෘෂ්ටියයි. තවත් පිරිසක් හිටියා ශ්‍රමණ බ්‍රහ්මණයින් උච්ඡේද දෘෂ්ටිය අරගෙන ඒක තුළින් මේ සසරින් මිදීමට උත්සාහ කළා. ඒ අයත් වරදවල වටහා ගත්තා. ඒ අයත් කාරණය හරිහැටි තේරුම් ගත්තේ නැහැ. මේ ශරීර කූඩුව නැති වුනාම මෙයින් ඉවරයි කීවට බේරෙන්න බැහැ. අවිද්‍යාවත් තෘෂ්ණාවත් තිබෙන තාක් මේ සංසාරයේ ධර්ම පරම්පරාව අර සංඛත, සංස්කාර පරම්පරාව යනවා. ඒකයි බුදුරජාණන් වහන්සේ ඒ අන්ත දෙකටම ගියේ නැත්තේ.

ඒ වෙනුවට ඔන්න බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. කොතනද විමුක්තිය තියෙන්නේ කියලා. යම් අවස්ථාවක අන්න අර උපාදාන- 'සබ්බුපාදානක්ඛයා' සියලු උපාදානයන් අතහැරීමෙන්, ක්ෂය කිරීමෙන් 'සබ්බූපධිපටිනිස්සග්ගා' සියලු උපධීන් අතහැරීමෙන් උපාදාන කියලා කියන්නේ අල්ලා ගැනීම්. උපධි කියල කියන්නේ අල්ලාගෙන තැන්පත් කරගත් ටික. දන් මේ පින්වතුන් ධනය අල්ලගන්න, තවත් නොයෙකුත් දේවල්, වස්තු සම්භාර අල්ලගන්න නිරන්තරයෙන් වෙහෙසෙනවා. ඒ ගැන හිත හිතා උපාදාන ඇතිකර ගන්නවා. ඒවා ලැබුනාට පසු ඒවා තැන්පතු හැටියට තැන්පත් කරගෙන, නිධාන හැටියට තැන්පත් කරගෙන, ඒවා රකින්න උත්සාහ කරනවා උපධි හැටියට. නමුත් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා මේ ඔක්කොම භයක්. මේවා අඤ්ඤථාභාවයට, වෙනස්වන ස්වභාවයට පත්වෙන දේවල්. එතකොට ඒවා අල්ලා ගැනීම තුළිනුයි අර

කියාපු දුකත් භයත් ඇති වන්නේ. අන්න ඒක නිසා බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරන විසඳුම ශාස්වතවූ සදාකාලික පැවැත්මකුත් නොවේ. මෙතනින් ජීවිතය කෙළවරයි කියා හිතාගෙන ඕන විධියට තම තමන් සැප විඳීම හෝ වෙන වෙනත් ව්‍රත ආදිය තුළින් විමුක්තිය පැතීමවත් නොවේ. මෙන්න මේ තත්ත්වය වටහා ගැනීමයි. මෙතන අර අවිද්‍යාව තුළින්, ඒ අනවබෝධය තුළින්, කරන උපාදානය, අල්ලා ගැනීම, අතහැරිය අවස්ථාවේ උපාදානයක් එක්කම අතහැරෙන එක තමයි උපාදානයෙන් අල්ලාගෙන තමාගේ මමත්වය තහවුරු කරගන්න තියන **උපධීන්**. උපධීන් කියල කියන්නේ අවසාන වශයෙන් බලනකොට අපි මේ එක්රැස්කර ගත්තු පංචඋපාදානස්කන්ධයමයි. යමක එල්ලිලා ඉන්නවා වගේම තමයි. යමක් පිට රඳා සිටීම. එල්ලීගන ඉන්න එක කොයි වෙලාවෙ හරි අත හැරුනොත් එතනත් වැටීම. යමක් මත රඳා සිටිනවා නම් ඒ යට තට්ටුව දිරායන කොට ඒත් වැටීම. එතකොට උපාදාන, උපධි කියන වචන දෙක තුළ තියෙන්නේ ඕකයි. අර උපාදානයම තමයි අන්තිමට තමාගේ ඒ පැවැත්මට උපධි හැටියට හේතු වන්නේ. ඔය උපධි වචනය පින්වතුන් අහලත් ඇති බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා කෙටියෙන් සළකා ගත්තොත් මිල මුදල්, යාන වාහන, අඹුදරු, වතුපිටි ආදී තමන්ගේ වත්කම් හැටියට සලකන හැමදෙයක්ම. ඒවා තුළයි කෙනෙක් ආරක්ෂාව, සුරක්ෂිත බව, රැකවරණය පතන්නේ. නමුත් ඒවා බලාගන ඉඳිද්දිම බිඳිලා සුණුවිසුනු වෙලා යනවා. **ඒවා අල්ල ගත්තු ගැන්ම යම් ප්‍රමාණයකට දැඩිද ඒ ප්‍රමාණයටම දුකයි.** ඒවා කලින් සිතින් අතහැරියා නම් ඡන්දරාග ප්‍රහාණය කියන ආකාරයට, ඒ අවස්ථාවේ ඒකේ දෙයක් නැහැ. **'ඒකෙ දෙයක් නැහැ'** කියන්න පුළුවන් තත්ත්වයක් එනව. එතනම තමයි නිවන.

එතකොට නිවන කියල කියන්නේ-මේක කිච්චට වරදවා වටහා ගන්න එපා. නිවන කියන්නෙ **"දෙයක් නෑ,"** කියන එකයි. එතකොට දෙයක් තියනව නම් තමයි මේ ඔක්කොම ප්‍රශ්න. ඒ ටික තමයි අර සංඛත, අසංඛත කියන වචන දෙක තුළ තියෙන්නේ. මේ ශූන්‍ය වූ, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවය ඇති ධර්මතාවන් තුළ සත්ත්වයා ප්‍රකල්පනය කරනවා **'දෙයක්'** සිතලුවක් හැටියට. ඒ දෙයක් හැටියට ගත්තු දෙය- ඒකම තමයි සංසාරයේ දිගින් දිගට යන්නේ, ඒ සංස්කාර ප්‍රවාහයමයි. ඒ අවිද්‍යාවත් තෘෂ්ණාවත් තුළින් ඇතිකර ගත්තු චිත්ත ශක්තිය තව තවත් රූප මවමින් අපි මේ සංසාරයේ අරගෙන යනවා. කොටින්ම යම් අවස්ථාවක විදර්ශනා ප්‍රඥාව තුළින් අර තත්ත්වය දකලා උපධීන් උපාදානයන්ට හේතුවූ වැරදි සංකල්පවල යථා තත්ත්වය අවබෝධකරගෙන ලෝකයේ **ශූන්‍යත්වය, හිස්බව** දුටුවා නම් අන්න ඒ අවස්ථාවෙයි විමුක්තිය තිබෙන්නේ.





ඒක නිසා තමයි බුදුරජාණන් වහන්සේ මොඝරාජ කියන මහා ගැඹුරු වැටහීම් ඇති බ්‍රාහ්මණ මානවකයාට ප්‍රකාශ කළේ,

**සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු - මොඝරාජ සදා සතො**
**අත්තානුදිට්ඨිං ඌහච්ච - එවං මච්චුතරො සියා**
**එවං ලොකං අවෙක්ඛන්තං - මච්චුරාජා න පස්සති**

'මොඝරාජ, ලෝකය ශූන්‍ය වශයෙන් බලව 'සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු මොඝරාජ සදාසතො' හැමකල්හි සතිමත්ව ලෝකය ශූන්‍ය වශයෙන් බලව. 'අත්තානුදිට්ඨිං ඌහච්ච' ආත්ම අනුදිට්ඨිය කියල කියන්නේ අස්මිමානය, ගැඹුරුම මමත්වය පිළිබඳ හැඟීම. ඒක මුලින් උපුටා දමලා 'එවං මච්චුතරො සියා' එහෙමයි මාරයාගෙන් එතෙරවන්නේ, මාරයාගේ බන්ධනයෙන් එතර වන්නේ. 'එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති', ලෝකය දිහා ඒ අන්දමට ශූන්‍ය වශයෙන් බලන කෙනා මාරයාට අහුවෙන්නේ නැත. මාරයාට පෙනෙන්නේ නැත. ඒ නිසා තමයි බුදුරජාණන් වහන්සේ බොහෝ අවස්ථාවල අර මාරයා අභියෝග කරගෙන ආවාම කියන්නේ නුඹට මාව අල්ලගන්න බැහැ කියලා. අල්ලගන්න බැරි ඒකයි. අර සියල්ල අත හැරිය නිසා. මාරයාට අහුවෙන ටිකයි සංඛතය, අර අල්ලගත්තු දෙය. එතැනමයි මාරයා. ඉතින් ඒකයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ 'යං යං හි ලොකෙ උපාදියාති තෙනෙව මාරො අනෙවති ජන්තුං' ලෝකයේ යම් යම් දෙයක් අපි අල්ලා ගන්නවා නම් ඒක එක්කම මාරයා පස්සෙ එනවා. මාරයා ඒ අල්ලා ගත්තු දෙයට ආරූඪ වෙලා ඒක ඔස්සේ සංසාරයේ අපට නැවත නැවත දුක් පමුණුවනවා.

එතකොට අන්න ඒ කියාපු උපාදානයන්, උපධි උපාදානයන් අතහැරීම කියන උතුම් නිවන සඳහායි අද මේ වටිනා දවසේ මේ පින්වත් පිරිස- බුදුරජාණන් වහන්සේ ප්‍රකාශකර තිබෙන අනුපුබ්බ සික්ඛා, අනුපුබ්බ කිරියා, අනුපුබ්බ පටිපදා කියන මධ්‍යම ප්‍රතිපදාවට අනුව අනුපිළිවෙලින් යන ශික්ෂණයක් ක්‍රියාදාමයක් ක්‍රියා පටිපාටියක් තිබෙනව- ඒකට අදාළව ශීලය සමාදන් වුනා. ඊළඟට ඒ සීලයේ පිහිටලා සමථ, විදර්ශනා වශයෙන් භාවනා වැඩුවා. ඒවායේ අග්‍රඵලය තමා අපි කවුරුත් බලාපොරොත්තු වන උතුම් අමාමහ නිවන. අර කියාපු සදාකාලික තත්ත්වයක් නොවෙයි චිත්ත විමුක්තියමයි. ඒක මෙලොවම සාක්ෂාත් කරගත හැකි තත්ත්වයක්. ඊට පස්සේ 'ප්‍රශ්නයක් නැහැ', 'දෙයක් නැහැ' කියල කියන්න පුළුවන් තත්ත්වයට ඒ බුදුරජාණන් වහන්සේ වගේ පත්වෙන්න ශක්තිය ලැබේවා කියල අපි ප්‍රාර්ථනා කරනවා.

මේ අපි වචනයෙන් කිව්වට මේක ඇත්ත වශයෙන් ප්‍රත්‍යක්ෂයක් වශයෙන් එනකොට අන්න අර විදියට ගැඹුරින් ඊට අවශ්‍ය කාර්ය සම්පාදනය, කලින් ජීවිත වල කෙරිලා නැත්නම් මේ ජීවිතයේ කරන්න සූදානම් වෙන්න ඕනෑ. කරන්න තියෙන්නේ මෙච්චරයි කියලා හිතා ගත්තොත් මේක කවදාකරලා කෙළවර වෙනවාද කියල ප්‍රශ්නයක් නැහැ. **කරන්න තියෙන්නේ මෙච්චරයි** කියන අදහස ඇතිව අද ඇතිකරගත් කුසල ශක්තියත්, රැක්ක ශීලයත් කළ භාවනාවත් ධර්ම ශ්‍රවණයත් මේ පින්වතුන්ගේ උතුම් ධර්ම ප්‍රාර්ථනා සමෘද්ධ කරගැනීමට සියලු ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදී සංසාර දුකින් අත්මිදී උතුම් අමාමහ නිවනින් සැනසීමට ඒකාන්තයෙන් හේතු වාසනා වේවා කියා ප්‍රාර්ථනා කරගන්න. එසේම අවීචියේ සිට අකනිටා දක්වා වූ යම්තාක් සත්ත්වයින් මේ පින්වතුන්ගේ ඥාතීන් ඇතුළු, සංසාර විමුක්තිය බලාපොරොත්තුවෙනව නම් පැතූ යම් බෝධියකින් ඒ උතුම් අමාමහ නිවන සාක්ෂාත් කර ගනිත්වා මේ ධර්ම ශ්‍රවණ ආනිශංසයෙන් කියල ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියල පිං අනුමෝදන් කරන්න.

"එත්තාවතාව අම්හෙහි .........."



# 34 වන දේශනය

# 34 වන දේශනය

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

**දනංච පෙය්‍යවජ්ජඤ්ච**
**අත්ථචරියාච යා ඉධ**
**සමානත්තතාච ධම්මෙසු**
**තත්ථ තත්ථ යථාරහං**

**එතෙ බො සංගහා ලොකෙ**
**රථස්සාණීව යායතො**
**එතෙච සංගහා නාස්සු**
**න මාතා පුත්තකාරණා**
**ලභෙථ මානං පූජංවා**
**පිතා වා පුත්තකාරණා**

**යස්මා ච සංගහා එතෙ**
**සමවෙක්ඛන්ති පණ්ඩිතා**
**තස්මා මහත්තං පප්පොන්ති**
**පාසංසාච භවන්ති තෙ**

-අංගුත්තර නිකාය චතුක්ක නිපාත

සැදැහැවත් පින්වතුනි,

දුරුතු පෝය දවස ව්‍යවහාර වර්ෂ ක්‍රමයට අනුව අවුරුද්දක පළමු පෝය දවසයි. අවුරුද්දක් ආරම්භ වෙනකොට හැම කෙනෙක්ම වගේ තම තමන්ගේ අනාගත දියුණුව, ප්‍රගතිය, ඉදිරිගමන, ගැන හිත යොදවනවා. තිලෝගුරු බුදුරජාණන් වහන්සේ පුද්ගලයාගේත් සමාජයේත් ඉදිරිගමනට ප්‍රගතියට හේතුවන වටිනා කාරණා හතරක් දක්වා වදාළ ගාථා කීපයකුයි අද අපි මාතෘකා හැටියට ගත්තේ. ගමන් කරන රථයකට කඩ ඇණය උපකාර වෙන්නා වගේ සමාජයේ ප්‍රගතියට උපකාර වෙන ධර්ම කාරණා හතරක් තමයි බුදුරජාණන් වහන්සේ මේ ගාථා තුළින් ඉදිරිපත් කරන්නේ.

**දනංච පෙය්‍යවජ්ජඤ්ච**
**අත්ථචරියාච යා ඉධ**
**සමානත්තතාච ධම්මෙසු**
**තත්ථ තත්ථ යථාරහං**





දනය - දීම - දන්දීම කවුරුත් දන්නවා. පෙය්‍යවජ්ජ කියල කියන්නේ ප්‍රියවචනයයි. එතකොට දානය ප්‍රිය වචනය ඊළඟට අර්ථචර්යාව. අර්ථචර්යාව කියල කියන්නේ අනුන්ගේ යහපතට ක්‍රියාකිරීම. දන් මේ කාලයේ පරාර්ථ චර්යාව කියල යෙදෙන්නේ ඒකයි. 'සමානත්තතාච ධම්මෙසු තත්ථ තත්ථ යථාරහං' -එතන ටිකක් අමුතු විදියටයි ප්‍රකාශ කරන්නේ. ඒ ඒ අවස්ථානුකූල, ඒ ඒ තැන්හි සුදුසු පරිදි, සමානාත්මතාව. ඒකයි හතරවෙනි කාරණය. 'සමානත්තතාච ධම්මෙසු - තත්ථ තත්ථ යථාරහං'. ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව **'එතෙ බො සංගහා ලොකෙ - රථස්සාණී ච යායතො'** - මේ සංග්‍රහ වස්තු හතර, ලෝකයට ගමන් කරන රථයට කඩ ඇණය වගේ උපකාර වෙනවා කියන එකයි ඊළඟට ප්‍රකාශ කරන්නේ. ඊළඟට වදාළා **'එතෙච සංගහා නාස්සු'** මේ සංග්‍රහ වස්තු නැතිනම් **'න මාතා පුත්ත කාරණා ලභෙථ මානං පූජංවා පිතා වා පුත්ත කාරණා** මවක් පුත්‍රයා නිසා ගරු බුහුමන් ලබන්නේ නැත. පියෙක් පුතාගෙන් ගරු බුහුමන් ආදිය ලබන්නේ නැත. පූජාවන් ලබන්නේ නැත. ඊළඟට ප්‍රකාශ කරනවා **'යස්මාච සංගහා එතෙ සමවෙක්ඛන්ති පණ්ඩිතා'** යම් හේතුවකින් පණ්ඩිතයෝ නුවණැත්තෝ, මේ සංග්‍රහ වස්තු නුවණින් සළකා වටහා ගනිත්ද **'තස්මා මහත්තං පප්පොන්ති'** ඒ නිසා ඒ හේතු කොට ගෙන ඔවුහු මහත් බවට, විපුල බවට, උසස් බවට පත් වෙනවා. **'පාසංසාච භවන්ති තෙ'** ප්‍රසංසනීය වෙනවා. ඔන්න ඕකයි එතකොට මේ ගාථාවල අදහස.

දන් එතකොට අපි මේ මෙතන කියාපු සමහර කාරණා දනටම බොහෝ දෙනාට ප්‍රකටයි. දානය කියන එක අපට කණට හුරුයි. අපි කවුරුත් දන්නවා මෙතන දීමනාව කියන එක තුළ දෙපැත්තක් තිබෙනවා. සාමාන්‍යයෙන් දානය දීමනාව කියනකොට අතින් අතට මාරු කිරීමක් වගේ හැඟෙන්නේ. නමුත් දානයට යටින් යම් යම් ආකල්පමය වෙනසක් තිබෙනවා. දන් මේ දීමනාව කෙරෙන්නේ, දන් යම් යම් අයගෙන් ඇතැම් කෙනෙක් අවස්ථානුකූලව තමන්ගේ අගහිඟකම් නිසා යමක් ඉල්ලගෙන එනවා. ඒ අවස්ථාවේ සුළු නමුත් ඒ උවමනාව පිරිමැසීම ඒ තැනැත්තාට විශාල සහනයක්. අන්න එබඳු අවස්ථාවක දානය බලාපොරොත්තු වන කෙනාට දීමනාව දෙන්ට ඕනෑ. තවත් ඇතැම් අවස්ථාවක කෙනෙක් දීමනාව නොවේ බලාපොරොත්තු වන්නේ ප්‍රියවචනයක්. සමාජයේ සමහර අය ඉන්නවා කියනවා ඒ අය මොකක්වත් නුදුන්නත් කමක් නැහැ වචනයම මසුරන් වටිනවා කියලා. අර ප්‍රිය වචනය කියලා කියන කවුරුත් දන්නවා. 'ඵරුසා වාචා' කියන පරුෂ වචනය කාටත් අමිහිරි වගේම ප්‍රිය වචනය කණට මිහිරියි. 'යා සා වාචා නෙලා කණ්ණසුඛා

පෙමනීයා හදයංගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා' ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේ අර ප්‍රියවචනය විස්තර කරලා තියනවා. යම් වචනයක් තිබෙනවා නම් 'නෙලා' නිදොස්, 'කණ්ණසුඛා' කණට ප්‍රියයි, 'පෙමනීයා' ප්‍රේමය ඇතිවෙනවා, 'හදයංගමා' හෘදය ඇතුළටම යනවා. 'පොරී', පෞරී - සභ්‍යයි, බහුජන කන්තා' බොහෝ දෙනා ඇදිලා එනවා බහුජන මනාපා බොහෝ දෙනාට ප්‍රිය වෙනවා. අන්න එබඳු වචන අවස්ථානුකූල එබඳු වචන, ඇතැම් විට වැඩි දෙයක් නොවේ සමාජයේ ඔය 'අම්මේ තාත්තේ අයියේ අක්කේ' කියන වචන වල පවා ඒ වචනත් එක්කම යන ප්‍රිය හැඟීම්- ඒ වගේ ප්‍රිය වචන ඇතැම් කෙනෙක් එහෙම එකක් බලාපොරොත්තු වෙනවා. 'පෙය්‍යවජ්ජං'. ඊළඟට අර්ථචර්යාව - අත්ථචරියා තවත් කෙනෙක් සාමාන්‍ය අවස්ථානුකූලව දීමනාව පමණක් නොවේ ප්‍රිය වචනය පමණක් නොවේ ඊටත් වඩා තමන්ගේ දියුණුව සැලසෙන උපදෙස් බලාපොරොත්තු වෙනවා. දැන් මේ කාලයේ **'උපදේශනය'** කියලා එකකුත් තියෙන්නේ. උපදේශකයොත් හුඟක් ඉන්නේ. අන්න එහෙම තමන්ගේ ආර්ථික හෝ ආධ්‍යාත්මික දියුණුවට උපදෙස් දීම. අර්ථචර්යාව. පරාර්ථචර්යාව කියන අදහසයි. ඊළඟට සමානාත්මතාව කියල කියන්නේ දැන් මේ සමාජයේ නානා විධ කුලභේද පන්තිභේද තියනවා. ඒ නිසාම ඇතැම් අයට මාන්නය නිසා කොන්කිරීම් ආදිය වෙනවා. නමුත් බොහෝ දෙනා බලාපොරොත්තු වෙනවා අවස්ථානුකූලව එකට ඉඳගන්න, එකට ආහාර අනුභව කරන්න, සැපදුක් බෙදා ගන්න, අන්න ඒ විදියෙ සහෝදරත්වය පිළිබඳ හැඟීමක් බොහෝ දෙනා තුළ තිබෙනවා. ඒකට රුකුල් දෙන කෙනා ප්‍රිය මනාප වෙනවා. ඉතින් අවස්ථානුකූලව කළයුත්තක් සමානාත්මතාව කියන්නේ. ඒ ඒ අවස්ථානුකූලව සමානාත්මතාව. භේද අමතක කරලා යම්කිසි උපේක්ෂාවක් හිතේ ඇතිකරගෙන ඒ අය පිළිබඳව මානව සහෝදරත්වය සිහිපත් කරගෙන අවස්ථානුකූලව එක සමානව සැළකීම.

ඉතින් මෙන්න මේ කාරණා ප්‍රකාශ කිරීමේදී බුදුරජාණන් වහන්සේ මෙතන මව්පියන් ගැන සඳහන් කිරීම ඉතාම වැදගත් වෙනවා. මොකද, අපි කවුරුත් අහල තියෙනවා ධර්මයේ මව්පියන් හඳුන්වලා තියෙන්නේ 'බ්‍රහ්මාති මාතා පිතරො' ආදී වශයෙන්. බ්‍රහ්මයින් හැටියට හඳුන්වලා තියෙන්නේ සතර බ්‍රහ්ම විහරණය පුරුදුකරන අය හැටියටයි. අපට වැඩිය පුරුදු මව්පියන් දරුවන් පිළිබඳව සතර බ්‍රහ්ම විහරණය වඩන අය හැටියට සැළකීමටයි. නමුත් මෙතන ප්‍රකාශ කරනවා මේ කියාපු දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාව, කියන ධර්ම යම්කිසි මවක් හෝ පියෙක් හෝ පුරුදු කරන්නේ නැත්නම් ඒ අයට දරුවන්ගේ ගරු





බුහුමන් ලැබෙන්නේ නැත කියලා. ඒකෙන් අපට හිතා ගන්න පුළුවන් මේ කියන ධර්ම හතරට යටින් තිබෙන්නේ, ආකල්පයක් වශයෙන් තිබෙන්නේ මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ඛා කියන ගුණයි. කෙලින්ම මෙතන සඳහන් නූනත්. කොටින්ම කියතොත් ඒ **සතර බ්‍රහ්ම විහරණයේ ප්‍රතිරාවයක් නැඟෙනවා මේ කියාපු දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව තුළින්.**

ඒක අපි තේරුම් ගන්න උත්සාහ කරමු. දැන් මවක් හෝ පියෙක්, විශේෂයෙන්ම මවක් දරුවකු මෙලොවට බිහිවුනාට පස්සේ කරන ටික හිතලා බැලුවොත් ඒ දානය ඇරඹෙන්නේ අර කවුරුත් දන්නවා ලේ කිරිකරලා පොවනවා කියලා. ඒ මව්කිරි දීමෙන්ම ඇරඹෙන දානය දරුවා වෙනුවෙන්. ඊළඟට මවත් පියාත් තමන්ගේ කාලය, ධනය, ශ්‍රමය වැය කරමින්, සෙනෙහස ඒ පැත්තට යොමු කරමින්, දරුවකු ඇතිදැඩි කරනහැටි. ඒ ටික තමයි ධර්මයේ සඳහන් වන්නේ මව්පියන් පිළිබඳව බුද්ධ වචනය වශයෙන්. 'ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරො' මව්පියන් තමාව ඇති කළා. දැඩි කළා. මේ ලෝකය පෙන්නුම් කළා. හඳුන්වා දුන්නා. ඔය විදියට දරුවකු ඇතිදැඩි කිරීම සඳහා කාලය, ධනය, ශ්‍රමය ආදියෙන් මව්පියන් කරන පරිත්‍යාගයයි, දානය හැටියට බැලුවොත්. ඊළඟට ප්‍රිය වචනය. මේ කවුරුත් දන්නවා මව්පියන් දරුවන් කෙරෙහි තියන ස්නේහය නිසා දැන් ඔය දරු නැලවිලි ආදිය බලනකොට කොයි තරම් සෙනෙහසකින්ද අඩන දරුවකු පරක් කරන්නේ.

තව ටිකක් වැඩුනට පස්සේ සමහර විට දඟකාර අවධියේදී මවක් පාවිච්චි කරනවා සමහර විට දැඩි වචන. නමුත් කරුණාවෙන් ඒවා පාවිච්චි කරන හැටියටයි අපි කල්පනා කරන්න ඕනෙ.ඒ ස්නේහයම එතන කරුණාවට හැරෙනවා. ඒ කරුණාන්විත වචනය බැලූ බැල්මට දැඩි වුනත් ඒක ඇතුළේ තියෙන්නේ අර දරුවාගේ ආරක්ෂාව සැලසීම. ඒක නිසා ඒ කරුණාව අන්න අර ප්‍රිය වචනය, ප්‍රිය වචනය සාමාන්‍යයෙන් අප හිතන ප්‍රිය ස්වරූපය පමණක් නොවේ. අවස්ථානුකූලව දැඩි වචනය පවා ප්‍රියවචනයක් වෙනවා. ඒ දරුවාගේ ශුභ සිද්ධිය තකා යෙදූ නිසා අවස්ථානුකූලව. ඉතින් ඒ අතින් **මව්පියන් කුඩා අවධියේදී කරන දරු නැලවිල්ල පමණක් නොවේ දඟකාර අවධියේදී හික්මවීම සඳහාත් යොදන වචනය අප සළකන්ට ඕනෑ ප්‍රියවචනය හැටියට.**

ඊළඟට අර්ථචර්යාව කියලා කියන්නේ මව්පියන් දරුවන්ගේ යහපත තකා කවුරුත් දන්නවා ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම් හොඳ නරක කියාදීම්. ඒකයි අර 'පුබ්බාචරියාති වුච්චරෙ' පූර්වාචාර්යයන් වහන්සේලා කියලා

කියන්නේ. ඒ විධියට ඊළඟට දරුවන් සමාජයේ නැඟී සිටිය හැකි තත්ත්වයකට, ස්වශක්තියෙන් නැඟී සිටිය හැකි තත්ත්වයකට, මව්පියන් පුදුම අන්දමේ පිහිටක් දරුවන්ට ලබාදෙනවා. අන්න අර්ථචර්යාව. හිත වැඩ කැමති වීම.

ඒ වගේම අවසාන වශයෙන් තියෙන සමානාත්මතාව සමහර විට තේරුම් ගන්න අපහසු වෙන්න පුළුවන්. දන් අපි සමාන්තර වශයෙන් දක්වුවොත් දානය කියන එකට මෛත්‍රිය, ප්‍රියවචනයට කරුණාව, අර්ථචර්යාවට එතකොට මුදිතාව, අපට සම්බන්ධ කරන්න තියෙන්නේ. අර්ථචර්යාව- දරුවකුගේ හැදීම වැඩීම පිළිබඳව මුදිතාවක් ලොකු සතුටක් මව්පියන්ට තියෙනවා. අසල්වාසීන්ගේ හැදීම වැඩීම ගැන සමහර විට ඊර්ෂ්‍යාව තිබුණත් තමන්ගේ දරුවන් ගැන මුදිතාවක් තියෙනවා. සතුටුවීමක් තියෙනවා. 'අනේ හොඳයි, ඒ අයට හරියනවා නම් හොඳයි' කියලා. ඔන්න ඊළඟට සමානාත්මතාව කියල තියෙන්නේ අපට ඒකට එකතු කරන්න තියෙන්නේ උපේක්ෂාව. කොහොමද උපේක්ෂාව මතුවන්නේ? අපට හිතාගන්න පුළුවන් දන් සාමාන්‍යයෙන් දරුවන් වැඩිහිටි තත්ත්වයට පත්වුනාට පස්සේ මව්පියන් තමන්ගේ දායාදය පවරාදීම. ඒ වගේම වගකීම. ආයතනයක් නම් ආයතනවල අයිතිකරුවෝ 'පුත්‍රයෝ' කියල දාන අවස්ථාවක් තියෙනවා. ඒ වගේම නොයෙකුත් විධියේ තමන්ගේ වතුපිටි ආදිය බෙදාහදා ගන්නවා. ඒ වගේම තවදුරටත් හිතනවා නම් සාමාන්‍යයෙන් දරුවන් මව්පියන්ට කරන ඇප උපස්ථානයම දරුවන් රෝගී වූ බැරිවූ අවස්ථාවක මව්පියන් උපේක්ෂාවෙන් යුතුව සමානාත්මතාවෙන් යුතුව ඒ කටයුතුත් දරුවන් වෙනුවෙන් කරනවා. අන්න ඒකයි සමානාත්මතාව අවස්ථානුකූලව කළයුතු දෙයක්. ඒ අනුව අපට හිතාගන්න පුළුවන් අර සතර බ්‍රහ්ම විහරණයත් මේ කියාපු සතර සංග්‍රහ වස්තු යට තියනවා කියලා.

ඒ කිව්වේ අර පවුලේ සම්බන්ධතාව පිළිබඳවයි. නමුත් අපි දන්නවා දන් සිඟාලෝවාද ආදී සූත්‍රවල කියවෙනවා උතුරු දිශාව වන මිත්‍රයින් ඔවුනොවුන්ට සත්කාර කරන්නේ ඔය කියාපු සතර සංග්‍රහ වස්තු වලින් බව. දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව කියන කාරණා වලින්. අර හය දිශාවක් ගැන කියන තැන සිඟාලෝවාද සූත්‍රයේ තමන්ගේ හිත මිතුරන් තමයි උතුරු දිශාව. ඒ උතුරු දිශාවට නමස්කාර කරනවා වගේ ඒ උතුරු දිශාවට පිහිට වෙන්නේ ඔන්න සතර සංග්‍රහ වස්තු වලින්.

ඊළඟට සමාජයට කෙලින්ම බලපාන ආකාරය බුදුරජාණන් වහන්සේ පිරිසිදුව දක්වලා තියෙනවා එක තැනක. දන් 'එතදග්ග වග්ගය' කියලා ධර්මයේ සඳහන් වෙනවා කොටසක්. ගිහි පැවිදි ශ්‍රාවකයින්ගේ විශේෂ





ශක්තීන් හැකියාවන් අනුව 'එතදග්ග' තනතුර දෙනවා. මේ මේ අංශයෙන් මොහු ප්‍රධානයි කියලා. එබඳු තැනක සඳහන් වෙනවා. සතර සංග්‍රහ වස්තූන්ගෙන් පිරිසකට සංග්‍රහ කරන මගේ ශ්‍රාවක උපාසකයින් අතර හත්ථක ආලවක අග්‍රයි කියලා බුදුරජාණන් වහන්සේ වදාරනවා. ඒ වගේම එක සිද්ධියකුත් සඳහන් වෙනවා ධර්මයේ. ඔන්න එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ අලව්නුවර අග්ගාලව චෛත්‍යයේ වැඩ ඉන්න වෙලාවක හත්ථක ආලවක උපාසකතුමා,-හත්ථක ආලවක කියන්නේ අනාගාමී උපාසක තුමෙක්, බුද්ධකාලයේ සිටි ශ්‍රේෂ්ඨ උපාසකයෙක්, මාර්ගඵල අවබෝධ කළ අනාගාමී තත්ත්වයට පැමිණි කෙනෙක්-හත්ථක ආලවක උපාසකතුමා එනවා පන්සියයක පිරිසක් එක්ක බුදුරජාණන් වහන්සේ දකින්න. ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට වැඳලා එකත්පසක හිඳගත්තාම බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. 'ආලවක ඔබේ පිරිස බොහොම විශාලයි නෙ. කොහොමද ඔය තරම් විශාල පිරිසකට සංග්‍රහ කරන්නේ?' ඔන්න ඉතින් හත්ථක ආලවක උපාසකතුමා කියනවා 'ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ යම් සතර සංග්‍රහ වස්තුවක් ප්‍රකාශ කරලා තියනවා නම්- සංග්‍රහවස්තු හතරක් - අන්න ඒ සංග්‍රහ වස්තූන්ගෙනුයි මම මේ පිරිසට සංග්‍රහ කරන්නේ. මේ පිරිසෙන් යම් කෙනෙකුට දානය අවශ්‍ය නම්, දියයුත්තක් අවශ්‍ය නම්- (අපි හිතමු සමහර විට රැකීරක්ෂා ආදිය පිළිබඳ, ගොවිතැනට අවශ්‍ය උපකරණ හෝ වේවා, මිල මුදල් හෝ වේවා, අවශ්‍යතාවන් අනුව යම් යම් දේ දීම)- ඒ දානය බලාපොරොත්තු වෙන කෙනාට මම දානය දෙනවා. ඒ වගේම ඇතැම් කෙනෙක් ප්‍රියවචනය බලාපොරොත්තු වෙනවා නම්, ඒක නුවණින් සළකලා ඒ අයට ප්‍රිය වචනයෙන් මම සංග්‍රහ කරනවා. එතකොට පිරිසක් අතර අර විධියට අම්මා තාත්තා ආදී වශයෙන් ප්‍රිය වචනයෙන් කථා කරන කොට ඒ අයගෙ හිත මෘදු වෙනවා. මුදු මොළොක් බව. ඒක ඉතින් අවංකවම කළයුත්තක්.

ඊළඟට දක්වනවා යම් කෙනෙකු බලාපොරොත්තු වෙනවා නම් ඒ අයගේ දියුණුව පිළිබඳ උපදෙස්. ඒකත් මම දෙනවා. අර්ථචර්යාව. ඒ වගේම අවස්ථානුකූලව මම සමානාත්මතාව-එකට ඉඳගෙන ආහාර ගැනීම ඒ විධියේ යම් යම් අවස්ථාවල සමානාත්මතාව තුළිනුත් මම සංග්‍රහ කරනවා. එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'සාධු! සාධු! බොහොම හොඳයි ආලවක. ඔය විධියට තමයි අතීතයේත් යම් කෙනෙක් පිරිසකට සංග්‍රහ කළා නම් ඔන්න ඔය සංග්‍රහ වස්තු වලින්මයි. අනාගතයේත් යම් කෙනෙක් පිරිසකට සංග්‍රහ කරනවා නම් ඒත් ඔය සතර සංග්‍රහ වස්තු වලින්මයි. වර්තමානයේත් ඔය සතර සංග්‍රහ වස්තුවෙනුයි පිරිසකට සංග්‍රහ

කළ යුත්තේ.'ඒ හත්ථක ආලවක උපාසකතුමා පිරිසත් එක්ක නැගිටලා ගියාට පස්සේ බුදුරජාණන් වහන්සේ විශේෂ ප්‍රශංසාත්මක වාක්‍යයක් ප්‍රකාශ කරනවා සංඝයා වහන්සේලාට, 'මහණෙනි මේ හත්ථක ආලවක උපාසක තැන ආශ්චර්ය අද්භූත ධර්මයන් අටකින් සමන්විත කෙනෙක් හැටියට හිතාගන්න කියල. මොනවද අට? එයින් හතක් මේ කවුරුත් දන්නවා. ආර්ය ධන හැටියට දක්වන. සද්ධා, සීල, හිරි, ඔත්තප්ප, සද්ධා, සීල, කවුරුත් දන්නවා. 'හිරි' කියන්නෙ පවට ලැජ්ජාව, 'ඔත්තප්ප' කියන්නේ පවට බය. පාපයට භය. ඊළඟට 'සුත' - බහුශ්‍රැත බව හත්ථක ආලවක බහුශ්‍රැතයි. ඊළඟට 'චාග' පරිත්‍යාගශීලියි. ඊළඟට 'පඤ්ඤා' - ප්‍රඥාව. ආර්‍ය පුද්ගලයෙක් නිසා ප්‍රඥාව තියෙනවා. අවසාන වශයෙන් දක්වනවා අල්පේච්ඡයි. හත්ථක ආලවක අල්පේච්ඡයි. අල්පේච්ඡතාවට සම්බන්ධයි අර සමානාත්මතාවත්. ඒ අවස්ථාවේ තමන්ගේ ලොකුකම අමතක කරලා අවස්ථානුකූලව සමානාත්මතාව දක්වනවා. ඉතින් ඔය විධියේ පිරිසකට සංග්‍රහ කිරීම පිළිබඳ ප්‍රවෘත්තිය ධර්මයේ සඳහන් වෙනවා.

ඒ වගේම තවත් වැදගත් ගැඹුරු සූත්‍රයක-ගැඹුරු කියලා කියන්න පුළුවන් එක්තරා ප්‍රමාණයකින්-බුදුරජාණන් වහන්සේ මේ කියන **සතර සංග්‍රහ වස්තුවම නිවනට නැඹුරු කර** දක්වලා තියනවා. ඒ කොහොමද? ඔන්න එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'මහණෙනි ලෝකයේ තිබෙනවා බල හතරක්. මොනවද බල හතර? **පඤ්ඤා බලං, විරිය බලං, අනවජ්ජ බලං, සංගහබලං** කියල. ප්‍රඥා බලය, වීර්ය බලය. අනවජ්ජ බල කියන්නේ නිරවද්‍යතාව ඒකත් ශක්තියක් හැටියට. ඊළඟට සංගහ බලං. එතකොට සංගහ බලං කියල කියන්නේ අර සංග්‍රහ වස්තුමයි. ඔන්න ඊළඟට එක එකක් විග්‍රහ කරනවා. මොකද්ද 'පඤ්ඤා බලං' කියල කියන්නේ? දීඝ විස්තරයක් අපි කෙටි කරල කිව්වොත් එතන තෝරන්නේ බුදුරජාණන් වහන්සේගේ දේශනාවට අනුව හඳුනාගන්නවා මෙන්න මේ මේ දේවල් කුසල්. මේ මේ දේවල් අකුසල් මේ මේ දේවල් සාවද්‍යයි. වැරදි සහිතයි. මේ මේ දේවල් නිර්වද්‍යයි, මේ මේ දේවල් කළු ධර්ම, මේ මේ දේවල් සුදු ධර්ම ඔය විධියට කළු, සුදු හඳුනා ගන්නවා වගේ, නුවණින් හොඳ නරක හරියට හඳුනා ගන්නවා. ඒක තමයි ප්‍රඥා බලය. ඒක ඉතින් ආර්ය පුද්ගලයෙකුට අවශ්‍යයෙන්ම තියනවා. ඊළඟට විරිය බලං කියන්නේ අන්න ඒ ධර්මයන් හඳුනාගත්තා නම්, හොඳ දේවල් නරක දේවල් වෙන් වෙන්ව හඳුනාගත්තා නම්, ඊළඟට කරන්න තියෙන්නේ මොකක්ද? නරක දේවල් ඉවත් කිරීමත් හොඳ දේවල් ළංකර ගැනීමත්. ඒ සඳහා යොදන වීර්යයයි එතන විරිය බලං කියලා දක්වන්නේ. ඉතින් එතනත් කෙටියෙන් දක්වනවා අපි කවුරුත් අහලා තියන සතර ආකාර





සම්‍යක් ප්‍රධානය. අර නුවණින් දැක්ක අකුසල්, වැරදි සහිත දේවල්, කළු ධර්ම, දුරු කිරීම සඳහා අර නිතර වගේ දකින්ට ලැබෙන පාඨය 'ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති' ආදි වශයෙන් දක්වනවා. ඒ සඳහා ඕනෑකමක් ඇතිකර ගන්නවා. වෑයමක් දරනවා. වීර්යයක් අරඹනවා. සිත දැඩිව පිහිටුවා ගන්නවා. උත්කෘෂ්ට ප්‍රයත්නයක් දරනවා. ඔය විධියට නරක දේවල්, අකුසල් දේවල්, ඉවත් කිරීම සඳහා දැඩි ප්‍රයත්නයක් දරනවා. ඒ වගේම හොඳ දේවල්, කුශල ධර්මයන්ගේ ප්‍රතිලාභය සඳහා, ලබා ගැනීම සඳහා ඒ වගේම වීර්යයක් දරනවා. ඕකයි වීර්ය බලය. ඒකත් බලයක්, ශක්තියක්. බලපුළුවන්කාර කමක්. නරක දේවල් පන්නන්නත්, හොඳ දේවල් ළංකර ගන්නත්. ඒක වීර්ය බලයක් හැටියට දක්වනවා. ඊළඟට 'අනවජ්ජ බලං'. ඒක කෙටියෙන් නිරවද්‍යතාව දක්වන්නේ. යම්කිසි පුද්ගලයකුට නිවැරදි කාය වාග් මනෝ කර්මයන් තියෙනවා. අන්න අර කියාපු ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් හැටියට ඒ තැනැත්තාට තමන්ගේ කය වචනය සිත පිළිබඳ ක්‍රියාකාරීත්වය හරියාකාරව පවත්වා ගන්න පුළුවන්. එතකොට අනවජ්ජ බලය කියලා කියන්නේ නිවැරදි ජීවිතය, නිවැරදි ජීවිතය පිළිබඳ ශක්තිය. සිත, කය, වචනය හරිමාර්ගයේ යෙදවීම.

ඔන්න ඊළඟට තියෙනවා **'සංගහ බලං'** ඒක ටිකක් අමුතු විධියකටයි එතන විග්‍රහ කරන්නේ. සංගහ බලය කියන්නේ, ඒකෙන් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ, අර සතර සංග්‍රහ වස්තුමයි. නමුත් ඔන්න විවරණය දෙන්නේ අමුතු විධියකට. එතනදී බුදුරජාණන් වහන්සේ උත්කෘෂ්ටම අර්ථයෙන් ඒ හතර දක්වන්නේ. **'එතදග්ගං භික්ඛවෙ දානානං යදිදං ධම්මදානං'** මහණෙනි දානයන් අතුරෙන් මේකයි අග්‍ර. එනම් ධර්ම දානය ඊළඟට ප්‍රියවචනය පිළිබඳව දක්වනවා.**'එතදග්ගං භික්ඛවෙ පෙය්‍යවජ්ජානං යදිදං අත්ථිකස්ස ඔහිතසොතස්ස පුනප්පුනං ධම්මං දෙසෙති'** මොකක්ද ප්‍රියවචනය කියලා කියන්නේ. අපි හිතන මිහිරි වචනයම නොවෙයි. 'අම්මා' 'තාත්තා' කියන එක නොවේ. මෙතන ඊට වඩා ගැඹුරින් දක්වනවා. 'අත්ථිකස්ස ඔහිතසොතස්ස' කියල කියන්නේ ධර්මය අසනු කැමති කන් නමාගෙන සිටින අයට 'පුනප්පුනං' නැවත නැවත ධර්මය දේශනා කිරීම තමයි මෙතැන ප්‍රිය වචනය හැටියට දක්වලා තියෙන්නේ. මොකද ඒ? **මොකද ඒ?** ධර්මය තරම් රස දෙයක් නැහැ කවුරුත් දන්නවා නේ. කවුරුත් කියලා කියන්න බැහැ. ධර්මය හරියට හඳුනා ගත්තු අය දන්නවා. ධර්මය තරම් රසවත් දෙයක් නැහැ. ඒක තමයි කියන්නේ 'සබ්බදානං ධම්මදානං ජිනාති - **සබ්බං රසං ධම්ම රසො ජිනාති'** ධර්ම රසය හැම රසයම පරදනවා. ඒ වගේම කණට ඒ තරම් රසායන දෙයක් නැතෙයි

කියල කියනවා. ඒක නිසා තමයි අන්න **නියම ප්‍රියවචනය කියන්නේ. ධර්මය අසනු කැමැත්තන්ට නැවත නැවත ධර්මය දේශනා කිරීම.** ඒකයි ප්‍රියවචනයෙන් සංග්‍රහ කිරීම.

ඔන්න ඊළඟට අර්ථ චර්යාව. ඒකත් අමුතු විධියටයි දක්වන්නේ. මොකක්ද අර්ථ චර්යාව? ව්‍යාපාර දියුණු කරගන්න දෙන උපදෙස් නොවෙයි. ඒ උපදේශනය නොවෙයි. මෙතන දක්වන්නේ ශ්‍රද්ධාව නැති පුද්ගලයාව ශ්‍රද්ධාවේ පිහිටුවනවා, ශ්‍රද්ධාවේ සමාදන් කරවනවා. 'නිවෙසෙති පතිට්ඨපෙති' කියන වචන යෙදෙනවා. ශ්‍රද්ධාව නැති පුද්ගලයකු තුළ ශ්‍රද්ධාව ඇති කරනවා. ඒ සඳහා විශේෂ උත්සාහයක් යොදනවා. ශ්‍රද්ධාවේ පිහිටුවනවා තුනුරුවන් කෙරෙහි. ඊළඟට සීලය නැති තැනැත්තා, දුශ්ශීල පුද්ගලයා සීලයෙහි පිහිටුවනවා. ඒකයි අර්ථචර්යාව. ඊළඟට මසුරු පුද්ගලයා ත්‍යාග ගුණයෙහි පිහිටුවනවා. පරිත්‍යාගය පැත්තට යොමුකරනවා ඒ පුද්ගලයාව. ඊළඟට ප්‍රඥාව නැති පුද්ගලයා ප්‍රඥාවේ පිහිටුවනවා. ඔන්න එතකොට එතන අපට පේනවා අර්ථචර්යාව කියන එක ලෝකෝත්තර මට්ටමින් දක්වූ බව, නිවනට උපකාරවන අන්දමින්. ඒකටම ගැලපෙන අන්දමින් ඊළඟට සමානාත්මතාව දක්වන්නේ කොහොමද? අමුතු විදියකට එතැනත් පෙන්නුම් කරන්නේ. සෝවාන් පුද්ගලයා සෝවාන් පුද්ගලයාට සමානයි. සකදාගාමි පුද්ගලයා සකදාගාමී පුද්ගලයාට සමානයි. අනාගාමී පුද්ගලයා අනාගාමී පුද්ගලයාට සමානයි. අර්හත් පුද්ගලයා අර්හත් කෙනාට සමානයි. කොහොමද අපි මේක තේරුම්ගන්නේ? මාර්ගඵල මට්ටමට ගත්තට පස්සේ අන්ත දුගියෙක් හෝ වේවා, මහා පණ්ඩිතයෙක්, කුලීනයෙක්, රජකෙනෙක් හෝ වේවා සෝවාන් තත්ත්වයට පැමිණියානම් සෝවාන් බවින් සමානයි. සකදාගාමී තත්ත්වයට පැමිණියා නම් සකදාගාමී බවින් සමානයි. ඕක අනුව තමයි අපට හිතාගන්න තියෙන්නේ. දැන් බුදුරජාණන් වහන්සේගේ ශාසනය තුළ කුලභේදයක් නැතිබව අපි කවුරුත් දන්නවා. ඒක නිසාමයි ඕනෑම කුලයකින් මහණ වුනත් 'ශ්‍රමණ ශාක්‍ය පුත්‍ර' කියලා කියනවා. ශාක්‍යපුත්‍රිය ශ්‍රමණ තත්ත්වයට පත්වෙනවා. ඒවගේ මෙතනත් අන්න අර මාර්ග ඵල අනුවයි සමානාත්මතාව මෙතන දක්වලා තිබෙන්නේ, ගැඹුරු අර්ථයකින්. ඉතින් ඔන්න ඔය විධියට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා **මේ සතර සංග්‍රහ වස්තුම නිවන්කරා යන තාක් කෙනෙකුට උපකාර වෙන බව.**

ඊළඟට මේකටම අපට සම්බන්ධ කරන්න පුළුවන් තවත් වටිනා සූත්‍ර තිබෙනවා. දැන් මේක ආශ්‍රයෙන් අපට හිතාගන්න පුළුවන් සතර බ්‍රහ්ම විහරණයෙන් පටන් ගෙන ඒක ආකල්ප වශයෙන් ඇතිව මේ කරන සමාජ සංග්‍රහය එදිනෙදා ජීවිතය යහමහට ගැනීමට උපකාර වනවා පමණක් නොවේ නිවනට නැඹුරු වන්නත් උපකාර වන බව මේ සතර සංග්‍රහ





වස්තු විග්‍රහයෙන් පෙනෙනවා.

මේ කාලයේ අපි කවුරුත් දන්නවා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ජනප්‍රිය වීගෙන යන විෂයයක් තමයි **'උපදේශනය'** කියන එක. ඉතින් ඒ කොයි කොයි විධියේ පාඨමාලා ඔස්සේ උපදේශනය වෙනවාද කියන එක අපි දන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරන සතර සංග්‍රහ වස්තුත් ඒක යට තියන සතර බ්‍රහ්ම විහරණත් ගැන කල්පනා කර බලන කොට ඒවා නියම උපදේශකයෙක් වෙන්න, නියම උපදේශනය මොකක්ද කියලා හඳුනාගන්න උපකාර වෙනවා. මොකද, අර ඇතුළතින්ම කෙනෙකුට නැත්නම් කෙනෙකුගේ යහපත පිළිබඳව යෙදීමට ඇති ඕනෑකම, එහෙම නැත්නම් මෛත්‍රිය කරුණා මුදිතා උපේක්ෂා, - ඒකම තමයි ඔය කවුරුත් දන්නවා කරණීය සූත්‍රයේ සඳහන් වෙනවා මෛත්‍රිය ගැන ප්‍රකාශ කරන තැන **'මාතා යථා නියං පුත්තං - ආයුසා එක පුත්තමනුරක්ඛෙ - එවම්පි සබ්බභූතෙසු - මානසං භාවයෙ අපරිමාණං'** එතකොට මවක් යම්සේ තමාගේ එකම පුත්‍රයා ජීවිතය පරිත්‍යාග කිරීමෙන් හෝ රැකගන්නවා වගේ එහෙම නැත්නම් ඒ පමණටම මවක් තුළ දරුවකුට තියන මෛත්‍රිය වගේ, 'අපරිමාණං' අප්‍රමාණ වශයෙන් ලෝකයාට ඒක විහිදුවන්න කියලා. ඒක ආශ්‍රයෙන් අපට හිතාගන්න පුළුවන් මෛත්‍රිය වගේම කරුණාව මුදිතාව උපේක්ෂාව ඒ හැම එකක්ම 'අප්පමඤ්ඤා' කියලා දක්වනවා. අප්‍රමාණ වශයෙන් විහිදුවීමෙන් තමයි අන්න මුළු සමාජයම ඒකට අහුවෙන්නේ, සමාජයම නතු කරගන්න පුළුවන් වන්නේ. සමාජය කියලා කියන්නේ දැන් මෙතන මේ පිරිසක් කියලා කියපු ඒකයි. නමුත් දැන් තියන නොයෙකුත් සමාජ ධර්ම වලට වඩා වෙනස් වන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ ඔය විදියෙ දෙයක්.

ඒ වගේම දැන් අපි සාමාන්‍යයෙන් ලෝකයේ සමහර දේවල් ආත්මාර්ථකාමී කියලා සළකනවා. දැන් මෙතන මේ කියවෙන්නේ පරාර්ථචර්යාව. ඇත්ත වශයෙන්ම දක්වනවා බුදුරජාණන් වහන්සේ අනිත් තැන්වල දක්වන මැදුම් මහ වගේ මේ ධර්මයේත් තියනවා **'අත්තහිත පරහිත'** කියලා ඒ දෙපැත්තම. තමාගේ යහපතත් අනුන්ගේ යහපතත්. දැන් කුසලාකුසල විග්‍රහය පිළිබඳවත් බුදුරජාණන් වහන්සේ දක්වලා තිබෙන්නේ යමක් අකුසල් වෙන්නේ මොකද, ඒක තමාගේ පරිහානියටත් හේතු වෙනවා, අනුන්ගේ පරිහානියටත් හේතු වෙනවා. දෙපක්ෂයේම පරිහානියට හේතු වෙනවා. ඒව තමයි අකුසල් කියලා කියන්නේ. ලෝභ, දෝස, මෝහ ආදී වශයෙන් ඇතිවන දේවල්. අනිත් අතින් බලන විට දෙපැත්තේම යහපත සැලසෙන දේවල් තමයි කුසල් කියලා කියන්නේ. බුදුරජාණන් වහන්සේ ඒ ප්‍රකාශය කෙලින්ම සංඝයා වහන්සේ කෙනෙකුට ප්‍රකාශ කළ තැනක් සඳහන් වෙනවා. සංඝයා

වහන්සේ නමක්, නම සඳහන් වන්නේ නැහැ කවුද කියලා, ඇවිල්ලා බුදුරජාණන් වහන්සේගෙන් අහනවා "භාග්‍යවතුන් වහන්ස කාටද 'පණ්ඩිතො මහාපඤ්ඤො' කියලා කියන්න සුදුසු? කාටද කියන්නේ, " පණ්ඩිතො මහ පඤ්ඤො' කියලා". බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා යම් කෙනෙක් තමාගේ හිංසාව පිණිස තමාගේ පරිහානිය පිණිස නොසිතයිද, අනුන්ගේ පරිහානිය පිණිස නොසිතයිද, ඒ වෙනුවට තමාගේ හිතසුව පිණිසත් අනුන්ගේ හිතසුව පිණිසත්-**'අත්ත හිතං පරහිතං උභයහිතං සබ්බලොක හිතමෙව චින්තෙති'** කියලා සඳහන් වෙනවා එතන වටිනා වාක්‍යයක්. ඇතැම් කෙනෙක් හිතන්න පුළුවන් මේ බෞද්ධයා කියලා කියන්නේ කොන්වෙලා ඉන්න ආත්මාර්ථකාමී කෙනෙක් කියලා. නමුත් අන්න අර විධියට බුදුරජාණන් වහන්සේ දක්වනවා දෙපැත්තම. 'අත්තහිතං පරහිතං උභයහිතං සබ්බලොක හිතමෙව චින්තෙති' **අන්න පණ්ඩිත මහා ප්‍රාඥ පුරුෂයා බුදුරජාණන් වහන්සේ හඳුන්වන හැටි. තමාගේ යහපතත්, අනුන්ගේ යහපතත්, දෙපක්ෂයේම යහපතත්, මුළු ලෝකයේම යහපතත් හිතන කෙනෙක් හැටියටයි දක්වලා තිබෙන්නේ.**

ඒක වඩාත් ප්‍රකට වන වටිනා සූත්‍රයක් තව තැනක තිබෙනවා. පුද්ගල හතරකට බෙදලා අමුතු විධියේ විග්‍රහයක් දක්වනවා. දන් ඔය **'හිත' කියලා කියන්නේ යහපත.** ඒ ටික තේරුම් ගත්තා නම් ඔන්න ඊළඟට කියනවා එක පුද්ගලයෙක් ඉන්නවා ඒ පළමුවැනි පුද්ගලයා තමාගේ යහපත සඳහාවත් අනුන්ගේ යහපත සඳහාවත් වැඩ කරන්නේ නැති කෙනා. **'නෙව අත්තහිතං න පරහිතං'.** එයා බුදුරජාණන් වහන්සේ හඳුන්වන්නේ මේ විධියටයි. යම්සේ මහණෙනි සොහොනක තියෙනවා නම් අශූචි තැවරුන ගිනි පෙනෙල්ලක්. ගමට ලීකෑල්ලක් හැටියට ප්‍රයෝජනයට ගන්නත් බැහැ. කැලේට ලී කෑල්ලක් හැටියට ප්‍රයෝජනයට ගන්නත් බැහැ. අන්න ඒ වගේ මම හඳුන්වනවා. අන්න අර කියාපු පුද්ගලයා. අත්තහිතත් නෑ පරහිතත් නෑ. තමාගේ යහපත සළකන්නෙත් නැහැ. අනුන්ගේ යහපත සළකන්නෙත් නැහැ. ගන්නම දෙයක් නැහැ. ඔන්න පළමු වැනි පුද්ගලයා.

ඔන්න ඊළඟට දෙවෙනි පුද්ගලයා. දෙවෙනි පුද්ගලයා කවුද? **'පරහිතාය පටිපන්නො නො අත්තහිතාය'** අනුන්ගේ යහපත සඳහා වැඩ කරනවා. නමුත් තමන්ගේ යහපත ගැන සළකන්නේ නැහැ. ඒක කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ඔන්න ඔය දෙන්නා අතුරෙන් ශ්‍රේෂ්ඨයා, විශිෂ්ටයා, හැටියට සළකන්නේ දෙවෙනියා. ඒක හිතා ගන්න පුළුවන් නේ. කොහෙත්ම වැඩක් නැති පුද්ගලයත්, අනුන්ගේ යහපත සළකන තමන්ගේ යහපත සළකන්නේ නැති පුද්ගලයාත්. ඒ දෙන්නාගෙන් දෙවෙනි කෙනා





උසස් බව අපට පිළිගන්න පුළුවන්.

ඔන්න ඊළඟට එනවා කෙනෙකුට හිතන්න හොඳ කාරණයක්. තුන්වෙනි පුද්ගලයා කවුද? **අනුන්ගේ යහපත සළකන්නේ නැහැ. තමන්ගේ යහපත සළකනවා.** තමන්ගේ යහපත සඳහා වැඩ කරනවා. ඒක ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා **මේ තුන්දෙනාගෙන් විශිෂ්ට පුද්ගලයා දෙවැන්නා නොවේ තුන්වැන්නා.** අන්න ඒක කෙනෙකුට අභියෝගයක් වෙන්න පුළුවන් මේ කාලයේ චින්තනයේ හැටියට. එතකොට දෙවැන්නා කවුද? තමාගේ යහපත සළකන්නේ නැහැ අනුන්ගේ යහපත විතරයි සළකන්නේ. තුන්වැන්නා කවුද අනුන්ගේ යහපත සළනන්නේ නැහැ. තමන්ගේ යහපත පමණයි සළකන්නේ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මෙයා මේ තුන්දෙනාගෙන් විශිෂ්ටයා හැටියට. ඒක අපි පස්සේ තේරුම් කරන්න බලමු.

ඔන්න ඊළඟට හතර වෙනුව දක්වනවා - ඒකේ නම් අමුතුවෙන් විවාදයක් නැහැ. හතරවෙනි පුද්ගලයා **අනුන්ගේ යහපතත් තමන්ගේ යහපතත් දෙකම සළකනවා. ඒ තැනැත්තා තමයි හතරදෙනාගෙන් විශිෂ්ටයා.** එතකොට මෙතන බුදුරජාණන් වහන්සේ පුදුම විග්‍රහයක් දීල තියෙන්නේ. එක්කෙනෙක් ගැන කෙලින්ම කීවා දෙකක් ආවාට පස්සේ දෙන්නාගෙන් විශිෂ්ටයා. තුනක් ආවාට පස්සේ තුන්දෙනාගෙන් විශිෂ්ටයා. හතරක් ආවාට පස්සේ හතරවෙනියා ශ්‍රේෂ්ඨයි. ඉතින් **මෙතන සමහර විට සැකයක් ඇතිවන්න පුළුවන් ඇයි අර අනුන්ගැන නොසිතා තමන්ගෙ දියුණුව ගැන හිතන කෙනාට විශිෂ්ට තත්ත්වය දුන්නෙ කියලා. ඒක තේරුම් ගන්න උපකාරවන ගාථාවක් තියෙනවා ධම්මපදයේ.**

අත්තදත්ථං පරත්ථෙන
බහුනාපි න හාපයෙ
අත්තදත්ථමභිඤ්ඤාය
සදත්ථපසුතො සියා

ඒ කියන්නේ බොහෝ වූ පරාර්ථය සඳහාවත් තමාගේ අර්ථය, තමන්ගේ දියුණුව, මේ දීර්ඝ සංසාරයේ තමන්ගේ ආධ්‍යාත්මික දියුණුව, කැප කරන්න එපා කියලා. **'අත්තදත්ථං පරත්ථෙන - බහුනාපි න හාපයෙ** බොහෝ පරාර්ථය සඳහාවත් තමාගේ- තමාට තමා පමණයි ඉන්නේ- තමාගේ හිතසුව විනාශ කරගන්න එපා. **'අත්තදත්ථමභිඤ්ඤාය - සදත්ථපසුතො සියා'** තමන්ගේ අර්ථය යහපත හරියාකාරව තේරුම්ගෙන ඒකෙහි යෙදෙන්න කියලා. මොකද මේ කියන්නේ? තමා මඩගොඩේ ඉඳගෙන කොහොමද කෙනෙක් මඩගොඩෙන් ගන්නේ? තමා නරක ප්‍රතිපත්ති වල-දන් අපි

හිතමු අනෙක් අයට උපකාර වෙන්නයි කියලා අපි පස්පවම කරනවා. සමාජයට උපකාර වෙන්න කියලා අපි ප්‍රාණඝාතය කරනවා, හොරකම් කරනවා, බොරු කියනවා, අනෙකුත් පව්කම් කරනවා. සමාජයට උපකාර වෙන්න. නමුත් අන්තිමට නරක ආදර්ශයක් නිසා සමාජයත් පිරිහෙනවා. ආධ්‍යාත්මික අතින්. තමනුත් ඒ එක්කම පිරිහෙනවා. නමුත් පිටට පේන්නේ පරාර්ථය හැටියට. අන්න ඒක නිසා **පරාර්ථයට නියම පදනම ආත්මාර්ථයමයි. ආත්මාර්ථය කියලා කීවේ අර විධියේ පටු අදහසක් නොවෙයි. ඇතුළත ආධ්‍යාත්මික දියුණුවක්.** එහෙමයි අපට හිතාගන්න තියෙන්නේ. එතකොට අර 'අත්තදත්ථං පරත්ථෙන' කියන ගාථාව ධම්මපදයේ දකලා කෙනෙක් ප්‍රශ්නයක් නගන්නත් පුළුවන්. ඇයි බුදුරජාණන් වහන්සේ හරි ආත්මාර්ථකාමිත්වයක් ගැන නේ දේශනා කරලා තියෙන්නේ කියලා. මේක ආශ්‍රයෙන් තේරුම් ගන්න ඕනෑ, ඒ කියන්නේ තමන්ගේ අර ආධ්‍යාත්මික ප්‍රගතිය ගැන අමතක කරලා ලෝකාර්ථය සඳහාය කියලා පව්කම් කිරීම. දැන් මොකද බුදුරජාණන් වහන්සේම ප්‍රකාශ කළා නේ කුසල් අකුසල් විග්‍රහය අනුව **දෙපක්ෂයටම වැඩදායක දේ පමණයි කුසල්**. එක පක්ෂයකට පමණක් නොවේ. ඒක හරියට තේරුම් ගත්තාට පස්සේ අන්න බුදුරජාණන් වහන්සේ පණ්ඩිත මහා ප්‍රාඥ පුද්ගලයා ගැන කළ විග්‍රහයෙන් පෙනෙනවා නියම ඉලක්කය. ඒකමයි බුදුකෙනෙක් කරන්නෙ - නියම ඉලක්කය නම් අත්තහිත පරහිත දෙකම ඒ ඒ මට්ටමින්.

ඒ කොයි මට්ටමින් කළත් ඒක ධර්මානුකූල වෙන්න ඕනෑ. ධර්මානුකූල වෙන්න නම් අන්න අර කියාපු බල හතර ගැන අපි හිතන්න ඕනෑ. 'පඤ්ඤා බලං' කීවේ මොකද? දැන් යම් කෙනෙකුට සමාජ සේවයක් කරන්න ඕනෑ නම් මොකක් හරි බලපුළුවන්කාර කමක් තිබෙන්න එපායැ. දැන් අපි හිතන්නේ බොහෝ දෙනාට සමාජ සේවයක් කරන්න බලපුළුවන්කාරකමක් තියෙන්න ඕනෑ. මෙන්න ධර්මානුකූලව බලපුළුවන්කාරකම. ප්‍රඥාව තියෙන්න ඕනෑ, හොඳ නරක වටහා ගැනීමට, කුසල් අකුසල් වටහා ගැනීමට, යුතු අයුතුකම් වටහාගැනීමට, කළයුතු නොකළ යුතුදේ වටහා ගැනීමට. ඒ බලය උපකාරකරගෙන, ඒ බලපුලුවන්කරකම උපකාර කරගෙන තමයි ප්‍රශ්නයක් ආවාම 'උපදේශනය' කරන්නේ. උපදේශකයාට අයිති දෙයක් ඒ ප්‍රඥා බලය. ඊළඟට 'විරිය බලං'. ඒ උපදේශකයා අර නරක දේ ඉවත් කරන්න කොහෙත්ම උනන්දුවක් නැත්නම්, වීර්යයක් දරන්නෙ නැත්නම්, හොඳ දේ ළංකර ගන්න වීර්යයක් දරන්නේ නැත්නම්, එයා කරන උපදේශනය, මොකක්ද? අර විරිය බලය නැති ඒ කුසීතයා, ඒ විධියේ කුසීත පුද්ගලයාට සංග්‍රහයක් කරන්න බැහැ. පරාර්ථචර්යාවේ යෙදෙන්න බැහැ. ඊළඟට ඒ වගේම තමයි 'අනවජ්ජ බලං' නිරවද්‍ය ක්‍රියා මාර්ගයක් ඇති තැනැත්තා තමයි ඒකට සුදුසු. තමන්ගේ





චරිත ස්වභාවය අර විධියට නොමගට යනවා නම් ඒ තැනැත්තාට බැහැ නියම සේවයක් කරන්න. ඊළඟට ඒ වගේම තමයි අර "සංගහ බලං" කියන එකේ කිට්ටුවටවත් එන්න බැහැ ධර්මානුකූලව.

ඒ එක්කම එම සූත්‍රයේම සඳහන් වෙනවා ඔන්න ඔය කියාපු බල හතර ඇති ආර්ය ශ්‍රාවකයා, මොනවද බල හතර, පඤ්ඤා බලං, විරිය බලං, අනවජ්ජ බලං, සංගහ බලං කියන බල හතර ඇති පුද්ගලයා කල්පනා කරන ආකාරය බුදුරජාණන් වහන්සේ දක්වනවා, එබඳු ඒ පුද්ගලයාට භය හතරකින් නිදහස් වෙන්න පුළුවන් කියලා. මොනවද භය හතර? භය කියලා අපි පාවිච්චි කරන්නේ අන්තරාය. සාමාන්‍ය කෙනෙක් භය වන දේවල්. මොනවද භය හතර? සාමාන්‍ය සමාජයේ ජීවත්වන පුද්ගලයාට එන භය හතරක් ඔතන තියෙන්නේ, 'ආජීවික භය' ආජීවික භය කියන්නෙ ජීවිකාව පිළිබඳ භය. රක්ෂාව නැතිවෙයි කියන භය, මේ බුදුරජාණන් වහන්සේ කතාකරන්නේ. ඊළඟට දෙවනුව දක්වන භය මොකක්ද? අසිලෝක භයං. සිලෝක කියන්නේ ප්‍රශංසාව. එතකොට ගර්හාව, නින්දාව, ගැරහීම පිළිබඳ භය. ඕකත් තියනවා නෙ සමාජගත පුද්ගලයාට. ඊළඟට තුන්වන භය මොකක්ද? 'පරිස සාරජ්ජ භයං' පිරිසක් මැදට යන්න භය. මොකද කියල හිතා ගන්න පුළුවන්. පිරිසක් මැදට යන්න භය. ඕකත් භයක් සමාජගත පුද්ගලයාට. සතරවෙනි භය මොකක්ද? මරණ භය. පස්වෙනි භය මොකක්ද දුගති භය. එතකොට ආර්ය පුද්ගලයා ගැන සඳහන් වෙනවා ඒ ආර්ය පුද්ගලයා ඔය පඤ්ච භය සමතික්‍රමණය කරනවා. ඉක්මවනවා කියලා.

වෙනෙකක් තබා ඒ පුද්ගලයා හිතන ආකාරයත් බුදුරජාණන් වහන්සේ දක්වනවා. මෙන්න මෙහෙම හිතනවයි කියලා. 'මට මේ ජීවිකා වෘත්තිය පිළිබඳ භයක් නැහැ. මොකටද මම ජීවිකා වෘත්තිය පිළිබඳ භයක් ඇති කරගන්නේ? මට තියෙනවා ප්‍රඥා බලය, මට තියෙනවා විරිය බලය. මට තියෙනවා අනවජ්ජ බලය, මට තියෙනවා සංග්‍රහ බලය, 'අර පුද්ගලයා හිතන ආකාරයට කියන්නෙ,' ප්‍රඥාව නැති කෙනයි ජීවිකාව පිළිබඳ භය, ජීවිකාව නැති වෙයි කියල භය ඇති කරගන්න ඕනෙ. කුසීතයයි ජීවිකාව පිළිබඳ භය ඇති කරගන්න ඕනෙ. වැරදි කාය වාග් කර්ම ඇති කෙනයි ජීවිකාව පිළිබඳ භයක් ඇති කර ගන්න ඕනෙ. පිරිසට සංග්‍රහ නොකරන තැනැත්තයි ජීවිකාව පිළිබඳ භය ඇතිකර ගන්න ඕනෑ.' ඒ වගේම ඊළඟට කියවෙනවා අනික් භය පිළිබඳවත්.' මට නැහැ ගර්හාව, නින්දුව, පිළිබඳ භයක්. මොකටද මම භය වන්නේ ගැරහීම නින්දාව පිළිබඳව. මට තියෙනවා ප්‍රඥා බලය, වීර්ය බලය, අනවජ්ජ බලය, සංග්‍රහ බලය, ප්‍රඥාව නැති කෙනයි ඒ ගැරහීම් පිළිබඳව නින්දාව පිළිබඳව භය වෙන්න

ඕනෑ. කුසීතයයි ඒ විධියට භය වන්න ඕනෙ. වැරදි කාය වාග් කර්ම තියන කෙනයි ඒ විධියට ගැරහීමට භය වන්න ඕනෑ. සංග්‍රහ නොකරන කෙනයි ඒ විධියට භය වෙන්න ඕනෑ,' ඒ විධියටම සඳහන් වනවා පිරිසක් මැදට යාම පිළිබඳව. එතනදිත් ඒ පුද්ගලයා කල්පනා කරන ආකාරය. 'මට භයක් නැහැ පිරිසක් මැදට යන්න. මොකද මට තියෙනවා අර කියාපු ප්‍රඥා බලය, වීර්ය බලය, අනවජ්ජ බලය, සංග්‍රහ බලය. එතනදිත් ප්‍රකාශ කරනවා,' ප්‍රඥාව නැති මිනිහයි පිරිසක් මැදට යන්න භය වෙන්න ඕනෑ. කුසීතයයි ඒ විධියට භය වෙන්න ඕනෑ. වැරදි කාය වාග් කර්ම ඇති කෙනයි භය වෙන්න ඕනෑ. අනිත් අයට සංග්‍රහ නොකරන කෙනයි භයවෙන්න ඕන! ඒ විධියටම සඳහන් වෙනවා. මරණ භය පිළිබඳව. මේ ආශ්‍රයෙන් හිතා ගන්න පුළුවන්. එතනදිත් කියවෙන්නේ මම මොකටද මරණයට භය වෙන්නේ. ප්‍රඥාව නැති මිනිහයි මරණයට භය වෙන්නේ. වීර්ය නැති මිනිහයි. වැරදි ක්‍රියාමාර්ග ඇති කෙනයි සංග්‍රහ නොකරන කෙනයි මරණයට භය වන්නේ. ඊළඟට දුගතිය පිළිබඳවත් ඒ විධියටයි.

ඉතින් මේක ටිකක් සමහර විට පටලැවිල්ලක් වෙන්න පුළුවන්. මේ පින්වතුන්ට හිතාගන්න අමාරු වෙන්න පුළුවන්. මේක තේරුම් ගන්න වෙන්නේ මෙහෙමයි. දැන් අර කියාපු කායවාග් කර්මවල අඩුපාඩුකම් තියෙනවා නම්- ඇත්ත වශයෙන්ම මේ යුගයේ හැටියට හොඳ මිනිහට තැනක් නැහැ කියන කථාවක් තියෙනවා නේ සමාජයේ. කවුරුත් දන්නවා රට යන හැටි. දැන් වැල යන අතට මැස්ස බඳින එකනේ වැඩි. ධර්මය අධර්මය සළකන්නේ නැහැ. වැල යන අතට මැස්ස බඳිනවා. ලේසි වැඩේ. ආත්මාර්ථකාමීව. නමුත් අන්න බුදුරජාණන් වහන්සේ ඒවා පෙන්නුම් කරල දීල තියෙනවා. එබඳු අයට වැඩිකල් ඉන්නත් බැහැ ඒ තත්ත්ව වල. ඉතින් කෙසේ හෝ වේවා. අන්න අර කියාපු සුදුසුකම් නැත්නම්, ආජීවික භය කියල කියන්නේ සමහර විට ලොකු රස්සාවක් ලැබෙයි හිටි ගමන්. මේ කාලයේ තියනවා නේ අල්ලස් දූෂණ ආදී නානාවිධ දේවල්. බොහොම බයෙන් ඉන්නේ කොයි වෙලාවේ මේක අහුවෙලා තමන්ගේ තනතුර නැති වෙලා පාරට බහින්න වෙයිද කියලා. ඒ විධියේ භයක් නැහැ. අන්න අවංක පුද්ගලයට. අර කියාපු ගුණධර්මවල පිහිටපු පුද්ගලයාට භයක් නෑ. එතැන නැති වුනත් වෙන තැනකට යනවා. අමුතු සහතික ඕන නැහැ එබඳු පුද්ගලයාට. විමසලා බලන එක විතරයි අහවලා කොහොම කෙනෙක්ද කියලා. බොහෝ දෙනා අනික් අයගේ සහතික බලාපොරොත්තු වෙනවා. හොඳ ජීවිතයක් ගෙවන කෙනාට සහතික අවශ්‍ය නැහැ. අර වගෙයි ටිකක් විපරම් කරලා බලනකොට. දැන් එක පැත්තකින් අපි කිව්වා හොඳ මිනිහාට තැනක් නැහැ කියලා සමාජයේ. තව පැත්තකින් ඇහෙනවා සමාජයේ වැඩකට මිනිහෙක් නැහැ කියලා. මෙච්චර ජනගහණයක් හිටියත්





වැඩකට මිනිහෙක් නැත්තෙ මොකද? අවංක මිනිහෙක් නැහැ. යන්ත්‍රයක් ගැන විශ්වාසය තියන්න පුළුවන් මේ කාලයේ තියන යන්ත්‍ර ගැන, යකඩ මිනිසුන් ගැන. මනුෂ්‍යයින් ගැන විශ්වාසයක් තියන්න බැරි තරම් ධර්මයෙන් ඉතාමත්ම දීන තත්ත්වයට වැටිලා තියනවා. ඒක නිසා අපට හිතා ගන්න පුළුවන් බුදුරජාණන් වහන්සේගේ වචනය අදටත් සත්‍ය බව. එතකොට ඒ පුද්ගලයාට ජීවිකාව පිළිබඳ භයක් නැත කීවේ ඒකයි. එවැනි පුද්ගලයින්ට සමාජයේ කවදත් තැනක් තියනවා.

එතකොට ඒ වගේම තමයි. අර ගර්හාව නින්දාව පිළිබඳව මේ කාලයේ අහන්න ලැබෙන අල්ලස් දූෂණ ආදිය. හොඳට වැජඹෙන, ඉහළින්ම වැජඹෙන පුද්ගලයින් පිළිබඳව හිටිගමන් ලොකු අකුරින් පළවෙනවා යම්කිසි ප්‍රවෘත්තියක්. ඊට පස්සේ ඒ තැනැත්තා කොහේද කියලා නැහැ. අන්න එතකොට එයින් පේනවා චරිත ශක්තියේ දුර්වලකම නිසාමයි ඒ තැනැත්තාට සභාවක් මැදට යන්න බැරි. 'පරිස සාරජ්ජ භය' කියන්නේ ඒකයි. ඔන්න දැන් හිතාගන්න පුළුවන් බුදුරජාණන් වහන්සේ අර ආර්ය පුද්ගලයාගේ සිතුම් පැතුම් වචනයට නඟලා ඉදිරිපත් කළේ මොකද කියලා. ලෝකයාට පාඩමක් හැටියට. ඒ පුද්ගලයා හිතනවා භය නැතිව. 'මම භය නෑ ඕවාට. මම මොකටද භය වෙන්නේ' අන්න එහෙම කියන්න පුළුවන් චරිත ශක්තියක් ඒ පුද්ගලයාට ඇතිවෙනවා ආර්ය ශ්‍රාවකයාට. එතකොට ජීවිකාව පිළිබඳ භයක් නැහැ. නින්දා ගර්හාව පිළිබඳ භයක් නැහැ. පිරිස් මැදට යාමට භයක් නැහැ. මරණයට භයක් නැහැ. දුගතියට භයක් නැහැ. ඔන්න ඕකයි අපට හිතාගන්න තියෙන්නේ.

ඒ එක්කම අපි කල්පනා කරලා බලමු. දැන් මේ කියන්නේ සමාජ සේවය ගැන. එහෙම නැත්නම් පරාර්ථය ගැන. දැන් මේ කාලයේ 'සමාජ සේවය' ආදී වචන තියෙන්නේ. මේවා පිළිබඳව අපි කවුරුත් කතා කළාට මොකද සමාජයේ තියෙන විශාලම පිළිලයක් තමයි ඊර්ෂ්‍යාව කියන එක. ඒකට විරුද්ධ ගුණය තමයි මෙතන මේ කියන මුදිතාව. අර මව්පියන් දරුවකු ඇති දැඩි කිරීම පිළිබඳව ඇතිකර ගන්න මුදිතාව. 'මුදිතාව' කියන වචනය පවා බොහෝ දෙනාට පැහැදිලි නැහැ. මුදිතාව කියල කියන්නේ අනුන්ගේ සැපත පිළිබඳව සතුට ඇතිකරගැනීම. එහෙම නැත්නම් අනුන් සැපතේ සිටිනවා දකලා හරියට තමන් සැපතට පත්වුනා වගේ සිතින් සතුටු වන ගතිය. ඒ ගුණය බොහො දෙනා තුළ අඩුයි. ඒ නිසා සමහර විට පරාර්ථසේවය කියලා කරනවා නමුත් අර නූල් සූත්තර වගේ බලාපොරොත්තු වන්නේ ඒ පුද්ගලයා තමා යටතේ තබා ගැනීම. ඒ පුද්ගලයාට තනිව නැඟී සිටින්න දෙන්නේ නැහැ. ඊර්ෂ්‍යාවට හැරෙනවා. "අපෙන් කාල බීල හැදිච්ච කෙනා. මෙයාට කොහොමද මම සම ආසනය

දෙන්නේ." ඔන්න ඔය ප්‍රශ්නය එනවා. සමානාත්මතා කතාවත් ඒ එක්කමයි යන්නේ. ඊර්ෂ්‍යාව ඇතිතාක්, ඒ කියන දුර්ගුණය ඇතිතාක්, අර කියාපු පරහිත සංකල්පය සම්පූර්ණ වන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම අර උපදේශකයෙකුට තියෙන්න ඕන මුදිතාව. ඔන්න එතකොට අපට පෙනෙනවා අර සතර බ්‍රහ්ම විහරණයත් මෙන්න මේ කියාපු සංග්‍රහ බලයත්, සංග්‍රහ වස්තූන් පිළිබඳ අවබෝධය වගේම ඒ ක්‍රියාත්මක වීමත්. ඒකට යටින් තිබෙන්නේ අර සිත පිළිබඳ කාරණයයි. දැන් අපි සතර බ්‍රහ්ම විහරණ ගැන කියන කොට බොහෝ විට දැක්වූවා මේවා පවුලේ මට්ටමින්. දැන් අපි පවුල කියන්නෙ සමාජයේ ඒකකයක්. ඒක නිසා තමයි බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙන්නෙ

"**මාතායථා නියං පුත්තං - ආයුසා එක පුත්ත මනුරක්ඛෙ**

**එවම්පි සබ්බ භූතෙසු - මානසම්භාවයෙ අපරිමාණං**"

ඒක උපමාවක් විතරයි. නිදර්ශනයක් පමණයි. යම්සේ මවක් තමාගේ දරුවකු තම ජීවිත පරිත්‍යාගයෙන් රැක ගන්නා වාගේ හැම සත්ත්වයා කෙරෙහිම **අපරිමාණ වශයෙන් අප්‍රමාණව** - අන්න එතකොට අපට හිතාගන්න පුළුවන් සමාජ සේවකයකු අර කියාපු සතර බ්‍රහ්ම විහරණයෙ මෛත්‍රිය අපරිමාණ වශයෙන් වඩනවා. දැන් පවුලකට සීමා කරලා වඩන ගුණය මුළු මහත් සමාජයටම. මොකද, බුදුරජාණන් වහන්සේට නම් පෙනුනේ - අපි මේ කොටුකර ගන්නවා ජාති වශයෙන් ගෝත්‍ර වශයෙන් ඒ විධියට කොටුකර ගත්තට- බුදුරජාණන් වහන්සේගේ බුදු ඇසට පෙනුනේ හරියට මුහුදට ගසාගෙන යන පිරිසක් වගේ. මේ ඔක්කොම සංසාර සාගරයේ සත්ත්වයින්. එතකොට ඒ කොයි හැටි හෝ වේවා අර නුවණැති ආර්ය පුද්ගලයා කල්පනා කරනවා අර ඊර්ෂ්‍යාව ආදී දුර්ගුණ වලින් ඉවත් වෙලා හැමදෙනාගේම යහපත. ඒක තුළ තමාගේ අධ්‍යාත්මික වැඩීමක් වෙනවා ඒකයි 'අප්පමඤ්ඤා' කියලා උසස් ධ්‍යාන තත්ත්ව වශයෙන් දක්වලා තියෙන්නේ. ඉතින් ඒවා වචන පමණක් නොවෙයි. කෙනෙක් උත්සාහවත් වෙනවා නම් ක්‍රියාත්මක කරන්න පුළුවන්.

මෛත්‍රිය ගැන කවුරුත් අහලා තියනවා. මෛත්‍රී භාවනාව වඩන හැටිත් අපි බොහෝ අවස්ථාවල නා නා විධ ක්‍රම වලින් දක්වලා තියෙනවා මේ දේශනා ආදියෙදි. ඉතින් අර කෙටියෙන් තමන් සළකා ගත්තොත් හැම දෙනාම සැපයට කැමතියි. දුකට අකමැතියි කියන ඒ සංකල්පය හිතට ධාරණය කර ගත්තාට පස්සේ 'සුවපත් වේවා' වැනි වචනයකින් පටන් ගන්න භාවනාව යම් අවස්ථාවක එක පුද්ගලයකුට පමණක් සීමා කරලා නොවේ. ඒකට තමයි ධර්මයේ තියෙන්නේ 'දිසා ඵරණය' කියලා. 'අප්පමඤ්ඤා' කියල කියන අප්‍රමාණ තත්වයට සිත වැඩීමේදී මෛත්‍රී භාවනාවට ධර්මයේ දැක්වෙන්නේ '**එකං දිසං දුතියං දිසං තතියං දිසං චතුත්ථිං දිසං**





**උද්ධං අධො'** එක දිසාවක් දෙවෙනි දිසාව තුන්වැනි දිශාව, හතරවැනි දිසාව ඉහළ පහළ ආදී වශයෙන් මුළු මහත් විශ්වයටම සීමාවක් නොමැතිවම අර 'සුවපත් වේවා' කියන හැඟීම විහිදුවා හැරීමයි. සමහර විට කියනව සීමා සම්භේද කියල කිසිම සීමාවක් නැතිව, වැට කඩුළු ඉවත් වෙන ආකාරයට. ඒ මෛත්‍රිය පිළිබඳව දක්වලා තියනව වගේම කරුණාව පිළිබඳවත් එහෙම කියල තියෙනවා අප්‍රමාණ තත්වයට වඩන්න කියලා. මුදිතාව පිළිබඳවත් එහෙමයි. අර ඊර්ෂ්‍යාවට එතකොට ඉඩක් නැහැ. ඊර්ෂ්‍යාව කියල කියන එක සමාජ පිළිලයක්. පිළිලය කියන එක ගහක හට ගත්තොත් ගහ විනාසයි. ඒ වගේම තමයි මේ කවුරුත් දන්නවා හැම තැනම තරඟකාරිත්වය කියල එකක් තියනවා. ඇත්ත වශයෙන් දක්ෂතාව, නිපුනතාව, කුසලතාව, මැනීමට උපකරණයක් හැටියට උපයෝගිතාව ඇති දෙයක් හැටියට අප සළකනවා විභාග තරඟ ආදිය. ක්‍රීඩා තරඟ. දහම් පාසල් වල පවා තරඟ තියෙනවා. නමුත් මේ තුළින් ඉතාම සියුම් අන්දමින් ඇතිවෙන අර ඊර්ෂ්‍යාව ආදී දේවලින් පරිස්සම් වෙන්න ඕනෑ. පරිස්සම් වෙන්නෙ අන්න අර මුදිතා ආදී ගුණයෙනුයි. එතකොට අපිට තරඟ නැතිව බැරිව වගේ පෙනෙනවා, අර **කුසලතාව** මැනීම සඳහා. **නමුත් කුසලයාට ලැබෙන්නේ තෑග්ග නොවේ. ප්‍රශංසාව නොවේ. තමන් එක්ක තරඟ කළ අයගේ ද්වේශය, ඊර්ෂ්‍යාව.** ඒ නිසාම සමහර විට අකාල මරණය.

මේ පින්වතුන් හොඳින් දන්නවා ඒක පාසල් මට්ටමට ඇවිල්ලා. රැකියා මට්ටමේ තිබුන එක. අනිත් ඒවා ගැන අපි කියන්න ඕනෙ නැහැ. ඊට ඉහළ මට්ටම් ගැන. රැකියා ආදී දේවල සමාජයෙ විවිධ තරාතිරම් වල තිබුන එක අධ්‍යාපන ක්ෂේත්‍රයටත් ඇවිල්ලා. වැඩියෙන් ලකුණු ගත්තු කෙනා සමහර විට තමන්ගෙම හිතවතුන්ගෙන් මරණයට පත්වෙනවා. ඒ විධියේ තත්ත්වයක්. මොකද තරඟකාරිත්වය අවශ්‍යතාවක් වුනත් ලෝකයේ දක්ෂතාව උරගා බැලීමට, ඒ තරඟය තුළ අර ඒ දිනූ කෙනා අලුත් ඉලක්කයක් ලෝකයට දුන් හැටියට, අලුත් වාර්තාවක් පිහිටවූ කෙනෙක් හැටියට, සළකලා ප්‍රශංසා කරන්න තෑග්ගක් දෙන්න නැමෙනවා වෙනුවට, ඒ මුදිතා ගුණය වෙනුවට, ලෝකයා තුළ තිබෙන්නේ එයා වට්ටලා, එයා නැති කරලා විනාශ කරලා, එතෙන්ට පැමිණෙන එකයි.

අන්න එතකොට අපි කල්පනා කරන්න ඕන ඔය විධියට බුදුරජාණන් වහන්සේ දැක්වූ පරහිත සංකල්පය. මේවා උපකාර වෙනවා ඇත්ත වශයෙන් මේ කාලයේ උපදේශකයින්ට. උපදේශනය කියල කියන්නේ ඒකත් වවාගෙන කන රස්සාවක් නොවෙයි. අන්න අර කියාපු ඇතුළත තියන කුසල් ශක්තිය ඉදිරිපත් කරගෙන ඒ එක්කම තමාගේ ආධ්‍යාත්මික දියුණුවට උපකාර වෙන අන්දමටයි. හැම දෙයක්ම, හැම රැකියාවක්ම, මුදලට

යටවන යුගයක උපදේශනයත් රැකියාවක් කරගෙන සමහරු ඒක තුළ අර නියම ආකල්පය ඇති කරගන්නෙ නැහැ. අන්ධයෙක් කොහොමද කෙනෙකුට පාර දක්වන්නේ.

දැන් මේ පින්වතුන් අහල තියනවා බුදුරජාණන් වහන්සේ ලෝකය ගැන කථා කරන තැන අන්ධයා, එකැස් කණා, ඇස්දෙකම පෙනෙන කෙනා කියලා ඔය විධියට දක්වලා තියනවා. අන්ධො, එක චක්ඛු, ද්වි චක්ඛු. අන්ධයා කියන්නෙ, මෙලොව යහපත ගැන අවබෝධයකුත් නැහැ. පරලොව යහපත ගැන අවබෝධයකුත් නැහැ. තමාගේ යහපත දන්නෙත් නැහැ අනුන්ගෙ යහපත දන්නෙත් නැහැ. ඒ විධියට. නමුත් එකැස් කණා මෙලොව යහපත ගැන පමණක් අදූරදර්ශීව කෙටිකාලීන සැලසුම් වලින් තමාගේ ආර්ථික දියුණුව, අනියම් මාර්ග වලින් හරි ඇතිකර ගන්නවා. එකැස් කණාගේ වපර දෘෂ්ටියෙන් කෙනෙකුට පිහිටවෙන්න බැහැ. මෙලොව පරලොව දෙකම පිළිබඳව හොඳ නරක වටහා ගත්තු බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා මේ සංසාර ගමන ගැන හිතලා බලනකොට කවුරුත් නොයෙකුත් විධියේ විවිධ කුලවල, ජාතිවල ඒ ඒ තැන්වල උපන්නත් මේ එකම සංසාර ගමනේ යෙදෙන්නේ. ඇතැම් විට සංසාරයේ ඔවුනොවුන්ට නෑයින් වෙලා සහෝදරයින් වෙලා එකට හිටපු කට්ටිය. ඒ විධියේ අවබෝධයක් ගත්තා නම් ඒ තැනැත්තාට තේරෙනවා මේ එක්කෙනෙක් වට්ටලා ඒ තැනට ඒම වැනි දේවල් තමාගේ පරිහානියට හේතුවන බව. අන්ධයාට කොහොමත් බැහැ. එකැස් කණාගේ වපර දෘෂ්ටිය අරගෙනත් බැහැ කෙනෙකුට උපදේශනයක් කරන්න. ඒ අනුව අපි හරියාකාරව දෙපක්ෂයේම දෙලොවටම යහපත සැලසෙන - දෙලොව පමණක් නොවේ නිවනත් සැලසෙන හැටියටයි. දැන් මෙතන මේ සතර සංග්‍රහ වස්තු බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරලා තියෙන්නේ. මෙලොව දියුණුවත් පරලොව දියුණුවත් අවසානයේ නිවනත් සැලසෙන ආකාරයට. අර සංග්‍රහ බල කියන තැනින් අපට මාර්ග ඵල අනුව සමානාත්මතාව දක්වල තියෙන්නෙ ලෝකෝත්තර පැත්තෙන්.

ඒ අනුව අපි කල්පනා කරන්න ඕන. එතකොට මේ සතර සංග්‍රහ වස්තු කියන්නෙ මේ ශාසනයේ ඉතාමත්ම වටිනා ධර්මයක් බව. බොහෝ දෙනා ඇතැම් විට අපේ මේ දේශනා ගැන උදාසීන වෙනවාත් ඇති හැමදාම නිවන ගැන කියනවා කියලා. නමුත් ඔන්න නිවනට මඟ තියෙන්නෙත් මේ කියාපු ක්‍රියා මාර්ග තුළින් බව අපි තේරුම් ගන්න ඕනෑ. මේක වෙන් කරන්න බැහැ ධර්මයෙන්. එතකොට මේ සතර සංග්‍රහ වස්තු, සතර බ්‍රහ්මවිහරණ, තම තමන්ගේ ආධ්‍යාත්මික දියුණුවට වගේම සමාජයේ දියුණුවටත් හේතුවෙනවා. සමාජය කියලා කියන්නේ පුද්ගලයාගෙන් වෙන්වූ දෙයක් නොවේ. පවුල කියලා කියන්නෙ අර ජාතියෙන්-සමාජයෙන් වෙන්කර





ගත්තු දෙයක් නොවේ. ඒකකයක් හැටියට සැළකුවාට කමක් නැහැ. ඉතින් මෙතන තියන අඩුපාඩුවම තමා සමාජයට බලපාන්නේ. මෙතන තියන දියුණුවම තමා සමාජයට බලපාන්නේ. ඉතින් අපි පුද්ගලයින් වශයෙන් මව්පියන්ගෙන් ඉගෙන ගත්තු සතර බ්‍රහ්ම විහරණ, මව්පියන් ඇසුරෙන් හඳුනාගත්තු ඒ සතර සංග්‍රහ වස්තු, අපි අපගේ ජීවිත වලට ළං කරගෙන අන්න අර කියාපු උපදේශනය අනික් අයට දෙන්න කලින් තමන් සංග්‍රහ බලයෙන් ශක්තිමත් වුනොත් අන්න එතකොට ඇත්ත වශයෙන්ම තමන්ට පුළුවන් මඩගොඩින් නැගිටලා අනික් අයත් ඒ තත්ත්වයෙන් නැගිටුවගන්න.

අපි කල්පනා කරන්න ඕන, බුදුරජාණන් වහන්සේ මේ ධර්මය දේශනා කළේ එක දවසින්ම නිවන් දක්වන්ට නොවේ. විවිධ තරාතිරම් වලයි ඒ ඒ අය ඉන්නෙ. ඒකයි බුදුරජාණන් වහන්සේ දාන කථාවෙන් ආරම්භ කළෙ. දානකථාවෙන් ආරම්භ කරල අනුපිළිවෙල කථාව කියන්නේ. දාන කථා, සීල කථා, සග්ග කථා. දානයේ වටිනාකම වෙන එකක් කරන්න බැරි කෙනාට ඒකවත් කරන්න කියලා. සීලයක් රකින කියලා. දන් දෙනකොටවත් ඒ සීලය රැකගන්න කියලා. ඊළඟට ඒවායේ, දානයේ සීලයේ, ආනිසංස දක්වලා 'සග්ග කථා'. ඊළඟට කාමයන්ගේ ආදීනව. ක්‍රම ක්‍රමයෙන් කුඩා දරුවන් සෙල්ලම් බඩු වලින් ඉවත් කරලා ඉහළට ගන්නවා වගේ ලෝකයා ඒ කියාපු ලෞකික මට්ටමින් ඉහළට අරගෙන චතුරාර්ය සත්‍යය දක්වලා බුදුරජාණන් වහන්සේ නිවන් කරා ගෙන ගියා.

අන්න ඒ වගේ අපිත් කල්පනා කරන්න ඕන මේ අවුරුද්ද ආරම්භයේදි මෙන්න මේ කියාපු සතර සංග්‍රහ වස්තු වලින් පටන් ගන්න ගමන, සතර බ්‍රහ්ම විහරණ වලින් පටන් ගන්න ගමන, යම් අවස්ථාවක නිවන් දක්වා ගෙන යාමට මේ දේශනාවත් හේතුවේවා කියල. මේ දේශනා ශ්‍රවණයේ ආනිශංස මේ පින්වතුන්ටත් උපකාර වෙනවා නම් තමන්ගේ බණ භාවනාදියට, සිත සමාධිමත් කර ගැනීමට, ඒ කුසල ශක්තීන් උපකාර කරගෙන මේ ජීවිතයේදීම උත්සාහවත් වෙලා කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය තුළින් බණ භාවනා සාර්ථක කරගෙන සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් කියන මාර්ගඵල ප්‍රතිවේධයෙන් උතුම් අමාමහ නිවන් සාක්ෂාත් කර ගැනීමට මේ ධර්ම දේශනාව උපකාරවත් වේවා! කියල ප්‍රාර්ථනා කර ගන්න අතරම ධම් ශ්‍රවණ ආනිශංසත් ධර්ම දේශනයේ ආනිශංසත් අනුමෝදන් වීමට බලාපොරොත්තු වන විශ්වයේ යම්තාක් සත්ත්වයින් සිටිනවා නම් අවීචියේ සිට අකනිටාව දක්වා ඒ හැම කෙනෙක්ම අනුමෝදන්වීම තුළින් තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා! කියල ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

## “එත්තාවතාච අම්හෙහි ....”

# 35 වන දේශනය



## 35 වන දේශනය

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

උට්ඨානෙන 'ප්පමාදෙන
සඤ්ඤමෙන දමෙන ච
දීපං කයිරාථ මෙධාවී
යං ඔඝො නා'භිකීරති

-ධම්ම පදය, අප්පමාද වග්ගය

ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

කෙනෙකුගේ සමාජ සම්මත බුද්ධි මට්ටමත්, සාංසාරික බුද්ධි මට්ටමත්, අතර ලොකු පරතරයක් සමහර අවස්ථාවල්වල ඇතිවෙන්න ඉඩ තියෙනවා. සමාජයේ සම්මත විභාග පරීක්ෂණ ආදිය අනුව කොන් කෙරෙන පුද්ගලයකු තුළ පවා සංසාරයේ දියුණු කරගෙන ආපු ගැඹුරු වැටහීම්, විශේෂ චිත්ත ශක්ති, සැඟවිලා තියෙන්න පුළුවන්. නිසියාකාර කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලැබිලා නොපසුබට වීර්යයෙන් උත්සාහ කළොත් ඒ වගේ කෙනෙකුට වුනත් තමා තුළින්ම ආශ්චර්යවත් හැකියාවන් මතුකර ගන්න පුළුවන් බවට හොඳ නිදර්ශනයක් අද අපි මේ මාතෘකා කරගත්තු ගාථාවට අදාළ නිදාන කථාවෙන් හෙළිවෙනවා.

රජගහ නුවර එක්තරා සිටු පවුලක තරුණ දියණියක් වැඩි ආරක්ෂාව සඳහා තමන්ගේ දෙමව්පියන් විසින් සත්මහල් ප්‍රාසාදයක රඳවා ගෙන සිටිය නමුත් තමාගේම දාසයෙක් එක්ක මිත්‍ර සම්බන්ධකමක් ඇතිකරගෙන සිටු මැදුරෙන් පැනලා ගියා. ගිහිල්ලා ඈත පළාතක වෙස්වළාගෙන වගේ ජීවත්වුනා. එහෙම ජීවත් වෙන අතරෙදි පළමුවරට දරුවකු ලැබෙන්න කිට්ටුවුනාම ඒ සිටු දියණිය ස්වාමිපුරුෂයාට කියනවා "නෑයින් නැති තැනක දරු ප්‍රසූතියක් සිදුවීම බොහොම කරදර සහිතයි. අපි යමු අපේ මව්පියන් ළඟට" කියලා. නමුත් මේ ස්වාමිපුරුෂයා භයයි යන්න. ගියොත් මරනවා කියලා. නමුත් ඒ කාරණය කිව්වේ නැහැ. 'හෙට යමු, හෙට යමු' කියලා කල් දැම්මා. ඒක තේරුම් ගත්තා සිටු දියණිය. ඒක නිසා ස්වාමිපුරුෂයා නැති අවස්ථාවක අසල්වාසීන්ට කියලා ගේදොර අස්කරලා පිටත්වෙලා ගියා. ස්වාමිපුරුෂයා ගෙදර ආවාට පස්සේ මේ කාරණය අසල්වාසීන්ගෙන් දැනගෙන පස්සෙන් එළවාගෙන වගේ ගියා. අතර මඟදී හමුවුනා. අතරමඟදීම දරුවකු ලැබුනා ඒ තැනැත්තියට. ඊට පස්සේ දෙන්නා තීරණය කළා, අපි දැන් ඉතින් ආපසු ගෙදර යමු, කියලා. මඟදි උපන්න නිසා ඒ දරුවාට 'පන්ථක' කියලා නම තැබුවා.

එහෙම ඇවිල්ලා ගෙදර ඉන්න අතරේ දෙවෙනි වරට දරුවකු ලැබෙන අවස්ථාවෙදිත් ඒත් කල්පනා කළා සිටු දියණිය මව්පියන් හම්බවෙන්න යන්න ඕනෑ කියලා. ස්වාමිපුරුෂයා ඒකට ඉඩ නොදෙන නිසා තනිව පිටත්වෙලා ගිහිල්ලා ස්වාමිපුරුෂයාත් අර වගේම පස්සෙන් ඇවිල්ලා හමුවුනා. ඒ අවස්ථාවෙදිත් දරුවා මහදීම ලැබුන බවයි සඳහන් වන්නේ. දෙන්නාම මහදීම ලැබුන නිසා දෙන්නටම 'පන්ථක' කියලා නම දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා කලින් ලැබුන දරුවට 'මහාපන්ථක' කිව්වා. දෙවෙනි දරුවාට 'චූල පන්ථක' කිව්වා. ඔය විධියට නම් දීලා මේ දරුවන් දෙදෙනා ඇතිදැඩි වන අතරේ මහා පන්ථක දරුවා මිත්‍රයින් එක්ක සෙල්ලම් කරන අතරේ ඒ අය තමන්ගේ සීයල ගැන බාප්පලා ගැන නෑයින් ගැන කථා කරනවා. ඇවිල්ලා අම්මගෙන් අහනවා "කෝ අපට නැද්ද නෑදෑයෝ? අපට සීයල නැද්ද?" එතකොට මව කියනවා අපට ඉන්නවා ඒ කට්ටිය රජගහ නුවර. අර සිටු කුලයේ සිටුවරයත් සිටු දේවියත් නෑයින් බව කිව්වහම "ඇයි අපි එහෙ යන්නේ නැත්තේ?" කියලා ඇසුවා. ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න බැහැ. නමුත් "මේ දරුවා නිතර නිතර අහනවා මොකද අපි එහෙ යන්නේ නැත්තේ කියලා. බැරිම තැන සිටු දියණිය ස්වාමිපුරුෂයාට කියනවා "මේ දරුවන්ගෙන් මට බේරෙන්න බෑ මේ ප්‍රශ්නය නිසා, මේ දෙන්නා එක්කගෙන යමු අපි. මොකද මව්පිය දෙන්නා අපිව මරාගෙන කන්නේ නැහැ නේ" කියලා. ඔහොම ඇවිටිලි කළා. ස්වාමිපුරුෂයා කියනවා 'මට නම් යන්න බැහැ ඒවුනත් මොකක්හරි මම උපායක් යොදන්නම්" කියලා. ඊළඟට දෙන්නා මේ දරුවන් දෙන්නත් එක්ක පිටත්වෙලා ගියා. ගිහිල්ලා රජගහ නුවර දොරටුව ළඟ ආගන්තුකයින් සඳහා ඇති ශාලාවක නතරවෙලා පණිවුඩයක් යැව්වා සිටුමැදුරට. මෙන්න මෙහෙම දරුවන් දෙදෙනාත් එක්ක දියණිය ඇවිල්ලා ඉන්නවා කියලා. නමුත් සිටු ජෝඩුව කල්පනා කරනවා අපට මේ සංසාරයේ දරුවන් නොවුන කෙනෙක් නැහැ. නමුත් මේ දෙදෙනා අපට ලොකු අපහාසයක් ගෙන දුන්නා. ඒක නිසා ඒ අය නාවාට කමක් නැහැ. දරුවන් දෙන්නා විතරක් අප ළඟට එවන්න කියලා පණිවුඩය ඇරියා, ධනයත් දීලා "මෙන්න මේ ධනය ඕනෑ තරම් අරගෙන ගිහිල්ලා කැමති තැනක වාසය කරන්න. දරුවන් දෙදෙනා විතරක් මෙහාට එවන්න" කියලා. ඒ විධියට ඒ දරුවන් දෙදෙනා එව්වා සිටාණන් ළඟට.

ඉතින් මේ කියන සිටාණන් නිතර බුදුරජාණන් වහන්සේ දකින්න යනවා බණ අහන්න එහෙම. මහා පන්ථක දරුවත් ඒ එක්කම යනවා. නිතර නිතර බණ අහනකොට මේ දරුවට හිතුනා, මහණවෙන්න. ඉතින් සීයාට කියනවා, "අනේ! මට අවසර දෙනවා නම් මම මහණ වෙනවා."





කියලා. 'අපොයි මුළු ලෝකෙ අනික් හැම දෙනාම මහණ වෙනවාට වඩා කැමතියි මම ඔය දරුවා මහණ වෙනවට' කියලා බුදුරජාණන් වහන්සේ ළඟට එක්කගෙන ගියා. 'මේ මගේ මුණුබුරා මහණ වෙන්න කැමැත්තක් ප්‍රකාශ කරනවා,' කියලා. බුදුරජාණන් වහන්සේට කීවා. බුදුරජාණන් වහන්සේත් එක්තරා භික්ෂූන් වහන්සේ නමකට පැවරුවා මහා පන්ථක දරුවාව මහණ කරන්න. ඉතින් ඒ විදියට පැවිදි වෙලා උපසම්පදාවෙලා ධර්මය ඉගෙනගෙන බණ භාවනා කරලා රහත්වුනා. රහත්වෙලා කල්පනා කරනවා "අනේ පැවිදි සැපය, ධ්‍යාන සැපය, ඵල සැපය මගේ මල්ලිටත්-චූල පන්ථකටත්-දෙන්න ඇත්නම් හොඳයි" කියලා. එක දවසක් සිටුමැදුරට ගිහිල්ලා "සිටාණෙනි, ඔබ අවසර දෙනවා නම් මම මේ චූලපන්ථකත් පැවිදි කරන්නම්" කීවා. "අපොයි බොහොම හොඳයි. මගේ කිසි විරෝධයක් නැහැ" කියලා පැවිදි කරන්න අවසර දුන්නා. චූල පන්ථකත් එක්කරගෙන ගිහිල්ලා පැවිදි කෙරුවා.

ඊළඟට මේ පොඩි චූලපන්ථක හාමුදුරුවන්ට කටපාඩම් කරල පාඩම් දෙන්න ගාථාවක් පැවරුවා. ගාථාව ඉතාම ලස්සණ ගාථාවක්. පුංචි ළමයින්ටම දෙන විධියේ ගාථාවක්. ඇත්ත වශයෙන්ම බුද්ධානුස්මෘතියට අදාළ, බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇතිවන විධියෙ අදහසක් තියන ගාථාවක්.

**පදුමං යථා කොකනදං සුගන්ධං**
**පාතො සියා ඵුල්ලමවීතගන්ධං**
**අංගීරසං පස්ස විරොචමානං**
**තපන්තමාදිච්චමිවන්තලික්ඛෙ**

තාලය අනුව බැලුවත් පාඩම් කරගන්න පහසු වගෙයි පෙනෙන්නේ. මොන හේතුවකින් නමුත් මේක කටපාඩම් කරගන්න බැහැ චූල පන්ථක පොඩි හාමුදුරුවන්ට. මේ ගාථාව කටපාඩම් කරගන්න බැහැ. පළමු පදය කටපාඩම් කරලා දෙවෙනි පදය කටපාඩම් කරන කොට පළමු පදය අමතක වෙනවා. ඔය විධියට හාරමාසයක් තිස්සේම කටපාඩම් කරන්න උත්සාහ කළා. බැරිවුනා. ඉතිං ඒකට හේතුව දක්වනවා අතීත කර්මයක් නිසයි ඒක වුනේ කියලා. අතීතයේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ මේ චූලපන්ථක පොඩිහාමුදුරුවෝ හොඳ ඥානවන්ත සංඝයා වහන්සේ කෙනෙක් වී ඉඳගෙන ඒ පිරිසේ සිටි එක්තරා අදක්ෂ භික්ෂූන් වහන්සේ නමක් පාඩම් දෙන අවස්ථාවේ පාඩම් දීමට බැරි දුර්වලකම ගැන විහිළු තහළු කරලා ලැජ්ජා කිරීම නිසා අර හාමුදුරුවෝ අන්තිමට පාඩම් නොදී පාඩම් නොකරම ඇරියා. අන්න ඒ අකුසලේ නිසා

මේ ජීවිතයේ දී චූල පන්ථක හාමුදුරුවන්ට අර වගේ පොඩි ගාථාවක් පවා හාරමාසයක් තිස්සේ පාඩම් කරගන්න බැරිවුනා කියලා දක්වනවා. ඒක නිසා මහා පන්ථක හාමුදුරුවෝ කල්පනා කළා. දැන් ඉතින් මේ එක ගාථාවක් පාඩම් කරන්න බැරිනම් මොකටද කියලා චූල පන්ථක හාමුදුරුවන්ට කතා කරලා කියනවා "චූල පන්ථක ඔබට මේ හාරමාසයක් තිස්සේ බැරිනම් මේ පුංචි ගාථාව කටපාඩම් කරන්න කොහොමද මහණකම සම්පූර්ණ කරගන්නේ, කොහොමද රහත් වන්නේ? දැන් ඉතින් ගෙදර යන එක හොඳයි" කියලා කිව්වා. ඇහෙව්වා. නමුත් චූල පන්ථක හාමුදුරුවන්ට ඒ වෙන කොට පැවිද්ද ගැන බොහොම ආසාව තියනවා. ගෙදර යන්න කැමති නැහැ. පැවිද්දට බොහොම ලැදියි.

ඉතින් ඔහොම තියන අවස්ථාවේදි එතන කියවෙනවා, බොහෝවිට මේ කටයුතු වේළුවනාරාමයේදී කෙරුනෙ. නමුත් මෙතන කියවෙනවා ජීවක වෛද්‍යාචාර්ය තුමාගේ අඹ වනයේ ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ වැඩ සිටියේ. ඉතින් ජීවක වෛද්‍යාචාර්ය තුමා එක දවසක්දා- සමහර විට මේ කියන දවසේම වෙන්ට ඕන- බුදුරජාණන් වහන්සේ දකලා බණ අහලා ඇවිල්ලා මහා පන්ථක හාමුදුරුවන් ළඟට ආවෙ මොකටද, මහා පන්ථක හාමුදුරුවෝ ඒ වෙන කොට සංඝයා වහන්සේලා අතර යම් කිසි තනතුරක් දැරුවා. මොකක්ද තනතුර 'භත්තුද්දේසක' කියල කියනවා. ඒ තනතුරේ අදහස මොකක්ද? දැන් සංඝයා වහන්සේලා විශාල පිරිසක් ඉන්න කොට ගිහි පින්වතුන් ඇවිල්ලා දානයකට පණස්නමක් සියනමක් ඕන කීවාම මේ හාමුදුරුවෝ තමයි ඒකට වාර අනුව සංඝයා වහන්සේලා තෝරලා යවන්නේ. ඒ තනතුරයි මේ මහා පන්ථක හාමුදුරුවෝ දැරුවේ. ජීවක වෛද්‍යාචාර්ය තුමාගෙන් මහා පන්ථක හාමුදුරුවෝ අහනවා කොච්චර සංඝයා වහන්සේලා අවශ්‍ය ද කියලා. බුද්ධ ප්‍රමුඛ සියලුම සංඝයා වහන්සේලා කියලා කීවා. කොච්චර සංඝයා වහන්සේලා ඉන්නවාද කියල ඇහුවා. පන්සියයක් සංඝයා වහන්සේලා වැඩ ඉන්නවා කීවාම මම ඒ හැම දෙනාටම ආරාධනා කරනවා කියලා ජීවක වෛද්‍යාචාර්ය තුමා කියනකොට මහා පන්ථක හාමුදුරුවෝ කියනවා මේ චූලපන්ථක පොඩි හාමුදුරුවෝ ඉගෙන ගැනීමට දක්ෂකමකුත් නැහැ. ඒ හාමුදුරුවෝ ඇරෙන්න අනික් අයට ආරාධනා කරන්න මම අවසර දෙනවා කියලා. ඉතින් මේක ඇහුනා අර පොඩි හාමුදුරුවන්ට. "දැන් ඉතින් මාව මහා පන්ථක හාමුදුරුවන්ට එපාවෙලා වගෙයි. මට ගෙදර යන්නයි වෙලා තියෙන්නේ. ගෙදර ගිහිල්ලා දන්පින් කරගෙනවත් ඉන්න ඕන" කියලා හිතාගෙන ඔන්න පස්සෙන්දා උදෑසන මේ පොඩි හාමුදුරුවෝ ගෙදර යන්න සූදානම් වෙලා පිටත්වුනා.





එදා උදෑසන බුදුරජාණන් වහන්සේ මහා කරුණා සමාපත්තියට සමවැදිලා ලෝකය දිහා බලන කොට පෙනී ගියා මේ චූලපන්ථක හාමුදුරුවන්ව. එතකොට බුදුරජාණන් වහන්සේ කළේ මොකක්ද? මේ චූලපන්ථක හාමුදුරුවෝ එන මාර්ගයේ දොරටුව ළඟ සක්මන් කර කර සිටියා. චූල පන්ථක හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේ දකලා වැඳලා හිටගත්තාම බුදුරජාණන් වහන්සේ අහනවා "මොකද චූලපන්ථක මේ වෙලාවේ? කොහේද මේ යන්නේ?" එතකොට කියනවා "අපේ අයිය හාමුදුරුවෝ මහා පන්ථක හාමුදුරුවෝ මාව විහාරයෙන් නෙරපනවා දක්ෂ නැහැ කියලා. ඒක නිසා මම ගෙදර යන්න යනවා" කියලා. එතකොට බුදුරජාණන් වහන්සේ කියනවා "චූලපන්ථක ඔබේ පැවිද්ද මට නේ අයිති? ඇයි අයියා හාමුදුරුවෝ යන්න කීවාම ඇයි මා ළඟට ආවේ නැත්තේ, එන්න මාළඟට". කියලා හිස අතගාලා එක්කරගෙන ගිහිල්ලා බුදුරජාණන් වහන්සේගෙ ගන්ධ කුටිය ළඟ ඉඳගන්න සැලැස්සුවා. ඉඳගන්න සලස්වලා ඍද්ධියෙන් මැවූ රෙදිකඩක් කියලා කියවෙනවා. කොයි හැටි නමුත් සුදු රෙදිකඩක් අතට දීලා කියනවා "චූලපන්ථක ඉරපායන දිහාවට හැරිලා මේ රෙදි කෑල්ල පිරිමදින්න "රජො හරණං, රජො හරණං" කිය කියා." "රජෝ හරණං" කියන වචනයේ තේරුම 'කිලුට ඉවත් කරනවා', 'කිලුට ඉවත් කරනවා'. 'කිලුට ඉවත් කරනවා' කිය කියා මේ සුදුරෙදි කෑල්ල පිරිමදින්න කියලා ඒ වැඩය පැවරුවා.

ඒ වෙලාව වෙනකොට දානයට වඩම්මගන යන පිරිස ආවා. ඉතින් බුදුරජාණන් වහන්සේත්, ඒ සියලුම සංඝයා වහන්සේලාත්, ජීවක වෛද්‍යාචාර්ය තුමාගේ දාන ගෙදරට වැඩම කළා. එතෙන්දි වෙන දේවල් ඔන්න ඊළඟට කියවෙනවා. ජීවක වෛද්‍යාචාර්ය තුමා බුදුරජාණන් වහන්සේට අතපැන් වත්කරලා දානය පූජාකරන්න සූදානම් වුනා. නමුත් බුදුරජාණන් වහන්සේ පාත්‍රය අතින් වැහුවා. අතින් පාත්‍රය වැහුවාම ජීවක වෛද්‍යාචාර්ය තුමා ඒකට හේතුව විමසුවා. බුදුරජාණන් වහන්සේ කියනවා "ආරාමයේ තව භික්ෂූන් වහන්සේලා ඉන්නවා නේද" කියලා. මහාපන්ථක හාමුදුරුවෝ කියනවා. "ආරාමයේ භික්ෂූන් වහන්සේලා නැහැ නේද ස්වාමීනි" කියලා. ඉන්නවා කියලා නැවතත් බුදුරජාණන් වහන්සේ කීවාම ජීවක වෛද්‍යාචාර්ය තුමා සේවකයකු යැව්වා බලන්න.

ඒ යන වෙලාව වෙනකොට මොකද වෙලා තියෙන්නෙ. මේ අතරෙ තවත් දෙයක් සිද්ද වුනා. චූල පන්ථක හාමුදුරුවෝ අර රෙදිකඩ අතුල්ල අතුල්ල ඉන්නකොට පෙනුනා ඒක කිලිටි වෙනවා. කිලිටි වෙනවා දකලා "කිලිටි යවම්" කියන අදහසින් පිරිමදින්නේ. නමුත් ඒක කිලුටු වෙනවා. ඔන්න ඊළඟට කල්පනා කරනවා මේ රෙදිකඩ කිලුටු වුනේ මගේ මේ

ශරීරයේ කිලුට නිසා. අනේ "අනිච්චා වත සංඛාරා" කියලා සංස්කාරයන්ගේ ස්වභාවය මෙහෙම නේද කියලා හිත විදර්ශනා පැත්තට හැරුනා. අන්න ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ අර දාන ගෙදර ඉඳගෙනම ආලෝකයක් යවලා චූල පන්ථක හාමුදුරුවන්ට අවවාදයක් කළා ගාථාවකින්. චූලපන්ථක ඔය ශරීරයේ තියෙන කිලුට විතරක් නොවෙයි හිත ඇතුළෙත් රාග, දෝස, මෝහ කියලා කිලිටි තියෙනවා. අන්න ඒවා අතාරින්න කියලා ගාථා ප්‍රකාශ කළා. සෘද්ධියෙන් වාගේ ඒවා ප්‍රකාශ කළේ. ඒක පිහිට කරගෙන විදර්ශනා වඩලා චූලපන්ථක හාමුදුරුවෝ අභිඥාලාභී මහරහතන් වහන්සේ කෙනෙක් බවට පත්වුනා.

ඉතින් ඊට පස්සේ තමයි අර කිව්ව විධියට බුදුරජාණන් වහන්සේ පාත්‍රය අතින් වැහුවාම මහා පන්ථක හාමුදුරුවෝ කියනවා "සංඝයා වහන්සේලා ආරාමයේ නැහැ" කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ කියනවා ඉන්නවා කියලා. ඉතින් මේක බේරගන්න තමයි අර ජීවක වෛද්‍යාචාර්ය තුමා සේවකයෙක් යැව්වේ. ඒ සේවකයා එනකොට ආරාමය හාමුදුරුවරුන්ගෙන් පිරිලා. සමහර හාමුදුරුවරු සිවුරු මහනවා. සමහරු සිවුරු පඬු ගහනවා. සමහරු සජ්ඣායනා කරනවා නොයෙකුත් විධියේ එකිනෙකට වෙනස් රූප ඇති සංඝයා වහන්සේලා දහස් නමක් වැඩ හිටියා. මොකද මේකට හේතුව. චූල පන්ථක හාමුදුරුවෝ මේ සිද්ධවෙන හැම දෙයක්ම බලාගෙන ඉන්නවා. දැන් ඉතින් අභිඥාලාභී. දිවැසින් දුටුවා මහා පන්ථක හාමුදුරුවෝ කියනවා සංඝයා වහන්සේලා නැහැ කියලා. බුදුරජාණන් වහන්සේ කියනවා සංඝයා වහන්සේලා ඉන්නවා කියලා. මම ඉන්න බව පෙන්නන්නම් කියලා තමයි මැව්වේ. අර දහසක් නමක් මැව්වේ. එතකොට අර සේවකයාට තේරුම් ගන්න බැහැ. ඇවිල්ලා කිව්වා "සංඝයා වහන්සේලා දහස්නමක් විතර ඉන්නවා" කියලා. එහෙනම් ගිහිල්ලා කියන්න ශාස්තෲන් වහන්සේ චූල පන්ථක හාමුදුරුවන්ට එන්න කියනවා කියලා. දෙවෙනි වරට ගිහිල්ලා එහෙම කියන කොට අර දහසක් නම කියනවා 'මමයි චූල පන්ථක, මමයි චූල පන්ථක' කියලා අර සෘද්ධියෙන් මැවූ සංඝයා වහන්සේලා. ඒකත් බේරුම් කරගන්න බැරිව ඊළඟට ආයෙත් ඇවිල්ලා ඒ බව කිව්වට පස්සෙ බුදුරජාණන් වහන්සේ කියනවා "එහෙනම් පළමුවෙන්ම මම චූලපන්ථක කියලා කියන හාමුදුරුවන්ගේ අතින් අල්ලා ගන්න. එවිට අනිත් අය අන්තර්ධාන වේවි" කියලා. ඒ විධියටම අර පණිවිඩකාරයා ගිහිල්ලා ඒ කියපු ආකාරයට කළා. ඔන්න ඊළඟට ඒ දූතයත් එක්කම චූල පන්ථක හාමුදුරුවෝ වැඩියා. වැඩියාට පස්සෙ දානය වළඳලා අනුමෝදනාව පවා බුදුපියාණන් වහන්සේ ඒ චූලපන්ථක හාමුදුරුවන්ට පැවරුවා. චූල පන්ථක හාමුදුරුවෝ





දැන් අභිඥාලාභී මහරහතන් වහන්සේ නමක්. ඉතාමත් ව්‍යක්ත අන්දමින් ඒ දේශනාව කළා.

මේ සිද්ධිය කොයිතරම් ආශ්චර්යවත්ද කියතොත් සංඝයා වහන්සේලා අවස්ථා කීපයකදීම මේක තුළ තිබෙන ධර්මතාවත්, ඒ කියන්නේ මහා පන්ථක හාමුදුරුවෝ බැරිය කියලා මේ ශාසනයේ අභව්‍ය කෙනෙක් හැටියට කොටින්ම තියනව නම් කාළකන්නි කෙනෙක් හැටියට- දැන් හාරමාසයක් තිස්සේ ගාථාවක් කටපාඩම් කරගන්න බැරිනම් කාලකන්නි කෙනෙක් වාගේ නේද? ඒක නිසා අභව්‍ය කෙනෙක් හැටියට - සළකලා මේ ශාසනයේ මොකක්වත් කරගන්න බැරි කෙනෙක් හැටියට සළකලයි ගෙදර යවන්න සූදානම් වුනේ මහා පන්ථක හාමුදුරුවෝ. එහෙම කෙනෙක් බුදුපියාණන් වහන්සේගේ මහා කරුණාවෙන් පුදුම විධියේ උපාය කෞශල්‍යය නිසා අර වරුවක් ඇතුළත අභිඥාලාභී මහරහතන් වහන්සේ කෙනෙක් වුනා කියන ඒ ආශ්චර්යවත් කාරණය ගැන සංඝයා වහන්සේලා කීපවරක්ම ධර්ම සභාවේ කථා කළ බව සඳහන් වෙනවා. ඇතැම් අවස්ථාවල බුදුපියාණන් වහන්සේ ජාතක කථා වලින් පෙන්නුම් කරනවා අතීතයේත් මම යම් යම් අවස්ථාවල මේ චූලපන්ථකට උපකාර වුනා කියලා.

විශේෂයෙන්ම මේ ධර්මය පිළිබඳව වැදගත්වන කාරණය තමයි, එක් අවස්ථාවක සංඝයා වහන්සේලා ඒත් ඔය මාතෘකාව උඩ කථා කරන අතර කීවා මේ චූල පන්ථක පොඩි හාමුදුරුවෝ උත්සාහය අත නොහැර වීර්යවන්තව ක්‍රියා කළ නිසයි බුදුරජාණන් වහන්සේගේ පිහිටත් ලබාගෙන අර වරුවක් තුළ අර තරම් ඉක්මණින් තත්ත්වයක් ලබාගත්තේ කියලා. මේ කථාව ඇසුන අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ "එසේය, මහණෙනි, යම්කිසි කෙනෙක් මේ ශාසනයෙහි අප්‍රමාදීව උට්ඨාන වීර්යයෙන් කටයුතු කරනවා නම් තමන්ට පුළුවන් තමන්ගේ නිවන ලබා ගන්න කියන අදහස දෙන අපි අර කලින් මාතෘකා කළ ගාථා ධර්මය වදාළා.

"උට්ඨානෙන 'ප්පමාදෙන
සඤ්ඤමෙන දමෙන ච
දීපං කයිරාථ මෙධාවී
යං ඔඝො නා' භිකීරති"

'උට්ඨානෙන අප්පමාදෙන,' නොපසුබට වීර්යයෙන් සහ අප්‍රමාදයෙන්, අප්‍රමාද ප්‍රතිපදාවෙන් 'සඤ්ඤමෙන දමෙන ච' ශීලාදී ගුණධර්ම වලින් ඇතිකර ගන්නා සංයමයෙන්, ඉන්ද්‍රිය දමනයෙන්, නුවණැති පුද්ගලයා 'මෙධාවී' අර සැඩ වතුරවලට ගසාගෙන නොයනා අන්දමේ දිවයිනක්

තනා ගන්නේය, සාදා ගන්නේ ය. එතනදී දිවයින කියලා කිව්වේ නිවනටයි. 'ඕඝ' සැඩවතුරු. කියලා කීවේ කාම, භව, දිට්ඨි, අවිජ්ජා කියලා කියන කෙලෙස් සැඩවතුර සංසාරයේ සත්ත්වයා ගසාගෙන යන කෙලෙස් සැඩවතුර වලට අසුවෙන්නේ නැති, ඒවායින් බේරිලා ඉන්න පුළුවන් දිවයින - නිවන. නිවනට නමක් දිවයින කියලා කියන්නේ, අර්හත් ඵල සමාධි අවස්ථාවේ භුක්ති විඳින නිවීම. අන්න ඒ තත්ත්වය ලබා ගන්නේය කියන ගැඹුරු අර්ථය ඇති ගාථා ධර්මය බුදුපියාණන් වහන්සේ වදාළා.

අපි සැකෙවින් ගත්තොත් කතාවේ සාරංශය ඕකයි. ඊළහට දැන් අපි මේක තුළින් අපට ගන්න පුළුවන්, තම තමන්ගේ ජීවිතයටත් උපකාර වෙන ධර්ම කාරණා, මතුකර ගන්න බලමු.

දැන් අපි ආරම්භයේදීම කිව්වා සමාජ සම්මත විභාග, පරීක්ෂණ ආදියෙන් කෙනෙකුගේ සාංසාරික බුද්ධි මට්ටම මනින්න බැරිබව. යම් යම් ශක්තීන් තිබෙන්න පුළුවන් අවස්ථානුකූලව හොඳ කල්‍යාණ මිත්‍ර ඇසුර ලැබුනොත් ඒවා මතුකර ගන්න පුළුවන්. ඒකට හොඳ නිදර්ශනය තමයි අර මහාපන්ථක හාමුදුරුවෝ මේ නිවන් විභාගයෙන් අසමත් කරලා අභව්‍ය කෙනෙක් හැටියට සළකලා ගෙදර යවන්න හදපු චූලපන්ථක හාමුදුරුවන්ව බුදුපියාණන් වහන්සේගේ කල්‍යාණ මිත්‍ර පිහිට නිසා මහා කරුණාව නිසා, වරුවක් තුළ ඉතාම සුළු කාලයකදී උතුම් තත්ත්වයක් ලබා ගැනීම. ඒකෙන් අපට පෙනෙනවා මේ ලෝකයේ අපි හිතන නොයෙකුත් බුද්ධි පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ, විභාග ආදිය පැවැත්වූවාට මොකද ඒවා තුළින් හෙළිකරගන්න බැහැ පුද්ගලයෙකුගේ තියෙන වටිනාකම. ඇතුළත ගැබ්වෙලා තිබෙන්න පුළුවන් ඉතාමත්ම වටිනා ශක්තීන්.

ඒ වගේම මේ කථාන්තරය තුළින් හෙළිවෙනවා අර චූල පන්ථක පොඩි හාමුදුරුවෝ තමන් ඒ තත්ත්වය ලබාගත්තට පස්සේ අයියා හාමුදුරුවන්ට පොඩි සරදමකුත් කළබව. මහා පන්ථක හාමුදුරුවන්ට යම්කිසි සරදමකුත් කළා. මොකක්ද කළ සරදම? සරදම කියන්නෙ යම්කිසි පාඩමක් ඉගැන්වීමක් කියලා කියන්න පුළුවන්. දැන් අපි දන්නවා මේ සමාජයේත් ඉන්නවා බොහොම අය - මේ කාලයේ සමහර උගතුන් ත්‍රිහේතුක පටිසන්ධි කතාවක් ඉස්සරහට අරගෙන නිවන් සඳහා උත්සාහ කරන බොහෝ ශ්‍රද්ධාවන්ත අය පසුබට කරන්න බලනවා. කලින්ම විභාගයෙන් ෆේල් කරල ගෙදර අරින්න වගෙයි. අන්න ඒ වගේ වැඩක් කරනවා වගේ පෙනෙනවා බොහෝ දෙනා. ඒකට නිදසුනක් වගේ දෙයක් තමයි මෙතනත් මහා පන්ථක හාමුදුරුවන්ගෙන් සිද්ධවුනේ. ඉතින් ඒකට හරියන්න චූලපන්ථක





හාමුදුරුවෝ මහා පන්ථක හාමුදුරුවන්ට දාහකින් පිරුන විහාරයක් පෙන්නලා පාඩමක් ඉගැන්නුවා. ඒ කියන්නේ ඔය විධියට එකපාරටම කොන් කරන්න බැහැ. කෙනෙකු තුළ තිබෙන්න පුළුවන් වටිනා ශක්තීන්. ඉතින් ඒක අපට කියන්න පුළුවන් එක්තරා ශාසනික හුරතලයක් කියලා.

ඊළහට ඒ එක්කම අපට හිතාගන්න පුළුවන් මේ කතාන්තරයෙන් හෙළිවන ඉතාමත් වටිනා කාරණයක් තමයි, බුදුපියාණන් වහන්සේගේ මහා කරුණා ගුණය. මේ මහා කරුණා ගුණය එක්කම බුදුපියාණන් වහන්සේම සමහර අවස්ථාවල ප්‍රකාශ කරනවා "මහණෙනි, මට නුඹලා පිළිබඳව අනුකම්පාවක් තිබෙනවා" කියල. "මා තුළ නුඹලා පිළිබඳ අනුකම්පාවක් තිබෙනවා," කියලා. අපි දන්නවා අපි අහලා තිබෙනවා බුදුපියාණන් වහන්සේ අෂ්ට ලෝක ධර්මයෙන් කම්පා නොවන විධියේ තත්ත්වයක්, නිවනක්, ලබාගෙන තිබෙන බව. නමුත් බුදුපියාණන් වහන්සේ දීර්ඝ කාලයක් පුරපු පාරමී ශක්තිය නිසා ලෝකයා අතර අනුකම්පාව ලැබිය යුතු, කරුණාව ලැබිය යුතු, අයගේ සිතුම් පැතුම් පිළිබඳව යම්කිසි සසල වීමක්, චලනයක් බුදුපියාණන් වහන්සේගේ හිතට වැටහෙනවා. ඒ වැටෙන විශේෂ අවස්ථාව තමයි අන්න අර කියාපු මහා කරුණා සමාපත්ති අවස්ථාව. දැන් මේ කාලයේත් ඔය යම් යම්-මේවාට උපමාවන් නොවුනත් සමාන නොවුනත්-යම් යම් උපකරණ ගැන මේ පින්වතුන්ට හිතට එනවා ඇති. මොන ආකාරයකින් නමුත් බුදුපියාණන් වහන්සේ මහාකරුණා සමාපත්තියට සමවැදුනම ඒ කරුණාව දැක්විය යුතු, එහෙම නැත්නම් සසලවන හදවත් වල ඒ චලනය, බුදුපියාණන් වහන්සේගේ හිතට අහුවෙනවා.

ඒ වගේම තමයි ඒ සිද්ධිය ගැන හිතලා බලනකොට බුදුපියාණන් වහන්සේගේ මහා කරුණාවත් එක්කම යන එක තමයි, අර අනුකම්පාවත් එක්කම යන එක තමයි, ප්‍රඥාව තුළින් ඇතිකර ගන්න උපාය කෞශල්‍යය. එක්තරා උපායක් යොදනවා. දැන් පුරිස දම්ම සාරථී ගුණය කියලා බුදුරජාණන් වහන්සේ තුළ තිබෙන විශේෂ ගුණය තමයි ඒ ඒ පුද්ගලයින් හික්මවන්න පුළුවන්, ඒ අය නිවනට යොමු කරන්න හැකි, විශේෂ ශක්තියක් තිබෙනවා. ඒකට ඕන උපක්‍රමය බුදුපියාණන් වහන්සේ අවස්ථානුකූලව කරනවා. දැන් මෙතනත් අර චූලපන්ථක හාමුදුරුවන් ගැන ටිකක් හිතලා බලමු. දැන් ගෙදරක පොඩි දරුවෙකුට කන්නවත් නොදී ගෙදරින් පැන්නුවාම ඒ දරුවා තුළ කොයිතරම් සංවේගයක් ශෝකයක් අනාථ බවක් හිතේ ඇති වෙනවා ඇද්ද? මේ චූලපන්ථක හාමුදුරුවන්ටත් සිද්ධවුනේ ඒ වගේ දෙයක්. තමන්ව මහණ කළෙත් ඒ මහා පන්ථක හාමුදුරුවො. තමන්ගේ අයිය. ගෙදරින් එක්ක ගෙන ඇවිල්ලා මහණ කරල ඉවරවෙලා අන්තිමට අසමත්

කරලා අභව්‍ය කෙනෙක් හැටියට සළකලා එපමණක් නොවෙයි දාන ගෙදරට කරපු ආරාධනාවත් වැළැක්වුවා. කොයි තරම් වේදනාවක් අර පුංචි හදවතේ ඇති වෙන්න ඇද්ද චූල පන්ථක හාමුදුරුවන්ගේ?

දැන් එතකොට අපි දන්නවා ඒ විධියේ අවස්ථාවක මව්කෙනෙක් ක්‍රියාකරන ආකාරය. "අයියා එළෙව්වාට මොකද පුතේ මගේ පුතා ඇයි මා ළඟට ආවේ නැත්තේ? මට ඇවිල්ලා කිව්වේ නැත්තේ?" කියල හිස අතගාලා සනසන්නා වගේ බුදුපියාණන් වහන්සේත් ඒ අවස්ථාවේ අර චූලපන්ථක හාමුදුරුවන්ගේ හිස අතගාලා "එන්න මගේ ගඳකිළිය ළඟට එන්න. ඇයි පැවිද්ද මටනේද අයිති. මහා පන්ථකට නොවේ නේද?" කියලා බුදුපියාණන් වහන්සේ ඒ පොඩි චූලපන්ථක හාමුදුරුවන් සැනසුවා. මේ අවස්ථාවේ අපිට පෙනෙනවා අර මහා කරුණා ගුණයත් ඒ වගේම උපාය කෞශල්‍ය ඥානයත්. තව පොඩ්ඩක් එහෙ මෙහෙ උනා නම් චූලපන්ථක හාමුදුරුවෝ ගෙදර. නමුත් ඊට කලින් බුදුපියාණන් වහන්සේ දොරටුව ළඟට ඇවිල්ලා අර විදියට ප්‍රශ්න කරලා සැනසුවාම කොයිතරම් ධෛර්යයක් ලැබෙන්න ඇද්ද අර පුංචි ඔලුවට ඒ ශ්‍රී හස්තය ස්පර්ශ කරනකොට? එතනත් යම්කිසි ධර්මතාවක් තිබෙනවා. බුදුපියාණන් වහන්සේ එහෙම හිස අතගාන බවක් කියලා නැහැ. පුංචි රාහුල හාමුදුරුවන්ගේවත් හිස අතගෑවේ නැහැ. රාහුල කුමාරයා එල්ලිලා ගියා. අතගෑවේ නැහැ හිස, එල්ලිලා ගියාට. නමුත් මේ අවස්ථාවේ හිස අතගෑවා. ඒක තුළ ලොකු ධර්මතාවක් තිබෙනවා. ඒක තව දුරටත් හෙළිවේවි ඉදිරියට කියනකොට. ඉතින් අර කියාපු අම්මා කෙනෙක් වගේමයි ඒ අවස්ථාවේ ක්‍රියා කළේ. ඒ තුළින් ලැබුණු ධෛර්යය අපිට තේරුම් ගන්න පුළුවන්. චූලපන්ථක හාමුදුරුවන්ට තියන ශ්‍රද්ධාව නිසාම, ගෞරවය නිසාම, බුදුපියාණන් වහන්සේ ළඟට ගිහිල්ලා කියනවා තබා කිට්ටුවෙන්නවත් බැරි කෙනෙක් කියලා හිතන්න ඇති. බුදුරජාණන් වහන්සෙ එසේ මෙසේ කෙනෙක් නොවෙයි අපට කිට්ටු වෙන්නවත් බැරි කෙනෙක් කියලා චූලපන්ථක හාමුදුරුවෝ හිතන්න ඇති. නමුත් අන්තිමට තමන් ළඟටම ඇවිල්ලා හිස අතගාලා එන්න මගේ කුටිය ළඟට කියලා කියන කොට කොයි තරම් ධෛර්යයක් අර පුංචි හාමුදුරුවන්ට ඇතිවෙන්න ඇද්ද?

ඊළඟට ඒ වගේම තමයි අර ගාථාවෙන් කියවුන ආකාරයට චූලපන්ථක හාමුදුරුවෝ ඒ ලැබුන ධෛර්යය පිහිටකර ගෙන බුදුපියාණන් වහන්සේ කියූ ආකාරයට කීකරුව අර රෙදිකඩ පිරිමදිමින් සිටියා. අර ඔක්කොම සඟ පිරිස දාන ගෙදර ගියා. චූලපන්ථක හාමුදුරුවන්ට දාන වේලත් නැහැ. ආහාරය නැතිවුනත් බුදුපියාණන් වහන්සේ කියාපු ආකාරයට අප්‍රමාදව උට්ඨාන වීර්යයෙන් නොපසුබට වීර්යයෙන් යුක්තව සංයමයෙන් දමනයෙන් යුක්තව ඒ භාවනාවේ යෙදුනා.





ඒ භාවනාව ගැනත් හිතනකොට එතනත් යම්කිසි ධර්මතාවක් තිබෙනවා. පින්වතුනි, සමහර ධර්මකථා වල සිද්ධි සංඝටනාව, සිද්ධි ගැලපීම් තුළ යම්කිසි පුදුම විධියේ ගැඹුරක් තිබෙනවා. අපි සාමාන්‍යයෙන් කථාවක් කියාගෙන යනකොට සිද්ධි පෙළ කියනවා ඒවා ගැන විග්‍රහ කරන්න පෙළඹෙන්නේ නැහැ. නමුත් නැවතිල්ලෙ කල්පනා කරල බලනකොට මේ හැම සිද්ධියක් තුළම මහ පුදුම සම්බන්ධයක් තියෙනවා.

කර්ම විපාක දෙකක් මේ චූලපන්ථක හාමුදුරුවන් පිළිබඳව කියවෙනවා. එකක් නරක කර්මයක්. නරක කර්මය මොකක්ද? කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේදී ඉගෙනීමේ අදක්ෂ භික්ෂුවකට කවටකම් කළා. විහිළු කළා. ඒක නිසා අන්න අර ගාථාව පාඩම් කරගන්න බැරිවුනා. ඊළඟට හොඳ පැත්තකුත් තිබෙනවා. ඒක දක්වන්නේ මෙහෙමයි. අර තරම් ඉක්මනට අර රෙදිකඩ පිළිබඳ කමටහන තුළින් රහත්බව ලැබුවේ කොහොමද? අතීතයේ රජ කෙනෙකුව සිටි කාලයේ නගරය පැදකුණු කරන අතරේ- අපට හිතාගන්න පුළුවන් ඇතකු පිට වෙන්න ඇති-නගරය පැදකුණු කරනවා කියන්නේ නගරය වටේ යන්න ඇති දවල් කාලයේ පරීක්ෂා කිරීම් වශයෙන්- ඒ ප්‍රදක්ෂිණා කරන අතරේ තද ගිනිඅව්ව නිසා නළලේ දහඩිය ගලන කොට ළඟ තිබූ සුදු රෙදි කඩකින්, ලේන්සුවක් වගේ දෙයකින්, නළල පිහ දැම්මා. නළල පිහ දැම්මාම අරගෙන බලනකොට මේ රෙදි කෑල්ල කිලිටි වෙලා. රජ කෙනෙක් වුනාට - සමහර විට ඇතාපිට ඉන්න ඇත්තෙ- ඒ වුනත් හිත විදර්ශනාවට ගියා. 'අනිච්චා වත සංඛාරා' මේ විධියයි හැම සකස් කිරීමක්ම. හැම සකස්කිරීමක් මේ විධියට අනිත්‍යයි. කොයි විධියට හිටියත් ශරීරයේ ස්වභාවය මේකයි කියලා විදර්ශනාවට හිත ගියා. ඒ විදර්ශනාවට ගිය හිතට සම්බන්ධ කරන්නයි බුදුරජාණන් වහන්සේ අර කියාපු විධියට පිරිසිදු රෙදි කඩක් දීල ඉර දිහාවට හැරිලා "රජෝ හරණං" "රජෝ හරණං" කියන්න කීවේ. මේ කාලයේ,ඒ ගැන හිතල බලනවා නම් ඇතැම් අය කියනවා ගිහි පින්වතුන්ට ගිහි පින්වතුන්ගේ ව්‍යාපාර ආදිය දියුණුකරන්න ඕනෑ කරන බණ දේශනා මිසක් විදර්ශනාව ගැන කියන්න වටින්නෙ නෑ කියල. විදර්ශනාව කියන එක ඔය කැලෑවල තනිව භාවනා කරන සංඝයා වහන්සේලාට විතරක් තියන දෙයක්. ඒක ගිහි පින්වතුන්ට ඕන නැහැ කියල. දැන් මෙතන තියනවා ඔන්න හොඳ නිදසුනක්. ඒ අතීතයේ චූලපන්ථක හාමුදුරුවෝ රජෙක් හැටියට ඉඳගෙන- රජෙක් වුනාට මොකද ඒත් දාඩිය ගලනවා ධර්මතාව එහෙමමයි-ඒ ගැලූ දහඩිය ටික අපතේ යැව්වේ නැහැ. දැන් මේ කාලයේ නම් සමහර විට දහඩිය ගලන කොට ඒක ලේන්සුවෙ ගාගෙන ඒක සාක්කුවේ දාගැනීම විතරයි කරන්නේ. නමුත් මේ දාඩිය ටික අතීතයේ ඒ රජ්ජුරුවෝ විදර්

ශනාවට යොමු කර ගත්තා. **විදර්ශනාවට බර කර ගත්තා. විදර්ශනාවට බැර කර ගත්තා. අන්න ඒ බැර කරගත්තු විදර්ශනා හිතුවිල්ල තමයි අන්තිමට රහත්වීමටත් උපකාර වුනේ.** එතනත් හොඳ පාඩමක් තියෙනවා. ඒ තුළින් අපට පේනවා එදිනෙදා ජීවිතයේ අපි අහක දාන කෙළටිකත් නිවනට උපකාර කරගන්න ඕන බව. ගලන දහඩිය ටිකත් නිවනට උපකාර කරගන්න පුළුවන්. කොහොමද නිවනට උපකාර කර ගන්නේ? බුදු පියාණන් වහන්සේ වදාළ ත්‍රිලක්ෂණය අනුව සංස්කාර ස්වභාවය මෙහෙමයි කියලා මෙනෙහි කිරීමට. එක මොහොතක හරි ලෝකයේ යථා තත්ත්වය පිළිබඳ ගැස්මක්, තිගැස්මක්, සංවේගයක්, ඇතිවුනා නම් ඒක ඉබේටම එකතු වෙනවා. යම්කිසි අවස්ථාවක නිවන් බලාපොරොත්තු වෙනවා නම් ඒ අවස්ථාවට සමහර විට කමටහනක් හැටියටත් ඉදිරිපත් වෙනව. අන්න ඒ විධියේ පුදුම ධර්මතාවක් මේකෙන් පෙනෙනවා.

එතකොට චූල පන්ථක හාමුදුරුවන්ට රහත්වෙන්න උපකාරවුනු කාරණා අපට මේක තුළින් ගොනුකර ගන්න පුළුවන්. මේ කමටහන ඇත්ත වශයෙන් සුදුරෙදි කඩක කිලිටක් කියල කියන්නේ. දන් බොහෝ වේලා සුදුරෙදි කඩක් දිහා බලා ඉන්න කොට ඒක තුළින් කසිණ ආදි වශයෙන් ධ්‍යාන ඇතිවන්නත් පුළුවන්. එතකොට ඒ ධ්‍යාන පාදක කරගෙන විදර්ශනාව තමයි අන්න අර කිව්ව කිලුට. සුදුරෙදි කෑල්ල දිහා බලාගෙන 'රජෝ හරණං' 'රජෝ හරණං' කියන කොට මෙතන මහා ආශ්චර්යවත් දෙයක් සිද්ද වෙලා තියෙන්නේ එක වේලක් තුළ. ගාථාවක් පාඩම් කරගන්න බැරි පොඩි හාමුදුරුවෝ කිසිම වෙන උපදේශයක් නැතිව අභිඤ්ඤලාභීව ධ්‍යාන ඔක්කොම පාස් කරලා අභිඥා ලබාගෙන විදර්ශනාවෙනුත් ඉහළටම ගිහිල්ලා රහත්වුනේ කොහොමද කියන එක අපි ටිකක් තේරුම් ගන්න බැලුවොත් අර බුදුපියාණන් වහන්සේ දුන්න කමටහන තුළම සමහර විට ඒක තියෙන්න පුළුවන්. සමථ පාදක කරගෙන එහෙම නැත්නම් ධ්‍යාන පාදක කරගෙනයි විදර්ශනාව වැඩුවේ. සමථයට උපකාර වෙනවා අර සුදු වර්ණය. නමුත් අන්න විදර්ශනාවට අර කිලිටිවුන අවස්ථාව හේතු වුනා.

තවත් මේක ඇතුළට අපි ගැඹුරින් කිමිදිලා බැලුවොත් මේකට උපකාර වන දෙයක්ම තමයි අර මොන හේතුවකින් නමුත් මහා පන්ථක හාමුදුරුවෝ පාඩම් කිරීමට දුන් ගාථාව. අපි අර ගාථාව කිව්වෙ ඒක මේ පින්වතුන්ට කට පාඩම් කර ගන්න බැරි වුනත් ඉතාමත් ලස්සණ ගාථාවක්. ඒ ගාථාව තුළත් යම්කිසි ධර්මතාවක් තිබෙනවා. එකක් තමයි බුදුරජාණන් වහන්සේ පිළිබඳව, බුදුරජාණන් වහන්සේ කෙරෙහි, පුදුම ශ්‍රද්ධාවක් ඇතිවන දෙයක් ඒ ගාථාවෙන් කියවෙන්නේ. හරිම ලස්සන ගාථාවක්.





**පදුමං යථා කොකනදං සුගන්ධං**
**පාතො සියා ඵුල්ලමවීතගන්ධං**
**අංගීරසං පස්ස විරොචමානං**
**තපන්තමාදිච්චමිවන්තලික්ඛෙ**

යම්සේ උදෑසන පිපුණු සුවඳවත් රත් පියුමක් තිබේද අන්න ඒ වගේ. මේ බුදුපියාණන් වහන්සේට දෙන උපමාවක්. උදෑසන පිපුණු සුගන්ධවත් රතු නෙළුම් මලක් වගෙයි. ඊළඟට අනික් උපමාව මොකක්ද? 'තපන්තමාදිච්චමිවන්තලික්ඛෙ' අහසේ බැබළෙන සූර්යයා වගෙයි. ඒ වගේ ලක්ෂණ, ඒ වගේ ඉතාමත් ශෝභමානවත් වූ, 'අංගීරසං පස්ස විරාජමානං' 'අංගීරස බුදුරජාණන් වහන්සේ දිහා බලව' කියන එකයි. උදෑසන සුපිපි සුගන්ධවත් රත් පියුමක් වැනිවූද, අහසේ දිළිසෙන සූර්යයා මෙන් බැබළෙන්නාවූද, අංගීරස බුදුරජාණන් වහන්සේ දෙස බලව' කියන ඔය ගාථාවයි චූලපන්ථක පොඩි හාමුදුරුවන්ට කටපාඩම් කරන්න දුන්නේ. **කටපාඩම් කරගන්න බැරිවුනාට මොකද ඒ අදහස හිතට වදින්න ඇති. ඒ තුළින් බුදුරජාණන් වහන්සේ කෙරෙහි බුද්ධානුස්සති වශයෙන් ශ්‍රද්ධාව වැඩෙන්න ඇති.** ඉතින් ඒකත් අපතේ ගියේ නැහැ. ඒ පසුබිම උඩම, ඒ ආකර්ෂණය උඩම, බුදුරජාණන් වහන්සේ පිහිටවුනා.

ඊළඟට එතැනත් තියනව යමක් තව ටිකක් කල්පනා කරලා බැලුවොත්. බුදුරජාණන් වහන්සේ රෙදිකඩ අතට දීලා ඉර දිහා බලගෙන භාවනා කරන්න කීවාම සාමාන්‍යයෙන් කෙනෙක් කැමතිවෙන්නේ නැහැ ඒකට. දන් කාලයේත් ඔය භාවනා කරන අය පවා හොඳ හොඳ තැන් බලනවා නෙ. නමුත් මෙතන ඉර නගින කොට දහඩිය ගලනවා. මේක අපහසු දෙයක්. නමුත් අන්න ගාථාවෙන් කියවෙනවා ඇත්ත වශයෙන් නෙළුම් මලක් වුනත් පිපෙන්න නම් ඉර එළිය ඕන. ඉර එළිය දිහා බලාගෙනයි පිපෙන්නේ. ඒ වගේම තමයි චූල පන්ථක පොඩි හාමුදුරුවොත් බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇති ශ්‍රද්ධාව නිසා, බුදුරජාණන් වහන්සේ එතැන උපමා කර ඇත්තේ සූර්යයාට. බැබළෙන සූර්යයා වගේ. බැබළෙන සූර්යයා දිහා බලාගෙනයි නෙළුම් මලක් පිපෙන්නේ. මේක මේ විධියට කවුරුවත් තෝරන්නේ නම් නැතිව ඇති. අපි තව ටිකක් ගැඹුරින් හිතනකොට මෙහෙම අහුවෙනවා. ඒ කොයි ආකාරයෙන් නමුත් **ඒ ගාථාවත් උපකාර වෙන්න ඇති අර කමටහන සම්පූර්ණ කරගන්න.**

නොපසුබට වීර්යයෙන් උත්සාහයෙන් බුද්ධ වචනයට කීකරුව ඉර දිහා බලාගෙන රෙදිකඩ පිරිමැද්දා. ඉතින් ඒක තුළින් අතීතයේ අර රජකාලේ ලැබූ අත්දැකීමත් ඒකට සම්බන්ධ වුනා. ඒකෙ යම් අඩුවක් තිබුණා නම්

ඒක සම්පූර්ණ වන්නයි බුදුපියාණන් වහන්සේ හිස අතගෑවේ. බුදුපියාණන් වහන්සේගේ ඒ ශ්‍රී හස්තයෙ ස්පර්ශය නළලේ තියන කොට අන්න ඒකත් සම්පූර්ණයි. අර අතීතයේ ආපු විදර්ශනා සිතිවිල්ලට අවශ්‍ය අංග හැම එකක්ම මෙතන තියනවා, චූල පන්ථක හාමුදුරුවන්ට උදව් කරන්න. ඒවා යෙදිලා ආවා කොයි ආකාරයකින් නමුත්. අර ගාථාව හාරමාසයක් තිස්සේ කටපාඩම් කරන්න බැරිවුනාට ඒකේ අදහසත් හිතට වදින්න ඇති. බුදුරජාණන් වහන්සේ සූර්යයා වගෙයි. සූර්යයාගේ එළිය අවශ්‍යයි නෙළුම් මලකට පිපෙන්න නම්. ඉතින් ඒ වගේම අනෙක් කාරණා රෙදි කඩත් කිලුටත් ඒ හැම එකක්ම එකතුවෙලා මේ සංයෝගයෙන් තමයි චූලපන්ථක හාමුදුරුවෝ ඒ තරම් ඉක්මණින් නිවන් ලැබුවේ. අපි හිතන්න ඕන කවුරු ගැනත් එහෙමයි. මේ දීර්ඝ සංසාරයේ අර කලින් කිව්ව ආකාරයට අර අහක යන කෙළ ටිකක් නිවනට බැර කළොත්, අහකට ගලාගෙන යන දහඩිය ටිකත් නිවනට බැර කළොත්, ඒකේ අවසාන ආනිසංසය තමන්ට යම්කිසි දවසක ලැබෙනවා ඇති. ඉතින් ඒ තුළින් මේ කථාවේ තියන සිද්ධි වල පවා ලොකු ගැඹුරක් පෙනෙනවා.

ඊළඟට ඒ වගේම තමයි බුදුපියාණන් වහන්සේගේ මහා කරුණා ගුණය, උපාය කෞශල්‍ය ඥානය. බුදුරජාණන් වහන්සේ පිළිබඳව විශේෂයෙන් සඳහන් වෙනවා අනෙකුත් ශ්‍රාවකයින්ට නැති විධියේ මහා පුදුම ප්‍රඥාවක් තිබෙනවා කියලා. ඒ ඒ සත්ත්වයාගේ අතීත කර්මයන් පිළිබඳව ඥානයක්. ඒකට ආසයානුසය ඥානය කියලා කියනවා. ආසය කියන්නේ සාමාන්‍යයෙන් කිව්වොත් යම්කිසි සතෙක් ලැගගන ඉන්න තැන. අනුසය කියන්නේ හිත ඇතුළේ යටපත් වී තිබෙන යම්කිසි විශේෂ චිත්ත ස්වභාවයන්. ඒ හැම එකක්ම බුදුපියාණන් වහන්සේට හසුවෙනවා, බුද්ධ ඥානයට. එතකොට අතීතයේ මෙන්න මේ මේ තත්ත්ව වල ඉඳලා මේ මේ දේවල් කරලා තිබෙනවා. ඒවා තුළින් මේ මේ විධියේ චිත්ත ශක්තීන් හිත ඇතුළෙ ගැබ්වෙලා තිබෙනවා කියලා තේරුම් අරගෙන තමයි බුදුපියාණන් වහන්සේ අර විධියට ක්‍රියා කරන්නේ. සාමාන්‍ය ලෝකයාට තේරුම් ගන්න බැහැ මේක. සාමාන්‍යයෙන් හිතන්න පුළුවන් ඇයි බුදුරජාණන් වහන්සේ චූල පන්ථක හාමුදුරුවන්ගේ ඔලුව අතගෑවේ කියලා. අර විධියට අච්චර වැඩ තියෙද්දී මහට ඇවිත් සක්මන් කරකර සිටියේ ඇයි කියලා. නමුත් මහ පුදුම විධියට ගැලපිලා එනවා මේ හැම එකක්ම. මේවා බුදුරජාණන් වහන්සේ දුන්නාම නොවේ. චූලපන්ථක හාමුදුරුවෝ සංසාරයේ කරපු හොඳ නරක දෙකට සම්බන්ධයි. නරක නිසා ගෙදර යන්න සිද්ධ වුනෙ. අර තරම් ශෝකයක් ඇතිවුනේ. තමන්ගේ සහෝදරයා විසින් දාන වේලක් වරද්දන විධියට ගෙදර යන්න සැලැස්වූයේ අසමත් කරලා.





ඊළඟට බුදුරජාණන් වහන්සේ ඒකට යෙදූ උපාය මාර්ගය සංඝයා වහන්සේලාගෙත් අවධානය යොමුකරවන්න, මේ ආශ්චර්යවත් සිද්ධියට. කවුරුත් දානය වළඳන්න බලාගෙන ඉන්න ඇති. නමුත් දානය වැළඳීම පරක්කු වුනා. කීප සැරයක් සේවකයෙකු ඇරලා චූලපන්ථක හාමුදුරුවෝ ඉන්නවාද නැද්ද කියල දනගන්න යෙදුනා. ඒ තුළින් අපට මහා අගනා ධර්මතාවක් හෙළිවුනා. ඒකයි ආශ්චර්යම දේ. ආශ්චර්යවත් කාරණයක් නිසාම තමයි අපට පොත්වලින් පේන හැටියට සංඝයා වහන්සේලා නිතර නිතර ඒ කාරණය ගැන කථා කළේ. මේ කාලයේත් ඇත්ත වශයෙන් අපි නිතර නිතර ඒ වගේ දේවල් ගැන හිතන්න ඕන. අන්න අර කියාපු විධියට ලෝක සම්මත සමහර විභාගවලින් පරීක්ෂණවලින් ගොඩින්ම අසමත් කරලා ගෙදර යවන්න හදන විධියේ ආකල්පයකුත් ඇතැම් අය තුළ තිබෙන නිසා. එහෙම නැත්නම් අර කීවා වගේ අභව්‍ය - එහෙම නැත්නම් ත්‍රිහේතුක ප්‍රතිසන්ධි උත්පත්තියක් නැත - කියලා විදර්ශනා ආදියට උත්සාහ නොකළ යුතුයි කියන මතිමතාන්තර පැතිරෙන්නේ ඔන්න ඔය විධියේ දුර්වලතාවක් නිසයි. ඉතින් මේක නිසා හැම කෙනෙකුටම ධෛර්යවත් වෙන්න හොඳ කතාන්තරයක් මේක. කතාන්තරය වශයෙන් බැලුවාම.

ඊළඟට බුදුපියාණන් වහන්සේ අවසානයේ දේශනා කළ ගාථාව. එතැන ඇත්ත වශයෙන් ධර්මයට අදාළ කාරණා රාශියක් තියනවා.

**උට්ඨානෙන 'ප්පමාදෙන**
**සඤ්ඤමෙන දමෙන ච**
**දීපං කයිරාථ මෙධාවී**
**යං ඔඝො නා 'භිකීරති**

බොහෝ විට ධම්මපද ගාථාවල එක වචනයක්වත් අහක් කරන්න බැහැ. මහ පුදුමයි වචනයක් වචනයක් පාසාම ගැඹුරට ගියොත් විශාල පොතක් ලියන්න තරම් දේවල් තිබෙනවා. ඉතින් මෙතන කියවෙනවා කාරණා කිහිපයක්. අපි අර්ථය කලින්මත් කීවා. නිවනට උපකාර වන කාරණාය මෙතන කියලා තියෙන්නේ කියලා.

**"උට්ඨානෙන 'ප්පමාදෙන**
**සඤ්ඤමෙන දමෙන ච"**

උට්ඨාන කියල කියන්නේ නොපසුබට වීර්යයයි. වැටෙන්න වැටෙන්න නැගිටින්න ඕනෑ. ඒකෙනුයි සාර්ථකත්වය ලැබෙන්නේ. ඒකයි සාර්ථකත්වයට මාර්ගය. ඉතින් මෙතනත් චූලපන්ථක හාමුදුරුවන්ගේ හිත වැටිලා තිබුනේ. දැන් ඉතින් ගෙදර ගිහිල්ලා දැන් පින් කරගෙනවත් ඉන්න ඕන කියලයි පිටත්වෙන්න හැදුවෙ. නමුත් අන්න උත්සාහවත්කළා බුදුපියාණන් වහන්සේ. ධෛර්යවත් කළා. කොයිතරම්ද කියතොත් අර ශ්‍රී හස්තයේ ස්පර්ශය කර්මවේගය ගෙවන ආශීර්වාදයක් වෙන්නත් ඇති. කොයි ආකාරයකින් නමුත් එයින් ධෛර්යවත් වෙලා බුද්ධ වචනයට කීකරුව අර විධියට භාවනා කළා. අනිත් හැමදෙනාම දානෙ ගෙදර ගියා. පාලු ආරාමයේ අඹ වනයේ මේ චූලපන්ථක පොඩි හාමුදුරුවෝ භාවනා කරනවා. අන්න ඒ ටිකට තමයි 'උට්ඨානෙන' නොපසුබට වීර්යය. 'අප්පමාදෙන', අප්‍රමාදීව, ආහාර ගැනත් නොතකා භාවනා කළා.

ඊළඟට 'සඤ්ඤමෙන දමෙන ච'. සංයමය, බුද්ධ වචනයට කීකරුව. සීලාදී ගුණධර්ම වලට ලැදි නිසාම තමයි ගෙදර යන්න අකමැති වුනේ. සාමාන්‍යයෙන් ඔය සමහර පොඩි හාමුදුරුවරු කොයි වෙලාවේ ගෙදර යනවාද කියලා නැහැ. ඒ තරමට හිතන අය ඉන්නවා. ගෙදරටමයි හිත. නමුත් මේ පුංචි හාමුදුරුවෝ ගෙදර යන්න අකමැතියි. බැරිම තැනයි අර ගෙදර යන්න සූදානම් වුනෙ. එයින් අපට පේනව අර සංයම දම ආදී ඒ ගුණ ධර්ම පොඩි හාමුදුරුවෝ ඒ වෙනකොටත් දියුණු කරගෙන තිබුණු බව. විශේෂයෙන්ම ඒක නිවනට උපකාර වන ආකාරයට කීකරුව පිළිපැද්ද නිසා තමයි 'උට්ඨානෙනප්පමාදෙන - සඤ්ඤමෙන දමෙන ච'.

ඊළඟට 'මේධාවී' කියන්නේ නිවන් පැත්තෙන් නුවණැති පුද්ගලයා. දැන් මේ කාලයේ නුවණැති පුද්ගලයා හඳුන්වන්න නොයෙකුත් විදියෙ වචන තියනවා. වචන පමණක් නොවෙයි තව නොයෙකුත් දේවල් තියෙනවා. මේ පින්වතුන් දන්නවා අකුරු එහෙම තියනවා, උගතෙක් හඳුනාගන්න පණ්ඩිතයෙක් හඳුනාගන්න. ලෞකික මට්ටමේ විභාගවලින් පාස්වෙලා ලැබෙන උපාධි කියන ජාතියකින් පණ්ඩිතයින් හැටියට පෙනී සිටින ක්‍රමයකුත් තියනවා ලෝක සම්මත. නමුත් 'මේධාවී' කියන වචනය විශේෂයි. ධර්මයේ මෙධාවී කියල කියන්නේ 'ධම්මොජ පඤ්ඤාය' ධර්මය නමැති ඕජස ඇති ප්‍රඥාවක්. ධර්මය නමැති ඕජස ඇති ප්‍රඥාවක්. ඕජස කියල කියන්නේ තෙත් බව. ඒකට අනික් පැත්ත කියනව නම් වියලි ශුෂ්ක. අනික් අයගේ බොහෝ දෙනාගෙ ප්‍රඥාව වේලිච්ච ප්‍රඥාවක්. ශ්‍රද්ධා දී ගුණධර්ම නෑ එතන.

'ධම්මොජ පඤ්ඤා' කියල කියන්නේ ධර්මය නමැති ඕජස ඇති ප්‍රඥාව.





එබඳු පුද්ගලයාටයි 'මේධාවී' කියන්නේ. ඒ තත්ත්ව ලබන්නට නම් දැන් මේ කාලයේ ඉන්න උගත්තු වැඩි දෙනෙක් නැහැ සුදුස්සන්. දැන් මෙතන චූල පන්ථක හාමුදුරුවෝ 'මේධාවී'. හාරමාසයක් තිස්සේ පාඩම් කරලත් බැරිවුනා ගාථාවක් හරියට කටපාඩම් කරගන්න. දැන් නම් විභාගෙන් පාස් වෙන්න නම් ඇත්ත වශයෙන් කටපාඩම් කරගන්නත් ඕන. එහෙම බැරිවුනාට මොකද මේධාවී නමින් බුදුපියාණන් වහන්සේ හැඳින්වූවා. ඉතින් එබඳු මේධාවී පුද්ගලයා මොකද කරන්නේ?

**දීපං කයිරාථ මේධාවී**
**යං ඔඝො නාභිකීරති**

සැඩ වතුර වලට අසුනොවන, සැඩ වතුර වලට ගසාගෙන නොයන දිවයිනක් සාදා ගන්නේය, කියන එකයි අදහස.

දිවයින කියල කීවාම ඒකත් නොපිටට ගන්නා අය ඉන්නවා. නිවනට දිවයින කියල නම දීල තියනව. දිවයින කියලා, ලෙන කියලා, තව නොයෙකුත් නම් නිවන පිළිබඳව දක්වලා තිබෙනවා. එපමණකින් **ඇතැම් කෙනෙක් හිතනවා නිවන කියලා කියන්නේත් මේ භවයේම යම්කිසි හැංගිච්ච අපි කියන්න කැමති නැති යම්කිසි ගුප්ත තැනක් කියල.** එහෙමත් ඇතැම් කෙනෙක් කල්පනා කරනවා. ඒ තරමටම සත්ත්වයා තුළ භවරාගය දැඩියි. සසර දුක නැති කරන්නත් ඕන. සංසාරයේ ඉන්නත් ඕනෑ. ඒ විධියේ දෙයක් මෙතන තියෙන්නේ. ඒ විධියටයි බොහෝ උගත්තු මේ නිවන පවා තෝරන්නේ. එහෙම තේරවිලි වලට උපකාර කර ගන්නවා ඔය දිවයින කියන වචනයත්. බුදුරජාණන් වහන්සේ කියලා තියෙන්නේ සංසාර සාගරයෙන් ඉවත්වෙලා නිවන කියන දිවයිනට ගිහිල්ලා 'සදාකාලික අජරාමර' තව මොකක්ද 'නිත්‍ය මංගල පරම රමණීය' තැනක සදාකාලිකව ඉන්න ඔය විධියේ සංකල්පයකුත් බොහෝ දුරට නිවන පිළිබඳ තිබෙනවා. නමුත් වරදවා තේරුම් ගන්න නරකයි. මෙතන මේ දිවයින කියලා කියන්නේ සාංසාරික සත්ත්වයා ගසාගෙන නොයන මේ සිත පිළිබඳ තත්ත්වයක්. මෙතන කියන්නෙ චිත්ත විමුක්තියක්. අර්හත් ඵල විමුක්තියයි. ඒ කියන්නේ සංසාරයේ හැම සත්ත්වයාම කාමය කියන, කාමොඝ කියන සැඩ වතුරට ගසාගෙන යනවා. ඊළඟට භවය පැවැත්ම - පැවැත්මට ඇලුම් කරනවා. මොන අන්දමේ පැවැත්මක් නමුත්. දැන් ඔය රෝහලක ඉන්න රෝගියකුගෙන් ඇසුවොත් මැරෙන්න කැමතිද කියලා නැහැ කියනවා. ඇගේ කොච්චර පණුවො දමල සිටියත් පැවැත්මට කැමතියි. අන්න ඒ විදියට පැවැත්මට පුදුම විධියේ ආසාවක් මේ ලෝකයා තුළ තියනවා. ඉතින් ඒකට ඇදිලා යනවා. ඊළඟට දිට්ඨි. නොයෙකුත් දෘෂ්ටි, නොයෙකුත් වැරදි දෘෂ්ටි ගන්නවා.

වැරදි ආකාරයේ හැඟීම්, ජීවන දර්ශන ඇතිකර ගන්නවා. ඊළඟට අවිජ්ජා. අවිජ්ජා කියලා කියන්නේ අපි නොදන්නම කියල කියනවා. කෙටියෙන් සළකල බැලුවොත් දන් සාමාන්‍යයෙන් අවිජ්ජා කියන එක තෝරන්නෙ පොතේ කියන හැටියට චතුරාර්ය සත්‍යය පිළිබඳ නොදැනීම කියලා. සංසාරය දුකක් බව දන්නේ නැහැ. ඒ දුකට හේතුව තණ්හාව බව දන්නේ නැහැ. තණ්හාව සංසිඳවීම නිවන බව දන්නෙ නැහැ. ඒකට මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය බව දන්නේ නැහැ කියලා.

නමුත් අපට තවත් ආකාරයකින් ඒක තේරුම් ගන්න පුළුවන්. නොදන්නම කියලා කියන්නේ මේ සසර දුක් ස්වභාවය අමතක කිරීමේ ගතිය. බොහොම පහසුවෙන් අමතක වෙනවා සත්ත්වයාට. මේ සංසාරයේ ජීවිතයක ඉතාමත්ම බරපතල දුක් විඳලා, මහා භයානක භීෂණ අන්දමින් ගිනිවලට අහුවෙලා තැලිල පොඩි වෙලා මැරුණත්, පැවැත්මට තියන ආශාව නිසා ඉක්මණින්ම ඒ දුක, අර අත්දැකීම්, අමතක වෙනවා. ඊළඟට ඒ දුක අමතක වෙනව වගේම ඒ දුකට හේතුව තණ්හාව බවත් අමතක වෙනවා. ඊළඟට ඒ තණ්හාව නැතිවුන තැන තමයි ලොකුම සැනසීම කියන එකත් අමතක වෙනවා. ඊළඟට මෙන්න මේ සැනසීම ලබන්න නම් අපේ සිත් තුළ අපේ පෞරුෂය පිළිබඳ අංග සම්පූර්ණ පරිවර්තනයක් සිද්ධවෙන්න ඕන පියවර අටකින් කියලා, ආර්ය අෂ්ටාංගික මාර්ගය නමැති පියවර අටකින් කියලා, ඒ කාරණයත් අමතක වෙනවා. චූල පන්ථක හාමුදුරුවෝ විතරක් නොවෙයි මේ සංසාරයේ ඉන්න අපි කවුරුත් මෙන්න මේ හතර පදය අමතක කරනවා. **මේ හතර පදය කටපාඩම් කර ගන්න බැරිවයි මෙච්චර කාලයක් සංසාරයේ ඇවිල්ලා තියෙන්නේ. මේ හතරපදය හරියටම එක පෙළට කටපාඩම් කරගත්තා නම් ඒ තැනැත්තා මාර්ග ඵල ලැබුවා.**

එතකොට දුක, දුක්ඛ සමුදය, නිරෝධය, මාර්ග කියල කියන මේ සංසාර පැවැත්ම දුකක්. මේකට හේතුව තණ්හාවයි. මේ තණ්හාව සංසිඳුවා ගැනීම තමයි ලෝකයේ තිබෙන උතුම්ම සැපත. ඒක කරන්න නම් අප ඇතුළත යම්කිසි වැඩීම් වශයෙන් දියුණු කිරීම් වශයෙන් සම්‍යක් දෘෂ්ටියෙන් පටන්ගෙන සම්‍යක් සමාධියෙන් ඉවර වෙන ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළින් සම්පූර්ණ ජීවිත පරිවර්තනයක් - සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කියන ආකාරයට සිත කය වචනය පිළිබඳ පැවැත්මේ පූර්ණ පරිවර්තනයක් - සිද්ධවෙන්න ඕන. ඔන්න ඔය කියන හතර පදය අමතක කිරීම නිසා තමයි මෙච්චර කාලයක් අපි සංසාරයේ ඇවිල්ලා





තියෙන්නේ. එතකොට මාර්ග ඵල ලැබීමේදී වෙන්නේ එක සිතකම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග අටම පහළවීමේ ප්‍රබල සමාධිය තුළින්, මාර්ග සමාධිය තුළින්, එක මොහොතකදීම අර හතර කාරණාම පැහැදිලි වෙනව. ගාථාව කටපාඩම් වුනා වගේ හරියට. මොකද ඒ? දැන් අපි දන්නවා පහනක් දල්වෙන කොට කාරණා කීපයක්ම සිද්ධ වෙනවා. දල්වෙන මොහොතක් පාසා පාන්තිරය දැවෙනවා. යම්කිසි ප්‍රමාණයකට තෙලුත් ඉවරවෙනවා. ආලෝකයකුත් පැතිරෙනවා. අන්ධකාරයත් නැති වෙනවා. ඒ වගේම තමයි මේ චතුරාර්ය සත්‍යයත්. චතුරාර්ය සත්‍යය අවබෝධ වන අවස්ථාව දක්වන්නෙත් ඔය වාගේ උපමාවකින්. ඒ මාර්ග චිත්තය ලබලා චතුරාර්ය සත්‍යය අවබෝධ වන අවස්ථාවේ ඒ හතරම එකට අහුවෙනවා කියලා කියනවා. මොකද අර දුක, මේ මුළු මහත් පැවැත්මට දුකක් කියන ඒක අවබෝධ වෙන්න නම්, ඇත්ත වශයෙන්. මේක යට කියන තණ්හාව සම්පූර්ණයෙන් දකින්නත් ඕනැ. එක පැත්තකින් දුක නැති වෙනවා. තණ්හාවත් ගෙවිල යනවා. ඊළඟට ඒක තුළින් අර්හත්වය, නිවන, තමයි ආලෝකය. ආලෝකය පැතිරෙනවා. මේකට යම්කිසි වැඩීමකුත් සිද්ධ වෙන්න ඕන ඇතුළතින්. ආර්ය අෂ්ටාංගික මාර්ගය. පහන දල්වෙනවා නම් තමයි අර ආලෝකය පැතිරෙන්නේත් අන්ධකාරය නැති වෙන්නේත්. ඔන්න ඔය විදියට චතුරාර්ය සත්‍යයම කෙනෙකුට ප්‍රත්‍යක්ෂ වෙනවා කියල කියන්නේ ඕකයි.

ප්‍රත්‍යක්ෂවීම පොතෙන් ඉගෙන ගන්නවා වගේ දෙයක් නොවෙයි. ඒ අවස්ථාවේ, මාර්ග ඵල ලබන අවස්ථාවේ, රහත්වන අවස්ථාවේ, කෙනෙකුට ප්‍රත්‍යක්ෂ වෙනවා බුදුපියාණන් වහන්සේගේ වචනය. මේ මුළු මහත් සංසාරික පැවැත්ම, එහෙම නැත්නම් පංචස්කන්ධය, රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියල කියන පංචස්කන්ධයම දුකක්. දුකක් බව වැටහෙන්නේ මේවායේ සංස්කාර තත්ත්වය අවබෝධ කර ගැනීමෙන්. මෙතන 'මම මාගේ' කියලා ගතයුතු දෙයක් නැහැ. මෙතන තියෙන්නේ සකස්කිරීම් ගොඩක්. ඇතිව නැතිවන සකස්කිරීම් ගොඩක්. සංස්කාර ගොඩක් කියන හැඟීම. ඉතින් ඒ වගේම මේවා වවන්නේ, වැඩිකර ගන්න පොළඹන්නේ තණ්හාවයි. සංසිඳෙන්නේ නැති, සැපයට කැමති ආශාව, මේ පැවැත්මට කැමති ආශාව ආදී ආශාවන් නිසා. ඒ විදියට අවබෝධය සම්පූර්ණ වෙන්නේ අන්න අර ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග අටම සම්පූර්ණ වෙලා හරියට කෙලින් සෘජුවම ඒ මාර්ගය සිතක පහළ වන කොටයි. ඒ අවස්ථාවේදීයි. ඒකට කියනවා මාර්ග චිත්තය. ඒක ඉතාම ප්‍රබල සමාධියක්. ඒ ප්‍රබල සමාධියෙන් තමයි කෙලෙස් මට්ටම් කැපිලා ධර්මයේ දක්වෙන ආකාරයට සංසාර පැවැත්ම ගෙනයන යම් චිත්ත

ශක්තියක්, බලවේගයක්, මේ අපේ චිත්ත සන්තාන වල තිබෙනවා නම් ඒවා ගෙවිලා යන්නේ ඒ ප්‍රබල සමාධිය තුළින්. අර අවබෝධය තුළින්. ඒ නිසා තමයි කියන්නේ සෝවාන් වීමේදී ආත්ම හතකට සීමාවෙනවා, සකදාගාමී වීමේදී තවත් එක්වරක් පමණක් මෙලොවට ඒම, අනාගාමී වීමේදී බ්‍රහ්මලෝකයේදීම දුක් කෙළවර කිරීම නැවත මෙලොවට නොඒම, රහත් වීමේදී නැවත උත්පත්තියක් ලබාදෙන ස්වභාවය නැතිවෙලා එහෙම පිටින්ම උපත කෙළවර කළා කියන අවබෝධය එනවා. නැවත උත්පත්තියකට උපකාර වන යම් කෙලෙස් මට්ටම් මේ චිත්ත සන්තානයෙ තිබෙනවා නම්, අනුසය වශයෙන් ලැගගෙන සිටින දේවල් තිබෙනවා නම්, ඒ ඔක්කොම වියළී යනවා කියන්නේ ඒකයි. චතුරාර්ය සත්‍යය හරියට අවබෝධ වන, ප්‍රත්‍යක්ෂවන අවස්ථාව. අන්න ඒ තත්ත්වයයි මෙතන දිවයින කියල කියන්නේ. ඒ චිත්ත විමුක්තියයි.

ඉතින් රහතන් වහන්සේලා ලබාගත්තු, සොයාගත්තු, හදාගත්තු, දිවයිනට ගොඩවෙලා ඉන්න අවස්ථාව වගේ තමයි අර්හත් ඵල සමාපත්තියට සමවැදී ඉන්න අවස්ථාව. ලෝකයෙන් වෙන්වෙලා. ඒ අවස්ථාව තමයි ඇත්ත වශයෙන් ලෝකයේ ඇති කිසිවකට උපමා කරන්න බැරි විදිහෙ උතුම්ම තත්ත්වය. ඒක සොයා ගැනීම නිසාමයි අපි මේ බුදුරජාණන් වහන්සේට ලෝකයේ අනික් කිසිම කෙනෙකුට නොකරන විදියේ පුද පූජා ගෞරව සම්මාන කරන්නේ. ලෝකය වැඩීමට, ලෝක වර්ධන වශයෙන් ලෝකය වැඩීම ගැන, දේශනා කළ නිසා නොවෙයි. ඒ ඒ පුද්ගලයාගේ හැකියාවන් අනුව දේශනා කළ නමුත් ඒ හැම එකකින්ම බුදුරජාණන් වහන්සේ උත්සාහ කළේ මේ සංසාරය දුකක් බව වටහා දීලා මේ සංසාරයෙන් එතර කරවීමටයි. සංසාරයෙන් එතරවීම කියන එක සිත පිළිබඳ තත්ත්වයක්. ඒ සංසාරයෙන් එතරවෙලා වෙන දිවයිනකට ගොඩවෙලා ජීවත්වීම නොවෙයි. ඒක නිසා අපි කල්පනා කරගන්න ඕනෑ නොයෙකුත් කෙලෙස් බලපෑම් නිසා බුද්ධ ධර්මය පවා විකෘත කරලා බොහෝ දෙනෙක් තේරුම් ගන්නව. ඒ විධියට දෘෂ්ටිය වැරදි නම්, දැක්ම වැරදි නම්, වැරදි පැත්තට නම් යන්නේ, කොහොමද කෙනෙක් නිවන් දකින්නේ?

අන්න ඒක නිසා අපි කල්පනා කර ගන්න ඕනෑ මේ විධියේ ධර්ම කථා වලිනුත් ඒ වගේම මේ ගාථාවේ තිබෙන ගැඹුරු අර්ථයත්. දැන් මෙතන කියැවෙන අනිත්‍යතාව සංස්කාරයන්ගේ අනිත්‍යතාව. අතීතයේ රජකෙනෙකු වී පවා -අතීතයේ රජ කෙනෙක්ව හිටියත් චූලපන්ථක හාමුදුරුවෝ අනන්ත කාලයක් මේ සංසාරයේ ධර්මයට නැඹුරුව හිතුම් පැතුම් ඇති කරගෙන ඉන්න ඇති. ඒ වගේ අපි, අපි ගැනත් හිතන්න ඕන.





අපි දැන් ගිහි ජීවිතයේ කොයි කොයි මට්ටමේ හිටියත් අප තුළ තිබෙන්න පුළුවන් යම් යම් නිවනට උපකාර වන ශක්තීන්. ඒවා නිකම් මතුවන්නේ නැහැ. අපි මතුකර ගන්න උත්සාහ කරන්න ඕන. ඒක තමයි අපි කිව්වේ ඒවා අහකට යන්න නොදී ඒවා නිවනට බැර කරන්නෙයි කියලා. ඒ විධියට කරනකොට ටිකෙන් ටික අන්න සංස්කාරයන්ගේ අනිත්‍යතාව කෙනෙකුට හිතට හොඳට ජීර්ණ වෙලා ක්‍රම ක්‍රමයෙන් අර විදර්ශනාව වැටහෙනවා. විදර්ශනාව කියල කියන්නේ විශේෂ දැක්මක්. ලෝකයා අනිකුත් යන්ත්‍ර සූත්‍ර වලින් උපකරණ වලින් දකින දැක්මක් වගේ නොවෙයි. ප්‍රත්‍යක්ෂ වශයෙන් විනිවිද දැකීමක් කෙනෙකුට ඇතිකර ගන්න පුළුවන්.

ඒ විනිවිද දැකීමේ ක්‍රමය තමයි මාර්ග ඵල අවබෝධය පිළිබඳව දැක්වෙන තැන්වල කියවෙනවා විදර්ශනා ඥාන වශයෙන් මතුවෙනවා කියලා. ඒක සාමාන්‍ය ශාස්ත්‍රීය විෂයයක් හැටියට දිගට නොකීවත් අපි කල්පනා කරන්න ඕන එතන තියන ධර්මතාව මොකක්ද? අපි කවුරුත් දන්නවා නිවන් දකින්න නම් සරලව කෙටියෙන් කීවොත් අනිත්‍ය, දුඃඛ, අනාත්ම කියන ත්‍රිලක්ෂණය, ලකුණු තුන, අවබෝධ කර ගන්න ඕන කියලා. අපි කවුරුත් ඒක දන්නවා. 'අනේ අනිච්චං' කියලවත් කියන්න පුළුවන් තත්ත්වයට. බෞද්ධයෝ දන්නව අනිච්ච කියන වචනය. නමුත් ඒක ගැඹුරින් කල්පනා කරල බැලුවොත්, ඒක විදර්ශනා ඥාන වශයෙන් මතුවෙන කොට, දෙකකට බෙදෙනවා. ඒකයි අපි කියන්නේ අනිත්‍යතාව කියන බීජයෙන් මතුවන මුල් පත්‍ර දෙක වගේ තමයි ඇතිවීම් නැතිවීම් දෙක. ඇතිවීම් නැතිවීම් දෙකත් පෙනෙනවා ටිකක් ගැඹුරින් කල්පනා කළොත්. අනිත්‍යතාව කියල කියන්නේ මේ ඇතිවීමයි නැතිවීමයි. ඇතිවෙනවා පවතිනවා නැතිවෙනවා. පවතිනවා කියන අවස්ථාව අපි හිතින් හදා ගත්තාට මොකද ඇතිවීමයි නැතිවීමයි ඇත්ත වශයෙන් තියෙන්නේ. යමක් ඇතිවෙනවා. අපි පවතිනවා කියලා හිතා ගන්න අවස්ථාවකුත් තියනවා. ඊළඟට නැතිවෙලා යනවා. මේක ශීඝ්‍රව වැටහෙන කොට ඊළඟට පෙනෙනවා ඇතිවීමටත් වැඩිය ශීඝ්‍රයෙන් නැතිවෙනවා වගේ. ඒ එක්කම කලකිරීමක් එනවා. කලකිරීම වැඩිවන්න වැඩිවන්න අවබෝධයත් වැඩිවෙනවා. මොකද තණ්හාවේ ස්වභාවය නැවත නැවත උපද්දවා ගැනීමයි. තණ්හාව අඩුවන කොට ඔන්න පෙනෙනවා අනිත්‍ය ස්වභාවය. මේ එකක්වත් පවතින්නේ නැහැ. ඒව ඇතිවීම් නැතිවීම් වශයෙන් සංස්කාර ගොඩ නොයෙකුත් උපමා වලින් කියවෙනවා කබලක බැදෙන තල පුපුරන්නා වගේ බොහොම ශීඝ්‍රයෙන් නැතිවෙලා යනවා විදර්ශනා ඇසට පෙනෙන්න පටන් ගන්නවා.

ඊළඟට ක්‍රම ක්‍රමයෙන් නැතිවීම නිසාම 'භංග' කියලා කියන විනාශ

වෙලා යෑම පෙනෙනවා. වෙන දේවල් පමණක් නොවේ හිත පවා-යමක් ගැන හිතන කොට ඒ හිතුවිල්ලත් බිඳිලා යනවා පෙනෙනවා. ඒ තරම් ගැඹුරින් මේක බිඳිලා යනවා පෙනෙන කොට හයකුත් ඇතිවෙනවා. මොකක්ද මේ පැවැත්ම කියල කියන්නෙ. මෙතන මමය කියලා ගන්න දෙයක් නැහැ. මෙතන ඇතිවීම් නැතිවීම් ගොඩක්. මට අල්ලා ගන්න දෙයක් නැහැ. ඔක්කොම දිරච්ච වැටවල්. ඒ විධියට හිතෙනවා. මේ තත්ත්වය හිතන කොට ඒක තුළින් භයක් ඇතිවෙනවා. ඒ භය නිසාම ඊළඟට කලකිරීමක් ඇති වෙනවා පංචස්කන්ධය ගැන. ක්‍රම ක්‍රමයෙන් ඇතුළතින් කලකිරීමක් ඇති වෙනවා. දිවි නසා ගන්න කලකිරීමක් වගේ දෙයක් නොවේ. මේ සංසාර පැවැත්මේ කෙළවරක් දකින්න ඕන කියලා. ඊළඟට මේකෙන් මිදෙන්න ඕන කියන හැඟීම ඇති වෙනවා. බිඳි බිඳී යන මේ විදියෙ තත්ත්වයකින් මම මිදෙන්න ඕනෑ කියලා. නමුත් එක පාරට අතහරින්න අමාරුයි. මොකද 'මේක මගේ' කියන හැඟීම තියන නිසා.

අන්න එතකොට තව ගැඹුරින් කල්පනා කරනකොට මේවා සංස්කාර වශයෙන් වැටහෙනවා. සංස්කාර ගොඩක්. මගේ කියලා ගන්න දෙයක් නැහැ. මේවා ඇතිවෙනවා නැති වෙනවා පමණයි. සමහර විට උපමාවක් දෙනවා සාමාන්‍ය ලෝකයාට වැටහෙන ආකාරයට. දැන් යම්කිසි කෙනෙක් තමාගේ ප්‍රිය මනාප භාර්යාව වෙන කෙනෙක් එක්ක කතාබහ කරමින් ඉන්න කොට සමහර විට තමන්ට ද්වේශයක් ඇතිවෙනවා. යම්කිසි අවස්ථාවක ඒ තැනැත්තිය දික්කසාද කළානම් හිතට බලපෑමක් වෙන්නේ නැහැ. අන්න ඒ වගේ මමය මාගේය කියල හිතා ගත්තු දේවල් මේවා සංස්කාර ගොඩක් පමණයි කියල හිතෙන කොට මේකෙන් මිදෙන්න හිත සකස් වෙනවා. ඊළඟට ඒවා පිළිබඳ උපේක්ෂාවක් ඇතිවෙනවා. ඊළඟට තව දුරටත් අනිච්ච, දුක්ඛ, අනාත්ම කියන ත්‍රිලක්ෂණය ගැඹුරින් වඩලා එහෙම කරලා තමයි අන්තිමට මේ පංචස්කන්ධයෙන් හිත මුදාගන්නේ සම්පූර්ණයෙන්ම. ඒ මිදුණු හිත තමයි අර දිවයින කියලා කිව්වෙ. ඒ මුදාගත්තු හිත තමයි රහතන් වහන්සේගේ අවසාන අවස්ථාවේ හිත හැටියට මතුවෙලා නැවත උපාදානයකට නැඹුරු වෙන්නේ නැති නිසාමයි පැවැත්මක් නැත්තේ. ඕකයි ධර්මතාව.

ඉතින් පොතේ කොයි කොයි හැටියට දීර්ඝව තිබුනත් අපි ඒවා ගැන වෙහෙසෙන්න ඕන නැහැ. මේ සාමාන්‍ය ඉඟියක් කළේ අර දිවයින පිළිබඳව. බොහෝ දෙනා භවය අනුවමයි දිවයින තෝරන්නේ. මේක භව නිරෝධයක්, භවයේ පැවැත්මේ කෙළවරක් කියන එකත් ඇතැම් කෙනෙක් විශ්වාස කරන්නේ නැහැ. ඉතින් මේ ගාථාව ආශ්‍රයෙනුයි මේ ගැඹුරු ටික කිව්වේ.





මේ වටිනා පෝය දවසේ මේ පින්වත් පිරිස, අපි හැම කෙනෙක්ම, කල්පනා කරන්න ඕනෑ බෞද්ධයෝ නම් අපේ ගමන නිවන කරා යන ගමනක් කියලා. ආපසු හැරිලා භවයම වඩන්න යන ගමනක් නොවෙයි. ඉතින් ඒක නිසා අපි උත්සාහ කරන්න ඕනෑ මේ නිවන් ඉලක්කයම හිතට ඉදිරිපත් කරගෙන අපි හැම දෙයක්ම කරලා අපට මේකෙන් නිවනම ලැබේවා කියලා, මේ සසරින් මිදීමට අපට හැකියාව ලැබේවා කියලා පතන්න ඕන. ඒකට උපකාර වන දේවල් තමයි අපි මේ කර්මස්ථාන කියලා කියන්නේ. ඒ කර්මස්ථාන කියන එකත් අමුතු ගුප්ත දෙයක් නොවෙයි. එදිනෙදා ජීවිතයේ අර කියාපු දහඩිය, කෙළ ආදී දේවල් තමන්ගේ ශරීරයේ ස්වභාවය මෙනෙහි කරන්න අවස්ථාව ආවාම ඒක තමන්ගේ ශරීරය තුළින් හෝ අනුන්ගේ ශරීරය තුළින් හෝ ඒවායින් සම්පූර්ණ ප්‍රයෝජනය ගන්න ඕන. ඒ ඇතිවෙලා නැතිවන විදර්ශනා සිතිවිල්ල කොතනක හෝ සටහන් වෙනවා. ඒක උපකාර වෙනවා අවසානයේ නිවනට.

ඉතින් අන්න ඒ විදියට අපි මේ අද දවසේ ධර්ම දේශනාව තුළින් අර පුංචි චූලපන්ථක හාමුදුරුවන්ගේ ශාසනික හුරතලය දුටුවා. බුදුපියාණන් වහන්සේගේ පුදුම මහා කරුණාව, අනුකම්පාව, බුද්ධානුස්සති වශයෙන් බුදුරජාණන් වහන්සේගේ ගුණ සම්භාරය දුටුවා. ඒ වගේම මේක තුළින් අපේ ඉලක්කය වියයුතු නිවන ගැන දැන ගත්තා. ඈත නොවෙයි නිවන. ඒක ළඟම තිබෙනවා. අපි අපිම මේ අභව්‍ය සංඥාව නැතිව භව්‍ය සංඥාව ඇති කරගෙන මේක අද අදම ප්‍රත්‍යක්ෂ කර ගන්න පුළුවන් කියලා උත්සාහ කරනවා නම් මේ ජීවිතයේදීම ලබා ගන්න පුළුවන්. අන්න ඒ විධියේ පිරිසිදු අදහස් සිතිවිලි රාශියක් ඇතිකරගන්න අවස්ථාව සැලසුනා. ඒ වගේම අපි දන්නවා මේ හැම එකක්ම සීලාදී ගුණධර්ම තුළිනුයි ආරම්භ වෙන්නේ. ඉතින් ආජීව අෂ්ටමක සීලය සමාදන් වුනා. ඊටත් වඩා වටිනා ශීලයක් මේ වැඩි දෙනෙක් සමාදන් වෙලා ඉන්නවා. ඉතින් ඒ සීලාදී ගුණධර්ම වලින් කය වචනය හික්මවාගෙන කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබාගෙන භාවනා කමටහන් ලබාගෙන භාවනා වශයෙන් සිත දියුණුකර ගැනීමෙනුයි කවදා හෝ අපට අර කියාපු ක්‍රමයට විදර්ශනා ඥාන අපතුළම දියුණු කරගෙන, මේ සංසාරයෙන් මිදීමට උපකාර වන්නා වූ ඒ මාර්ග ඥාන ඇතිකරගෙන,සෝවාන් සකදාගාමී අනාගාමී අර්හත් කියන මාර්ග ඵල ප්‍රතිවේධයෙන් මේ සංසාර දුක්ඛය කෙළවර කර උතුම් අමාමහ නිවනින් සැනසීමට පුළුවන් වන්නේ.

අන්න ඒක නිසා මේ පින්වත් පිරිස මේ ධර්ම ශ්‍රවණය තුළින්, අපිත් ධර්ම දේශනාමය වශයෙන්, යම් කුසලයක් ඇති කර ගත්තා නම් ඒ හැම කුසලයක්ම අපි අනුමෝදන් කරමු. මේ විශ්වයේ අපේ ඥාතීනුත් ඇතුළුව යම්තාක් මෙ බඳු කුසල් අනුමෝදන් වීමට කැමති දිව්‍ය බ්‍රහ්ම රාජයාණන් වහන්සේලා සිටිනවා නම් ඒ හැම කෙනෙක්ම මේ පින් අනුමෝදන් වෙත්වා!. ඒ හැම කෙනෙක්ම තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමාමහ නිවන සාක්ෂාත් කර ගනිත්වා. අපටද හැකිතාක් ඉක්මණින් ක්‍රියාත්මක වී වඩ වඩාත් බණ භාවනා ගැන උනන්දු වෙලා, මේ ජීවිතයේදීම, මේ බුද්ධෝත්පාද කාලයේදීම, ශාසනය ශීඝ්‍රව පරිහානියට යතත්, අපි උත්සාහ වෙලා මේ කියාපු ගුණධර්ම අපතුළ දියුණු කරගෙන සෝවාන් සකදාගාමී අනාගාමී අර්හත් කියන මාර්ගඵල ප්‍රතිවේධයෙන් උතුම් අමාමහ නිවන සාක්ෂාත් කර ගැනීමට මේ ධර්ම ශ්‍රවණමය කුසලයත් හේතු වාසනා වේවා කියා ප්‍රාර්ථනා කරගෙන මේ විධියට ගාථා කියා පින් දෙන්න.

"එත්තාවතාච අම්හෙහි ......"

## ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකරන ලද ග්‍රන්ථ

| | ග්‍රන්ථ නාමය | | පිටපත් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | නිවනේ නිවීම | පළමු වෙළුම | 11000 |
| 02. | නිවනේ නිවීම | දෙවන වෙළුම | 8000 |
| 03. | නිවනේ නිවීම | තෙවන වෙළුම | 5000 |
| 04. | නිවනේ නිවීම | සිවුවන වෙළුම | 6000 |
| 05. | නිවනේ නිවීම | පස්වන වෙළුම | 5000 |
| 06. | නිවනේ නිවීම | සයවන වෙළුම | 3500 |
| 07. | නිවනේ නිවීම(පුස්තකාල මුද්‍රණය) | ප්‍රථම භාගය(1-6 වෙළුම්) | 500 |
| 08. | නිවනේ නිවීම | සත්වන වෙළුම | 3000 |
| 09. | නිවනේ නිවීම | අටවන වෙළුම | 3000 |
| 10. | නිවනේ නිවීම | නවවන වෙළුම | 5000 |
| 11. | නිවනේ නිවීම | දසවන වෙළුම | 5000 |
| 12. | නිවනේ නිවීම | එකොළොස්වන වෙළුම | 3000 |
| 13. | පහන් කණුව ධර්ම දේශනා | පළමු වෙළුම | 9000 |
| 14. | පහන් කණුව ධර්ම දේශනා | දෙවන වෙළුම | 8000 |
| 15. | පහන් කණුව ධර්ම දේශනා | තෙවන වෙළුම | 6000 |
| 16. | පහන් කණුව ධර්ම දේශනා | සිවුවන වෙළුම | 7000 |
| 17. | පහන් කණුව ධර්ම දේශනා | පස්වන වෙළුම | 6000 |
| 18. | පහන් කණුව ධර්ම දේශනා | සයවන වෙළුම | 4000 |
| 19. | 'හිතක මහිම' | පළමු වෙළුම | 8000 |
| 20. | 'හිතක මහිම' | දෙවන වෙළුම | 5000 |
| 21. | උත්තරීතර හුදෙකලාව | | 9000 |
| 22. | විදසුන් උපදෙස් | | 8000 |
| 23. | චලන චිත්‍රය | | 6000 |
| 24. | Towards A Better World | | 6000 |
| 25. | Seeing Through | | 3000 |
| 26. | Nibbana - The Mind Stilled | Volume I | 3000 |
| 27. | Nibbana - The Mind Stilled | Volume II | 3000 |
| 28. | Nibbana - The Mind Stilled | Volume III | 3000 |
| 29. | Nibbana - The Mind Stilled | Volume IV | 1000 |
| 30. | Nibbana - The Mind Stilled | Volume V | 2000 |
| 31. | The Magic of the Mind | | 2000 |


නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම් :-
ජී. ටී. බණ්ඩාර, ස්ථාපක, ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්, 191, හැව්ලොක් පාර, කොළඹ 5.
දු.ක. - 0112-508173, 2592747 - 48


## වෙනත් කෘති

*1. Concept and Reality in Early Buddhist Thought -(1971)
*2. Samyutta Nikaya - AnAnthology, Part II - Wheel No, 183/185 -(1972)
*3. Ideal Solitude - Wheel No, 188 - (1973)
*4. The Magic of the Mind - (1974)
*5. උත්තරීතර හුදෙකලාව -'දම්සක්' අංක 172/173 - (1990)
-එම- (නව මුද්‍රණය), ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය (2001)
6. Towards Calm and Insight - (1991)
7. විදසුන් උපදෙස් - (1996)
8. නිවනේ නිවීම - (1997-2004)
-ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය, මහා භාරකාර දෙපාර්තමේන්තුව
(සම්පූර්ණ පොත වෙළුම් 11 කින් නිකුත් වී ඇත.)
9. From Topsy - turvydom to Wisdom -Volume 1 - (1998)
(Essays written for 'Beyond the Net, - A website on the Internet
- Website address http:// www.beyond thenet.net)
10. පහන් කණුව ධර්ම දේශනා - 1- වෙළුම - (1999)
11. Seeing Through - (1999)
12. හිතක මහිම - 1 - (1999)
13. නිවනේ නිවීම - ප්‍රථමභාගය - (1-6 වෙළුම්) - පුස්තකාල මුද්‍රණය(2000)
14. හිත තැනීම - (2000)
15. පහන් කණුව ධර්ම දේශනා - 2 වෙළුම - (2000)
16. Towards A Better World -Translation of 'Lo-wada-Sangarava' - (2000)
17. පැවැත්ම හා නැවැත්ම - (2000)
18. ඇති හැටි දැක්ම - (2001)
19. පහන් කණුව ධර්ම දේශනා - 3 වෙළුම - (2001)
20. දිවි කතරේ සැඳෑ අඳුර - (2001)
21. කය අනුව ගිය සිහිය - (2001)
22. මා-පිය උවැටන - (2002)
23. ප්‍රතිපත්ති පූජාව - (2003)
24. Nibbana - The Mind Stilled - Volume I - (2003)
25. පහන් කණුව ධර්ම දේශනා - 4 වෙළුම - (2003)
26. අභිනික්මන - (2003)
27. හිතකමහිම - 2 - (2003)
28. පහන් කණුව ධර්ම දේශනා - 5 වෙළුම (2005)
29. පහන් කණුව ධර්ම දේශනා - 6 වෙළුම (2006)
30. Nibbana - The Mind Stilled - Volume II - (2005)
31. Nibbana - The Mind Stilled - Volume III - (2005)
32. Nibbana - The Mind Stilled - Volume IV - (2006)
33. Nibbana - The Mind Stilled - Volume V - (2007)
34. The Magic of the Mind - (2007)

* Buddhist Publication Society, P.O. Box, 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61, මහනුවර